**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

Please provide the following information of your book/publication (please note that one consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : ශ්‍රී [illegible]
2. Author/ Authors : කරුණාසේන හෙට්ටිආරච්චි
3. Publisher : කර්තෘ
4. Year of Publication : 2009
5. ISBN (if applicable) : 978-955-0229-03-01
6. Access option : Open Access

**Author/copyright owner consent:**

I/we Karunasena Hettiarachchi (your name/names), as the author/s or copyright owner/s, would like to provide my/our consent for making available the above publication on the E-Repository of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would like to provide my consent to allow the E-Repository Management Committee to make the publication accessible to the students of University of Sri Jayewardenepura and public.

Signature of the Author/s or Copyright owner/s: [signature]

Date: 2023.09.14

CamScanner

# මූලාශ්‍ර හෙළිකරන අනුරපුර දාගැබ්



**කරුණාසේන හෙට්ටිආරච්චි**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



CamScanner

# මූලාශ්‍ර හෙළිකරන අනුරපුර දාගැබ්

ප්‍රථම මුද්‍රණය : 2009

© කරුණාසේන හෙට්ටිආරච්චි

ISBN - 978-955-0229-03-1

කර්තෘගේ වෙනත් ග්‍රන්ථ

දඹදෙණි අස්න හා කඳවුරු සිරිත - 1998

ඡද්දන්ත සැහැල්ල - 2003

පිටකවරයේ ඡායාරූප - කරුණාසේන හෙට්ටිආරච්චි

මුද්‍රණය - සංදේශා පබ්ලිෂර්ස්
අංක 38, යටවතුර, කහවල, පාදුක්ක.
දුරකථන : 077 4805717
071 7200987

කර්තෘ ප්‍රකාශනයකි.



ජීවිතය ගොඩනැගූ

ලොකු හාමුදුරුවන්ට

# පටුන


හැඳින්වීම vi

ථූපාරාම දාගැබ 1

මිරිසවැටි දාගැබ 15

රුවන්වැලි දාගැබ 23

අභයගිරි දාගැබ 59

දක්ඛිණථූප දාගැබ 91

ජේතවන දාගැබ 109




Scanned with CamScanner

# හැඳින්වීම

මෙරට වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් අතර දාගැබ තරම් ලාංකික ජනතාවගේ සිත් දිනාගත් වෙනත් පූජ්‍ය වස්තුවක් ඇතැයි සිතිය නොහැකිය. එය බුදුන් වහන්සේ සංකේතවත් කළ පූජනීය වස්තුවක් වූ අතර දාගැබක් ඉදිකිරීම ආයාසකර කාර්යයක්ද විය. හුදෙක් එය සාමූහික පරිශ්‍රමයක ප්‍රතිඵලයක් වන්නේය. සෑම බෞද්ධයෙකු ම පාහේ දාගැබක් ඉදිකරනවිට ඊට කර්මාන්තකාර හෝ දායකත්වයක් සැපයීමට අභිගය ඇළුම් කමක් දක්වන බව දුටුගැමුණු රජු රුවන්වැලි දා ගැබ ඉදිකිරීමේ සමයේ දී ඇතිවූ ඇතැම් සිද්ධි වලින් පවා පෙනීයයි. එය මහ පිංකමක් ලෙස අතීතයේ සිට ම සැලකුණි.

දාගැබ විහාරස්ථානයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සැළකුවා සේම එය විහාරයේ සංකේතය ද විය. දාගැබක් ඉදි කිරීමේ දී ඊට වඩාත් ම සුදුසු ස්ථානය ලෙස සලකනු ලැබ ඇත්තේ අදාල භූමියේ ඉහළ ම ස්ථානයයි. එබැවින් දාගැබ සැතපුම් ගණනාවක් දුර සිට වුවද සැදැහැවතුන්ගේ දෙනෙතට හසුකර ගැනීමේ හැකියාව තිබිණි. එය සුදු පැහැති වර්ණ ගන්වා තිබූ හෙයින් එම දර්ශණීය වඩාත් චිත්තාකර්ෂණීය විය. අතීතයේ සිට ම දාගැබ් ඉදිකිරීම ඒවායේ විවිධ පූජා පැවැත්වීම හා සම්බන්ධයෙන් වෙනම සංස්කෘතියක් බිහිව තිබූ බව දීපවංසය, මහාවංසය, ථූපවංසය, පූජාවලිය ආදී මූලාශ්‍ර ග්‍රන්ථ වලින් මෙන් ම සෙල්ලිපිවලින් ද පැහැදිලිවේ. දාගැබ ජනතාවගේ අධ්‍යාත්මික සුවය මෙන් ම බාහිර සුවය ලඟා කර ගත් මහාර්ඝ වස්තුවක් විය.

ලංකාවේ දාගැබ් ආරම්භවීම අදින් වසර දෙදහස් පන්සියයකට පෙර එනම් ජීවමාන බුද්ධ කාලයේදී ම සිදුවූ බව වංසකතා සාක්ෂි දරයි. එනම් බුදුන්වහන්සේගේ පළමු ලංකාගමනය අවස්ථාවේ දී සමන් දෙවියන් විසින් මහියංගන දාගැබ ඉදිකළ බව සැලකේ. මේ හැර උතුරු පළාතේ ගිරිහඬු සෑයෙහි ද කේශධාතු තැන්පත්කොට තපස්සු භල්ලුක පූජා පැවැත්වූ බව පූජාවලිය හා තිරියාය සෙල්ලිපිය සාක්ෂි දරයි.

කෙසේ වෙතත් ලංකාවේ වඩාත් නිශ්චිත වංසකථා සාක්ෂි මෙන් ම පුරාවිද්‍යාත්මක සාක්ෂි ලැබෙන්නේ මහින්දාගමනයෙන් පසු

ලංකාවේ ඉදිවුණු දාගැබ් පිළිබඳවය. ඒ අනුව මහින්දාගමණයෙන් පසු ඉදිකෙරෙන පළමු දාගැබ වන්නේ ථූපාරම දාගැබයි. මෙය බුදුන්වහන්සේ වෙනුවට උන්වහන්සේගේ අඩුව පිරිමසාලීම් වශයෙන් නිර්මාණය කරන ලද බවට ඉඟියක් මහාවංසයෙන් ලැබේ. පසුව දෙවනපෑතිස් රජ යොදුනෙන් යොදුන බුදුන් වහන්සේගේ ධාතු තැන්පත්කොට දාගැබ් තැනූ බව මහාවංසයේ සඳහන්ය. ථූපාරාම දාගැබ ඉදිකිරීමෙන් පසුව අනුරාධපුරයෙහි ඉදිවුණු දාගැබ් ලෙස මිරිසවැටිය, රුවන්වැලිය, දක්ඛිණථූපය, අභයගිරිය, ජේතවනය ආදි දාගැබ් කීපය දැක්විය හැකිය.

අතීතයේ දී දාගැබ් නිර්මාණය කිරීමේ දී ඇතැම් රජවරු තම රාජ්‍ය කාලය තුල දී කළ අතර ඇතැම් අවස්ථාවන්හි දී එසේ නොහැකිවූ අවස්ථාද වේ. රුවන්වැලි දාගැබ මීට උදාහරණවේ. මෙම දාගැබේ ආරම්භක කටයුතු දුටුගැමුණු රජු විසින් කරන ලද්දේ වුව ද ඔහුගේ මරණය හේතුකොටගෙන දාගැබේ කටයුතු අවසන් කරනුයේ සොයුරු සද්ධාතිස්ස රාජ්‍ය සමයේ දී ය. දැනට පවත්නා පැරණි දාගැබ් වලින් බොහෝමයක් ම වරින් වර කඤ්චුක යොදමින් විශාල කරවන ලද ඒවාවේ. දුටුගැමුණු රජු විසින් කළ මිරිසවැටි දාගැබ හා වලගම්බා රජු විසින් ඉදි කළ අභයගිරි දාගැබ ජගබා රජතුමා විසින් පසුව විශාල කොට බඳවන ලද බව වංශකථාවේ සඳහන්ව ඇත. මහා පරාක්‍රමබාහු රජතුමා විසින්ද 12 වන සියවසේ දී අනුරපුරයේ දාගැබ් කීපයක් ම දැඩි ප්‍රතිසංස්කරණයකට ලක් කරන ලදී. මේ හැර අනුරපුරයේ මහ දාගැබ් සියල්ල ම පාහේ මේ වනවිට නැවත කිසියම් හෝ ප්‍රතිසංස්කරණයකට ලක්ව පවතී. ථූපාරාමය, රුවන්වැලිය, ලංකාරාම වැනි දාගැබ් අටමස්ථානයට අයත් චෛත්‍ය සංවර්ධන සමිති විසින් ප්‍රතිසංස්කරණය කරන්නට යෙදුනි. අනෙක් දාගැබ් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි මැදිහත්වීමෙන් ප්‍රතිසංස්කරණය වී ඇත.

මෙම පැරණි දාගැබ් තුලින් අතීත සමාජයේ තිබූ ආර්ථික සමුර්ධිතාව, තාක්ෂණික දැනුම, කලාත්මක හැඟීම මෙන්ම ආගමික භක්තිය පිළිබඳ අදහසක් ඇතිකිරීමට හැකියාව ලැබේ. එහෙත් ලංකාවේ විවිධ ප්‍රදේශවල කුඩා, මධ්‍යම හා විශාල ප්‍රමාණයෙන් ඉදිකළ සියදහස් ගණනක් වූ පුරාණ දාගැබ් අතුරින් විශාල ප්‍රමාණයක් මේ වන විට

විනාශයට පත්ව ගොසිනි. මේවායෙන් බොහෝමයක් විවිධ යුගයන්හි ද ආරාම අත් හැරීමෙන් පසු නිදන් මංකොල්ලකරුවන්ගේ කුරිරු විනාශ කිරීම්වලට ලක්වූ ඒවාය. මේ හැර දකුණු ඉන්දියානු ආක්‍රමණ සේම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන විජාතිකයන්ගේ විනාශකිරීම්වලට ද ලක්විය. විවිධ හේතු මත දාගැබ් විනාශභාවයට පත්වුයේ නමුදු ඒවා නැවත පිළිකර කොට වන්දනීය තත්වයට ගෙන ඒමට බෞද්ධ ජනතාව නිරතුරුව උත්සාහ වන්ත වී ඇත. අතීතයේ දී එම දාගැබ් පිළිසකර කිරීමට කිසිදු භාදකයක් නොතිබුණ අතර බ්‍රිතාන්‍ය පාලන සමයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව මේ කාර්ය කෙරෙහි සැලකියයුතු බලපෑමක් එල්ල වුණි. එහෙත් පසුගිය ශතවර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා චෛත්‍ය සංවර්ධන කමිටු අතර හටගත් ආරවුල් මධ්‍යයේ වුවද ථූපාරාමය, රුවන්වැලිය, තිස්සමහාරාමය, කතරගම කිරිවෙහෙර, කැළණිය ආදි දාගැබ් නැවත ප්‍රතිසංස්කරණයට ලක්වී ඇත. මෙහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එහි පුරාවිද්‍යාත්මක අගය රඳවා ගැනීමට මහන්සි ගත් අතර භික්ෂූන් වහන්සේලා සහ සැදැහැවත්හු ඊට පූජණීය අගයක් ලබාදීමට යත්න දැරූහ. දාගැබ වටා ගොඩනැගුණු ලාංකික සංස්කෘතිය පුරාවිද්‍යා උවමනාව වෙනුවෙන් යටපත් කළ හැකිද යන්න මෙහි දී මතුවන ප්‍රබල ගැටළුවකි. මෙම දාගැබ් ආශ්‍රයෙන් සැදැහැවතුන් ලබණ මානසික සුවය කාටනම් ප්‍රමාණය කළ හැකි ද?

"මූලාශ්‍ර හෙළිකරන අනුරපුරයේ දාගැබ්" යන මෙම ග්‍රන්ථයෙන් උත්සාහ දරණුයේ අනුරාධපුරයේ ඇති මහජනතාවගේ සුවිශේෂ අවධානය දිනාගත් ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිය, අභයගිරිය, දක්ඛිණ ථූපය හා ජේතවනය යන දාගැබ්වල ආරම්භය, ඒවායේ නිර්මාණ අංග හා විවිධ කාල වකවානුවල දී ඒ ඒ දාගැබ්වල සිදුකෙරුණු ප්‍රතිසංස්කරණ හා පුද පූජා පිළිබඳව මූලාශ්‍ර ග්‍රන්ථවලින් හා ශිලාලේඛණ ආශ්‍රයෙන් හෙළිවන කරුණු විමසා බැලීමය.

මා අභයගිරි විහාර ව්‍යාපෘතියෙහි පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් කටයුතු කළ 1988 - 1991 දක්වා අතර කාලයේ දී ත් ඉන් පසුව එහි සහකාර අධ්‍යක්ෂක වරයා ලෙස කටයුතු කරන අවස්ථාවන්හිදීත් පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් හා සාමාන්‍ය ජනතාව

විසින් අනුරපුර දාගැබ් වල ඓතිහාසික තොරතුරු දැන ගැනීමට නොතින් ආගාවකින් පෙළෙන බැව් හැඟී ගිය හෙයින් මෙම ග්‍රන්ථය කිරීමේ අදහස් පහළවිය. වරින්වර ඒ සඳහා තොරතුරු එක් කිරීමෙන් අනතුරුව කලක් ගතවුව ද එය මුද්‍රණද්වාරයෙන් එළි දැක්වීමට අවස්ථාව එළඹීම සතුටට කරුණකි.

දාගැබ් හා සම්බන්ධ ප්‍රථම පර්යේෂණාත්මක වාස්තුවිද්‍යා ප්‍රකාශනය ජේම්ස් ජේ. ස්මිදර් විසින් 1894 දී එළි දක්වනු ලැබීය. ඔහු විසින් අඳින ලද අනුරාධපුරයේ ගරා වැටුනු දාගැබ්වල හා ඒවායේ අංග පිළිබඳ සැලසුම් තරම් ක්‍රමාණකූල සැලසුම් තවමත් ඉදිරිපත්ව නැතැයි සඳහන් කළ හැකිය. එම සැලසුම් කෙරෙහි උගතුන් අදත් ආකර්ෂණීය වේ. මෙයින් පසුව ලංකාවේ දාගැබ් හා සම්බන්ධයෙන් ප්‍රාමාණික පර්යේෂණයක් සිදුකරන්නේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසිනි. ඔහු ඉන්දියානු දාගැබ් සමඟ ලංකාවේ දාගැබ් සසඳමින් ගැඹුරු පර්යේෂණයක් සිදු කරනු ලැබුණි. දාගැබ් අංග, ආයක හා ඒවායේ කැටයම් පිළිබඳවද ඔහු ගැඹුරු අවධානය යොමු කරන ලදී. මේ හැර මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ, මහාචාර්ය ටී. පී. කුලතුංග, මාලිංග අමරසිංහ ආදීන් විසින් ද යම් යම් ප්‍රමාණවලින් ලංකාවේ ස්තූප පිළිබඳව අවධානය යොමුකොට ඇත. එහෙත් එම උගතුන්ගෙන් ඉදිරිපත් නොවුණු ඒ ඒ දාගැබ් පිළිබඳ අඛණ්ඩ මූලාශ්‍රගත ඓතිහාසික තොරතුරු හැකිතරම් පාදක සටහන් ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමට මෙම පර්යේෂණයේදී උත්සුක වූනෙමි.


දැනුම පුළුල් කළ මහාචාර්ය මැන්දිස් රෝහණදීර, මහාචාර්ය ඇස්. බී. හෙට්ටිආරච්චි හා මහාචාර්ය ටී. ජී. කුලතුංග යන ඇඳුරු තුමන්ලාට හද බැති ස්තුතිය. මා නිරන්තර දිරිමත් කරන පත්මසිරි කන්නන්ගර මහතාට හා උපකාර කළ කෞශල්‍යට ස්තුතිය.

**කරුණාසේන හෙට්ටිආරච්චි**
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.



CamScanner

# ථූපාරාම දාගැබ



# ථූපාරාම දාගැබ

උස අඩි 62.11
විෂ්කම්භය 59.1

## පිහිටීම හා වර්තමාන තත්වය

ථූපඝරයක් සහිත මෙම දාගැබ අනුරාධපුර පැරණි නගරයට නිරිත දිගින් හා රුවන්වැලි දාගැබට උතුරු දිශාවෙන් පිහිටා ඇත. එය උත්තර අක්ෂාංශ 08" 21.19 ක් හා නැගෙනහිර දේශාංශ 80" 23.48 කින් යුතුව පිහිටියේය. ථූපාරාම දාගැබ අටමස්ථානයට අයත් පූජනීය ස්ථානයක් වන අතර එහි භාරකාරත්වය අටමස්ථානාධිපතීන් වහන්සේ සතුව පවතී. එසේ ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ආරක්ෂා වන ඓතිහාසික ස්ථානයක් ද වේ. ජනතාවගේ දෛනික පුද පූජාවන්ට ලක්වන මෙම දාගැබ දැනට පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණයට ලක්ව පවතී.

පොළොව මට්ටමේ සිට මීටර් 4 යි සෙ.මී. 40 ක් පමණ උස් වූ මීටර් 49 යි.සෙ. මී. 35 ක් තරම් වූ වෘත්තාකාර වේදිකාවක් මත මෙම දාගැබ ඉදි වී ඇත. වේදිකාවේ මතු මුහුණත දාගැබ් මළුව වශයෙන් භාවිත වන අතර මළුව දරා සිටින වේදිකාවේ පනාබැම්ම ගඩොලින් නිමවා හුණු කපරාරු කර තිබේ. පනාබැම්ම පහළ කොටසේ බොරදම් තීරු කිහිපයක් දක්නට ලැබෙන අතර පරණවිතාන මහත්මාගේ අදහස වන්නේ මෑත කාලයේ දී කරන ලද ප්‍රතිසංස්කරණ හේතුවෙන් එහි විශේෂ ලක්ෂණ බොහොමයක් ම මැකී ගොස් ඇති බවයි. එසේ ම බැම්මේ මුහුණතෙහි උන්නතව දැක්වෙන භිත්ති කුළුණු (කුඩ්‍යස්ථම්භ) දොළොස්වන සියවසට අයත් ශෛලිය අනුගමණය කර ඇතැයි ඔහු සඳහන් කරයි. (පරණවිතාන 1963: 67) එහි තිබූ පැරණි ලක්ෂණයන් ම හැකි තරම් ආරක්ෂා කර ගනිමින් පනා බැම්ම ප්‍රතිසංස්කරණය කරඇති බව අපට එච්. ඩබ්ලිව්. කේව් මහතාගේ ඡායාරූප අධ්‍යයනයෙන් පැහැදිලි වේ. (කේව් 1956: 4 වන ඡායාරූපය) දැනට මෙම පනාබැම්ම මත එනම් දාගැබ් මළුව සීමා කොට ඒ වටා කවුළු සහිත කෙටි වලාකුළු පවුරක් ඉදිකොට ඇත.



CamScanner

මළුව මත මීටර් 17 යි සෙ.මී. 70 ක් පමණ පාදයේ විශ්කම්භයෙන් යුතුව දාගැබ නිර්මාණය වී ඇත. මෙම දාගැබ බු:ව: 2372 දී අනුරාධපුර පළාතෙහි නායක පදවිය දැරූ පයිලගම රේවත නම් මහ තෙරුන්වහන්සේ නමක් විසින් අළුත්වැඩියා කොට කොත් පළඳවන ලද බව වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා සඳහන් කරයි. (හරිශ්චන්ද්‍ර 2001: 91) ඔහු සඳහන් කරන පරිදි ව්‍යවහාර වර්ෂ වලින් නම් එය 1829 වන්නේය. මෙම ඉදිකිරීම් 1842 දී සිදු වූ බව පරණවිතාන මහත්මා වාර්තා කරන අතර ( පරණවිතාන 1963: 67 ) කඹුරුපිටියේ වනරතන හිමියන් සඳහන් කරන්නේ පයිලගොඩ රේවත හිමියන් 1862 දී ථූපාරාම දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කොට ඇති බවය. ( වනරතන හිමි 1970: 54 ) මේ කරුණු 3 ම සත්‍ය විය හැකිය. හරිශ්චන්ද්‍ර දක්වන ආකාරයට මේ හිමියන් බු:ව: 2372 හෙවත් ව්‍යවහාර වර්ෂ 1829 දී පළාතේ නායක පදවියට පත්වීමෙන් අනතුරුව 1862 දී උන්වහන්සේ ථූපාරාම දාගැබ් ප්‍රතිසංස්කරණ කටයුතු නිමාකරන්නට ඇත. මෙසේ අවසන් වූයේ හුදෙක් දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු මිස එහි අනෙකුත් අංග වූ සලපතල මළුව වේදිකා පනාබැම්ම හා දොරටු ආදිය නොවේ.

අනෙකුත් අංග පසු කාලයේ දී වරින්වර පාදා ගැනීම් මෙන්ම විවිධ දායක භවතුන්ගේ ආධාර උපකාර හා ශ්‍රමදාන මඟින් සැකසුනු බැව් පෙනියයි. 1890 දී ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස සැලකෙන එච්.සී. පී. බෙල් මහත්මා විසින් ථූපාරාම දාගැබ හා සම්බන්ධ ආරාම සංකීර්ණයේ ආරාම ගොඩනැගිලි පාදාගැනීමේ අරමුණින් 1895 - 1896 වර්ෂ වලදී කැනීම් කරගෙන ගියබව ඔහුගේ වාර්තා වලින් පැහැදිලි වේ. ( 1895 Ceylon Sessional Papers, 1904, p.2, 1896 , p 1-3) එහිදී ඔහු දාගැබ පිළිබඳ සැලකිය යුතු විස්තරයක් තැබීමට ද අමතක කොට නැත. එහෙත් මෙම දාගැබ පිළිබඳව පළමුවෙන් වඩාත්ම සවිස්තරාත්මක සටහන තබන ලද්දේ 1894 දී ජේම්ස්. ජී. ස්මිදර් මහත්මා විසිනි. ඔහු මේ සඳහා ඡායාරූප මෙන්ම සැලසුම් ගණනාවක් ම ඉදිරිපත් කොට තිබීම ද පැසසිය යුතු කරුණකි. (Smither 1993: 1-18) බෙල් මහත්මා විසින් දාගැබට අයත් මළුවේ පනාබැම්මෙහි

කැනීම් කරන ලද්දේදැයි පැහැදිලිව කරුණු සඳහන් කර නැතත් 1894 දී පමණ ස්මිදර් මහත්මා විසින් පළකොට ඇති ඡායාරූපයෙන් පැහැදිලි වන්නේ බෙල් 1894 වනවිටත් පනාබැම්ම කැනීම් නොකළ බවය. කෙසේ වෙතත් එම බැම්මේ ස්වරූපය ස්මිදර් අවබෝධ කොටගෙන තිබූ බව ඔහුගේ සැලසුම් අංක 5 න් පැහැදිලිවේ. (ibid: pl 5) බෙල් මහතා විසින් 1896 ඉදිරිපත් කොට ඇති පුරාවිද්‍යා වාර්ෂික වාර්තාවේ ඡායාරූපයකින් පැහැදිලි වන්නේ (Bell 1896: pl vi) ඔහුගේ සමයේ දී සම්පූර්ණයෙන් ම පාහේ දාගැබ් මළුවේ පනාබැම්ම අනාවරණය කොට ගෙන තිබූ බවය. හෙන්රි ඩබ්ලිව්. කේව් විසින් පළකොට ඇති ඡායාරූපයෙන්ද මෙම කරුණ ස්ථිරවේ. (කේව් 1956: 4 ඡායාරූපය) වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මා ද මුල් සමයේදී දාගැබෙහි සිදුකෙරුණු ප්‍රතිසංස්කරණයන් පිළිබඳව වැදගත්තොරතුරු ඉදිරිපත්කොට ඇත. ඔහු සඳහන් කරන පරිදි දාගැබ් මළුවේ නැගෙනහිර පැත්තේ ඇති මලසුන් ගෙය **මහගොඩ ශ්‍රී ඥානේස්වර** නා හිමියන් විසින් තම ගුරු හිමියන් සිහිවීම පිණිස නිමවා ඇති අතර දකුණු පාර්ශවයේ මලසුන් ගෙය **හික්කඩුවේ ශ්‍රී සුමංගල** නා හිමියන් විසින් ඉදිකොට ඇත. (හරිශ්චන්ද්‍ර. 2001: 92) එසේම පහන් ගෙයක අවශ්‍යතාවයක් ද දාගැබ් මළුවට ඇතැයි සඳහන් කරන එතුමා එය ඉදිකිරීමට පරිත්‍යාගශීලී සැදැහැවතෙකුට ආරාධනාවක් ද කරයි. (එම: 92) මෙයින් පෙනෙන්නේ එකල කැමති ආකාරයකින් දාගැබ් මළුවේ ඉදිකිරීම් කටයුතු කිරීමට සැදැහැවතුන්ට බාධාවක් නොතිබූ බවය. හරිශ්චන්ද්‍රගේ වාර්තා කිරීම් වලට අනුව දාගැබ වටා සලපතල මළුව හා වැලිමළුව වශයෙන් පැහැදිලිවම භූමි කොට්ඨාශ දෙකක් තිබෙන බවින් එහි වට අඩි 540 කින් යුතු පිට පවුරේ කොටසක් බු:ව: 2451 දී හෙවත් ව්‍යවහාර වර්ෂ 1908 දී **ගල්මඩුවේ සිද්ධාර්ථ** නම් තෙරුන්වහන්සේ නමක් විසින් ප්‍රතිසංස්කරණය කොට ඇත. (එම: 92) මෙසේ වරින් වර මෙම දාගැබ් මළුවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වී ඇති අතර අද දක්වා ම ඊට විවිධ අංග එකතු කිරීම සිදුවන බැව් සඳහන් කළ යුතුය. මෙම් ඇතැම් එකතු කිරීම් පැරණි නිර්මාණ ලක්ෂණ කෙරෙහි අවධානයෙන් තොරව කරන ලද ඒවා බැව් පෙනීයයි. ඒ අනුව මෙම දාගැබ් මළුවෙහි සලපතළ ඇතුරුම් සීමාවට පිටතින් වූ පවු වැලි මළුව කිසියම් සංවිධානයක් විසින් මැතදී ගල් පුවරු අතුරා

එහි මුල් ස්වරූපය වෙනස්කොට ඇත. මෙම ගල් පුවරු පැරණි ගල් පුවරු වලට සමාන කමක් ද නොදක්වන අතර ඒවා මළුවට බෙහෙවින් ආගන්තුක බවක් උසුලයි.


ථූපාරාම මළුවේ ඇති තවත් වැදගත් ම අංගයක් වන්නේ චෛත්‍ය ගෘහය දරා සිටි ගල් කුළුණු පෙළයි. මෙහි කුළුණු පේළි 4 ක් දාගැබ වටා වලයාකාරව සිටුවා ඇත. මෙම කුළුණු දාගැබ අන්තයේ සිට පිටතට ක්‍රමයෙන් උසින් අඩු වේ. මෙම කුළුණු මත දාගැබ ආවරණය කෙරෙන පරිදි වහලය ඉදිව තිබූ බව උගතුන්ගේ පිළිගැනීමයි. (පරණවිතාන 1962 : 67-85) මෙම කුළුණු වලින් ඇතැම් ඒවා කැඩී ඇතත් ඇතැම් ඒවා තවමත් හොඳින් ආරක්‍ෂා වී පවතී. දාගැබ ආසන්නයෙහි ම ඇති ගල් කුළුණු සියල්ල ම කඳ හා කුළුණු හිස වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. දාගැබෙන් පිට අන්තයේ කුළුණු පෙළ පමණක් අටැස් හැඩයක් ගන්නා අතර අනෙක් කුළුණු පේළි 3 හි ම සෙ. මී. 180 ක් තරම් වූ යට කොටස හතරැස් වන අතර ඉහළ කොටස අටපට්ටම් හැඩයක් ගනී. මෙහි පළමු කුළුණු පෙළ දාගැබේ පාදමේ සිට සෙ. මී. 90 ක් පමණ දුරින් පිහිටා ඇත. මෙහි සියලු කුළුණු ගණන 52 ක් තිබූ බවට සාධක වේ. මේ කුළුණු පිහිටි සීමාව ගල් පුවරු අතුරා තිබෙන අතර එය ගල් ඇතුරූ අනෙක් කොටසට වඩා සෙ.මී. 15 ක් පමණ උසින් බොරදම් තීරුවකින් වෙන් කොට දක්වා ඇත. මෙම පළමු ගල් කණු වටයේ සිට මීටර් 3 ක් පමණ දුරින් දෙවන ගල් කණු වටය පිහිටා තිබෙන අතර එම එක් ගල් කුළුණක උස මීටර් 6 යි සෙ.මී. 35 ක් තරම් වේ. මෙබඳු කුළුණු 36 ක් තිබී ඇත. දෙවන කුළුණු පෙළෙන් මීටර් 3 ක් දුරින් 3 වන කුළුණු පෙළ පිහිටා තිබෙන අතර එම කුළුණක උස මීටර් 6 සෙ.මී. 10 ක් පමණ වේ. 3 වන පෙළ සඳහා ගල් කණු 40 ක් වේ. පිටතින් ම ඇති ගල් කණු පෙළ 3 වන කණු පෙළෙහි සිට මීටර් 4 යි සෙ.මී. 20 ක් දුරින් පිහිටියේය. කුළුණු 48 ක් මෙහි තිබී ඇති අතර එක් කුළුණක උස ද මීටර් 4 යි සෙ.මී. 20 ක් පමණ වේ. මේ අනුව කුළුණු සියල්ල 176 ක් වන්නේය. අවසන් කුළුණු පෙළ දක්වා ම කොටස ගල් අතුරා සලපතළ මළුවක් මෙන් පවතී. තුන්වන හා හතර වන එනම් අවසන් ගල් කුළුණු පෙළ



CamScanner

අතර චෘත්තාකාරව දිවෙන ගඩොල් බැම්මක් තිබී ඇතැයි පරණවිතාන සඳහන් කරයි. (1962 : 67) ස්මිදර් ගේ සැලසුම් වලට අනුව මෙම ගඩොල් බැම්ම තිබී ඇත්තේ 4 වැනි ගල් කුළුණු පෙළ බිත්ති අභ්‍යන්තරයට හසුවන පරිදිය. (Smither pl. iv) ස්මිදර්ගේ මෙම ඉදිරිපත් කිරීම වඩා නිවැරදි යැයි සිතිය හැකි වේ. මෙම චෘත්තාකාර බිත්තිය වටදාගෙහි වහලය දැරීමට අතිශය උපකාර වූවාට සැක නැත. මෙම බිත්තිය හා පතාබැම්ම සීමා කොට ඉහළට එසැවුන පිට පවුර අතර මීටර් 3 ක පමණ තීරුව වැලි මළුව වශයෙන් භාවිත වී ඇත. ස්මිදර් මහතා වාර්තා කොට ඇත්තේ මෙහි ගඩොල් අතුරා තිබූ බවය. ඇතැම් විට ගඩොල් අතුරා ඒ මත වැලි අතුරා තිබුණා ද විය හැකිය. එහෙත් මෙම පවුර හෝ ගඩොල් ඇතුරුම් සහිත වැලි මළුව එහි අද දක්නට නැත. පසුකාලීන ප්‍රතිසංස්කරණ වලින් මෙම සළකුණු වෙනස්ව ගොස් ඇත. මේ හැර ස්මිදර් මහත්මා විසින් ඔහුගේ සැලසුම්වල සලපතළ මළුව මත එහි නිරිත දිගින් මීටර් 13 ක් පමණ දිග හා පළල මීටර් 6 ක් තරම් වූ පිළිම ගෙයක සාධක ඉදිරිපත් කොට ඇත. මළුව මත වූ මෙම පිළිම ගෙයි සාධක සියල්ල පසුගිය සමයන්හි දී කරන ලද ප්‍රතිසංස්කරණ වලදී අතුරුදන්ව ගොසිනි. මෙම පිළිම ගෙය ථූපඝරය තුළ මුල් සමයේ සිට ඉදිකර තිබුණා යැයි සිතිය නොහැකිය. වටදාගෙය විනාශව ගිය සමයක මෙය ඉදිවන්නට ඇතැයි සිතිය හැකි වේ. එහෙත් එම කාලය කවරදාක දැයි පැහැදිලි නැතත් බොහෝ විට පොළොන්නරු සමයෙහි දී වීමට ඉඩකඩ ඇත.

මෙම චෛතියඝරයේ උපකල්පිත සැලැස්මක් පරණවිතාන මහත්මා විසින් නම් ලංකාවේ ස්තූපය නම් කෘතියේ ඉදිරිපත් කර තිබෙන අතර ( පරණවිතාන 1962 : 83 ) එහි ආකෘතියක් ද කතා අනුරපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. මේ හැර හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ රෝලන්ඩ් සිල්වා මහත්මාගේ උපකල්පිත සැලැස්ම පරණවිතාන මහත්මාගේ සැලසුමට වඩා වෙනස් ආකෘතියක් ගනී.



ථූපාරාම දාගැබ 1894 දී පමණ
(උපුටා ගැනීම ජේම්ස්. ජී. ස්මිදර්ගේ
Architectural Remains Anuradhapura)

## ඓතිහාසික පසුබිම

මෙම දාගැබ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී (ක්‍රි.පූ. 250-210) මිහිඳු මහ රහතන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ඉදිවුනු බැව් වංසකතාවේ සඳහන්ය. මේ පිළිබඳව දීර්ඝ විස්තරයක් මහාවංසයේ එයි. (මහාවංසය 1967: 17, 1-64) එහි සඳහන් වන පරිදි දාගැබ ඉදිකිරීමේ අදහස මුලින් ම මිහිඳු මහ රහතන් වහන්සේ විසින් දෙවනපෑතිස් රජු වෙත දන්වන ලද්දේ උන්වහන්සේ ලක්දිව පැමිණ මාස 6 ක් ඉක්ම ගිය තැනදීය. එම අදහස දන්වා ඇත්තේ ද ඉල් මස පුර පසළොස්වක පොහොය දිනයක වීම ද විශේෂ කරුණකි. (එම: 17, 2-3 ) බුදුන්වහන්සේ වෙනුවට උන්වහන්සේගේ අකු ධාතුව තැන්පත් කොට මෙම ස්තූපය සාදන ලද බව එහි කියැවේ. දාගැබ ඉදිකළ භූමිය පෙරසිටම පූජණීය ස්ථානයක්ව තිබූ බව වංසකතා සාක්ෂි දරයි. මේ පිළිබඳව මහාවංසයේ පළමුව සඳහන් වන්නේ බුදුන් වහන්සේගේ තුන්වන ලංකා ගමනය අවස්ථාවේ දී ථූපාරාම දාගැබ පිහිටි තැන උන්වහන්සේ සමවත් සුවයෙන් වැඩහිඳි බවය. (එම: 1, 82) මේ හැර මෙම භූමියේ ප්‍රමෝජ වස්තු නම් දේවාලයක් ද වූ බව වාර්තා කරයි. ( එම: 17, 30) වංසත්ථප්පකාසිනියේ මෙය විස්තර කොට ඇත්තේ මහේජ නම් යක්ෂයකුගේ දේවායතනය මෙහි වූ බවය. (වංසත්ථප්පකාසිනි 1994: 293) මේ හැර ස්තූපය පිහිටුවන ලද ස්ථානය කොළොම් මලින් ද ආදාරි නම් වැලින් ද ගැවසී තිබූ බව වංසත්ථප්පකාසිනිය වැඩි දුරටත් විස්තර කරයි. (එම: 293) දීපවංසය සඳහන් කරන පරිදි ථූපාරාමය පිහිටි ස්ථානය කකුසඳ, කෝණාගම කාශ්‍යප යන බුදු වරුන්ගේ ධාතු ද පුරාණයේ සිට තැන්පත්ව තිබූ ස්ථානයක්වෙයි. (දීපවංසය 1970: 15, 24-25) මෙම කරුණ තවත් විස්තර කරන ථූපවංසයේ **"ඒ බිම ද ආදී බුදු වූ තුන් දෙනා වහන්සේගෙන් කකුසඳ බුදුන්ගේ ඩබරා ධාතුව පිහිටියේය. කෝණාගම බුදුන්ගේ පටී ධාතුව පිහිටියේය. කාශ්‍යප බුදුන්ගේ ජලසාටිකාව පිහිටියේය. මේ තුන් බුදුවරයන්ගේ ධාතු පිහිටුවා කරන ලද දාගැප් එතැන තට කල්හි දේවතානුභාවයෙන් කටුයෙන් ගහනව අනේක ගසින් පිරිවරන ලදුව සිටියේය."** (සිංහල ථූපවංසය 1958: 52) මෙම කරුණු වලින් පෙනෙන්නේ ථූපාරාමය ඉදිකළ භූමිය දිගුකලක සිට ම පූජ්‍යත්වයට පත්ව තිබූ

ස්ථානයක් විය. මහ රජතුමා ථූපය පෙරටු කොට මෙම විහාරය කරවූ නිසා මෙම ස්ථානය **ථූපාරාමය** නම් වූ බව ද මහාවංසය වැඩි දුරටත් සඳහන් කරයි. (මහාවංසය 1967: 17, 64)

මෙම දාගැබ මුලින් අභය වැවේ මැටි භාවිතා කරමින් අභ්‍යන්තර කොටස සකසා එහි ආරක්ෂාවට දෙවැනිව ගඩොලින් බැඳ නිර්මාණය කළ බව මහාවංසය වාර්තා කරයි. (එම: 17, 37-38) මේ හැර දේවානම්පියතිස්ස සමයේ දී දාගැබේ මළුව හෝ වෙනත් අංග පිළිබඳව වංසකතා වැඩිමනක් තොරතුරු ඉදිරිපත් නොකරයි. එහෙත් දාගැබෙහි හැඩය කවරාකාර විය යුතු දැයි දෙවනපෑතිස් රජු මිහිඳු හිමියන්ගෙන් විමසූ කල ධාන්‍යාකාර විය යුතු යැයි වදාළ බව ථූපවංසය වාර්තා කරයි. (ථූපවංස 1958 : 52) මෙම දාගැබෙහි හැඩය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන පරණවිතාන මහතා සඳහන් කරන්නේ ථූපාරාමයේ වර්තමාන හැඩය ධාන්‍යාකාර නොවන අතර මෙම දාගැබේ කරන ලද පසුකාලීන ප්‍රතිසංස්කරණ හේතුවෙන් එම හැඩය වෙනස්ව ගොස් ඇති අතර වර්තමාන හැඩය 1842 දී කරන ලද ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් බව ය. (පරණවිතාන 1963: 11)

ථූපාරාම දාගැබෙහි විවිධ රජවරු විසින් කරන ලද ප්‍රතිසංස්කරණ හා නව ඉදිකිරීම් ගැන වංසකතාවල සඳහන් වුවත් ඒ කිසිවකත් සලපතල මළුවේ කරන ලද ප්‍රතිසංස්කරණ හෝ ඉදිකිරීම ගැන පැහැදිලිව සඳහන් නොවේ. දේවානම්පියතිස්ස රජතුමාගෙන් පසුව මෙම දාගැබෙහි සැලකිය යුතු ප්‍රතිසංස්කරණයක් සිදු වන්නේ **සද්ධාතිස්ස** රජුගේ දෙවුපුත් **ලජ්ජතිස්ස** රාජ්‍ය සමයේ දී ය. මහාවංසයේ හා දීපවංසයේ එම රජතුමා ථූපාරාම් දාගැබෙහි ගලින් කඤ්චුකයක් කළ බව කියැවේ. (මහාවංසය 1967: 33, 23-24 ., දීපවංසය 1970: 20, 12) කඤ්චුක යන වචනය සිංහලයට පරිවර්තනය කිරීමේදී සිංහල මහාවංසයේ හා දීපවංසයේ රට අර්ථ දක්වා ඇත්තේ " ගලින් උතුම් වූ දා ගෙයක් කරවීය " යනු හා " ශෛලමය ගෘහයක් කරවීය " යනුවෙනි. මෙය වැරදි අර්ථ කථනයක් ලෙස කඹුරුපිටියේ වනරතන හිමි ප්‍රකාශ කරයි. කඤ්චුක යනු දාගැබ වැසෙන සේ ගලින් කළ සැට්ටය බව උන්වහන්සේ වැඩි දුරටත් සඳහන් කරති. (වනරතන හිමි 1970: 55)



CS CamScanner

මෙම නිගමණය නිවැරදි බව අපට ද පිළිගත හැකි වේ. වනරතන හිමි **සැට්ටය** යනුවෙන් අදහස් කරනුයේ පැරණි දාගැබ වටකොට ඊට බද්ධව පිටතින් නවත් ආවරණයක් සැකසීමයි. මෙහිදී ස්ථිර වශයෙන් ම මුල් දාගැබ විශාල බවට පත්වේ. ගජබා රජු ද මෙසේ ම මිරිසවැටි දාගැබට කඤ්චුකයක් හෙවත් සැට්ටයක් කළ බව මහාවංසයේ සඳහන්ය. (මහාවංසය 1967: 35, 120) ගජබා රජුගේ මෙම කඤ්චුකය හෙවත් ආවරණය මිරිසවැටියේ මෑතදී කරන ලද ප්‍රතිසංස්කරණයන්හි දී අනාවරණය කොටගෙන තිබීම ද සැලකිය යුතු කරුණකි.

ථූපාරාම දාගැබ හා සම්බන්ධ අනෙක් වටිනා ඉදිකිරීම වන්නේ වසභ රාජ්‍ය සමයේ දී ඊට එකතු කරන ලද ථූප ඝරයයි. (එම: 35, 91) මෙම ථූපඝරයේ නිර්මාණ ලක්‍ෂණ පිළිබඳ වැඩි යමක් මූලාශ්‍ර ග්‍රන්ථවල දක්නට නොලැබේ. කෙසේ වෙතත් මෙම ථූපඝරය ගෝඨාභය (ක්‍රි:ව: 249-262) රාජ්‍ය කාලයේ දී නැවත ප්‍රතිසංස්කරණය කරන බැවින් එය දැව වලින් සකසා තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. පාලි මහාවංසයේ ඇති **ථූපාරාමෙ ථූපඝරං** (මහාවංසො 1957: 36, 106) යන වාක්‍යය සිංහල මහාවංසයේ **ථූපාරාම විහාරයෙහි දාගෙය** (මහාවංසය 1967: 36, 106) යනුවෙන් වැරදි ලෙස පරිවර්තන කොට තිබීම ද සඳහන් කළ යුතු වේ. මෙයින් පසුව 1 වැනි උපතිස්ස (ක්‍රි.ව. 368 - 410) රාජ්‍ය සමයේදී එතුමා විසින් ථූපාරාම දාගැබේ කොතෙහි රන් ආවරණයක් යෙදූ බව මහාවංසය කියයි. (එම: 37, 207 208) පාලි මහාවංසයෙහි මෙම කරුණු **ථූපාරාමෙච ථූපස්ස හෙම චුම්බටක කඤ්චුකං** යනුවෙන් ඇතත් එය සිංහල පරිවර්තනයෙහි දක්වා ඇත්තේ **ථූපාරාමයෙහි දාගැබට රන් කොතක් හා සැට්ටයක් කරවීය** යනුවෙන් වැරදි සහගත ලෙසය. ධාතුසේන රජු ද (ක්‍රි.ව. 459-477) ථූපාරාම සෑයෙහි දිරුම් පිළිසකර කර ඇත. (එම: 38, 70-71) දෙවන අග්ගබෝධි රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 608-618) ථූපාරාම දාගැබේ කොටසක් බිඳ වැටී ඇති අතර ඉන් චෛතියඝරය ද විනාශයට පත් වූ බව කියැවේ. දාගැබේ මෙම බිඳ වැටීම හේතුකොට ගෙන අකුධාතුව ද අනාවරණය වී ඇති අතර පසුව එය ආරක්ෂිත ලෙස ලෝවාමහාප්‍රාසාදයේ තාවකාලිකව තැන්පත්කොට තබා දාගැබ

හා ථූපඝරය ද පිළිසකර කොට මහ පූජා පවත්වා නැවත දාගැබෙහි තැන්පත් කොට ඇත. (එම: 41, 52-57)

මහාවංසය වැඩිදුරටත් ඉදිරිපත් කරන පහත කරුණු ඉතා වැදගත්ය. එනම් " ***දාගෙයි සිතියම් ආදියෙන් යුත් වූ සියලු කර්මාන්ත කල් නොයවාම කරවීය. පිළිම සතර හා සෙල් මුවා පලඟ ද රන්සත් ද ගෙහි සලකම් දළකඩ කම් ද සවිාකාරයෙන් කරවී*** " (එම: 41, 57-59)

මෙම වාර්තාවට අනුව චෛතියඝරය තුළ සිතුවම් ඇඳ සතර බුදුවරයන්ගේ පිළිම ආදිය තැන්පත් කර තිබූ බව පැහැදිලි වේ. එසේම එහි ගිලා කර්මාන්ත මෙන්ම ඇත් දළවලින් කරන ලද සැරසිලි කර්මාන්තයන් ද වූ බව පැහැදිලිය. ථූපඝරයේ සලකම් කිරීම යනුවෙන් මෙහි සඳහන් වන්නේ ඇතැම් විට චෛතියඝරයේ ගල් කුළුණු ආදියත් සලපතළ මළුවේ ගල් ඇතිරීම ආදියත් වීමට පුළුවන. 1 වැනි දාඨෝපතිස්ස රජු (ක්‍රි.ව. 643-650) ථූපාරාමයෙහි ථූපඝරයේ කොත පැහැර ගත් බව සඳහන්ය. (එම: 42, 132-133) පාලි මහාවංසයේ ඇති. "***ථූපාරාමෙ තථාගණහි සොවණ්ණං ථූපිකං සරෙ*** " යන්න සිංහල මහාවංසයට ගෙන ඇත්තේ " ***ථූපාරාමයෙහි රන්කොත ගත්තේය***" යනුවෙනි. මෙය නිවැරදි පරිවර්තනයක් නොවේ. පැහැදිලි ලෙසම ථූපිකංඝරෙ යනුවෙන් තිබෙන හෙයින් ථූපඝරයේ කොත යැයි අර්ථ ගැනීම දුෂ්කර නොවේ. දාඨෝපතිස්ස කාලයේ දී ම ඔහුගේ යුව රජු වූ කාෂ්‍යප ථූපාරාම දාගැබෙහි වූ දේවානම්පියතිස්ස හා සුළු අග්ගබෝධි යන රජවරුන් විසින් පුදන ලද සාර වස්තු පැහැර ගන්නා ලදී. (එම: 43, 137-139) මානවම්ම රජු (ක්‍රි.ව. 684-718) ථූපාරාමයෙහි ගෙය හෙවත් ථූපඝරයේ වහලය සෙවෙනි කර ඇත. (එම: 46, 66) ථූපඝරයක් සෙවෙනි කිරීම පිළිබඳව මහාවංසකරු කරුණු ඇතුලත් කරන්නට ඇත්තේ එය භාරධූර කාර්යයක් හා විශේෂ කාර්යයක් වූ නිසා විය යුතුය. මෙම වහලය කවර ද්‍රව්‍යයකින් නිමියේ දැයි ස්ථිරව ම සඳහන් කිරීම දුෂ්කර වේ. එහෙත් දෙවන දප්පුල (ක්‍රි.ව. 815-831) සමයේ දී ඔහු ථූපාරාම වටදාගෙය රන් උළු වලින් මනාව සෙවෙනි කොට ස්වර්ණමය දොරටු යෙදූ බව මහාවංසයේ සඳහන්ය. (එම: 49) රන් උළු යනුවෙන් මෙහි

සඳහන් කර ඇත්තේ රන් ආලේපිත තඹ ලප් විය යුතුය. අනුරාධපුරයෙහි කරන ලද කැනීම් වලින් රන් තහඩුවෙන් ලප් මෙනෙක් හමුව නැතත් රන් ආලේපිත ලප් හමු වී ඇති අතර එබඳු ලප් කැට කීපයක් අභයගිරි " මහාතිස්ස පාහියන් " කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා ඇත. සෙනරත් පරණවිතාන මහත්මාගේ අදහස වන්නේ ද මෙහි සියස්ස තඹ තහඩු වලින් ආවරණය කර තිබූ බවය. (පරණවිතාන 1963: 84)

මෙම ථූපඝරයේ කරන ලද තවත් ප්‍රතිසංස්කරණ අතර හයවන අග්ගබෝධි රජු (ක්‍රි.ව. 733-772) දීඝාගිය දොරටු අත්වැඩියා කරවා එහි වැම් ද අළුතින් යොදනු ලැබීය. (මහාවංසය 1967: 46, 66-67) දෙවැනි මිහිඳු රජු ද (ක්‍රි.ව. 777-797) ථූපාරාම දාගැබෙහි අලංකාරය සඳහා රනින් කංචුකයක් කරවා රිදී පටවලින් අලංකාර කළ බැව් සඳහන්ය. (එම: 46, 139-140) I වැනි සේන රාජ්‍ය සමයේදී (ක්‍රි.ව. 833-853) ලංකාව ආක්‍රමණය කළ පාණ්ඩ්‍ය හමුදාව ථූපාරාම චෛත්‍යයෙහි වූ රන්පට හා ඒ විහාරයෙහි වූ රන් පිළිම පැහැර ගත් බව සඳහන්ය. (එම: 50, 35-36) දෙවන උදය (ක්‍රි.ව. 887-898) ථූපාරාම දාගැබ රන් පටින් වැස්සවීය. (එම: 52, 72) සිව්වන මිහිඳු රජු (ක්‍රි.ව. 956-972) ථූපාරාම දාගැබ රන් රිදී පටින් වසා චේතියඝරයෙහි අතිශය අලංකාර රුවන් දොරටුවක් යොදනු ලැබීය. (එම: 54, 42-44) අනුරාධපුර යුගය අවසන් කරමින් ලක්දිව ආක්‍රමණය කරනු ලැබූ දකුණු ඉන්දියානු සොලින් තුන් නිකායට ම අයත් වෙහෙර විහාර සියල්ල විනාශ කර වස්තුව පැහැර ගත් බව වංසකතාව විස්තර කොට ඇත්තේ " ***වෙහෙර විහාර සියල්ල ද ලාභොලා බිඳ ඔජස් උරණ යකුන් සෙයින් ලක්දිවහි සාරය ගත්හ*** " යනුවෙනි. (එම: 55, 21-22) මෙසේ විනාශ වූනු ථූපාරාම දාගැබ නැවත ප්‍රතිසංස්කරණයට ලක්වන්නේ පොළොන්නරු යුගයේ දී මහපරාක්‍රමබාහු රජතුමාගේ මැදිහත් වීමෙනි. (එම: 74, 8-11) මෙහි පාඨ ලෙසම ථූපාරාම දාගැබ ප්‍රතිසංස්කරණය කරනලද බව සඳහන්ව නැතත් තුන් නිකායට ම අයත් දාගැබ් ප්‍රතිසංස්කරණය කරන ලදැයි යන සඳහනට අනුව ථූපාරාමය ද ප්‍රතිසංස්කරණය කරන ලදැයි සිතීම දුෂ්කර නොවේ. පූජාවලියෙහි ථූපාරාමය ප්‍රතිසංස්කරණය කළ බැව් පැහැදිලිව ම දක්වා ඇත. (පූජාවලිය 1997 : 783) කලාාණවතී බිසවගේ රාජ්‍ය සමයට අයත් (ක්‍රි.ව. 1202-1208) රුවන්වැලි සෑ පුවරු ලිපියෙහි ථූපාරාම දාගැබට

කපුරු පහන් පූජාවක් හා පතාක පූජාවක් කළ බැව් සඳහන් වේ. (Ez. iv 1943: 256) පොළොන්නරු සමයේ අවසාන භාගයේ දී එල්ල වූ මාඝ ආක්‍රමණයේ දී (1215) දාගැබ් බිඳ හෙලා ධාතු පැහැර ගත් බව මහාවංසයේ සඳහන්ය. (මහාවංසය 1967: 80, 69) මේ කරුණු පූජාවලියේ සඳහන් කර ඇත්තේ


***" රුවන්වැලි මහ සෑය බිඳුවා සෙසුත් දහස් ගණින් දාගැබ් බිඳුවා නොඑක් ශ්‍රධාවන්ත රජුන්ගේ චෛත්‍ය නැමති කීර්ති ශරීරවල කොත් නමැති වොටුනු හා රුවන් නමැති හෘද මාංශ ගෙන ධාතු නැමැති ජීවිත අන්තර්ධාන කරවා සංඝාරාම අයතැන් මහ පා දෙමළුන්ට ගෙවල් කරවා"*** (පූජාවලිය 1997: 784)

යනුවෙන් මෙම සඳහනෙන් පෙනෙන්නේ ථූපාරාමය ද මෙම විලෝපනයට බඳුන් වූ බවය. මෙතැන් සිට අපට ථූපාරාමය පිළිබඳව කලක් යනතෙක් තොරතුරු හමු නොවේ. මේ සඳහා බලපාන්නට ඇත්තේ එම ස්ථාන සම්පූර්ණයෙන් ම පාහේ අභාවයට යාම විය හැකිය. ථූපාරාමය පිළිබඳව අපට නැවත තොරතුරු ලැබෙන්නේ 1 වැනි බුවනෙකබාහු (1272-1284) රාජ්‍ය සමයේදීය. එතුමා අනුරපුරයට ගොස් ජේතවනය, ථූපාරාමය, ශ්‍රී මහ බෝධිය, ලෝවාමහප්‍රාසාදය හා රුවන්වැලි මළුව ආදී ස්ථානවල වල් සිඳුවා වැලිමළු තැනවීමට කටයුතු කළ බව පූජාවලියේ සඳහන්ය. (පූජාවලිය 1997: 802) මෙයින් පෙනෙන්නේ 13 වන සියවස වන විට ථූපාරාමය ද අභාවයට ගොස් තිබූ බවයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි.ව. 1747-1781) කාර්යයන් විස්තර කරන මහාවංසය ලක්දිව සොළොස්මස්ථාන හා ශ්‍රී වර්ධන පුරාදියෙහි චෛත්‍යයන් බඳවන ලද බව සඳහන්ය. (මහාවංසය 1967: 100, 130-131) එහෙත් මෙම සඳහන් පිළිගත හැකි මට්ටමක නොපවතී. දාගැබ් බැඳවීමට කෙසේ වෙතත් ඇතැම්විට සුද්ධ පවිත්‍ර කිරීම් පමණක් සිදුකරන්නට ඇත. සොළොස්මස්ථානයට අයත් අනුරාධපුරයේ මහාථූප කිසිවකුත් මෙම රාජ්‍ය සමයේ දී ප්‍රතිසංස්කරණ කරන ලද බවට පුරාවිද්‍යාත්මක සාධක හමු නොවේ. නැවත මෙහි නව ප්‍රබෝධය ඇති වන්නේ ඉහත විස්තර කොට ඇති පරිදි 19 වැනි සියවසේ අවසන් සමයේ සිටය.



CamScanner

# මිරිසවැටි දාගැබ





CamScanner

# මිරිසවැටි දාගැබ

## පිහිටීම හා වර්තමාන තත්වය

මෙම දාගැබ අනුරාධපුර පැරණි නගරයට නිරිත දිගින් හා තිසා වැවට උතුරින් පිහිටියේය. එය උත්තර අක්ෂාංශ 08°. 20,42 හා නැගෙනහිර දේශාංශ 80° . 23,20 වලින් යුතුව පිහිටියේය. අටමස්ථානයට අයත් මිරිසවැටි දාගැබ දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණයට ලක්කොට ඇත. දාගැබ වැලි මළුවකින් හා සලපතළ මළුවකින් සමන්විත වේ. වැලි මළුව මීටර් 17 ක් පමණ පළලින් යුක්ත වේ. සලපතළ මළුව සෙ.මී. 80 ක් උස සීමා පවුරකින් වටව තිබෙන අතර පවුරෙන් වට වූ සලපතළ මළුවේ දිග හා පළල මීටර් 84 ක් බැගින් වේ. පේසා වළලු 3 කින් සමන්විත දාගැබෙහි පාදයේ විශ්කම්භය මීටර් 42 සෙ.මී. 30 ක් වන අතර දාගැබේ උස මීටර් 57 සෙ.මී. 60 කි. මෙම දාගැබ ප්‍රතිසංස්කරණයෙන් පසු සුණු පිරියම් කොට 1993 ජුනි මස 4 වැනිදා කොත නිරාවරණය කරන්නට යෙදුනි. දාගැබෙහි සිව් දිසාවට මුහුණ ලා ආයක 4 ක සාධක තිබෙන අතර දැනට නැගෙනහිර ආයකය හැර අනෙක් ආයක තුනෙහි සාධක යම් පමණකින් ශේෂ වී ඇත. ඒවායෙන් බටහිර ආයකය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් තහවුරු කර ඇති අතර උතුරු හා දකුණු ආයකවල පහත අර්ධය පමණක් තහවුරු කොට ඇත. සලපතළ මළුවේ ගිනිකොන දිගින් දගක කීපයකට පෙර ඉදිකරන ලද විහාර ගෘහයක් දක්නට ලැබේ. සලපතළ මළුව මත ඇතැම් තැනක පැරණි ඉදිකිරීම් වලට අයත් ශිලාමය අවශේෂ හා පස් ගොඩවල් වේ. සලපතළ මළුවට පිවිසීම සඳහා සිව් දිශාවෙන් ම දොරටු ඇති අතර ඒවායෙන් වැඩි වශයෙන් භාවිතයට ගැනෙන්නේ දකුණු දොරටුව පමණි. සලපතළ මළුවේ සීමා බැම්මට පිටතින් සිව් දිශාවෙන්ම එතරම් විශාල නොවූ වැලි මළුවක් තිබෙන අතර එහි දිග සමාන වුවත් පළල අසමානය . අනෙක් දාගැබ් වල වැලි මළු සමග සසඳන කල මෙය විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය. මිරිසවැටි විහාරයට අයත් නේවාසික භික්ෂූන්ගේ ආවාස ගෘහය දාගැබට නුදුරින් ඊට බටහිරින් පිහිටියේය.

දුටුගැමුණු රජු ( ක්‍රි.පූ. 161-137 ) විසින් ගොඩනගන ලද ප්‍රථම දාගැබ වන්නේ මිරිසවැටියයි. එතුමා එළාර රජු සමග කරන ලද යුධ ජයග්‍රහණයෙන් අනතුරුව හා අභිෂේකයෙන් සතියක් ඉක්මී ගිය පසු තිසා වැවේ ජල ක්‍රීඩාවට ගිය බැව් මහාවංසයේ සඳහන් වේ. රජුගේ සියලු පරිභෝග භාණ්ඩ ද සිය ගණන් පඬුරු ද ධාතු සහිත කුන්තායුධය ද මිරිසවැටි දාගැබ පිහිට වූ තැනහි තබා ජල ක්‍රීඩාවේ යෙදුනු අතර එය හමාර කිරීමෙන් පසු කුන්තායුධය වඩම්මවන ලෙස රජු පිරිසට අණ කළත් එය එතැනින් සොලවනු නොහැකි විය. මෙම අසිරිය දුටු රජතුමා ධාතු සහිත කුන්තායුධය වටකොට දාගැබක් කරවා වසර තුනක් ඇතුළත එහි හාත්පස ආවාස ගෘහ තනවා භික්ෂූන්ට පූජා කළේය. (මහාවංසය 1967: 26, 6-15) මෙම පූජා කිරීමේ අවස්ථාවට භික්ෂූන් ලක්ෂයක් හා භික්ෂුණීන් වහන්සේලා අනූ දහසක් සහභාගී වූ බව සඳහන් වේ. එහි දී උභතෝ සංඝයා මධ්‍යයේ දී රජතුමා තමා විසින් සංඝයා සිහි නොකොට මිරිස් වැටියක් (මිරිස් මාළුවක්) අනුභව කරන ලද හෙයින් එම වරදින් අත් මිදීමක් ලෙස මිරිස්වැටි වෙහෙර කරන ලද බවත් එය පිළි ගන්නා ලෙසත් ආරාධනා කොට පැන් වඩා සංඝයාට පවරා ඇත. මෙම පිංකම සතියක් පුරා පැවැත්වූ බවත් දාගැබ ඉදිකිරීමට හා පිංකම් කටයුතු වෙනුවෙන් එතුමා 19 කෝටියක් මුදල් වැය කළ බව මහාවංසය වාර්තා කරයි. (එම: 26, 16-25) ථූපවංසය ද මෙම කරුණ මීට සමානවම ඉදිරිපත් කරයි. (ථූපවංසය 1958: 100-101) කඹුරුපිටියේ වනරතන හිමියන් සඳහන් කරන්නේ මිරිසවැටි පූජාව බොහෝ විට ම සිදුවන්නට ඇත්තේ තිස්සමහාරාමයේ සිට ම ජයකොන්තය සමග යුධ පෙරමුණෙහි වැඩම කළ පන්සියයක් වූ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වියහැකි බවය. උන්වහන්සේගේ මෙම තර්කය සාධාරණ විය හැකිය. තමන්ට ආශිර්වාදය උදෙසා භික්ෂූන් වහන්සේලා 500 නමක් තිස්සමහරාමියෙන් වැඩම්මවා ගත් බව මහාවංසයේ සඳහන්ය. (එම: 25, 1-3) වංසකතාවලින් අපට දාගැබ මුලින් ඉදි කිරීමේ දී එහි වූ හැඩය හෝ වෙනත් වාස්තු විද්‍යාත්මක අංග පිළිබඳව කරුණු අනාවරණය නොවේ. මිරිසවැටිය දාගැබ හා සම්බන්ධයෙන් නැවතත්

අපට තොරතුරු ලැබෙන්නේ ගජබා රාජ්‍ය සමයේ දී ය. (ක්‍රි.ව. 112-134) එතුමා මිරිසවැටි දාගැබ සඳහා කඤ්චුකයක් කළ බැව් මහාවංසයේ සඳහන් වේ. (එම: 35, 120) දුටුගැමුණු රජතුමා විසින් කළ දාගැබ ඒ වන විට වසර 200 ක් පමණ ඉක්මවා තිබූ හෙයින් දාගැබ සඳහා සැලකිය යුතු ප්‍රතිසංස්කරණයක් කිරීමේ අවශ්‍යතාව පැන නැගී තිබෙන්නට ඇත. මේ අනුව ගජබා රජු විසින් කඤ්චුකය හෙවත් ආවරණ දාගැබ ඉදිකරන්නට ඇත. මෙසේ ඉදිකළ කඤ්චුකයේ පැහැදිලි සාධක පසුගිය සමයේ දී කරනු ලැබූ ප්‍රතිසංස්කරණ වල දී අනාවරණය විනැයි එම දාගැබේ සංරක්ෂණ කටයුතු භාරව ක්‍රියා කළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාස්තු විද්‍යා අධ්‍යක්ෂ ගාමිණී විජේසූරිය මහත්මා සඳහන් කරයි. (විජේසූරිය 1993: 7) මෑතක දී කළ සංරක්ෂණවල දී දුටුගැමුණු රජතුමාගේ ඉදිකිරීම් හා ගජබා රජුගේ ඉදිකිරීම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට පහසුවන ආකාරයෙන් එහි කොටස් ඉතිරිකොට තිබීම පසැසිය යුත්තකි.

වොහාරිකතිස්ස (ක්‍රි.ව. 214-236) රාජ්‍ය සමයේ දී එතුමා මිරිසවැටි දාගැබෙහි ඡත්‍ර කරනු ලැබීය. (මහාවංසය 1967: 36, 35) මේ හැර රජතුමා මිරිසවැටි විහාරයෙහි පවුරක් කළ බව ද මහාවංසයේ සඳහන් වුවත් එහි ඒන අනෙක් කරුණු හා සසඳන කල එම පවුර බැඳවීම දාගැබ වටා කරන ලද්දක් නොව ආරාම භූමියෙහි කරන ලද සීමා පවුරක් බව පැහැදිලි වේ. (එම: 36, 37) දැනට දාගැබ වටා ඇති සීමා පවුර ක්‍රි.ව. 9-10 සියවස් අතර දී ස්ථිරව ම සිදූ වූ බව පවුරේ ඇති ශිලාලේඛන දෙකකින් ම පැහැදිලි වේ. ඇතැම් විට මෙම සෙල්ලිපි එහි පිහිටුවන්නට ඇත්තේ පස්වැනි කාශ්‍යප සමයේ දී (ක්‍රි.ව. 914-923) විය හැකිය. මහාවංසයේ සඳහන් වන පරිදි එතුමා මිරිසවැටියෙහි විශාල ප්‍රතිසංස්කරණයක් සිදු කොට ඇත. දාගැබ ඇතුළුව ආවාසයන් නැවත අලංකාර ලෙස කරවා ආරාමයට අයගම් දී අලංකාර මණ්ඩපයක් තනා භික්ෂූන් වහන්සේලා ද පිරිවරමින් අභිධර්මය දේශනා කළ බව සඳහන්ය. (එම: 52, 46-49) මේ රජතුමා බුද්ධිසම්පන්න ගුණ ගරුක අයෙකු බව මහාවංසය හඳුන්වා දෙන අතරම උගතුන්ගේ පිළිගැනීම වන්නේ දැනට ලංකාවේ ඇති පැරණි ම සිංහල කෘතිය වන ධම්පියා අටුවා ගැටපදය




CS CamScanner

ද එතුමාගේ කෘතියක් බවය. (Godakumbura 1955 : 31-33) මෙම රජුගේ සමයේ දී කරන ලද ප්‍රතිසංස්කරණ වල දී දාගැබ සීමා පවුර මෙන්ම සලපතල මළුවේ ගල් ඇතිරීම ද කරන්නට ඇතැයි සිතිය හැකි වේ. එහෙත් දාගැබේ වැලිකොන්ද ආසන්නයේ ම ඇති කිසඳ්වක්ව පාෂාණ වටිය ගජබා සමයේ දී පමණ කරන්නට ඇතැයි සිතිය හැක්කේ එම සමයන්ට අයත් අක්ෂරයෙන් ලියැවුනු ශිලාලේඛන එහි තිබෙන නිසාය. ඉන් පිටත ඇතුරුම් අනුරාධපුර යුගයේ අවසන් භාගයට අයත් කළ හැක්කේ එම යුගය නියෝජනය කරනු ලබන දාගැබක ආකෘතියක් දැක්වෙන රේඛා සටහනක් සහිත සෙල්ලිපියක් ද හමු වී තිබීමයි. පස්වැනි කාශ්‍යප රාජ්‍ය සමයේ දී මිරිසවැටි විහාරය වෙනුවෙන් කරනු ලැබූ පරිත්‍යාගයන් සනාථ කරන ප්‍රබල සාධකයක් ලෙස එම රජුට අයත් අභයගිරි පුවරු ලිපිය ද දැක්විය හැකි වේ. එහි මිරිසවැටි විහාරයෙහි භික්ෂූන් වහන්සේලා 500 නමක් වාසය කරවූ බව කියැවේ. (Ez I 1912: 46) සිව්වන මිහිඳු රජුගේ කාලයේ දී ද මිරිසවැටි විහාරයට කරන ලද පූජාවක් පිළිබඳ අභයගිරි පුවරු ලිපියක සඳහන්ය. (Ez IV 1943: 219) මෙම අක්ෂර පේළි කඩතොළු වී ගොස් ඇති හෙයින් ඒ පිළිබඳ පූර්ණ අදහසක් ගත නොහැකිය.


කෙසේ වෙතත් ද්‍රවිඩ ආක්‍රමණයන් සමග විනාශ වූ අනුරාධපුර නගරය හා එහි වූ දාගැබ් සියල්ල ආක්‍රමණිකයෝ කොල්ල කාගත් බවට සාධක වෙති. (මහාවංසය 1967: 55, 17-22) මෙම විනාශ කිරීමෙන් පසු වසර 150 කට නොඅඩු කාලයක් වනගතව පැවති අනුරාධපුරයේ පූජ්‍යස්ථාන නැවත විශාල ප්‍රතිසංස්කරණයකට යටත් වන්නේ I වැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී ය. (ක්‍රි.ව. 1153-1186) මේ යටතේ මහාවංසය සඳහන් කරන පරිදි අසූ රියන් උස් වූ මිරිසවැටි සෑය අනුරපුරයේ අනෙකුත් දාගැබ් මෙන් මහ ගස් වලින් ගහනව වලසුන්ගේ හා දිවියන්ගේ වාසස්ථාන බවට පත්ව තිබියදී රජතුමා විසින් වනය සිඳුවා මහාකොට ගඩොලින් බඳවා සුනු පිරියම් කොට මළුව ද පිරිසිදු කොට ඇත. (එම: 79, 102-106) නිශ්ශංකමල්ල රජතුමා ද මිරිසවැටිය තවත් විහාර කරවීමට **ලෝකේ අරක්මේනා** වන්ට පැවරූ බව රුවන්වැලි සෑ මළුවෙහි ඇති නිශ්ශංකමල්ල රජුට අයත් ශිලා ලේඛනයක සඳහන්ය.

(Ez II 1985: 78) එහෙත් මෙහි සඳහන් විහාර කරවීම යනු කවරාකාර කටයුත්තක්දැයි පැහැදිලි නැත. පොළොන්නරු යුගයෙන් පසුව මිරිසවැටි විහාරය සම්පූර්ණයෙන් ම අභාවයට යන්නට ඇතැයි සිතිය හැකි වේ. මේ පිළිබඳව නැවත සෙවීම් බැලීම කටයුතු සිදුවන්නට වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී ය. ඔවුන් විසින් මෙම පූජණීය ස්ථානය 1840 අංක 12 දරණ මුඩුබිම් පනත යටතේ රජයට පවරා ගනු ලැබිණි. (Silva 1973: 10-12) බ්‍රිතාන්‍ය සමයේ දී බෞද්ධ ජනතාව හැකි අයුරින් මිරිසවැටි භූමිය සුද්ධ පවිත්‍ර කොටගෙන පවත්වා ගෙන යාමට උත්සහ ගත් බව වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මාගේ වාර්තා වලින් පැහැදිලි වේ. ( හරිශ්චන්ද්‍ර 2001: 118-122) එසේම බ්‍රිතාන්‍ය ජාතිකයින් මැනවින් මිරිසවැටි දාගැබ හා එම ආරාම සංකීර්ණය අධ්‍යයනයට බඳුන් කළ බව ස්මිදර් ගේ වාර්තා වලින් පෙනීයයි.

1884 දී ජේ. ජී. ස්මිදර් මෙම දාගැබ පිළිබඳව සැලසුම් හා ඡායාරූපද සහිතව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරඇත. (Smither 1894: 25-29; pl. xiv - xxi) ඔහුගේ සැලසුම් තරම් සවිස්තරාත්මක සැලසුම් තවමත් මිරිසවැටි සෑය සම්බන්ධයෙන් කිසිවකුත් විසින් ඉදිරිපත් කොට නැතැයි සඳහන් කළ හැකි වේ. එසේ ම ඔහු විසින් ඉදිරිපත් කරන ඡායාරූපය මෙමම දාගැබේ විනාශ භාවය තේරුම්ගත හැකි පැරණි ම ඡායාරූපය කි. ඊට අනුව 19 සියවසේ අවසන් සමයේ දී ත් දාගැබ පත්ව තිබූ ඛේදනීය තත්වය තේරුම්ගත හැකි වේ. බරෝස් වාර්තා කර ඇති පරිදි 1886 දී මිරිසවැටි දාගැබේ වාහල්කඩ සංරක්ෂණය කර ඇත. (ASCA 1894: 2 ) 1890 වන විට මිරිසවැටි දාගැබේ වැඩ කටයුතු එවකට අටමස්ථානාධිපතිව වැඩවිසූ ශ්‍රී සුමණ මේධංකර නා හිමියන් විසින් කරගෙන ගිය බැව් උන්වහන්සේ හික්කඩුවේ සුමංගල හිමියන් වෙත යැවූ ලිපියකින් පැහැදිලි වේ. (පඤ්ඤානන්ද හිමි 1947: 684) මෙමම දාගැබේ පූජණීය භාවය තේරුම්ගත් **සියම් කුමාරයෙකු** විසින් 1892 - 1898 සමයේ දී දාගැබ ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් 12,500 ක මුදලක් පරිත්‍යාග කරනු ලැබුවද එම කටයුතු අතරමග නැවතුණි. (levrs: 1899: 227-8) මෙමම ප්‍රතිසංස්කරණය සඳහා



මිරිසවැටි දාගැබ 1885 දී පමණ.
(උපුටාගැනීම බෙව්ඩ් අතුකෝරලගේ අවුසහ පොතින්)




මිරිසවැටි දාගැබ 1894 දී පමණ.
(උපුටා ගැනීම ජේම්ස්. ජී. ස්මිදර්ගේ Architectural Remains Anuradhapura)



CamScanner

යටත් විජිත ආණ්ඩුවේ අනුදැනුම මත බ්‍රිතාන්‍යයේ රාජකීය ආසියාතික සංගමය මගින් 1900 දී සැලසුම් ශිල්පියෙකු ලංකාවට ගෙන්වා ඔහුගේ සැලසුම් අනුව ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකෙරෙණු බැව් සඳහන්ය. (විජේසූරිය 1993: 7) මෙම ප්‍රතිසංස්කරණයන් ගර්භය තෙක් පමණක් සිදුවී නැවතුනු අතර එය නැවතත් 70 දශකයේ දී ආරම්භ කරන ලදුව 1979 වර්ෂයේ දී එතෙක් පවත්වාගෙන ගිය ඉදිකිරීම්වල දුර්වලතා හේතුවෙන් දාගැබ විනාශයකට ලක්විය. මෙසේ විනාශ වූ දාගැබේ සුන්බුන් නැවතත් සම්පූර්ණයෙන් ම ඉවත්කොට 1991 වර්ෂයේ දී රාජ්‍ය මැදිහත්වීම හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ නැවත ඉදිකිරීම් ආරම්භ ආරම්භ කෙරුණි. 1993 වර්ෂයේ දී මෙම දාගැබේ ඉදිකිරීම් කටයුතු අවසන් කොට කොත් පළඳවනු ලැබීය. පසුව විනාශව තිබූ බටහිර ආයකය හා දකුණු ආයකය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් තහවුරු කළ අතර සලපතළ මළුවේ දකුණු පාර්ශවයේ ගල් ඇතිරවීම් ද අවසන් කර ඇත. එහෙත් මළුවේ වැඩි ප්‍රමාණයක ගල් ඇතිරවීම් හා තහවුරු කිරීම් කළ යුතුව පවතී. මේ හැර දාගැබ් පරිශ්‍රය තුළ විශේෂයෙන් සලපතළ මළුව හා සම්බන්ධයෙන් කළ කැනීමක් හෝ වෙනත් පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් පිළිබඳ වාර්තා නොමැත.




**1979 දී විනාශ වුනු මිරිසවැටි දාගැබ.**



CamScanner

# රුවන්වැලි දාගැබ





CamScanner

# රුවන්වැලි දාගැබ

## පිහිටීම හා වර්තමාන තත්වය

රුවන්වැලි දාගැබ පිහිටා ඇත්තේ පැරණි අනුරාධපුර ඇතුල් නගරයට දකුණින් හා ශ්‍රී මහා බෝධීන් වහන්සේට උතුරු දිශාවෙන් වන අතර එය උත්තර අක්ෂාංශ 08'', 21.49 හා නැගෙනහිර දේශාංශ 80'', 23.49 වලින් යුතුව පිහිටියේය. මෙම දාගැබ අටමස්ථානයට අයත් පූජණිය ස්ථානයක් වන අතර එහි ආගමික කටයුතු එම විහාරවාසී භික්ෂූන් විසින් කරනු ලැබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල එහි පුරාවිද්‍යාත්මක කාර්යාවලියෙහි නිරතව සිටී. අනුරාධපුරයේ වඩාත් අංග සම්පූර්ණ ලෙසින් සංරක්ෂණයට ලක් වූ දාගැබ ලෙසින් මෙය දැක්වීමට පුළුවන. එපමණක් නොව ලංකාවේ බැතිමතුන්ගේ වඩාත් ම ගෞරවාදරයට පත්ව ඇති දාගැබ වන හෙයින් ද මෙහි දෛනිකව සිදු කෙරෙන ආගමික වතාවත් වලට ද හිමිවන්නේ විශේෂ ස්ථානයකි. දාගැබෙහි උස මීටර් 101.40 ක් පමණ වන අතර සලපතළ මළුවේ දිග හා පළල මීටර් 143 ක් වේ. සලපතළ මළුව සීමා පවුරකින් වටකොට ඇති අතර එය ද මැනවින් සංරක්ෂණය කොට සුනු පිරියම් කොට තිබේ. මේ පවුරේ ඉදිරි මුහුණතෙහි මීටර් 2.70 ක් පමණ උස ඇත් රූප 334 ක් වේ. මෙම රූප අතරින් බටහිර පැත්තෙහි පුරාණ ඇත් රූප කිහිපයක් නටබුන් ආකාරයෙන් ම තබා තිබෙන අතර ඉතිරිය ප්‍රතිසංස්කරණය කොට ඇත. සලපතළ මළුව මත සිව් දිශාවට මුහුණලා ආයක සතරක් තිබෙන අතර මේවායෙන් 3 ක්ම මීට දශක කීපයකට පෙර හොඳින් සංරක්ෂණය කර ඇත. මීන් බටහිර පැත්තෙහි ආයකය පමණක් පැරණි ස්වරූපය තේරුම් ගත හැකි අයුරින් නටබුන් ස්වරූපයෙන් ම තබා ඇත. මෙය හැරුණු කොට ඉතිරි ආයක 3 ඉදිරියෙහි මලසුන් ගෙවල් 3 ක් ද මෑත භාගයේ දී ඉදිවී ඇත. එසේම වන්දනාමාන කරන බැතිමතුන් වෙනුවෙන් මළුවේ නැගෙනහිර දොරටුවට වම් පසින් විහාර මන්දිරයක් ද ඉදිවී තිබේ. මෙම විහාර මන්දිරය තුළ මීට දශක කීපයකට පෙර නිමවන ලද බුද්ධ ප්‍රතිමා මෙන් ම මළුවේ තිබී සොයාගත් පැරණි බුද්ධ ප්‍රතිමා 4 ක් ද තැන්පත් කොට

ඇත. මෙම බුද්ධ ප්‍රතිමා පිළිබඳව ආනන්ද කුමාරස්වාමි මහතාගේ අදහසක් උපුටා දක්වන පරණවිතාන මහත්මා එවා ක්‍රි.ව. 2 වන සියවසට පමණ අයත් යැයි සඳහන් කරයි. (පරණවිතාන 1963: 59) මේ සමග මෛත්‍රී බෝසත් ප්‍රතිමාව යැයි හඳුන්වනු ලබන ප්‍රතිමාවක් ද වේ. තව ද සලපතල මළුව මත විහාර ගෘහය අබියස ම නිශ්ශංකමල්ල රජුගේ ශිලාලේඛනයක්, දොළොස්මහේ පහනක් ද විහාර මහා දේවියගේ යැයි සැලකෙන පැරණි කාන්තා රුවක් ද වේ. වැඩි දෙනෙකුගේ අවධානයට ලක් නොවූ මේ කාන්තා රුවෙහි මුහුණ සහ අත් ආදිය මීට දශක කීපයකට පෙර ගලින් නිර්මාණය කොට ඊට බද්ධ කොට ඇති බවක් පෙනියයි. මේ හැර එහි වස්ත්‍ර ආදිය සිමෙන්ති බදාම යොදා ප්‍රබල ප්‍රතිසංස්කරණයකට ලක් කොට ඇත. තව ද සලපතල මළුවේ ගිනිකොන දිශාවෙන් **භාතිය** රජුගේ යැයි වැරදි ලෙසින් හඳුන්වනු ලබන **කණිට්ඨතිස්ස** රජුට අයත් ප්‍රතිමාවක් වෙයි. මේ ප්‍රතිමාවේ පාදමේ ශිලාලේඛනයක් ද වේ. ඒ වටා ආරක්ෂිත කුටියක් ඉදිකර තිබේ.

දාගැබේ නිරිත දිගින් ගලින් කරන ලද කුඩා දාගැබක් තිබෙන අතර එහි සම්පූර්ණ උස මීටර් 1.60 ක් වේ. පරණවිතාන මහතාගේ අදහස වන්නේ මෙහි නිර්මාණ ලක්ෂණ අනුව අනුරාධපුර අවසන් සමයට හෝ පොළොන්නරු යුගයට අයත්විය යුතු බවයි. (පරණවිතාන 1962: 59) රුවන්වැලි මළුවේ නැගෙනහිර දොරටුවට දකුණු පසින් දුටුගැමුණු රජතුමාගේ යැයි සැලකෙන මීටර් 2.85 ක් තරම් උස ශිලාමය ප්‍රතිමාවක් ද වේ. මෙම ප්‍රතිමාව සලපතල මළුවේ දාගැබ ආසන්නයේ තිබී හමු වී ඇති අතර එය හමු වන විට එහි සහ අත් තිබී නොමැති අතර පසු කාලයේ දී කරන ලද ප්‍රතිසංස්කරණ වල දී ඊට අංජලිබද්ධ මුද්‍රාවෙන් යුතු දෑතක් එක් කොට ඇති අතර උරහිස් මත තිබූ කුණ්ඩලාභරණ ද ඉවත් කොට ඇත. එසේ ම කුහර සහිත මෙදෙනත් බදාමයෙන් පුරවා මූලික ප්‍රතිමාවේ සැලකිය යුතු වෙනස්කම් රැසක් සිදුකොට ඇත. දාගැබ දෙසට වන්දනා කරමින සිටින ආකාරයෙන් ප්‍රතිමාව දැනට පිහිටුවා ඇත. මෙය රජ ප්‍රතිමාවක් ලෙස සලකනු ලැබුවත් බෝසත් රූපයක් ද විය හැකි බව පරණවිතාන අනුමාන කරයි. (එම: 59) කඹුරුපිටියේ වනරතන හිමියන් ද මෙම අදහස පිළිගනී.

(පරණවිතාන හිමි 1970: 82) මෙය මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවක් ලෙස ඉංග්‍රීසි ජාතික කේව් විසින් පළිගෙන ඇත. (කේව් 1956: 42) නන්දදේව විජේසේකර මහත්මා සඳහන් කරන්නේ මෙම ප්‍රතිමාවෙන් සැදැහැවත් රජෙකු නියෝජනය කරනවා විය හැකි බවය. (විජේසේකර 1970: 254) සලපතල මළුව මත නැගෙනහිර දොරටුවට වම් පසින් මැතිදී තනවන ලද විහාරමහා දේවියගේ ප්‍රතිමාවක් වේ. මේ හැරුණු විට දාගැබ් මළුව මත ඇති අනෙක් වටිනාම පූජනීය වස්තූන් වන්නේ දාගැබ පිරිවර කොට සලපතල මළුව මත සිව් කොණ ඇති පරිවාර දාගැබ් සතරයි. 1894 දී රුවන්වැලි දාගැබ පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කළ ජේ. ජී. ස්මිදර් මහතා තම සැලසුම්වල ඒ වන විට අනාවරණය වී තිබූ ගිනිකොන හා නිරිතදිග දාගැබ් දෙක පමණක් සැලසුමට ඉදිරිපත්කොට ඇත. (Smither 1992: pl. xxiii) ඉතිරි දාගැබ් දෙක ද අනෙක් මූලුවල තිබිය හැකි බව පරණවිතාන මහත්මා අනුමාන කොට තිබිණි. (පරණවිතාන 1962: 59) කෙසේ වුව ද මේවා 1960 දශකයේ අවසන් සමයේ දී ප්‍රතිසංස්කරණය කරන්නට යෙදුනි.

මෙසේ විස්තර කළ සලපතල මළුවට සෙ.මී. 250 ක් පහතින් වැලි මළුව පිහිටා ඇත. මෙහි දිග මීටර් 205 ක් වන අතර පළල මීටර් 29.90 ක් වේ. වැලි මළුව හා ඒ වටා ඇති සීමා පවුර මේ වන විටත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ මහාවිහාර ව්‍යාපෘතිය මගින් තහවුරු කොට තිබේ.

## ආරම්භය හා සංවර්ධනීය අවස්ථා

දුටුගැමුණු රජතුමා විසින් (ක්‍රි.පූ. 161-137) ඉදිකරන ලද රුවන්වැලි දාගැබ එතුමාගේ දෙවැනි දාගැබ වේ. මෙම දාගැබෙහි තරම් ඉදිකිරීම් පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු වෙනත් කිසිඳු ස්තූපයක් සම්බන්ධයෙන් මූලාශ්‍ර ග්‍රන්ථවල සඳහන්ව නැත. මහාවංසයෙහි මෙම දාගැබෙහි ඉදිකිරීම් ඇරඹීමේ සිට රජුගේ මරණය දක්වා කරන ලද වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පිළිබඳ තොරතුරු පරිච්ඡේද 3 කින් ඉදිරිපත් කෙරේ. (මහාවංසය 1967: 28, 29, 30 පරිච්ඡේද) මේ හැර

ථූපවංසය නැමැති ග්‍රන්ථය ලිවීමේ ප්‍රධාන අරමුණ වන්නේ ද රුවන්වැලි දාගැබේ ඉදිකිරීම හා පුද පූජාවන් විස්තර කිරීම ය. මේ අනුව පැරණි දාගැබ්වල වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් හා අංග පිළිබඳවත් එහි තාක්ෂණික ක්‍රම මෙන්ම දාගැබ් හා සම්බන්ධ ආගමික පුද පූජාවන් පිළිබඳව තේරුම් ගැනීමට ද මෙම මූලාශ්‍ර ග්‍රන්ථ බෙහෙවින් උපකාර වේ. වංසකතාවල හා ශිලාලේඛන මූලාශ්‍රවල රුවන්වැලි සෑය හැඳින්වීම සඳහා විවිධ නම් භාවිතා කොට ඇති බව පෙනේ. ඇතැම් නම් ව්‍යාකූලය. මෙසේ විවිධ නාමයන් යෙදූ වෙනත් දාගැබක් අපට හමු නොවීම ද විශේෂත්වයකි. ඒවා නම්,

මහාචේති
මහාථූප
හේමමාලී
සුවණ්ණමාලී
රත්නමාලී
රුවන්මැලි
රුවන්වැලි
රුවැලි මහ සෑ
රුවන් දාගැබ

රුවන්වැලි දාගැබ හැඳින්වීම සඳහා පැරණි ශිලාලේඛනවලත් මූලාශ්‍රවලත් වැඩි වශයෙන් යොදා ගෙන ඇත්තේ **මහාචේතිය** හෝ **මහාථූප** යන යෙදුමයි. මහා චේතිය හෝ මහාථූප යනුවෙන් මෙම දාගැබ හැඳින්වීමට පුරුදුව ඇත්තේ රුවන්වැලි දාගැබ සාදන සමය වන විට තිබූ විශාලතම දාගැබ එය නිසාවෙන් බැව් ප්‍රකට කරුණකි. මහාචේතිය ඉදිවීමට පෙරාතුව ම මෙම දාගැබ් භූමියේ සිදු වූ විශේෂ සිද්ධීන් දැක්වීම සඳහාත් වංසකතාකරු පැකිළීමකින් තොරව **මහාචේතිය** හෝ **මහාථූප** යන නාමය භාවිත කොට ඇත. එබඳු අවස්ථාවක් ලෙස බුදුන්වහන්සේ තුන්වැනි වර ලක්දිව වැඩම කළ අවස්ථාවේ දී සමවත් සුවයෙන් වැඩහිඳ පූජනීය භාවයට පත්කළ අවස්ථාව දැක්විය හැකිය. (මහාවංසය 1967: 1, 18) මෙය මහාථූපය ඉදිකිරීමට අවම වශයෙන් වසර 400 කටවත් පෙර සිදු වූ සිදුවීමකි. එහෙත් දීපවංසයෙහි මෙම



CamScanner

කරුණ මේ පමණ සවිස්තරාත්මකව ඉදිරිපත්ව නොමැති අතර තෙවැනි ලංකා ගමනේ දී උන්වහන්සේ මහමෙව්නා උයනේ හා එහි මහා බෝධිය පිහිටන තැන සමවතින් වැඩ හිඳ එම භූමිය වර්ණනා කළ බව පමණක් සඳහන් කරයි. (දීපවංසය 1970: 12, 61-69) එසේ ම මිහිඳු මහ රහතන් වහන්සේ මහාවිහාරය පිළිගන්නා අවස්ථාව විස්තර කරන දීපවංසය එම කරුණ බොහෝ කල්පනාවෙන් වාර්තා කරයි. එහිදී මහා විහාරය කේන්ද්‍ර කොට ගෙන බිහිවන පූජ්‍යස්ථාන හඳුන්වා දෙන ස්ථානයේ දී රුවන්වැලි දාගැබ් භූමිය හඳුන්වා දී ඇත්තේ

*"තථාගතස්ස ධාතුයේන අට්ඨ දෝණා සාරීරිකා ඒකං දෝණං මහාරාජ ආහරිත්වා මහිද්ධිකා ඉධෝකාසෙ නිධාපෙත්වා ථූපං කාරෙන්ති සෝභනං සංවේග ජනට්ඨානං බහු ජන පසාදනං "*

(දීපවංසය 1970: 14, 5-6)

බුදුන්වහන්සේගේ ද්‍රෝණ අටක් පමණ වූ ශරීර ධාතු වලින් එක් ද්‍රෝණයක් මහ රජතුමා විසින් ගෙනැවිත් බොහෝ ජනයාගේ ප්‍රසාදය සඳහා සංවේගස්ථානයක් ලෙස ථූපයක් කරවන ලද බව ඉහත සඳහන් වේ. එහෙත් මහාවංස කතුවරයා මෙම සිද්ධිය වාර්තා කිරීමේ දී දාගැබ හඳුන්වා ඇත්තේ **හේමමාලී** වශයෙනි. (මහාවංසො 1959: 15, 166-167) එහෙත් ඉන්පසු පරිච්ඡේද වල දුටුගැමුණු රජුගේ මෙම දාගැබ ඉදිකිරීමේ තොරතුරු දිගින් දිගටම ඉදිරිපත් කරන මහාවංසය භාවිත කරන්නේ **මහාථූප** යන යෙදුමයි. (එම: 26-33 පරිච්ඡේද) එපමණක් නොව එතුමාගේ සොයුරු සද්ධාතිස්ස සමයේ තොරතුරු වාර්තා කරන තැන ද **මහාථූප** යන යෙදුම වේ. (එම: 34, 23) ක්‍රි.ව. 1 වැනි සියවසේ පමණ සිට හමුවන ශිලාලේඛනවල ද **මහතුබ** යන යෙදුම හමු වේ. (IC 1983: 74, 111) මේ හැර **මහචෙත** හෝ **මහචෙය** යන යෙදුම ද දැකගත හැකි වේ. (Ibid 221, 197) දීපවංසයෙහි එකම අවස්ථාවක පමණක් **මහාචේති** යනුවෙන් යොදාගෙන ඇති අතර (දීපවංසය 1970: 19, 10) රුවන්වැලි දාගැබ හැඳින්වෙන අනෙක් සෑම අවස්ථාවක ම ඒ සඳහා යොදාගෙන ඇත්තේ **මහාථූප** යන යෙදුමයි. (එම: 20, 1, 5, 10., 21, 1,

13, 18, 21, 25, 26 .. 22, 35, 38, 46, 47, 50, 60) එසේම මහා බෝධිවංස ග්‍රන්ථපදයේ ද යොදා ඇත්තේ මහාථූප යන වචනයයි. (මහාබෝධිවංස ග්‍රන්ථපදය 1985: 150, 152, 157.)

බල්ලාටනාග රාජ්‍ය සමයේ දී (ක්‍රි.පූ. 119-109) මහාවංසයෙහි "**මහාථූපස්ස පරිතො වාරුනො හේමමාලිනො**" (මහාවංසො 1967: 33, 31) යනුවෙන් එනම් **හේමමාලි** හෙවත් **රුවන්වැලි** මහා ස්තූපය ලෙස හඳුන්වා ඇත. එහෙත් සිංහල මහාවංසය මෙය **රුවන්මල්** නම් මහාසෑය යනුවෙන් වරදවා පරිවර්තනය කොට ඇත. මහාවංසයට අනුව ඉහත විස්තර කොට ඇති පරිදි මිහිඳු හිමියන් මහා විහාර සීමාවේ පූජ්‍යස්ථාන දක්වන තැනේදී ද **හේමමාලි** යන්න පමණක් යොදාගෙන තිබීම ද සිහිකට යුතුය. **හේමමාලි මහාථූප** යනුවෙන් ඇතැම් විට වංසකතාකරු යොදන්නට ඇත්තේ මහාථූප නාමයෙන් තවත් දාගැබ් මහාවංසය ලියන සමය වන විට ඉදිවූ නිසා ද විය හැකිය. උදාහරණ ලෙස දීපවංසයෙහි ගජබා රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 114-136) අභයගිරියෙහි මහා ථූපය කළ බැව් සඳහන්ය. (දීපවංසය 1970: 22, 13) බෝධිවංස ග්‍රන්ථපදයේ ද **අභයතුරා මහා සෑ** යනුවෙන් වේ. (මහාබෝධිවංස ග්‍රන්ථපදය 1985: 156) **අම්බස්ථල මහාථූප** (මහවංසය 1967: 34, 71) අභයුත්තර මහාථූප (එම: 35, 119) යනුවෙන් සඳහන්ව තිබීමක් එසේ ම ධාතුසේන රාජ්‍ය සමයේ සිට (ක්‍රි.ව. 455-473) මහාවංසයේ අවස්ථා කිපයකදීම මහාචෛතිය තුන යනුවෙන් සඳහන් වේ. (එම: 38, 74 .. 40, 95 .. 42, 44.. 65, 147 .. 46, 122, 124) මහාථූප තුන යනුවෙන් අදහස් කර ඇත්තේ රුවන්වැලි අභයගිරි හා ජේතවනයයි. රුවන්වැලි දාගැබ් ඇතුළු මහා චෛතිය තුන ගැන වංසකතාවල අපට අවසන් වරට හමුවන්නේ දෙවන මිහිඳු රාජ්‍ය සමයේ දී ය. (ක්‍රි.ව. 717-797) පොළොන්නරු සමයේ දී අපට එක ම අවස්ථාවක දී පමණක් රුවන්වැලි දාගැබ් සඳහා **මහාථූප** යන යෙදුම භාවිත කළ බවට සාධක ලැබේ. එනම් I වැනි පරාක්‍රමබාහු රජු රුවන්වැලිය ප්‍රතිසංස්කරණය කොට එහි පූජාව සඳහා මහ ජනතාවට **මහාථූපස්ථානයට** පැමිණෙන ලෙස ඇණවීමක් කර ඇත. (මහාවංසය 1959: 74, 109 )

දෙවන සේන රාජ්‍ය සමයේ (ක්‍රි.ව. 853-887) හා පස්වන කාශ්‍යප රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 914-923) රුවන්වැලි සෑය හඳුන්වා ඇත්තේ **හේමවාලුක චේති** යනුවෙනි. (ථමං: 49, 50, 67, 82) හේමවාලුක යන්නෙහි සිංහල අර්ථය ගත හැකි වන්නේ **හේම** යනු **ස්වර්ණ** හෙවත් **රන්** යනුවෙනුත් **වාලුක** යනු **වැලි** යනුවෙනුත් ය. ඒ අනුව **රන්වැලි** චෛතිය යනුවෙන් හැඳින්විය හැකිය. සිව්වැනි මිහිඳු රජුගේ සමයේ දී (ක්‍රි.ව. 956-972) මහාවංසය මෙම දාගැබ හඳුන්වා ඇත්තේ **හේමමාලික චෛතිය** යනුවෙනි. මෙය සිංහල අර්ථ ගැන්වුවහොත් **හේම** යනු **රන්** යනුවෙනුත් **මාලික** යනු **මල්** යනුවෙනුත් ගෙන **රන්මල් දාගැබ** වශයෙන් හැඳින්විය හැකිය. එහෙත් **හේම වාලුක** යන යෙදුමෙහිත් **හේම මාලික** යනුවෙන් යෙදුනු තැනදීත් සිංහල මහාවංසය අර්ථ දී ඇත්තේ රුවන්වැලි දාගැබ යනුවෙනි. එහෙත් වචනවල අර්ථ ගතහොත් එය වැරදි යෙදුමකි. **හේම** යනු රන් වුවත් ඊට අර්ථ දීමේදී **රුවන්** යනුවෙන් යොදාගන්නා කල ඉන් අර්ථවත් වන්නේ **මැණික්** මිස **රන්** නොවේ. **හේම වාලුක** හෝ **හේම මාලික** යන යෙදුම අපට කිසිදු ශිලාලේඛනයකින් හමු නොවේ. එහෙත් පොළොන්නරු සමයේ දී අපට මහාවංසයේ **රතන වාලුක** යන යෙදුමක් හමු වේ. (ථමං: 74, 104 .. 76, 97) මේ සඳහා අපට ඉතා පැහැදිලි ලෙසින් **රතන** යන වචනය සඳහා මැණික් හෙවත් **රුවන්** යන්නත් **වාලුක** සඳහා **වැලි** යන්නත් එනම් **රුවන්වැලි** යනුවෙන් ගත හැකි වේ. පොළොන්නරු යුගයේ දී ලියැවී ඇති ශිලාලේඛනවල ද මෙම නාමය අපට දැකගත හැකි වේ. I වැනි පරාක්‍රමබාහු රජුට අයත් රුවන්වැලි සෑ පුවරු ලිපියක **රත්නමාලි මහ සෑ වහන්සේ** යනුවෙන් දක්වා ඇත. (ලිපිය අප්‍රකාශිතයි.) එසේම නිශ්ශංකමල්ල රජුගේ රුවන්වැලි සෑ පුවරු ලිපියෙහි **රුවන්වැලි දාගැබ් වහන්සේ** යනුවෙනුත් **රුවන්මැලි මළුව** යනුවෙනුත්, මේ හැර එම ලිපියේ අග එන සංස්කෘත ශ්ලෝකයේ උක්ත අර්ථයෙන් ම **රත්න චෛත්‍ය** යනුවෙන් ද දක්වා ඇත. (Ez II 1985: 77) මේ හැර කළ්‍යාණවතී බිසවගේ රාජ්‍ය කාලයට අයත් ( ක්‍රි.ව. 1202-1208 ) රුවන්වැලි සෑ පදර ලිපියෙහි අවස්ථා දෙකක දී ම මෙම දාගැබ හඳුන්වා ඇත්තේ **රුවන්මැලි** දාගැබ යනුවෙනි. (Ez. Iv 1943: 255) නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ ද නව රුවන්වැලි දාගැබක් කර ඇති බව ද ප්‍රකට කරුණකි. (Ez II 1985: 108, 135)


එසේ ම පොළොන්නරු සමයට අයත් යැයි සැලකෙන මහාබෝධිවංශ ග්‍රන්ථපදයෙහි **මහාථූප** යන වචනය සඳහා අර්ථ දී ඇත්තේ **රුවන්මැලි මහාථූප** යනුවෙනි. (මහාබෝධිවංශ ග්‍රන්ථපදය 1985: 150) එහි ම **මහාචේතිය** යන වචනය සඳහා **රුවන්වැලි** යන අරුත් දී ඇත. (එම : 160) මෙම උදාහරණ වලින් පැහැදිලි වන්නේ **රතනවාලුක, රතනමාලික, රුවන්වැලි** හා **රුවන්මැලි** යන රත්න හෙවත් **මාණික්‍ය** සම්බන්ධ එම නාමය යෙදෙන්නට පටන් ගත්තේ පොළොන්නරු යුගයේ සිට බවය. අනුරපුර යුගයේ දී **මහාථූප** , **මහාචේති** යන නාමයන්ට අමතරව **ස්වර්ණමාලි, හේමමාලි** ආදී වශයෙන් ස්වර්ණ හෙවත් රන් සම්බන්ධ කෙරෙමින් මෙම නාමය යෙදූ බවය.

අනුරපුර යුගයේ දී ස්වර්ණ හෙවත් රන් සම්බන්ධ කෙරෙමින් පටබැඳුනු නාමය පොළොන්නරු සමයේ දී රුවන් සම්බන්ධ වූයේ කුමක් නිසාදැයි සෘජුව සඳහන් කළ නොහැකිය. එහෙත් කඹුරුපිටියේ වනරතන හිමියන් සඳහන් කරන්නේ මහා බෝධිවංශ ගැටපදයේ මෙම දාගැබ **රතනමාලක** නම් ස්ථානයේ මුලින් ඉදිකළ බව සඳහන් වන හෙයින් **රත්නමාලි** යනුවෙන් යොදන්නට ඇති බව ය. (වනරතන හිමි 1970: 71) මහාබෝධිවංශ ගැටපදයේ සඳහන්ව ඇත්තේ පදලස දාගැබට නැගෙනහිරින් **රතන මාලකය** පිහිටි බවකි. (මහාබෝධිවංශ ගැටපදය 1985: 150) එහෙත් දැනට හඳුනාගෙන ඇති පරිදි ථූපාරාම දාගැබ අබියස පදලස දාගැබ පිහිටා තිබෙන අතර මහාථූපය පිහිටා ඇත්තේ පදලස දාගැබට දකුණු දිශාවෙනි. ඇතැම්විට ථූපාරාමය ද ඇතුළු මුළු භූමියම අතීතයේ දී **රතනමාලක** ලෙස හැඳින්වූයේදැයි සැක සහිතය. දීපවංසයෙහි ථූපාරාමය විස්තර කරන එක් තැනක

> ***" රතනමයාහි නික්ඛිත්තඤ්චා හොසි වාලිකාහිච***
> ***කඤ්චන විතානං ඡත්තං සොණ්ණමාලි විචිත්තකං "***
>
> (දීපවංසය 1970: 15 32)

(ථූපාරාම දාගැබ් භූමිය) **රුවන්මය වැලි දමා ගැවසූයේ රන්වියන් වලින් ද ඡත්‍රයෙන් හා රන්වන් මල් වැලින් විචිත්‍ර විය.**

දීපවංශයේ මෙම සඳහනට අනුව ථූපාරාමය ඉදිකොට ඇත්තේ රුවන් හෙවත් මාණික්‍යමය වැලි අතුරන ලද මළුවකය. එබැවින් මෙම මළුව **රතන මාලක** නම් වූයේ දැයි සිතිය යුතුය. ථූපය සහිත ආරාමය **ථූපාරාමය** වූවා සේ ම රුවන් ඇතුරූ මළුව **රතනමාලක** වීමේ අපහසුවක් ද නැත. ථූපාරාමය අසල ප්‍රාකාරයක තිබී හමු වූ ගජබා රජුට අයත් පුවරු ලිපියක **රතනාරාම** නම් විහාරයකට දෙන ලද දීමනා ගැන කියැවේ. (Ez. III 1933: 116) මේ ථූපාරාමයට අයත් විහාරයක් විය හැකිය. පරණවිතාන මහතා අනුමාන කරන්නේ එය රුවන්වැලි සෑය වියහැකි බව ය. (Ez III 1933: 118) කෙසේ වුව ද අනුරපුර සමයේ දී මේ පිළිබඳව සඳහන් නොවූයේ කවර හෙයින්දැයි කිම අපහසුය. 13 වැනි සියවසේ දී පමණ ලියැවුනු සිංහල බෝධිවංසයෙහි රුවන්වැලි දාගැබ සඳහා එම නාමය ලැබීම පිළිබඳව විස්තර කොට ඇත්තේ "***ධාතු ගර්භය රත්නමාලාවෙන් අලංකෘත වන බැවින් රත්නමාලා නම් වීයැ.***" ( සිංහල බෝධිවංසය 1685: 157 )



**රුවන්වැලිය දාගැබ 1894 ට පෙර**
**(උපුටා ගැනීම වලිසිංහ හරිස්චන්ද්‍රගේ පුරාවිද්‍යාව කෘතියෙන්)**

මෙසේ ධාතු ගර්භයේ තැන්පත්ව ඇති මාණික්‍ය සැරසිලි හා තැන්පතු හේතුවෙන් රුවන්වැලි දාගැබට එම නම ලැබුණු බව 13 වන සියවසට අයත් සාහිත්‍යමය සාධක වලින් පැහැදිලි වේ. ජනප්‍රවාදගත කතාවකට අනුව ස්තූපය ඉදිකළ ස්ථානයෙහි වූ නෙළුම් ගසකට අරක්ගත් **ස්වර්ණමාලී** නම් වෘක්ෂ දේවතාවියකගේ ඉල්ලීමට අනුව ඇයගේ නමින් මෙම දාගැබට **ස්වර්ණමාලී** නමින් නම් කළ බවට ද අදහසක් වේ. (කුලතුංග 2001: 27) මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ සඳහන් කරන්නේ රුවන්වැලි යනු මැණික් වැලි යන තේරුම දෙන්නකි. එහි පාලි පරිවර්තනය විය යුත්තේ **රතන වාලුක** යන්නයි. සෑය යන්න චෛත්‍ය යන්න වෙනුවට සිංහලෙන් යෙදෙන්නකි. **හේමමාලික චෛත්‍ය** හෝ **ස්වර්ණමාලික චෛත්‍ය** යන පාලි ව්‍යවහාරය සමග **රුවන්වැලි** සෑය යන්න ගැලපිය නොහැකි වන්නා සේ ම එය වැරදි ව්‍යවහාරයක් හා ව්‍යාකරණානුකූල වැරදි යෙදුමක් වුවත් දිගු කලක් භාවිතයෙන් මුල් බැසගත් ව්‍යවහාරයක් බවය. (වික්‍රමගමගේ 2001: 14) මහාවංසය සඳහන් කරන පරිදි රුවන්වැලි දාගැබ පිහිටි භූමිය සතර බුදුවරුන්ගේ ස්පර්ශය ලද භූමියක් වන අතර එය කකුධ නම් වැවක් ආසන්නයේ ඉදි වූ බවත් එම දාගැබ ඉදිවන ස්ථානය නිශ්චිතව ම හඳුනාගත් මිහිඳු මහ රහතන් වහන්සේ ඊට සපු මල් අට මිටක් පුදනු ලැබීය. (මහාවංසය 1967: 15, 51, 55, 65) මෙම ස්ථානයේ ඇති පූජනීය භාවය දේවානම්පියතිස්ස රජුට විස්තර කරන මිහිඳු මහ රහතන් වහන්සේ බුදුන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ ශාරීරික ධාතු තැන්පත්ව ස්වර්ණමාලි නමින් ප්‍රසිද්ධව අනාගතයේ දී එකසිය විසි රියන් දාගැබක් ඉදිකෙරෙන බැව් සඳහන් කිරීමෙන් අනතුරුව රජු එය ඉදිකිරීමට එක්වර ම ඉදිරිපත් වුවත් මිහිඳු හිමියන් විසින් රජතුමා ඉන් වළක්වා ඔහුගේ මුණුබුරෙකු වන දුට්ඨගාමිණී නම් කුමරෙකු අනාගතයේ දී එය ඉදිකරනු ඇතැයි සඳහන් කරයි. (මහාවංසය 1967: 15, 167-172) මෙම කරුණ ඇසූ රජු එම තොරතුර ගල් ටැඹක සටහන් කර තැබූ බව මහාවංසයේ කියැවේ. (එම: 15, 173) මෙසේ මෙම භූමියෙහි පූජනීය භාවය පළමු කොට වංසකතාකරුවන් විසින් මතු කර දෙනු ලබයි. දුටුගැමුණු රජු රජකමට පත්වීමෙන් පසුව මිහිඳු හිමියන්ගේ අනාගත වාක්‍ය පිළිබඳව කරුණු දැනගෙන ඒ පිළිබඳව සටහන් තබන ලද ලේඛන සොයා බැලීමේ දී රජුට මාලිගාවේ තිබූ

කරඬුවක බිහාලූ රන් සන්නස හමු වූ බව මහාවංසය කියයි. (මවං: 27, 3-8) මේ හැර ස්තූපය පිහිටන තැන දෙවනපෑතිස් රජු විසින් පිහිටුවන ලද ශිලා ස්ථම්භය ද දැකගත් දුටුගැමුණු රජු මහාථූපය ගොඩ නැගීමට තීරණය කරනු ලබයි. (මවං: 28, 2) දාගැබ ඉදිකිරීම පිළිබඳ අනාගත වාක්‍ය සඳහන් ලේඛන දෙක එනම් රජ මාලිගාවේ කරඬුවක වූ රන් තහඩු ලේඛනයත් ශිලා ටැඹත් පිළිබඳ කරුණු අපගේ අවධානයට ලක්විය යුත්තකි. දෙවනපෑතිස් රජු විසින් ලියන ලද මෙම ගල් ටැඹ හෝ මාලිගයේ තිබුනායැයි කියැවෙන රන් තහඩු ලේඛනය හමුව තැනත් මෙයින් අතීතයේ ක්‍රියාත්මක වූ ලේඛන සම්බන්ධ චාරිත්‍රය පැහැදිලි වේ. එනම් ශිලාලේඛනවල යම් සඳහනක් හෝ පරිත්‍යාගයක් පිළිබඳ සටහන් කෙරෙන සෑම විටම පාහේ එහි අනු පිටපතක් රජ මාලිගාවේ ගබඩාවේ තැන්පත් කිරීම චාරිත්‍රය යි. මේ පිළිබඳව කදිම සාක්ෂියක් ක්‍රි.ව. දෙවන සියවසට අයත් කණිට්ඨතිස්ස රජුට අයත් රුවන්වැලි සෑ මළුවෙන් හමු වූ ශිලාලේඛනයකින් ද තහවුරුවේ. (IC II, II 2001: 130) දාගැබ ඉදිකිරීමට ඉටාගත් දුටුගැමුණු රජු ඒ වන විටත් දෙමළුන්ගෙන් පීඩාවට පත්ව සිටි ජනතාවට බරක් නොවන පරිද්දෙන් එම කටයුතු සංවිධානය කරගත්තේ පෙනියයි. සක් දෙවියන්ගේ මෙහෙයවීමෙන් විශ්වකර්ම දෙවියන්ගේ මැදිහත්වීම මත ගමොල් රන් රිදී හා නොයෙකුත් වස්තු ලැබුණු බව මහාවංසයේ සඳහන් වේ. (මවං : 28, 3-43) මෙම කරුණු ථූපවංසයෙහි ද සඳහන්ව ඇත. (ථූපවංසය 1958: 104, 108) දාගැබ සඳහා අවශ්‍ය උපකරණ සම්පූර්ණ වූ පසුව දාගැබෙහි වැඩ කටයුතු රජු විසින් ආරම්භ කරන ලද්දේ වෙසක් පුර පසළොස්වක් පොහෝ දිනක දී ය. එය විසා නැකතින් ඇරඹි බව කියැවේ. (මහාවංසය 1967: 29, 1-2) මෙතැන් සිට දාගැබෙහි ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ තොරතුරු ක්‍රමානුකූල ලෙසින් විස්තර කොට තිබේ. ඒ අනුව පළමුවෙන් ම රජු විසින් දාගැබ පිහිටුවන තැන තිබූ සෙල්ලිපිය සහිත ගල් ටැඹ ඉවත්කර සත් රියනක් තැන පස් ඉවත්කොට ඊට අදාළ පාදම දැමීමේ කටයුතුවල නිරත වී ඇත. ඒ අනුව රජු විසින් පළමුව ම නුණුගල් කුළු ගස්වා පුළුම ස්ථරය ලෙස පොළොවේ අතුරා සමින් ආවරණය කරන ලද (සපත්තු යොදා) පතුල් ඇති ඇතුන්ගේ පාද වලින් ගල් කුට්ටි පාගවා පදනම ශක්තිමත් කරවා ඒ මත වෙඩරු මෙන් සියුම්

මැටි ස්ථරයක් අනුරුවා අනුක්‍රමයෙන් ගල්, ශුද්ධ වූ කරගල්, කුරුවින්ද පාෂාණ, යකඩ දැල්, බොරළු, පළිඟු ගල් (තිරිවාන), රසදිය මිශ්‍ර දිවුල් ලාටු, අටඟුල් ගනකම් ලෝහපට, තල තෙලින් හැනූ රත් හිරියල්, සතඟුල් ගනකම් රිදී පට ආදී වූ විවිධ ස්තරයන් ඇතිරවූහ. (මහාවංසය 1967: 29, 3-12) සත් රියනක් යටට පොළොව හැරීමෙනුත් පදනම සකස් කිරීමේ දී යොදාගත් අමුද්‍රව්‍ය හා ක්‍රමවේදය පිළිබඳව සැලකීමේ දී පෙනී යන්නේ මෙම සාරභාර වස්තුවේ කල් පැවැත්ම කෙරෙහි ඔවුන් අවධානය යොමු කළ ආකාරය හා ඒ පිළිබඳව තිබූ තාක්ෂණික දැනුමයි.

එහෙත් දාගැබෙහි පදනම සකස් කරගත් ආකාරය පිළිබඳ මහාවංසයට වඩා වෙනස් ඇතැම් කරුණු දීපවංසය ඉදිරිපත් කරන අතර මෙහි ඇති වැදගත් ම කරුණ වන්නේ පිහිටි ගල් තලය මතුයෙහි සිට ඉදිකිරීම් ආරම්භ කරන ලද බව ය.

**" සුධාභූමි ථූලසේලං මත්තිකං ඉට්ඨිකායච**
**විසුද්ධ භූමිකාවෙ ච අයෝ ජාලං මරුම්බකං "**


( දීපවංසය 1970: 19, 2 )

මෙහි **ථූලසෙල** යන පදය යොදා ඇත්තේ පිහිටිගල, පැතුරුණු ගල යන අර්ථයෙනි. පුරාවිද්‍යාත්මක වශයෙන් ගත්කල අභයගිරි දාගැබෙහි කරන ලද කැනීම වලදීත් ජේතවන දාගැබෙහි කරනලද කැනීම්වල දී ත් එම දාගැබ්වල පාදම ආරම්භ කොට ඇත්තේ පිහිටි ගල දක්වා ම සෑරීමෙන් බව අනාවරණය විය. දීපවංසය වැඩි දුරටත් සඳහන් කරන පරිදි මෙම පිහිටි ගල් තලය මත හුණු බදාම අතුරා මැටියෙන් ගඩොල් බැඳ උතුම් ලෙස භූමිය සකසා යකඩ දැල් යොදා ඒ මත කුරුවින්ද පාෂාණ දමා නැවත නැවත බොරළු ගල් අට වරක් ම යොදමින් පාදම සකස්කර ගෙන ඇත. (දීපවංසය 1970: 19, 2-3) මෙහි මහාවංසයේ මෙන් දිවුල් ලාටු, රසදිය, තල තෙල්, ආදී බදාම මිශ්‍රණයන් ගැන සඳහන්ව නැත. එහෙත් මෙහි එන **සක්ඛර** යන වචනය කෙරෙහි අවධානය යොමුවිය යුතුය. සක්ඛර යනු පාලි ශබ්දකෝෂයට අනුව **උක් හකුරු** හඳුන්වන නමකි. (බුද්ධදත්ත හිමි 1950: 482) උක් හකුරු



CamScanner

හුණු බදාම සමග මිශ්‍ර කල විට එය ඉතා දැඩි බදාමයක් බවට පත් වේ. දීපවංසකරු සක්බර භාවිත කළ බව සඳහන් කරන්නේ මෙම ඝන බදාමය සඳහා දැයි සිතිය යුතුය. එසේ ම මහාවංසයේ පාදමේ ඉදිකිරීම් සඳහා ගඩොල් භාවිත කළ බව නොකියවෙතත් දීපවංස කතුවරයා පාදමේ මුල සිට ම පාහේ ගඩොල් භාවිත කළ බව සඳහන් කරයි. ජේතවන අභයගිරි දාගැබ් වලින් අනාවරණය වූයේ ද පිහිටි ගල මතුපිට සිට ම පාදම ගඩොලින් බැඳ ඇති බවය. බෙල් මහත්මා ද ජේතවන දාගැබේ පාදම ගැන වාර්තා කොට ඇත. (Bell 1894: 2 ) මෙසේ බලන කල දීපවංස කරුගේ පදනම් සැකසීම පිළිබඳව තොරතුරු පුරාවිද්‍යාත්මක අනාවරණයවීම් සමග වඩා සැසඳෙන බැව් සඳහන් කළ හැකි වේ.



**රුවන්වැලි දාගැබ 1894 දී පමණ**
**(උපුටා ගැනීම ජේම්ස්. ජී. ස්මිදර්ගේ**
**Architectural Remains Anuradhapura)**



CamScanner

රුවන්වැලි දාගැබේ පදනම සැකසීමෙන් අනතුරුව ඇසළ මස පුර පසළොස්වක පොහොය දිනයේ දී දාගැබ ඉදිකිරීම සඳහා මුල්ගල් තබන බැව් භික්ෂූන් වහන්සේලාට දැන්වූහ. මෙම උත්සවය සඳහා රජතුමාගේ ඇනවීමෙන් නගරය අලංකාර කොට සැරසූ අතර මහ ජනතාවට ද එට සහභාගී වීමට අවස්ථාව සැලසීය. මෙම මුල්ගල් තැබීමේ උත්සවයෙහි සුවිශේෂත්වය වන්නේ දේශීය මෙන් ම විදේශීය භික්ෂූන් සහ භික්ෂුණීන් වහන්සේලා ලක්ෂ ගණනක් එට සහභාගී වීමයි. (මහාවංසය 1967: 29, 13-69) ලංකා ඉතිහාසයෙහි වාර්තා වන වැඩි, ම භික්ෂූන් වහන්සේලා පිරිසක් සහභාගී වුනු ආගමික උත්සවය ලෙස මෙම මුල් ගල් තැබීමේ උත්සවය දැක්විය හැකි වේ. මේ හැර ධාතු නිධානෝත්සවය විස්තර කරන තැනේ දී ධාතු ගර්භය තුළ තැන්පත් කළ පූජා වස්තුවල මෙන් ම ධාතු ගර්භයේ බිත්ති තලය මත අඳින ලද සිතුවම් පිළිබඳව ද දීර්ඝ තොරතුරු එයි. (එම: 30,31 පරිච්ඡේද) මහාවංසයට වඩා වැඩි තොරතුරු ථූපවංසයෙහි එයි. (ථූපවංසය 1958: 127-134 ) මෙම ධාතු නිධාන උත්සවය ද ඇසළ මස ශුක්ල පක්ෂයේ පසළොස්වක දිනයක උතුරුසළ නැකතින් සිදුකොට තිබීම ද විශේෂ කරුණකි. ( මහාවංසය 1967: 31, 109 ) වංශ කතාවට අනුව දුටුගැමුණු රජතුමාට රුවන්වැලි දාගැබෙහි ඉදිකිරීම් කටයුතු කිරීමට හැකිවූයේ දාගැබේ ගර්භය දක්වා පමණි. (එම: 31, 116-124) මාරාන්තික රෝගයකින් ගිලන් වූ රජු දාගැබෙහි ඉතිරි කටයුතු තම සොයුරු සද්ධාතිස්ස කුමරුට පැවරූ බවත්, සද්ධාතිස්ස කුමරු දාගැබේ හුණු පිරියම් කිරීම වෙනුවට දාගැබ සුදු වස්ත්‍රයෙන් වසා උද්ධ වේදියත්, කරච්ඡකය හා ඡත්‍ර ආදිය උණ දඬු වලින් කරවා සිතුවම් අන්දවා සැමෙයි කටයුතු අවසන් කළ බැව් දුටුගැමුණු රජුට දැන්වීය. රෝගී රජු සිවි ගෙයක හොවා මළුවට පමුණුවා සිවිගෙයි හිඳිමින් ම දාගැබ පැදකුණු කොට සතුටු සිත් උපදවා දාගැබ් මළුව මත දකුණු දොරටුව අබියස දී මහා සංඝයාගේ පිරිත් දේශනාව මධ්‍යයේ දී ම අවසන් හුස්ම හෙළීය. (එම: 32, 1-74) ලංකා ඉතිහාසය තුල දාගැබ් මළුවක මහ සහන මැද දී අවසන් හුස්ම හෙළූ එකම රජතුමා වන්නේ ද දුටුගැමුණු රජතුමා වන අතර එය සිදු වූයේ රුවන්වැලි සෑ මළුවේ දී වීම ද විශේෂ සිද්ධියකි.



CS CamScanner

සද්ධාතිස්ස සමයේ දී එතුමා දාගැබෙහි ඉතිරිව තිබූ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළ බව මහාවංසයෙන් පැහැදිලි වේ. ඡත්‍ර තැංවීම , හුණු ආලේප කිරීම, ඇත් පවුර කරවීම ආදිය ඒ අතරවේ. (එම: 33, 5) හත්ථි පාකාර යනුවෙන් සඳහන්ව ඇති හෙයින් ඇත්පවුර කරවූ බව ඉතා පැහැදිලිය. දීපවංසය මෙම කරුණ වැඩි දුරටත් විස්තර කරමින් දාගැබ වටකොට ඇත් පවුර බැඳ වූ බව වාර්තා වේ. (දීපවංසය 1970: 20, 5) එහි වැඩි දුරටත් සඳහන් කොට ඇත්තේ රජු දාගැබ සඳහා කඤ්චුකයක් හා කාරාපිණ්ඩය ද කරවූ බවය. (එම: 20, 5) කාරාපිණ්ඩය යනු කොත්කැරැල්ල යයි පරණවිතාන මහත්මා අනුමාන කළ ද (IC II 1983: 50) මෙයින් කියැවෙන්නේ යූපස්ථම්භය යැයි ව්‍යවහාර කරනු ලබන ශිලා ස්ථම්භයම බව අපට රුවන්වැලි මළුවෙන් ලැබුණු එබඳු පැණක ලියූ ශිලාලේඛනයකින් පැහැදිලි විය. මෙයින් පැහැදිලි වන්නේ සද්ධාතිස්ස සමයේ දී කරවිඩකය (යූපස්ථම්භය) හා ඇත් පවුර ද කළ බවය. පරණවිතාන මහත්මාගේ අදහස වන්නේ වංසකතා සාධක අනුව ඇත් පවුර ඉතා පුරාණ නිර්මාණ අංගයක් බවත් එසේ වුවත් දැනට පවත්නා (අවසන් ප්‍රතිසංසස්කරණයට පෙර) ඇත් පවුර අනුරපුර යුගයේ අවසන් සමයට හෝ පොලොන්නරු යුගයට අයත් බවය. (පරණවිතාන 1963: 59) පොළොන්නරු සමයේ දී ඇත් පවුරෙහි සැලකිය යුතු ප්‍රතිසංස්කරණයන් සිදු වී ඇති බව මෑත කැනීම් වලින් හමු වූ දත්ත වලින් පැහැදිලි වේ. (කුලතුංග 2001: 35)

සද්ධාතිස්ස රජතුමාගේ සොයුරකු වූ ලජ්ජිතිස්ස රජු ද (ක්‍රි. පූ. 119-109) මහාථූපය සඳහා නව වාස්තු විද්‍යාත්මක අංග හඳුන්වා දුන් බව වංසකතා සාක්ෂි දරයි. දීපවංසය වාර්තා කරන පරිදි මෙතුමා **තිලඤ්ජනයක්** එක්කළ බව කියයි.(දීපවංසය 1970: 20, 10) මෙයට සිංහල අර්ථ දී ඇත්තේ **මල් ආසන** තුනක් බවය. එහෙත් මෙම කරුණ ම මහාවංස ටීකාවේ ඉදිරිපත් කරන්නේ **කාරෙසි පුප්ඵාධානානි තීණි** යනුවෙනි. (වංසත්ථප්පකාසිනි 1994: 33, 22) මෙම කරුණ සිංහලයට පෙරලා ඇත්තේ **සෙල්මුවා මල් අසුන් තුනක්** කරන ලදි යනුවෙනි. (මහාවංසය 1967: 33, 22) එහෙත් **පුප්ඵාධාන** යනු දාගැබෙහි පේසාවන්



CS CamScanner

බව පරණවිතාන මහත්මා විසින් බොහෝ උදාහරණ දෙමින් සනාථ කොට ඇත. (පරණවිතාන 1963: 13-14) එතුමාගේ මෙම අදහස නිවැරදි වන අතර ඔහු වැඩි දුරටත් සඳහන් කරන්නේ මහාථූපයේ පේසා වළලු මුලින් ගඩොලින් ඉදිකර තිබී පසුව ඒවා ලජ්ජිතිස්ස රජු විසින් සුදු හුණුගල් වලින් ආවරණය කරන ලද බවයි (එම: 14) පරණවිතාන මහත්මාගේ මෙම නිගමනය ඉතා නිවැරදි බැව් එම පේසා වළලු නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වේ . එනම් ක්‍රි.පූ. සමයට අයත් බ්‍රාහ්මී ලිපි සහ සංකේත සහිත සුදු ගල් පුවරු ගණනාවක් ම පේසාවක් මත අතුරා තිබී හමු විය. ඒවායේ ඇත්තේ ඒවා පිදූ අයවලුන්ගේ නාම හා ඔවුන්ට අයත් සංකේත බව පැහැදිලි විය. මේවා අතර ඇති ඇතැම් සංඥා නාම දුටුගැමුණු රජුගේ යෝධයන්ට හා ඔවුන්ගේ ඥාති වරුන්ට අයත් බව පෙනීයයි. බිල්ලාටිනාග රාජ්‍ය සමයේ දී (ක්‍රි.පූ. 109-103) එතුමා මහා ථූපයේ හාත් පස වැලිමළුව කෙලවරෙහි සීමා පවුර කරවූ බව කියැවේ. (මහාවංසය 1967: 33, 31) මෙම සඳහනට අනුව අපට පෙනෙන්නේ මහාථූපයේ වැලි මළුව හා සීමා පවුර දාගැබ ඉදිවීමෙන් පසු කාලයේ දී ඊට එකතු වූ බවය. මෙහි වැලි මළුව සාදන ලද්දේ බිල්ලාටිනාග රජු විසින් ම දැයි පැහැදිලි නැතත් ඔහු සීමා පවුර කරවන අවස්ථාවේදී ම වඩාත් පිළිවෙලකට වැලි මළුව තනන්නට ඇතැයි සිතිය හැකි වේ. අනෙක් අතින් වැලි මළුව පිළිබඳව සඳහන් වන හෙයින් දාගැබ පිහිටි මළුව ඒ වන විට ගල් හෝ ගඩොල් අතුරා තිබෙන්නට ඇත. වැඩි වශයෙන් අපට අනුමාන කළ හැක්කේ ගඩොල් ඇතුරුමක් තිබුණු බවය. අභයගිරිය, ජේතවනය, හා තිස්සමහාරාමයේ තිස්ස දාගැබෙහි මළුවේ කරන ලද කැනීම් වලින් සලපතල මළුවට යටින් ගඩොල් ඇතුරුමක් තිබූ බවට සාධක ලැබුණි. මේ හැර එතරම් ප්‍රතිසංස්කරණයන්ට ලක් නොවූ නැගෙනහිර පළාතේ සෝමාවතී දාගැබ් මළුවේ තවමත් මෙම ගඩොල් ඇතුරුම දැකගත හැකි වේ. භාතිකාභය රජු විසින් මහාථූපයේ කරන ලද පූජාවන් හා සම්බන්ධ තොරතුරු වලින් ද අපට රුවන්වැලි දාගැබෙහි යම් යම් වාස්තු විද්‍යාත්මක අංග පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකි වේ. මෙම රජු හා සම්බන්ධ තොරතුරු මහාවංසයේ හා දීපවංශයේ බෙහෙවින් සමාන ආකාරයෙන්

වාර්තා වී ඇත. වංශකතාවේ කියැවෙන පරිදි රජු දාගැබ ප්‍රදක්ෂිණා කොට වන්දනා කිරීමේ දී භික්ෂූන් පිරිත් සජ්ඣායනා කරන හඬක් ඇසී එය ධාතු ගර්භය තුළින් යැයි සිතා ධාතු ගර්භය තුලට යාමට සිත් උපදවා ඒ තුලට ගොස් වන්දනා කළ බවත් පසුව විශාල පූජාවක් කළ බවත් සඳහන් වේ. (දීපවංසය 1970: 21, 1-21 ., මව 1967: 34, 41-59) ඔහු විසින් කළ දාගැබ් පූජාව පිළිබඳව වංසකතා වල එන තොරතුරු අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ එතුමා තරම් විවිධාංග සහිතව කරන ලද පූජාවක් වෙනත් කිසිඳු රජ කෙනෙකු විසින් නොකළ බවය. මෙම වංසකතා සාධකවලට අනුව දාගැබ වෙත ලඟා වීමට සිව් දෙසින් සතර දොරටුවක් ද (දීපවංස 1970: 21, 3-5) ධාතු ගර්භය තුළට ඇතුළු වීමේ හැකියාව තිබීම. (එම: 21, 8-9 ., මහාවංසය 1967: 34, 50-51) ආදිය දැක්විය හැකිය. මේ සඳහා ශක්‍ර දෙවියන්ගේ හා රහතන් වහන්සේලාගේ මැදිහත් වීමක් සිදු වූ බවක් ද කියැවේ. ධාතු ගර්භ ධාතු තැන්පත් කර ගර්භය වසා දැමීමෙන් පසු එහි නැවත ඇතුල් විය හැකි මාර්ගයක් පිළිබඳව කිසිදු අවස්ථාවක සඳහන් නොවන අතර ම පුරාවිද්‍යාත්මක වශයෙන් ද එබන්දකට සාධක හමු වී නැත. කෙසේ වෙතත් මෙය විශේෂ සිද්ධියක් බව සඳහන් කළ යුතු වේ. රජතුමා ධාතු ගර්භයට ඇතුල් වී එහි ඓශ්වර්යයන් බලා පිටතට පැමිණීමෙන් පසු එම දර්ශනය පෙතිකඩ චිත්‍ර වලට නගා දාගැබට පිදූ බව සඳහන් වීම වැදගත් වාර්තාවකි. (මහාවංසය 1967: 34, 51) දාගැබ හා සම්බන්ධ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් පිළිබඳව සැලකීමේ දී දාගැබ් මළුව වටා ප්‍රාකාරයක් තිබූ බවත් , ඊට එකතුවන ජලය පිටවීම සඳහා පවුර හරහා සොරොව් සකසා තිබූ බව ත් පැහැදිලි වේ. (එම: 34, 55 ., දීපවංස 1970: 21, 14-15) මෙයින් පැහැදිලි වන කරුණු කීපයක් තිබේ. එනම් දාගැබ පිහිටි මළුව වටා පවුරක් තිබීම , මළුව විශාල හෙයින් ජලය විශාල ප්‍රමාණයක් එක් රැස් වීම හා ඒවා ක්‍රමානුකූලව පිට කිරීමට ක්‍රම සකසා තිබීම,

තවමත් මෙබඳු සොරොව් මිරිසවැටිය, ලංකාරාමය, අභයගිරිය හා ජේතවන සලපතල මළුවල දැකගත හැකි වේ. රුවන්වැලි දාගැබ් මළුව

ප්‍රතිසංස්කරණ කටයුතු කර ඇති හෙයින් කොතෙක් දුරට මුල්ම ස්ථාන වල ඒවා පිහිටියේදැයි කිව නොහැකිය. දීපවංසයට හා මහාවංසයට අනුව මළුවේ වූ මෙම සොරොව් අවුරා එම නල **තලතෙල් හා මී තෙල්** දමා පුරවා පටපිළි වැටි වලින් පහන් දැල්වූ බව සඳහන්ය. (දීපවංසය 1970: 21, 14 ., මහාවංසය 1967: 34, 55) මෙය එක් වර ම් අපට හිතෙන්නේ සොරොව් අවුරා මළුව මත තෙල් පුරවා පහන් දැල්වූ බවකි. එහෙත් වංසකතාවේ විස්තර කරන්නේ තෙල් පුරවන ලද සොරොව් අවුරා ඒවා දැල්වූ බවය. මේ සෑම සොරොව්වකම පාහේ මළුව මත ගිල්වන ලද සතරැස් අවාටයක් වේ. නැතහොත් ගලින්ම කළ සොරොව්වල ආවාටයක් වේ. එම ආවාට වලට තෙල් පුරවා අවශ්‍ය නම් ඉතා පහසුවෙන් දැල්විය හැකි වේ. මෙම දාගැබ්වල එක් පැත්තක මෙබඳු ආවාට සහිත සොරොව් 10 ක් 12 ක් පමණ වේ. මේවායේ තෙල් පුරවා පහන් දැල්වීමෙන් විශාල ආලෝකයක් ජනිත කරවා ගැනීමේ හැකියාව ද ලැබේ. රුවන්වැලි දාගැබ් මළුවේ සිංහ මුඛයක් සහිත ජලය පිටවන පැරණි ජල මාර්ග කීපයක් ම වේ. රුවන්වැලි දාගැබට එකතු කළ අංග අතර භාතිකාභය රජු මහාථූපයේ වේදිකා දෙකක් කර ඇත. (එම: 34, 39) මෙම වේදිකා දෙක කවරේදැයි විස්තර කරන මහාවංස ටීකාව එය **කුච්ඡවේදිය** හා **මුද්ධවේදිය** යයි දක්වා ඇත. (වංසත්ථප්පකාසිනී 1994: 506 ) පරණවිතාන මහත්මා දීර්ඝ විගයෙන් කරුණු දක්වමින් **කුච්ඡවේදිය** යනු දාගැබ් ගර්හය හා සම්බන්ධ මුදුන් පේසාව වටා යොදන ලද වැට අදහස් කෙරෙන බවත් මුද්ධවේදි යනු දාගැබ මුදුනේ හතරැස් කොටුව අවුරා කරන ලද වේදිකාව බව පෙන්වා දෙයි. මෙම ලක්ෂණ දෙක ඉන්දියාවේ සාංචි ස්තූපයේ තවමත් පැහැදිලිව දක්නට ලැබෙන බව එතුමා වැඩි දුරටත් සඳහන් කරයි. (පරණවිතාන 1963: 15, 25) දැලිවල කොටවෙහෙරෙන් ලද කුඩා රන් කරඬුව අධ්‍යයනය කිරීමෙන් මෙම නිර්මාණාත්මක අංග වඩාත් හොඳින් තේරුම්ගත හැකි වේ. (පරණවිතාන 1964: 5 චිත්‍රය ඉ) සම්මෝහ විනෝදනියේ කුච්ඡි වේදියේ හා ඉන් පහළ වේදිකා දෙකෙහි මල් පිදූ භික්ෂුවක් ගැන කියැවෙන කතා පුවතක් ද වේ. (සම්මෝහවිනෝදනී 1923: 205) මේ අනුව මෙම වේදිකා සාමාන්‍ය ජනයා කෙසේ වෙතත් භික්ෂූන් වහන්සේලාවත් මල් පිදීමට හා දාගැබ



CamScanner

ප්‍රදක්ෂිණා කිරීමට යොදාගත් බව පෙනියයි.  මේ රජු **පාපිළිකඩ** යනුවෙන් නවත් අංගයක් දාගැබට එක් කොට ඇත. එය පාලි මහාවංසයේ **පාදවේදිකා** යනුවෙන් හඳුන්වා ඇත. (මහාවංසො 1959: 34, 41) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ මින් අදහස් කර ඇත්තේ දාගැබ් පාදයේ ඉදිකළ ගරාදි වැටක් පිළිබඳව ය. එය පිහිටි ස්ථානය නිශ්චිතව ම සඳහන් කිරීම මදක් දුෂ්කර කරුණක් වන බවත් එය දාගැබ වටා දිවෙන සලපතළ පැදකුණු මළුව සීමා කොට ඉදිකරන්නට ඇතිබවය.  (පරණවිතාන 1963: 57) භාතිකාභය රජු දාගැබ මත ජත්‍ර නැංවීම ද  කළ අතර (මහාවංසය 1967: 34, 41-44)  හුණු ගැල් සියයක් මුතු හා තල තෙල් සමග මිශ්‍ර කොට දාගැබේ ආලේප කරන ලද  බවත් සඳහන්ය. (මහාවංසය 1967: 34, 46) මෙහි ඇති අනෙක් විශේෂ සඳහන වන්නේ  දාගැබට බටහිර දිශාවෙන් වූ වැවකින් යන්ත්‍රයක් මගින් ගන්නා ලද ජලය රුවන්වැලි දාගැබ මත ඉසිමින් පූජාවක් කරන ලද බවයි. මහාවංසයෙහි මෙම වැව **අභයවාපී** නමින් හඳුන්වා ඇතත් ( එම: 34. 45) දීපවංශයේ සඳහන්ව ඇත්තේ **තිසා වැවෙන්** ජලය ගත් බවයි. (දීපවංසය 1970: 21, 17) නමුත් මහාවංසයේ එන අභය . වැව හෙවත් වර්තමානයේ බසවක්කුලම නමින් හඳුන්වන වැව මේ සඳහා උපයෝගී කර ගන්නට ඇතැයි අනුමාන කළ හැකි වුවත් සීහලවත්ථුවේ එන කතා වස්තුවක සද්ධාතිස්ස රජු ද තිසා වැවේ ජලය යන්ත්‍ර වලින් රුවන්වැලිය මත වැගිරෙන්නට සැලැස් වූ බැව් කියැවේ. (බුද්ධදත්ත හිමි 2003:- 122) මෙයින් අපට පැහැදිලි වන කරුණක් වන්නේ දාගැබ් ඉදිකිරීම් කටයුතු වලදී ද අවශ්‍ය වූ  විශාල ජල ප්‍රමාණය මෙබඳු යන්ත්‍ර මාර්ග වලින් ඒ ඒ තැන් වලට සම්පාදනය කරගන්නට ඇති බවය. ඉදිකිරීම් කාර්යවලියේ දී ජලය ද ප්‍රධාන සාධකයක් බව අමතක නොකළ යුතු වේ. භාතිකාභය රජතුමා මහාථූපය අවට යොදුනක මානයේ භූමියේ විවිධ මල් වර්ග ආදිය වවා අලංකාර ලෙස පවත්වා ගෙන ගිය බව ද සඳහන්ය. (මහාවංසය 1967: 34, 41)

මහාදාඨික මහානාග ( ක්‍රි.ව. 7-19 ) රාජ්‍ය සමයේ දී දාගැබ් මළුවේ කිඤ්චික්ඛ පාසාණ ඇතිරවීම හා  වැලි මළුව විශාල කරවා එහි



CamScanner

සීමාවක් ද සකසා ඇත. ( එම: 34' 70 ) රුවන්වැලි මළුවෙහි ගල් ඇතිර වූ බවට අපට ලැබෙන පළමු සඳහන වන්නේ මෙයයි. මහාවංසය සඳහන් කරන **කිඤ්චික්ඛ පාෂාණ** ඇතිරීම යනු කුමක්දැයි උගතුන්ගේ විමසුමට ලක්ව ඇත. මේ පිළිබඳව අදහස් දක්වන ඒ. ඇස්. හෙට්ටිආරච්චි මහත්මා සඳහන් කරන්නේ ඇතැම් මහාවංස සංස්කරණවල මෙම වචනය **කිඤ්චක්ඛ පාසාණ** යනුවෙන් ඇති බවත් එහෙත් **කිඤ්ජක්ඛ පාසාණ** යන්න වඩා නිවැරදි බව සඳහන් කරයි. (Ez VI 1943: 161) පරණවිතාන මහත්මා **කිඤ්චික්ඛ පාසාණ** යන වචනය ම ගෙන මහාවංස ටීකාවේ මෙම වචනය සඳහා දෙන අර්ථ ද සැලකිල්ලට ගනිමින් මින් අදහස් කරන්නෙ රුවන්වැලි දාගැබේ පේසාව ආසන්නයේ සිට අඩි 25 ක් පමණ පිටට විහිදෙන ගල් ඇතුරුම බව හඳුනා ගනී. (පරණවිතාන 1963: 56) හෙට්ටිආරච්චි මහත්මා ද පරණවිතාන අදහස ම ගෙන ඇති බවක් පෙනීයයි. (Ez VI 1943 : 162) පරණවිතාන මහත්මා වැඩි දුරටත් සඳහන් කරන්නේ දාගැබ අන්තයේ සිට පිටට විහිදෙන පරිදි නයිස් ගල් පුවරු අතුරුවා මෙම කිඤ්චික්ඛ ගල් ඇතුරුම කර ඇති බවය. මෙම වචනය විස්තර කරන මහාවංස ටීකාවේ

***"සෙල්මුවා පේසා වලල්ලට යටින් කිංජල්ක පාෂාණමය ගඩොළුවට අනතුරුව පුබුදු පියුම් නෙලූ කිංජල්ක පාෂාණමය පුවරු ඇතිරවී යන අර්ථයයි."***

*(වංසත්ථප්පකාසිනී 1994: 510)*

පාලි පාඨයට අර්ථදීම ඉහත ආකාර වුව ද පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ පද්මයක් විකසිත වන්නාක් මෙන් වේදිකාවෙන් පිටතට විහිදෙන පරිද්දෙන් ගල් පුවරු ඇතිරීම මින් අදහස් කළ බවත් (පරණවිතාන 1963: 56) මුල් ම සමයේ දී අඩි 25 ක් තරම් පළල මෙම ගල් ඇතුරුම පමණක් දාගැබ වටා අතුරා තිබූ බවත් ඉන් පිටත කොටස වැලි අතුරා තිබූ බවය. ( එම: 56) එහෙත් මෙම මළුව ගඩොල් වලින් අතුරා තිබූ බවට මීට පෙර අප විසින් සාධක සහිතව ඉදිරිපත් කොට ඇත. අනෙක් අතින් ඉහත ඉදිරිපත් වූ වංසකතා සාධකවලින් ද මළුවේ ගඩොල් අතුරා තිබූ බවට යම් ඉඟියක් ලැබේ.

එනම් මහාවංස ටීකාවේ එන

***" කිඤ්චක්ඛ පාසාණෝති සිලා පුප්ඵාධානස්ස හෙට්ඨා කිඤ්චික්ඛ යිට්ඨකස්සානන්තරං පදුම විකසිත කිඤ්චික්ඛ පාසාණෙ අත්ථාරපයති අත්ථො "***

(Vansattappakasini 11 1936: 634)

මෙහි එන **කිඤ්චික්ඛ යිට්ඨකස්සානන්තරං** යන්නෙහි **කිඤ්චික්ක ගඩොල අතරෙහි** යන අරුත් වේ. මේ දැනට වැලි කොන්ද වශයෙන් හඳුන්වනු ලබන ගල විය හැකිය. එය ගඩොලින් ඉදිකර තිබූ බව ඉන් අදහස් වේ. එසේ නම් ඒ හාත්පස බිම ද ගඩොල් අතුරා තිබුනේ යැයි සැක කිරීමට හේතුවක් නැත. එය එසේ ම වන්නට ඇත.

බොහෝ දාගැබ්වල කිඤ්චික්ඛ ගල් ඇතුරුම් කොටසෙහි මුල් සමයට අයත් ලිපි පිහිටා තිබීමෙන් පෙනී යන්නේ මෙම කොටස සෑම දාගැබක ම පාහේ වඩාත් පැරණි ඉදිකිරීමක් බවයි. මිරිසවැටිය, අභයගිරිය, දක්ඛිණ ථූපය ආදිය වඩාත් උදාහරණ සපයයි. එහෙත් ජේතවන දාගැබෙන් එබඳු සාධක හමු නොවේ. අමණ්ඩ ගාමිණී රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 19-29) එතුමා මහාථූපයෙහි අලංකාර ලෙස ඡත්‍ර මත්තෙහි ඡත්‍ර නැංවූ අතර. පාදවේදිය හා උද්ධවේදිය නිමවා ඇත. (මහාවංසය 1967: ·35, 2) මෙහි ඡත්‍ර කීයක් නැංවූයේ දැයි සඳහන් නොවෙතත් කීපයක් නංවන්නට ඇතැයි අනුමාන කළ හැකි වේ. මුල් සමයේ දී එක් ඡත්‍රයක් පමණක් තිබුනේ වුව ද මේ රජු විසින් එකිනෙක මත අනුක්‍රමයෙන් කුඩා වන පරිදි මෙම ඡත්‍ර නැංවීම සිදුකරන්නට ඇත. මෙබඳු සම්ප්‍රදායක් අතීතයේ දී තිබුණ බවට සාධක අපට දාගැබ් සලපතළ මළුවල අතුරා ඇති ගල් පුවරුවල පැරණි දාගැබ් ආකෘතීන් දක්වන රේඛා සටහන් මෙන් ම පැරණි කරඬු ද දැක්විය හැකි වේ. රුවන්වැලියේ උතුරු හා නැගෙනහිර ආයක අතර මළුවේ ඔබ්බවා ඇති සිරිපතුල් ගලක් මත මෙබඳු ස්තූප සටහන් 4 ක් ඇත. මින් 3 ක් ම ඡත්‍ර සහිත ඒවා වන අතර එකක් මත එකක් වන සේ ඡත්‍ර කීපයක්ම නංවා ඇත. මේ හැර අභයගිරියේ බටහිර ආයකය කැනීමෙන් ලද විදුරු කරඬුව ද ඡත්‍රාවලියකින් යුක්ත වේ. මෙම විදුරු කරඬුව දැනට අභයගිරි කෞතුකාගාරයේ වේ.

ඉහත දැක්වූ පරිදි අමණ්ඩ ගාමිණී රජු මහාථූපය වෙනුවෙන් කරන ලද අමතර කාර්යයන් දෙක වන්නේ **පාදවේදිය** හා **උද්ධවේදිය** නිර්මාණය කිරීමයි. මීට පෙර ද භාතිකාභය රජු විසින් මෙම අංග දෙක ඉදිකළ බව මහාවංශයේ සඳහන්ය. (මහාවංශය 1967: 34, 39 - 41., වංසත්ථප්පකාසිනී 1994: 506) පහත මළුවේ වැට හා ගර්භය මත සැකසුනු වැට මින් අදහස් කෙරෙන බව පරණවිතාන මහත්මා සඳහන් කරයි. (පරණවිතාන 1963: 15, 25, 57) මෙම වැට දැවයෙන් සකසා තිබූ හෙයින් නිතර නිතර ප්‍රතිසංස්කරණයන්ට ලක්වන්නට ඇතැයි සිතිය හැකිවේ. කල්යත් ම ස්ථිරව පවත්නා ලෙස ගඩොලින් ම සතරැස් කොටුව බැඳීමේ දී ද උද්ධවේදියේ එනම් ලී වැටෙහි ආකෘතිය ම ඒ සඳහා ගෙන තිබීම මෙහි විශේෂ ලක්ෂණයකි. මෙම නිර්මාණය අභයගිරිය, ජේතවනය ආදී දාගැබ්වල ඉතා පැහැදිලිය. මේ හැර කුච්ඡවේදිය යයි ඉහත අවස්ථාවක දී හැඳින්වූ දාගැබෙහි ජේසා වළල්ලට සම්බන්ධව ඉදිකළ වැටෙහි ආකෘතිය ද රුවන්වැලි දාගැබෙහි පහත ජේසාවේ ඇති වැටෙහි ආකෘතිය සහිත ගල් පුවරු ද මීට කදිම උදාහරණ වේ.

වසභ රජතුමා කීර්තිමත් රජ කෙනෙකු වුව ද එතුමා මහාථූපය වෙනුවෙන් කළ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීමක් හෝ ප්‍රතිසංස්කරණයක් පිළිබඳව සඳහන් හමුනොවේ. එහෙත් එතුමා සෑගිරි විහාරය, ථූපාරාම චෛත්‍යය, මහාථූපය හා මහ බෝ ගෙය යන තන්හි දහසක් පහන් පූජාවන් කරවූ බව කියැවේ. (මහාවංශය 1967: 35, 79- 80) I වන සිරිනාග රජතුමා (ක්‍රි.ව. 189-209) මහාථූපය රුවන් මල් දමින් පූජා කළ අතර ථූපයේ ඡත්‍රය ද කරවූ බව දීපවංසයේ සඳහන්ය. (දීපවංසය 1970: 22, 35) කඹුරුපිටියේ වනරතන හිමියන්ගේ අදහස වන්නේ මෙම සිද්ධිය ද ස්වර්ණමාලී නමින් මහසෑය හැඳින්වීමට ප්‍රමාණවත් සාධකයක් විය හැකි බවය. (වනරතන හිමි 1970: 72) එහෙත් මෙම අදහස කොතෙක් සාධාරණ දැයි කීම දුෂ්කරය. සංඝතිස්ස රජතුමා (ක්‍රි.ව. 243-247) විසින් මහාථූපයේ උපරිභාගයේ කරන ලද කර්මාන්ත කීපයක් ගැන දීපවංසයේ හා මහාවංසයේ කරුණු සඳහන්වඇත. (දීපවංසය 1970: 22, 46-50., මහාවංසය 1967: 36, 65-67) මෙම මූලාශ්‍ර දෙකෙහි ම එන පොදු කරුණු



CamScanner

වන්නේ දාගැබ මත ස්වර්ණමය ඡත්‍ර කරවීම හා මාණික්‍යමය ශිඛා ධූපයක් කරවීම ය. මෙම කරුණ මහාවංසයේ සඳහන්ව ඇත්තේ සුවහසක් (ලක්‍ෂයක්) වටිනා වජ්‍ර චුම්බටකයක් ධූපය මුදුනෙහි තැබූ බවය. (මහාවංසය 1967: 36, 66) එය වැඩි දුරටත් විස්තර කරන මහාවංස ටීකාවෙහි **වජ්‍ර චුම්බටකයට** පහතින් සෙණ උවදුරු මඩිනු පිණිස දරණුවක් වැනි අගනා වීදුරුමුවා සුඹුළුවක් ද පිදූ බව කියැවේ. (වංසත්ථප්පකාසිනී 1994: 538 ) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දාගැබ මත පිහිටුවන ලද මෙම පළිඟු වළල්ල කහවනු දග ලක්‍ෂයක් වූ බවය. (පරණවිතාන 1963: 32) එහෙත් මහාවංසය හා එහි ටීකාවේ සඳහන් වනුයේ **සුවහසක් වටිනා** යනුවෙනි. එනම් එහි වටිනාකම **ලක්‍ෂයක්** වන්නේ ය. කෙසේ වෙතත් එතුමාගේ අදහස වන්නේ විදුලි කෙටීමෙන් දාගැබ මත වූ මාණික්‍යයට සිදුවන හානිය පළිඟු වළල්ලෙන් වැලකී යන්නට ඇති බවය. (එම: 32) මේ හැර මහාවංසය විස්තර කරන පරිදි සංඝතිස්ස රජතුමා ලක්‍ෂයක් බැගින් වටිනා අගනා මැණික් සතරක් මුද්ධවේදියේ (සතර පැත්තෙහි වූ) සූර්ය ප්‍රතිබිම්බවල මැද ඔබ්බවනු ලැබීය. (මහාවංසය 1967: 36, 66- 67) සංඝතිස්ස රජුගේ සොයුරු සංඝබෝධි හෙවත් සිරිසඟබෝ රජු (ක්‍රි.ව. 247-249) ලක්දිව හටගත් නියං සායකින් ජනතාව බේරා ගැනීම සඳහා වර්ෂාව ඉල්ලා අධිෂ්ඨාන කොට වර්ෂාව වැස තමා දියෙහි ඉල්පෙන තරමට ම නොවසින්නේ නම් තමා මිය ගිය ද නොනැගිටින්නේ යැයි  මහ සෑ මිදුලේ වැතුරුණු බව කියැවේ. (එම: 36, 75-76) මෙම අධිෂ්ඨානය හේතු කොට ගෙන වර්ෂාව ලැබුණු අතර ඇමතිවරු මළුවේ දිය බැස යන ජල සොරොව් අවුරා රජු දියෙහි ඉල්පුනු කල ඉන් නැගිටගත් බව වැඩිදුරටත් කියැවේ. මින් පැහැදිලි වන කරුණක් වන්නේ භාතිකාභය රාජ සමයේ සිට ම මළුවෙහි ක්‍රියාත්මක වෙමින් තිබූ දිය සොරොව් සිරිසඟබෝ රාජ්‍ය කාලය වන විටත් ක්‍රියාත්මක වෙමින් තිබුණු බවය. අනෙක් අතින් ජල සොරොව් වැසීමෙන් පසු ජලය පිරෙන්නට ඇත්තේ මළුව මත ගඩොල් වැනි යමක් අතුරා තිබූ නිසාවෙනි. මීට පෙර මහාදාඨික මහානාග රාජ්‍ය සමයේ දී දාගැබ ආසන්නයෙහි කොටස්



CamScanner

ගල් පුවරු අතුරා තිබූ බව අනාවරණය විය. ඉන් පිටත තොටිය ලෙ ඩන විට වැලි අතුරා නොතිබුණ බව සංඝබෝධි කුමාරයාගේ ක්‍රියාවලියෙන් ද පැහැදිලි වේ. I ජෙට්ඨතිස්ස රජු (ක්‍රි.ව. 263-273) මහාථූපයට මාහැඟි මැණික් දෙකක් පිදූ බව සඳහන්ය. (මහාවංසය 1967: 36, 126) මේවා කුමක් සඳහා පුදන ලද්දේදැයි පැහැදිලි නැත. ධාතුසේන රජුගේ (ක්‍රි.ව. 455-473) කාර්යයක් විස්තර කරන මහාවංසය එතුමා මහ සෑ තුනෙහි දිරා ගිය ඡත්‍ර කරවූ බව වාර්තා කරයි. (එම: 38, 54-55) මහ සෑ තුන යනුවෙන් මෙහි අදහස් කර ඇත්තේ රුවන්වැලිය, අභයගිරිය හා ජේතවනයයි. මෙම ඡත්‍ර ලී වලින් සකසා තිබූ බව මෙල කරුණු වලින් අනුමාන කළ හැකි වේ. මහානාග රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 569-571) එතුමා මහාචේතිය තුනෙහි හුණු ආලේප කොට **චුම්බටකය** ද හස්ථිවේදිය ද එවායේ චිත්‍ර කර්ම ද කරවිය. (මහාවංසය 1959: 40, 95) සිංහල මහාවංසයේ **චුම්බටක** යන වචනය සඳහා කොත් කැරලි යන තේරුම දී ඇත. මෙය නිවැරදි යෙදුමක් නොවේ. චුම්බටකය යනු පළිගු වළල්ලක් බඳු වස්තුවක් බව පරණවිතාන මහත්මා විසින් හඳුනා ගන්නා අතර මීට පෙර ද සංඝතිස්ස රජතුමා විසින් මහාථූපයේ වජ්‍ර චුම්බටකයක් සවි කිරීමක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නට යෙදුනි. මෙහි එන **හස්ති වේදිය** යන ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව පවතී. මීට පෙර අපට **හස්ති ප්‍රාකාර** යන වචනය නැතහොත් වාස්තු විද්‍යාත්මක අංගය හමු වුවද **හස්ති වේදි** යන වචනය හමු වූයේ මහානාග රාජ්‍ය සමයේ දී ය. ස්මිදර්ගේ හා මහාචාර්ය ගයිගර්ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ හස්තිවේදි යනු මෙම දාගැබ් වල ඉහළ පේසාවේ අඩියක් පමණ පිටට නෙරන සේ අඩි 6, අඟල් 3 ක් පමණ සමාන පරතරයකින් යුතුව තැන්පත් කර ඇති ඇත් හිස් සම්බන්ධ කොට තනන ලද වැටයි. රුවන්වැලි දාගැබේ ඉහළ පේසාවේ තිබුණු මෙම ඇත් හිස් මෑතදී කරන ලද ප්‍රතිසංස්කරණ වලදී ඉවත් කරන ලදැයි පරණවිතාන මහත්මා කනස්සල්ල පලකර ඇති අතර ම එවා නිවැරදිව සැලසුම් ගත කර වාර්තා කර තැබූ ස්මිදර් මහත්මාට ස්තුතිය ද පල කර ඇත. (පරණවිතාන 1963: 15) අභයගිරි දාගැබෙහි කරන ලද කැනීම්වල දී හමුවුනු

හත්ථිවේදියට අයත් ඇත් හිස් 3 වන පේසාව මත මීටර් 3 ක නියත පරතරයකින් පිහිටුවා ඇති බවට සාධක ද හමුවී ඇත. මහානාග රජුගෙන් පසු වංසකතාවල හත්ථිවේදිය පිළිබඳව තොරතුරු අපට හමු නොවේ.

මෙයින් පසුව 1 වැනි අග්ගබෝධි රාජ්‍ය සමයේ දී එතුමා (ක්‍රි.ව. 571-604) මහාථූපයෙහි සූවිසි බරක් ඇති රන්මුවා ඡත්‍රය කරවූ බව කියැවේ. (මහාවංසය 1967: 41, 33) එහෙත් විසිහතර බර කවර මිණුම් ඒකකයෙන් දක්වන ලද්දේ දැයි පැහැදිලි නැත. අග්ගබෝධි රාජ්‍ය සමයෙන් පසුව අපට ඡත්‍ර කිරීම් පිළිබඳව සාධක හමු නොවේ. කුඩා අග්ගබෝධි හෙවත් දෙවන අග්ගබෝධි (ක්‍රි.ව. 604-614) රාජ්‍ය සමයේ දී එතුමා අළුත් වස්ත්‍ර වලින් දාගැබ් තුන ම ආවරණය කොට මහා පූජා පැවැත්වූ බව කියැවේ. (මහාවංසය 1967: 42, 43-44) සිලාමේඝවණ්ණ රජු (ක්‍රි.ව. 619-628) සෑ තුනට ම සත්කාර කළ බව පමණක් වාර්තා කර ඇත. (එම: 42, 65) මෙම සත්කාර කිරීම යනු කවරාකාර එකක් දැයි වංසකතාකරු පැහැදිලි නොකරයි. එසේ ම දෙවන කාශ්‍යප රජු (ක්‍රි.ව. 650-659) මහ සෑ තුනෙහි ම මහ පූජා පැවැත්වූ බව කියයි. මල් වතු, පොල් වතු හා වැව් ද කරවා මේ දාගැබ් වලට පිදූ බව ද සඳහන්ය. (එම: 42, 147-148) 1 වැනි දප්පුල ( ක්‍රි.ව. 659 ) රජු ද තම කෙටි රාජ්‍ය කාලය තුල දී මහ දාගැබ් තුනට සත්කාර කළ බව කියැවේ. (එම: 46, 122) ධාතුසේන රාජ්‍ය සමයේ සිට ම සම්ප්‍රදායක් ලෙස බොහෝ රජවරු මහාචේතිය තුනට විවිධ පරිත්‍යාග හා පූජාවන් පැවැත්වීමේ ක්‍රමයක් පවත්වා ගෙන ගොස් ඇත. එහෙත් මෙම සම්ප්‍රදාය පිළිබඳ සාධක 1 වැනි දප්පුල රජුගෙන් පසුව වාර්තා වී නැත.

දෙවන උදය රජතුමා (ක්‍රි.ව. 887-898) තමන්ගේ අභිෂේකය කරන ලද්දේ රුවන්වැලි සෑ දාගැබ් මළුවේ දී වන අතර එම චාරිත්‍රය වර්ෂයක් පාසා කිරීමට රජතුමා විසින් ලියා තබන ලදී. (එම: 51, 82-83) රුවන්වැලි දාගැබ් මළුවමත දී රජුගේ අභිෂේකය සිදු කිරීමෙන් රජවරුන්ගේ පැවැති ශාසනික ගෞරවයත්, දේශපාලනමය වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ හා ජනතාවගේ අවධානය සහ පක්ෂපාතීත්වය



CamScanner

තමා කෙරෙහි ලබා ගැනීමත් අපේක්ෂා කළ බව සිතිය හැකිය. වර්ෂයක් පාසා මෙම චාරිත්‍රය ඉදිරියට පවත්වා ගෙන යා යුතු යැයි ලේඛනගත කිරීමෙන් පැහැදිලි වන්නේ අභිෂේකයෙන් පසු වසරක් පාසා සැමරුම් උත්සව රුවන්වැලි දාගැබ් මළුවේ පැවැත්විය යුතු බවය. එපමණක් නොව අනාගත රජවරු ද මෙම අභිෂේක චාරිත්‍රය ඉටුකළ යුතු බව ඉන් ගම්‍යකරයි. පස් වන කාශ්‍යප (ක්‍රි.ව. 914-923) රජුගේ සමයේ දී එතුමාගේ බිසවක වූ **රාජිනී** නම් කුමරිය රුවන්වැලි සෑය පට සැට්ටයකින් පිදූ බව කියැවේ. (එම: 52, 67-68) සිව් වන මිහිඳු රජු (ක්‍රි.ව. 956-972) රුවන්වැලි දාගැබෙහි පට සැට්ට පූජාවක් කරවා ගී, නැටුම්, සුවඳ විලවුන්, නොයෙක් මල් පහන් හා සුවඳ දුම් පූජාවෙන් මහා පූජා පැවැත්වූ බව කියැවේ. අනුරාධපුර අවසාන සමයේ දී රුවන්වැලි දාගැබෙහි සිදුකෙරුණු වාර්තාගත අවසන් පූජාව මෙය ලෙස දැක්විය හැකි ය. මෙයින් පසුව දකුණු ඉන්දියානු ආක්‍රමණයිකයින්ගේ ක්‍රියා කලාප හේතුවෙන් අභාවයට පත්වන රුවන්වැලි දාගැබ නැවත අවධානයට යොමු වන්නේ පොළොන්නරු යුගයේ සිංහල පාලකයන් යටතේ දී ය. මේ අනුව රුවන්වැලි දාගැබෙහි පැහැදිලිව ම ප්‍රතිසංස්කරණ කටයුතු වාර්තාගතව ඇත්තේ 1 වැනි පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රාජ්‍ය සමයේ දී ය. මහාවංසය රුවන්වැලි දාගැබෙහි කරන ලද ප්‍රතිසංස්කරණ හා පූජාවන් සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට උත්සහ දරා ඇත. අනුරාධපුරයේ වූ දෙමළුන් විසින් නසන ලද මෙම දාගැබ හා අනෙකුත් මහ දාගැබ් ද රජවරුන්ට ප්‍රතිසංස්කරණය කළ නොහැකි වූ නිසා වලසුන් දිවියන් වසන ගඩොල් හා මැටි ගොඩවල් බවට පත්ව වනගතව තිබූ බව සඳහන් වේ. (එම : 79, 100-106) රුවන්වැලි දාගැබ දෙමළුන් හා වෙනත් කර්මාන්ත ශිල්පීන් ද යොදවා ගනිමින් රජු විසින් ප්‍රකෘතිමත් කළ බව ද වාර්තා වේ. (එම: 76, 104-106) දාගැබෙහි කටයුතු භාරව එක් ඇමතිවරයෙක් කටයුතු කර ඇති අතර දාගැබ 120 රියනක් උසට බැඳ එය සුනු පිරියම් කළ බවත් හාත්පස භූමි ප්‍රදේශය මෙන් ම දාගැබ් මළුව ද ශුද්ධ කරවූ බව සඳහන්ය. (එම: 76, 101-106) මෙම කරුණු සත්‍ය බව එතුමා විසින් පිහිටුවන ලද රුවන්වැලි සෑ මළුවේ ඇති පුවරු ලිපියෙන් ද පැහැදිලි වේ. අනුරාධපුරයේ දී කරන ලද මෙම ප්‍රතිසංස්කරණය අතිශය භාරධූර



CamScanner

එකක් වූවාට කිසිඳු සැකයක් නැත. මේ සඳහා වැය කළ මුදල මෙන් ම මානව ශ්‍රමය ද ඉතා ඉහළ මට්ටමක තිබූ බව ද තීරණය කළ හැකි වේ. රුවන්වැලි දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු හමාර කිරීමෙන් පසු එහි කොත් පැළඳවීමේ උත්සවය සඳහා රජතුමා ඇමතියන් හා පිරිවර පිරිවරා අනුරාධපුරයට පැමිණ ඇති අතර ලංකාවේ විවිධ දිශා වලින් භික්ෂූන් වහන්සේලා ද රැස් කරවාගෙන ඇත. උන්වහන්සේලාට සිව් පසයෙන් සංග්‍රහ කරමින් නුවර ද අලංකාර කොට සරසා පූජාවන් පවත්වා දාගැබ මත රන් කොතක් පළඳවා ඇත. (එම: 76, 104-122)

පරාක්‍රමබාහු රජුගේ බිසවක වූ **කල්‍යාණවතී** බිසවගේ සමයේ දී **පිරිවතුබිම් විජයනාවන්** විසින් පිහිටවූ ශිලාලිපියෙහි ද රුවන්වැලි දාගැබෙහි කළ ඇතැම් ප්‍රතිසංස්කරණ හා පුද පූජාවන් පිළිබඳවත් සඳහන්ය. එසේ ම රුවන්වැලියේ පවත්වාගෙන ගිය තේවා කටයුතු මෙන් ම දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු කළ කර්මාන්ත ශිල්පීන් පිළිබඳව ද කරුණු අනාවරණය වේ. මෙහි ඇති විශේෂ සඳහනක් වන්නේ දාගැබ් මළුවෙහි සිට ථූපවංශ දේශනාව පැවැත්වීමයි. (Ez IV 1943: 256) මහාවංසයෙහි නිශ්ශංකමල්ල රජු පිළිබඳව හා ඔහුගේ ආගමික කාර්යයන් පිළිබඳව දීර්ඝ තොරතුරු ඉදිරිපත් නොවුන ද ශිලාලේඛනවලින් එතුමාගේ දේශපාලන හා ආගමික කාර්යයන් පිළිබඳ බොහෝ කරුණු අනාවරණයවේ. ඒ අනුව අපට නිශ්ශංකමල්ල රජුට අයත් ශිලාලේඛන කීපයකින් ම රුවන්වැලි දාගැබ පිළිබඳව කරුණු අනාවරණය කරගත හැකිව පවතී. එතුමා රුවන්වැලි දාගැබ වෙනුවෙන් කළ පරිත්‍යාග හා පූජාවන් රුවන්වැලි පුවරු ලිපියෙන් පැහැදිලි වේ. (Ez II 1985: 70) දාගැබෙහි කළ කිසිඳු ප්‍රතිසංස්කරණ කටයුත්තක් පිළිබඳව නොකියවෙන අතර රුවන්වැලි දාගැබ කෙරෙහි එතුමාගේ පැවති ගෞරවයත් ජනතාවට හා සත්වයන්ට ලබාදුන් ප්‍රතිලාභ ද මෙම ලිපියෙන් පැහැදිලි වේ. මෙම රජුට අයත් **වඳුරුප්පේ** ලිපියෙහි දී එතුමා සඳහන් කර ඇත්තේ රුවන්වැලි දාගැබ **පිහිටි රටට** පියුමක් බඳු බවයි. මේ නිසා ම තම අන්තඃපුර ස්ත්‍රීන්ට වන්දනා කිරීම පිණිස පොළොන්නරුවෙහි **රුවන්වැලි** නම් නව දාගැබක් කළ බවය. (Ez V 1966: 487) ගල්පොත ලිපියෙහි ද එතුමා අනුරාධපුර රුවන්වැලි මහ

සෑ වහන්සේට තිස් ලක්ෂයක් ධනය වියදම් කොට පූජා පැවැත් වූ බව සඳහන් කර ඇත. (Ez II 1985: 106) එම පූජාවන් අතර ගල් දාගැබක් කළ බව සඳහන්ව ඇති හෙයින් රුවන්වැලි මළුවේ ඇති කුඩා ගල් දාගැබ එතුමාගේ නිර්මාණයක් ලෙස සලකනු ලැබේ. (කුලතුංග 2001, 38) නිශ්ශංකමල්ල රජුගෙන් පසුව පොළොන්නරු යුගයේ දී රුවන්වැලි සෑය හා සම්බන්ධව කිසිවෙකුත් විසින් කරන ලද කාර්ය භාරයක් පිළිබඳව වංසකතා හෝ මූලාශ්‍ර සාධක හමුනොවේ. පොළොන්නරු යුගයේ අවසානයත් සමග ක්‍රමයෙන් මහියංගන ස්තූපය කෙරෙහි රජවරුන්ගේ අවධානය යොමුවන බවක් වංසකතා සාක්ෂි වලින් පැහැදිලි වේ.

දඹදෙණි සමයේ දී දෙවන පරාක්‍රමබාහු රජුගේ පුත්‍ර සිව් වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු (ක්‍රි.ව. 1270-1272) රජු තම පිය රජු විසින් ආරම්භ කොට නිමවාගත නොහැකි වූ රුවන්වැලි සෑයේ නව කර්මාන්ත කිරීම් සඳහා අනුරධපුරයේ සිට බැහැර ගොස් පදිංචිව සිටි ජනයා හා ශිල්පීන් වහාම ආපසු කැඳවා නව කර්මාන්ත කරවූ බවත්, **සේනානාථ** නම් පිරිවෙනක මහ තෙරුන්වහන්සේ නමක් ඇතුළුව මහා සංඝයා එහි නවත්වා නවකම් කරවාගෙන යාමට කටයුතු සැලැස්වූ බව කියැවේ. (මහාවංසය 1967: 88, 83-88) එම සමයේ දී අනුරාධපුරයේ සිද්ධස්ථාන වනගහනයට ලක්ව තිබූ බව වංසකතාගත තොරතුරු වලින් පැහැදිලි වේ. (එම: 88, 80-81) උඩරට රාජ්‍ය සමයේ දී ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (ක්‍රි.ව. 1707-1739) රජතුමා ද මහා පිරිස් ගෙන නුවරින් නික්ම අනුරාධපුරයට පැමිණ මහ පූජා පැවැත්වූ බව මහාවංසය වාර්තා කොට ඇත. (එම: 97, 33) එහෙත් අනුරාධපුරයේ කරන ලද ප්‍රතිසංස්කරණයන් හෝ වෙනත් ආගමික පූජා පිළිබඳව දීර්ඝව තොරතුරු ඉදිරිපත්ව නැත. දෙවන රාජසිංහ රාජ්‍ය සමයේ දී (ක්‍රි. ව. 1635-1687) අනුරාධපුර ප්‍රදේශය වනගහනයට ලක්ව තිබූ බවත් එම ප්‍රදේශයේ මලහාර ජනයා විසූ බවත් **රොබට් නොක්ස්** වාර්තා කරයි. (නොක්ස් 2004:- 28, 187) නායක්කර් වංශයට අයත් උඩරට පාලකයෙකු වූ විජය රාජසිංහ රජතුමා ද (ක්‍රි. ව. 1739 - 1747) අනුරාධපුරයෙහි මහ පූජා පැවැත්වූ බව වාර්තා වී තිබේ. (මහාවංසය 1967: 98, 87) කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ දී (ක්‍රි. ව. 1747-1781) එතුමා මහ පිරිවර පිරිවරා

අනුරාධපුරයට ගොස් බෝධීන්වහන්සේට හා චෛත්‍යයන්ට ඇත් , අස් ආදීන් ද රන් රිදී ආදියෙන් ද පුදා මහ පින් රැස් කර ගත්තේ යැයි මහාවංසය වාර්තා කරයි. (එම: 99, 36-38) එසේ ම මෙම රජුගේ සමයේ දී ලක්දිව උපසම්පදාව පිහිටුවීම සඳහා සියම් දේශයෙන් මෙහි වැඩම කළ උපාලි හිමියන් ප්‍රමුඛ දූත පිරිස මහියංගනය ඇතුළුව සොළොස්මස්ථාන වන්දනා කිරීම සඳහා වැඩම කළ බව කියැවේ. (එම: 100, 127) එසේ වුව ද කිසිඳු විටෙක අනුරාධපුරයට වැඩම කළ බව නොකියයි. සොළොස්මස්ථානවලට අනුරාධපුරයේ රුවන්වැලි දාගැබ ඇතුළු පූජ්‍යස්ථාන කීපයක් ම අයත් හෙයින් එම දාගැබ වන්දනා කරන්නට ඇතැයි අනුමාන කළ හැකි වේ. මෙය වඩාත් පිළිගත හැක්කේ මේ වන විටත් වැලිවිට සරණංකර හිමියන්ගේ ශිෂ්‍යවරයෙකු වූ **ඉළුපැන්ගමුවේ** සාමණේර නම අනුරාධපුරයට ගොස් එහි නැවතී හිඳිමින් ශ්‍රී මහා බෝධීන්වහන්සේ අබියස ඒ වටා ආරක්‍ෂිත ගල් ප්‍රාකාරය ඉදි කරමින් සිටි බව වාර්තා වී ඇති හෙයිනි. (සංඝරාජ සාධු චරියාව 1969: 34) ලංකාව බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසුව සමස්ථ ලංකාවේ ඇතිවුන සංවර්ධනයත් සමග අනුරාධපුර ප්‍රදේශය නැවත ක්‍රමයෙන් දියුණුවට පත්වන්නට විය. විශේෂයෙන් 1833 දී කෝල් බෲක් ප්‍රතිසංස්කරණයත් සමග නුවර කලාවිය දිස්ත්‍රික්කය පිහිටුවනු ලැබීම මේ සඳහා ප්‍රධාන සාධකයක් විය. (Mills 1964: 68) අනුරාධපුර දිස්ත්‍රික්කය පිහිටුවීමෙන් පසුව එහි කටයුතු සඳහා සහකාර ඒජන්තවරයෙකු පත්කොට තිබූ අතර ඔහු වෙනුවෙන් පවුම් 400 ක් වැය කළ බව ද වාර්තා වී ඇත. (එම: 82) මේ සමයේ දී භික්‍ෂූන් වහන්සේලා අනුරාධපුරයෙහි ස්ථිරව වැඩ වාසය නොකළ අතර අටමස්ථානය ඇතුළු පූජණීය ස්ථානවල ආරක්‍ෂකයන් වශයෙනුත්, භාරකාරත්වයත් දරණ ලද්දේත් **නුවරවැව වන්නියා** විසිනි. (උක්කුබණ්ඩා 1992: 22 ) කොළඹ හා දකුණේ ජනතාව වන්දනාමාන සඳහා නැවත අනුරාධපුරයට පැමිණීමත් එසේ ම මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි , අනගාරික ධර්මපාල, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි , වලිසිංහ හරිශ්චන්ද්‍ර ආදී ප්‍රභූවරුන්ගේ බෞද්ධ ප්‍රබෝධ වැඩපිළිවෙලත් සමග රුවන්වැලියෙහි නවීන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ උදාවක් ඇති විය. මෙහිදී වඩාත් ම වැදගත් කාර්යභාර්යක් ඉටු කරනු ලැබූයේ **නාරන්විට සුමනසාර** නම් හිමි නමක විසිනි. බ්‍රිතාන්‍ය ආණ්ඩුව

විසින් එක් අතකින් පුරාවිද්‍යාත්මක කාර්යාවලිය ක්‍රියාත්මක කරන අත දේශීය බෞද්ධ ජනතාව භික්ෂූන් වහන්සේලාගේ පුරෝගාමීත්වය පරිත්‍යාග ශීලීන්ගේ දායකත්වයත් ලබා ගනිමින් මෙම පූජ්‍යස්ථාන නැවත වන්දනා කිරීමට සුදුසු ස්ථාන බවට පත්කර ගැනීමේ විශාල මෙහෙවරක යෙදුනි. 1840 අංක 12 දරණ මුඩුබිම් පනත බෞද්ධයින් හට පූජ්‍යස්ථානවල අයිතිය ලබා ගැනීමට හා ඒවා සංවර්ධනය කිරීමට විශාල බාධකයක්ව පැවති හෙයින් ඒවා නිදහස් කර ගැනීමට ද අරගල කිරීමට සිදුවිය. (හරිශ්චන්ද්‍ර 2001: 92)

රුවන්වැලි සෑයෙහි නිත්‍ය වාසය සඳහා මෙන් ම දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 1872-පමණ නාරන්විට සුමනසාර හිමියන් පැමිණි බැව් වාර්තා වේ. (එම: 155) උන්වහන්සේට නැවතීමට සුදුසු ස්ථානයක් එහි නොවූ හෙයින් තාවකාලිකව සෑ මළුවේ එක් තැනක බරකරත්තයක අඹරාවක් පිහිටුවා එහි සයනය කරමින් වන්දනාව සඳහා එන ජනතාවගේ ද සහය ලබා ගනිමින් දාගැබ ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයෙහි යෙදුනු බැව් වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා විසින් සඳහන් කරයි. (එම: 155) එතුමා සඳහන් කරන පරිදි නාරන්විට සුමනසාර හිමියන් බැහැ දැකීමට එවකට ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ **ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි** රුවන්වැලි සෑය වෙත 1876 පෙබරවාරි මස 15 වැනි දින පැමිණ උන්වහන්සේගේ කටයුතු ගැන අතිශය පුදුමයට පත්ව ඇත. මෙම සමයේ දී එතුමා නාරන්විට හිමියන්ගේ කටයුතු ගැන පැහැදී ඊට පෞද්ගලික වශයෙන් මුදල් පරිත්‍යාගයක් හා එම කාර්යය ප්‍රශංසා කොට ලිපියක් ද උන් වහන්සේට දී ඇත. එම ලිපියේ සඳහන් කරුණු අතර වර්ෂ 3 කට පෙර ගඩොල් ගොඩක් මෙන් පැවැති දාගැබ කැලේ එළිකර තුන්මාල් පේසාවේ වැඩි කොටසක් ඇළුත්වැඩියා කර කටයුතු කරගෙන යන බැව් සඳහන් කොට ඇතැයි වාර්තා කර ඇත. (එම: 155) නාරන්විට හිමියන්ට ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා දුන් ලිපියේ සඳහන් වැදගත් ම වගන්තිය වන්නේ

***" මේ වැඩේට මම සම්මාදන් දුනිමි. එසේ කළේ ආගමානුකූල ගොඩනැගිල්ලක් හැටියට සලකාගෙන නොව ( සිංහල ) ජාතිය සිහිපත්***



CS CamScanner

***වීමට හේතු වූ අනර්ඝ ගොඩනැගිල්ලක් මෙන් සලකාගෙන බව දත යුතුයි. මෙ දාගැබ එනාහි පුරාතන සිංහලයන්ගේ උසස් ශිල්ප ශාස්ත්‍ර දැනීමේ උතුම් ප්‍රතිඵලයක් මෙන් ද ලක්දිව රාජාභිෂේකය ලත් ඉතා බලසම්පන්න ශ්‍රේෂ්ඨ රජතුමා සිහිපත් වීමේ ලකුණක් මෙන් ද පවතී."*** (එම: 156)

ආණ්ඩුකාරවරයා විදේශිකයෙකු මෙන් ම අන්‍ය ආගමිකයෙකු වුව ද එතුමා මෙම පරිත්‍යාගය සිදු කරන්නේ උත්තරීතර මිනිස්කමට බව ඉතා පැහැදිලිය. ඔහුට මෙය ආගමික මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත් නොවුවත් එය මුළු මහත් ලෝක ප්‍රජාවට ම උරුම ස්මාරකයක් ලෙස තේරුම් ගත් බව පැහැදිලි වේ. නාරන්විට හිමියන් පසුව දාගැබ පළුවෙහි ම නැගෙනහිර ආයකය ඉදිරිපිට ආවාස ගෘහයක් තනාගෙන දාගැබේ ඉදිකිරීම් කටයුතු පවත්වා ගෙන ගොස් ඇත. උන් වහන්සේ පළමුව රාමඤ්ඤ නිකායට අයත් භික්ෂූන් වහන්සේ නමක් වූ අතර අටමස්ථානාධිපති හිමියන්ගේ බලපෑම් මත පසුව සියම් නිකායට පැමිණි බවත් ඒ අනුව නාරන්විට හිමි රුවන්වැලියේ භාරකාර හිමියන් බවට පත් වූ බව ද පැවසේ. (කුලතුංග, 2001: 41) මේ පිළිබඳ ඉඟි කෙරෙන යම් යම් පැරණි ලිපි ලේඛන ද වේ. 1890 අටමස්ථානාධිපති ශ්‍රී සුමණ මේධංකර අනු නා හිමි හික්කඩුවේ සුමංගල හිමියන්ට යැවූ ලිපියකින් මෙ බව පැහැදිලි වේ. (පඤ්ඤානන්ද හිමි 1947: 648) 1902 දක්වා ම උන්වහන්සේ සැදැහැවතුන්ගේ ආධාර ලබා ගනිමින් දුක සේ දාගැබේ ඉදිකිරීම් කටයුතු කරගෙන ගිය අතර 1902 දී වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මාගේ උදව්ව ද ලබමින් **අනුරාධපුර රුවන්වැලි මහා චෛත්‍ය වර්ධන සමාගම** නමින් සංවිධානයක් පිහිටුවා දාගැබේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කරනුලැබ ඇත. (හරිශ්චන්ද්‍ර, 2001: 156) මෙම සමාගමේ සභාපති ධූරය දරණ ලද්දේ හරිශ්චන්ද්‍ර මැතිතුමා විසිනි. (ධම්මබන්ධු:මුද්‍රිත වර්ෂය නැත 121) දාගැබේ තුන්වන පේසාව ඉදිකිරීම 19 වැනි සියවසේ අවසන් භාගයේ දී හා 20 වන සියවසේ මුල් සමයේ දී සිදු වූ බව පේසාව මත අල්ලා ඇති තඹ තහඩු, රිදී තහඩු හා කුඩා ගල් පුවරු ලේඛන සාක්ෂි දරයි. ඒවායේ 1879-06-13 , බු:ව: 2455 (ක්‍රි:ව: 1912) 1914, බු:ව: 2458 (ක්‍රි:ව: 1915) ආදී වර්ෂ වේ. 1879 වර්ෂය දරණ තඹ තහඩු ලිපියක්



CamScanner

විලච්චිය කෝරලයේ **පාලුගොඩ උපාසකරාල** නැමැත්තෙකු විසින් තබා ඇත. එසේම බු:ව: 2455 (1912) දරණ තඹ තහඩු ලිපියක් ඉංග්‍රීසි භාෂාවෙන් ලියාතිබෙන අතර එම ලිපිය පානදුර **මාරියා සොයිසා** නැමැති අයෙකුට අයත්ය. මින් පෙනෙන්නේ දුර බැහැර දාන පතියන් මේ සඳහා දායකත්වය සපයා ඇති බවකි. දෙවන හා තුන්වැනි පේසාවන් නාරන්විට හිමියන්ගේ මැදිහත්වීමෙන් 1879 වන විටත් ප්‍රතිසංස්කරණය කටයුතු කරගෙන ගියබව මෙම ලේඛනවලින් පැහැදිළිවේ. ඉහත දක්වන ලද විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාර වරයාගේ ලිපියෙන් ද මේ බව පැහැදිලි වේ. නාරන්විට සුමනසාර හිමියන් එකල බෞද්ධ ජනතාව විසින් සලකා ඇත්තේ **ගාමිණී අවතාර** හෙවත් දුටුගැමුණු රජුගේ පුනරාගමණයක් ලෙසිනි. (ධර්මබන්ධු: 24) මෙයින් උන්වහන්සේට රටේ එදා තිබූ ගෞරවය පැහැදිලි වේ. එහෙත් අවාසනාවකට මෙන් උන්වහන්සේ විසින් තැබූ කිසිඳු සටහනක් රුවන්වැලි දාගැබ් පරිශ්‍රයෙන් සොයාගත නොහැකිවාක් සේම උන්වහන්සේගේ නාමය ද සම්පූර්ණයෙන් ම පාහේ අද අමතක කරදමා හෝ අමතකව ගොයිනි. රුවන්වැලි දාගැබෙහි ඉදිකිරීම්වල දී අතිවිශාල ධන පරිත්‍යාගයක් කරන ලද්දේ **අකුරැස්සේ හේනේගම සිටුගේ හෙන්‍රික් සිල්වා අප්පුහාමි** මහත්මා විසිනි. එතුමා 1922 දී රුපියල් දෙලක්‍ෂ පනස් දහසක මුදලක් පරිත්‍යාග කරන ලදී. (එම: 303-304 පිටු) මේ හැර **රන්සිරිනෙල් පෙරේරා** (ඇවරිවත්තේ වෙදමහත්මා) ද විශේෂ ධන පරිත්‍යාගයන් සිදුකර ඇත. (එම: 96) 1926 පමණ වන විට සලපතළ මළුව මත ඇති නව විහාර ගෘහය ඉදිකිරීමට පටන්ගෙන තිබූ අතර මළුවෙන් හමු වූ හිටි බුදු පිළිම 3 ද ප්‍රතිසංස්කරණය කර එහි තැන්පත් කොට තිබිණි. (Schroeder 1990: 560) කෙසේ වෙතත් 1939 වර්ෂයේ නොවැම්බර් 23 වැනි දින **ඩී. බී. ජයතිලක** හා **රත්වත්තේ දියවඩන නිලමේ** තුමන් විසින් රුවන්වැලි දාගැබේ කොත් පළඳවන ලද අතර එහි චූඩා මාණික්‍ය පැළඳවීම 1940 ජුනි 17 වැනි දින හා එය විවෘත කිරීම ජුනි 19 වැනි දින සිදු වී ඇත. මෙම චූඩා මාණික්‍යය බුරුම රටෙන් බුරුම ජාතික **විනයාලංකාර** හිමියන්ගේ මැදිහත්වීමෙන් ලංකාවට ලබා දී ඇත. දාගැබෙහි උතුරු ආයකයත් ඇත් පවුර ප්‍රතිසංස්කරණ කටයුතුත් 1946 දී රුවන්වැලි ප්‍රතිසංස්කරණ සමිතිය මගින් කරගෙන ගිය බවත් ඊට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේත් තරමක



CamScanner

මග පෙන්වීමක් ලබා දුන් බවත් පරණවිතාන සඳහන් කරයි. (පරණවිතාන 1972 -37-51) එතුමා වැඩි දුරටත් සඳහන් කරන්නේ ඇත් පවුර ඉදිකිරීමට අත්තිවාරම් කැපීමේ දී රන් ආලේපිත තඹ බුදු පිළිමයක් ඇතුළු නවත් පුරාවස්තු ගණනාවක් ම ලැබුණු බවය. එහි තිබුණු කාන්තාවකට අයත් ආභරණ අනුරපුර යුගයේ අගභාගයට හෝ පොළොන්නරු යුගයේ මුල් භාගයට අයත් යැයි අනුමාන කරයි. (මේවා රුවන්වැලි සෑ පන්සලේ ඇත) ආයකය සෑරීමේ දී ද විවිධ පුරාවස්තු ලැබුණු බවත් ඒ කටයුතු වල දී රුවන්වැලි සෑ ප්‍රතිසංස්කරණ සමිතිය එම පැරණි වාස්තු විද්‍යාත්මක අංග පිළිබඳව පුරාවිද්‍යාත්මක වටිනාකමක් නොසලකා ම කටයුතු කළ බව සඳහන් කරයි. මේ පිළිබඳව පරණවිතාන මහතා දැඩි කනස්සල්ල පළකොට ඇත. (එම: 40 - 41) සලපතළ මළුවේ ගල් ඇතිරීම ද අටමස්ථාන සමිතිය මගින් අභිමත පරිදි කළ බවක් පෙනී යයි.

සලපතළ මළුව මත සතර මූළු වල තනා ඇති කුඩා පරිවාර දාගැබ් ආසන්න ගල් ඇතිරවීම 1969 දී විවිධ ප්‍රදේශවල දායක භවතුන් විසින් කර ඇති බව ඒවායේ තබා ඇති සටහන් වලින් පෙනීයයි. ගිනිකොණ දිග දාගැබ අබියස ගල් ඇතිරීම 1969-01-13 වැනි දින සිට 1969-01-19 දින දක්වා අතර සතියක් පමණ කාලයක කළ ශ්‍රමදානයකින් **පොතුහැර** දායක පිරිසක් වසින් කළ බව එහි සිමෙන්ති බදාමය මත සටහන් කළ දින සටහන් වලින් පැහැදිලි වේ. නිරිතදිග කුඩා දාගැබ අසල ගල් අතුරනු ලැබූ දායකයින්ගේ නම් ගම් පැරණි ගල් පුවරු මත කොටා ඇත. **පල්ලේගම, කුඩා පල්ලේගම, උඩගම** ආදී ප්‍රදේශවල අයගේ නම් එහි ලියැවී තිබේ. දින සටහන්ව ඇත්තේ 1969 පෙබරවාරි මාසයට අදාලවය. ඇතැමුන්ගේ නම්වල කෙටි යෙදුම් පමණක් ඉංග්‍රීසි අකුරින් ද සටහන් කර ඇත. මෙම කුඩා දාගැබ්වල ප්‍රතිසංස්කරණ කටයුතු හමාර කොට ඒවායේ කොත් පළඳවා ඇත්තේ 1970 වර්ෂයේ දී අටමස්ථානාධිපති **හල්මිල්ලෑවේ සිරි සුමන රේවත** නා හිමියන් විසිනි. එවකට රුවන්වැලි සෑයේ භාරකාරත්වය දරා ඇත්තේ **පල්ලේගම සිරිසුමණ ධර්මරක්ෂිත** නා හිමියන් විසිනි. සලපතළ මළුව මත තිබූ පැරණි වාස්තු විද්‍යාත්මක අවශේෂ හා සාධක බොහොමයක් ම වරින්

වර කරන ලද ප්‍රතිසංස්කරණවල දී ඉවත් කර ඇති බව ස්මිදර් මහත්මාගේ සැලසුම් හා වාර්තා අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. 2000 වසරේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මහාවිහාර ව්‍යාපෘතිය මගින් රුවන්වැලි වැලි මළුවේ සිට ප්‍රාකාරය කැනීම් කොට මේවන විට සංරක්ෂණය අවසන්කොට ඇත.

## සලපතල මළුවේ අභිලේඛන

රුවන්වැලි සලපතල මළුවේ ඇති අභිලේඛන සියල්ල ගණනය කළහොත් ඒවා සියයකට වැඩි වේ. මේවා ප්‍රධාන යුග තුනකට බෙදා දැක්විය හැකි වේ.

1 අනුරාධපුර යුගය
2 පොළොන්නරු යුගය
3 කොළඹ යුගය



**රුවන්වැලි දාගැබේ පේසා වළලු වල සටහන්ව ඇති ක්‍රි. පූ. 1 වන සියවසට පමණ අයත් සෙල්ලිපියක්.**



**රුවන්වැලි දාගැබ් මළුවෙන් හමුවූ ක්‍රි. ව. 2 වන සියවසට පමණ අයත් සෙල්ලිපියක්.**


භාෂා වශයෙන් ගත්කල සිංහල දෙමළ හා ඉංග්‍රීසි වේ. මේ ලිපි සලපතළ මළුව මත මෙන් ම පේසා වළලු මත ද වේ. මීට අයත් ලිපි කීපයක් කෞතුකාගාරවල හෝ ගබඩා වල ද දැනට තැන්පත්ව ඇත. මෙම දාගැබ මළුව බෙහෙවින් ප්‍රතිසංස්කරණයකට ලක්ව ඇති හෙයින් ඒ ඒ ලිපි කොතෙක් දුරට මුලින් ම පිහිටි ස්ථානයේ තිබේදැයි අපට ස්ථිරවම කිව නොහැකි වේ. එම්වායෙන් බොහොමයක් හොඳින් කියවිය හැකි තත්වයේ තිබෙන අතර ඇතැම් ඒවා විනාශව ගොසිනි. එසේ ම මීට දශක කීපයකට පෙර මළුවේ එකට තිබූ සෙල්ලිපිවල ඇතැම් කොටස් අදවන විට අස්ථාන ගතව ඇත.

මළුවේ ඇති අනුරාධපුර යුගයට අයත් පැරණි ම ලිපි ක්‍රි. පූ. 1 වන සියවසට පමණ අයත් වන අතර ඒවා වැඩි වශයෙන් ම දක්නට ලැබෙන්නේ පේසා වළලු මතය. එම ලේඛණ කුඩා ලිපිවන අතර ස්වටික හුණුගල් පුවරු මත ලියැවී ඇත. ඒවායේ ඇත්තේ සංඥා නාමයන් පමණි. පොළොන්නරු යුගයට අයත් ලිපි බොහොමයක් තැන්පත්ව ඇත්තේ සලපතළ මළුවේ දකුණු දොරටුවට ආසන්නයෙහි ය. දැනට පොළොන්නරු යුගයට අයත් ලිපි අනුරාධපුර සලපතළ මළු වලින් හමු වන්නේ රුවන්වැලි සෑයෙන් පමණි. පොළොන්නරු යුගයට අයත්ව හමුවන I වැනි පරාක්‍රමබාහු රජුට අයත් පුවරු ලිපියත් නිශ්ශංකමල්ල රජුට අයත් පුවරු ලිපියත් විශේෂ වටිනාකමකින් යුතු ඒවා වෙයි. මේ හැර කලයාණවතී බිසවගේ රාජ්‍ය සමයට අයත් පදර ලිපිය ද සමකාලීන සමාජ තොරතුරු අනාවරණය කරගත හැකි ලිපියක් ලෙස දැක්විය හැකි වේ.

තවද ප්‍රතිමාවක පාදස්තලයෙහි සටහන් කරන ලද එක ම ලිපිය ද රුවන්වැලි සෑ මළුවෙන් හමුවීම විශේෂත්වයකි. ද්‍රවිඩ භාෂාවෙන් ලියූ ශිලාලේඛන දෙකක් පමණක් සොයාගෙන ඇත. මේවා පැහැදිලි අක්ෂරයෙන් ලියා තිබෙන අතර ඒවා ද පොළොන්නරු යුගයේ අවසන් සමයට අයත් වේ. දැනට ලංකාවෙන් සොයාගෙන ඇති කුඩා ම අක්ෂරයෙන් ලියූ ශිලා ලේඛනය ද රුවන්වැලි සෑ මළුවෙන් හමුවී ම

විශේෂ කරුණකි. පොළොන්නරු යුගයෙන් පසුව රුවන්වැලි මළුවෙන් නැවතත් ලිපි හමුවන්නේ 19 වැනි සියවසේ අවසන් සමයේ සිටය. ඒවායෙන් ඇතැම් ඒවා තඹ තහඩුවල ලියා ඇත. මේ හැර 20 වන සියවසේ ලිපි ද නොඅඩුව සලපතළ මළුවේ දක්නට ලැබේ. මේ ලිපි බොහොමයක් ම පැරණි ගල් පුවරු මත ලියා තිබීම විශේෂ කරුණකි. මේ අතර ඇතැම් නව ලිපි පැරණි ශිලාලේඛන මත ලියා තිබීම කණගාටුවට කරුණකි. මෑත දී සටහන් කළ ඇතැම් ලිපි හුදෙක් තම නම පමණක් සටහන් කිරීමේ ආශාවකින් කළා මිස වෙනත් පරිත්‍යාගයක් කොට එය සටහන් කළා නොවේ.

# අභයගිරි දාගැබ



අභයගිරි දාගැබ 1894 දී පමණ
(උපුටා ගැනීම ජේම්ස්. ජී. ස්මිදර්ගේ
Architectural Remains Anuradhapura)

# අභයගිරි දාගැබ

## පිහිටීම හා වර්තමාන තත්වය

අභයගිරි දාගැබ පැරණි නගරයට උතුරු දිශාවෙන් මෙන් ම ශ්‍රී මහා බෝධියට හා රුවන්වැලි දාගැබට ද උතුරු දිශාවෙන් පිහිටියේ ය. මෙම දාගැබ මුහුදු මට්ටමේ සිට මීටර් 84.27 ක් උසින් පිහිටි අතර එය උත්තර අක්ෂාංශ 08", 22.13 ක් හා නැගෙනහිර දේශාංශ 80", 23.43 ක් ව පිහිටියේය. අභයගිරි විහාරය අටමස්ථානයට අයත් පූජණීය ස්ථානයක් වන අතර අටමස්ථානාධිපති නා හිමියන්ගේ අභිමතය පරිදි එහි භාරකාරත්වය කිසියම් භික්ෂුවකට පැවරිය හැකි වේ. දැනට දාගැබ අබියස භික්ෂූන්ගේ නේවාසිකස්ථානය වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් මෙම දාගැබේ හා ආරාම සංකීර්ණයේ පුරාවිද්‍යාත්මක කැනීම් හා සංරක්ෂණ කටයුතු කරගෙන යනු ලැබේ. මෙම කටයුතු 1981 වර්ෂයේ දී ආරම්භ වී මේ දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී.


අභයගිරි දාගැබ අනුරාධපුරයේ ඇති මහාථූප ත්‍රිත්වය අතරට අයත් වන්නකි. අභයගිරි දාගැබ් පරිශ්‍රය ගිලාමය සීමා පවුරකින් වට වී ඇති අතර ප්‍රාකාරයේ හරි මැදින් සිව් දිශාවෙන් දාගැබ වෙත ඇතුල්වීම සඳහා ද්වාර ප්‍රවේශ මණ්ඩප 4 ක් වේ. මෙම ප්‍රවේශ මණ්ඩප සියල්ල මේ වන විට ප්‍රතිසංස්කරණය කොට ඇත. මේවා අතරින් දකුණු ද්වාර මණ්ඩපයේ දොරටුවට සම්බන්ධව උසස් කලාත්මක ගුණයෙන් යුතු **සංඛ** හා **පද්ම** බහිරව ද්වාරපාල මුරගල් දෙකක් වේ. මෙම ප්‍රාකාර බැම්මෙන් වට වූ වැලි මළුව සතරැස්ය. පවුරේ දිග හා පළල මීටර් 238 ක් වේ. වැලි මළුව මීටර් 27 ක පළලින් යුක්තව විහිද පවතී. සිව් දිශාවෙන් ම සලපතළ මළුවට ගොඩවීම සඳහා මීටර් 8 ක් පමණ පළල විශාල සඳකඩපහණ 4 ක් වේ. මේවා ගල් තීරු එකට බද්ධ කිරීමෙන් සකසාගෙන තිබීම විශේෂ ලක්ෂණයකි. ඒවායේ කිසිඳු සැරසිල්ලක් හෝ කැටයමක් නොවේ. සඳකඩපහණ ඔස්සේ පියගැට පෙළ තරණය කොට සලපතළ මළුවට ගොඩවිය හැකි වේ. මෙය වැලි

මළුවට වඩා මීටර් 1.90 ක් උසින් පිහිටා ඇත. මෙම පනාබැම්ම ගඩොලින් නිමවා තිබෙන අතර එහි බොරදම් තීරු සලකුණු හැර වෙනත් සැරසිලි හෝ කැටයම් ආදියක් දක්නට නොවේ. පනාබැම්ම් මේවන විට සම්පූර්ණයෙන් ම සංරක්ෂණය කොට ඇති හෙයින් සලපතළ මළුවේ දිග පළල පැහැදිලිව ගත හැකිව පවතී. මේ අනුව සලපතළ මළුවේ දිග මීටර් 179.10 ක් වන අතර පළල ද එම ප්‍රමාණයම වේ. සලපතළ මළුවේ නැගෙනහිර ආයකයේ සිට බටහිර ආයකය දක්වා වන අර්ධය ගල් පුවරු අතුරා තහවුරු කොට ඇත. කෙසේ වෙතත් මේ වන විට සිදුකෙරෙන දාගැබ් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වලින් සලපතළ මළුවේ සුළු ඉඩක් හැර වැඩි ඉඩක් ඇහිරී පවතී. දාගැබේ දකුණු දොරටුවට මුහුණ ලා මෙන් ම දකුණු ආයකයට ඉදිරි පසින් 1918 වර්ෂයේ දී ඉදිකරන ලද විහාර ගෘහයක් වේ.

මේ තුළ නවීන සැතපෙන බුද්ධ ප්‍රතිමාවක් හා තවත් ප්‍රතිමා කීපයක් ම වේ. එසේ ම දකුණු දොරටුවට බටහිරින් ඒ අසල ම විශාල ඝණ්ඨා කුළුණක් තිබෙන අතර එය බ්‍රිතාන්‍ය සමයේ දී ඉදිකරන ලද්දකි. දාගැබට සම්බන්ධව සතර දිශාවට මුහුණලා ආයක 4 ක් වේ. මේවායෙන් දකුණු ආයකය හැර ඉතිරි ඒවා සංරක්ෂණයට බඳුන්කොට ඇත. එසේ වුව ද දකුණු ආයකය ද මේ වන විට කැනීම් කොට අනාවරණය කරගෙන ඇත. දාගැබේ උතුරු හා නැගෙනහිර ආයක අබියස කරවිඩක ටැඹක (යූපය) කැබලි කීපයක් දැක ගත හැකි වේ. දාගැබේ පේසා වළලු 3 ද මේ වන විට තහවුරු කොට ඇත. ගර්භය හා සතරැස් කොටුව ආදියේ ද අර්ධයක් පමණ සංරක්ෂණය කොට ඇත. බටහිර හා නැගෙනහිර ආයකය අබියස ද දාගැබේ සංරක්ෂණ කටයුතු පහසු කර ගැනීම සඳහා යකඩ බට උපයෝගී කොට ගෙන විශාල අටලු දෙකක් තනා ඇත. සලපතළ මළුවේ බටහිර දොරටුවට උතුරු පසින් බෝ රුකක් තිබෙන අතර ඒ අබියස වැලි මළුවෙහි දාගැබ් සංරක්ෂණ අංශයෙහි කාර්යාල මෙන් ම සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය උළු කැට ඇඹරීම සඳහා උපයෝගී කොට ගැනෙන යන්ත්‍ර සවිකල මඩු හා ගබඩා ආදිය ද වේ.



CS CamScanner



අභයගිරි විහාර සංකීර්ණය

## ආරම්භය හා සංවර්ධනීය අවස්ථා

ලක්දිව බෞද්ධ ශාසන ඉතිහාසයෙහි සුවිශේෂ තැනක් හිමි කරගන්නා අභයගිරි විහාරය ක්‍රි.පූ. 1 වැනි සියවසේ දී දෙවරක් ලංකාව පාලනය කළ වළගම්බා රාජ්‍ය සමයේ දී (ක්‍රි.පූ. 89-77) ඉදිවූවකි. නගරයට උතුරින් පිහිටි නිඝණ්ඨාරාමයක් බිඳ හෙලා අභයගිරිය විහාරය ගොඩනැගූ බව වංසකතා සාක්ෂි දරයි. (දීපවංසය 1970: 19, 15., මහාවංසය 1967: 33,45, 81) වංශකතාව වැඩි දුරටත් සඳහන් කරන්නේ එහි දොළොස් පිරිවෙනක් ගොඩනගා රජුට බෙහෙවින් උපකාරය කළ **කුපික්කල තිස්ස** නම් තෙර නමකට පිදූ බව ය. අභයගිරි යන්න නිඝණ්ඨයාගේ නාමයේ කොටසක් වූ **ගිරි** යන්නත් රජුගේ නාමයෙන් **අභය** යන්නත් ගෙන **අභයගිරි** යනුවෙන් නම් කළ බව ද සඳහන් වේ. (මහාවංසය 1967: 33, 84-85) එහෙත් ඇතැම් උගතුන්ගේ අදහස වන්නේ වෙස්සගිරි , චේතියගිරි ආදී වශයෙන් කඳු පර්වත ආශ්‍රය කොට මෙම විහාරය ඉදි කොට ඇති හෙයින් රජුගේ නම වන **අභය** යන්නට කන්ද හෝ පර්වතය යන අර්ථයෙන් **ගිරි** යන පදය යොදා **අභයගිරි** යනුවෙන් භාවිතයට ගෙන ඇති බව ය. (කුලතුංග 2004: 6) කුපික්කල තිස්ස හෙවත් මහාතිස්ස හිමියන් මෙම විහාරය පිළිගැනීම හේතුවෙන් ලංකාවේ ශාසන ඉතිහාසය තුළ නව අර්බුද හටගත් අතර උන්වහන්සේ **කුලසංසර්ග** දෝෂය හේතුවෙන් මහාවිහාරයෙන් නෙරපා දැමූහ. (මහාවංසය 1967: 33, 97) මෙම තීරණයෙන් කිපුණු උන්වහන්සේගේ ශිෂ්‍යවරයෙකු වූ **බහලමස්සු තිස්ස** නම් ස්ථවිර තෙමේ ද පන් සියයක් පමණ වූ භික්ෂු පිරිසක් ද ථේරීය නිකායෙන් භින්නව අභයගිරි විහාරයට ගිය බව නිකාය සංග්‍රහය වාර්තා කරයි. (නිකාය සංග්‍රහය 1987:21) මෙම භික්ෂූන් වහන්සේලාගේ සිව් පසය හා ආරක්ෂාව නිරතුරුව ම වලගම්බා රජු මෙන් ම එතුමාගේ ඇමතිවරු විසින් ලබාදුන් බවට වංසකතා සාක්ෂි දරයි. (මහාවංසය 1967: 33, 90-92, 101) අභයගිරි විහාරය ආරම්භ වන සමය වන විට සියවස් දෙකක් පමණ කාලයක් මහාවිහාරය ආගමික හා සමාජීය කටයුතුවල පුරෝගාමීත්වය ගෙන කටයුතු කර තිබිණි. එහෙත් මෙම ක්‍රියා පිළිවෙත කෙරෙහි ඇතැම් භික්ෂූන් නොකැමැත්තෙන් පසු වූ බව **බහලමස්සු තිස්ස** හිමියන් සමග



CS CamScanner

භික්ෂූන් වහන්සේලා 500 නමක් මහාවිහාරයෙන් වෙන්ව අභයගිරියට යාමෙන් පැහැදිලි වේ. එපමණක් නොව ගිහි ජනතාව අතර ද මහාවිහාරය කෙරෙහි යම් නොසතුටක් තිබුණේදැයි සැකසිතෙන්නේ උන්වහන්සේලා පිළිගෙන සිව්පසයෙන් උපස්ථාන කිරීමට ඉදිරිපත්වීම හේතුවෙනි. ඉන්දියාවේ **පල්ලරාරාමවාසී වජ්ජිපුත්තක** නිකායික **ධම්මරුචි** නම් භික්ෂුවගේ ශිෂ්‍යයින් වහන්සේලා අභයගිරිය සමග එක්වීම ද විශේෂ සිද්ධියකි. (නිකාය සංග්‍රහය 1987: 21) කෙසේ වුව ද මෙම භාවය ලංකාවේ බුදුසසුන මෙන් ම සිංහල සංස්කෘතිය ද නව මගකට යොමු කරවීමට තුඩුදුන් කරුණක් වූ බව පිළිගත යුතුව ඇත.

ක්‍රි.පූ. 1 වැනි සියවසේ වලගම්බා රාජ්‍ය සමයේ දී ඇරඹි මෙම ආරාම සංකීර්ණය වරින්වර සංවර්ධනය වෙමින් අනුරපුර අවසන් සමය වන විට ආරාම අංග වලින් වඩාත් දියුණු ආරාමයක් බවට පත් වූ බව පැහැදිලි වේ. එය වර්තමානයේ දී හෙක්ටයාර් 200 ක් තරම් භූමි ප්‍රදේශයක පැතිරී ඇති බව හඳුනාගෙන ඇත. (Wikramagamage 1984: 1) මෙම ආරාම සංකීර්ණයේ ප්‍රමුඛතම නිර්මාණය ලෙස සැලකෙන අභයගිරි දාගැබෙහි කර්තෘත්වය පිළිබඳව යම් යම් මතභේද පවතී. පරණවිතාන මහත්මා ඇතුළු බොහෝ විද්වතුන්ගේ අදහස වන්නේ මෙම දාගැබ වලගම්බා රජු විසින් කරවන ලද බවය. (පරණවිතාන 1963: 6) එහෙත් කඹුරුපිටියේ වනරතන නා හිමියන් (වනරතන හිමි 1970: 95-96) සහ මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහත්මා සඳහන් කරන්නේ මෙය ගජබා රජතුමාගේ කෘතියක් බවය. (වික්‍රමගමගේ 2001: 67)

සත්‍ය වශයෙන් ම වලගම්බා රජු අභයගිරි දාගැබ කළ බවට දීපවංසය, මහාවංසය, මහාවංස ටීකාව, නිකාය සංග්‍රහය, පූජාවලිය ආදී කිසිඳු මූලාශ්‍රයක පැහැදිලිව සඳහන් කොට නොමැත. මේ හැර කිසිඳු ශිලාලේඛනයක ද සඳහන්ව නැත. මීට පෙර ථූපාරාමය, මිරිසවැටිය හා මහාථූපය හෙවත් රුවන්වැලි දාගැබ ඉදිකරන අවස්ථාවේ දී ඒ ඒ දාගැබ් පිළිබඳව දීර්ඝව කරුණු ඉදිරිපත් කොට ඇතත් ඒ වන විට ඉදිව තිබූ මහාථූපයට ද වඩා විශාල ප්‍රමාණයේ දාගැබක් ඉදි කිරීමේ දී



CamScanner

වංශකතා කිසිඳු සඳහනක් නොකිරීම විමතිය දනවන කරුණකි. ඇතැම් විට එම බොහොමයක් මූලාශ්‍ර ග්‍රන්ථ මහාවිහාරය මගින් ලේඛනය වුනු ඒවා හෙයින් එසේ වූයේ දැයි කෙනෙකුට තර්ක කළ හැකි වේ. මහාවංසය එය වාර්තා කරන්නේ පහත අයුරිනි.

*" අභයුත්තරං මහාථූපං වඩ්ඪාපෙත්‍වා චිනාපයී*
*චතුද්වාරෙ චතුතෝව ආදි මුඛමකාරයි "*

(මහාවංසෝ 1967: 35, 119)

**අභය උත්තර මහාථූපය මහත්කොට බැඳවීය එහි සතර දොරටුව ද ආදි මුඛ සතරක් ද කරවීය** යන අර්ථ මීට ගත හැකි වේ. "**වඩ්ඪාපෙත්‍වා චිනාපයී** " යන වචන වලින් මහත් කොට හෙවත් විශාල කොට බැඳවීය යන අරුත් දෙයි. එසේ ගත් කළ එතෙක් තිබූ දාගැබක් විශාල කොට බඳවන ලද්දේය යන අර්ථය ගැනීම සාධාරණ වේ. එහෙත් ගජබා රජු හා සම්බන්ධයෙන් මෙම කරුණු විස්තර කරන දීපවංසය වාර්තා කරන්නේ

*" තිස්සස්ත්‍රජො පුත්තො ගජබාහුක ගාමිණි*
*කාරාපෙසි මහාථූපං භයාරාමෙ මනොරමෙ "*

(දීපවංසය 1970: 22, 13)

**තිස්ස රජුගේ අතිජාත පුත්‍ර වූ ගජබාහු ගාමිණී රජු මනොරම්‍ය වූ අභයගිරි විහාරයෙහි මහාසෑයක් ද කරවීය** යන අර්ථ මීට ගත හැකි වේ. මෙම සඳහනට අනුව ගජබා රජු අභයගිරි විහාරයෙහි මහ සෑයක් ගොඩ නගා ඇත. මෙහි වාර්තා කරන ආකාරයට හැඟෙන්නේ අළුතින් දාගැබක් ඉදිකළ බවය. මෙම වාර්තා කිරීම් වලින් කවර මූලාශ්‍රයක් වඩා නිවැරදි දැයි කීම දුෂ්කර කරුණකි. කෙසේ වෙතත් මහාවංසය මෙම සිදුවීම එනම් ගජබා රජු විසින් කරන ලද දාගැබ් කර්මාන්තය වාර්තා කරන්නේ අඩු තරමින් සිද්ධිය වීමෙන් වසර 500 ක් තරම් කාලයේ දී බව ද අප අමතක කළ යුතු නැත. අනෙක් අතින් වලගම්බා රාජ්‍ය සමයේ දී වංසකතාවල අභයගිරි විහාරයේ ආරම්භය පිළිබඳව වාර්තා

වීමෙන් පසුව ගජබා සමය වන තෙක් වූ වසර 200 ක් තරම් කා වකවානුව අතරතුර දී ද අභයගිරි විහාරය හෝ දාගැබ පිළිබඳ කිසි සඳහනක් වංසකතාවල නොවීම ද විශේෂ කරුණකි. මූල දීපවංස තුළ ම අභයගිරි විහාරය හා දාගැබ පිළිබඳව සඳහන්ව ඇත්තේ රජවරු 4 දෙනෙකුගේ රාජ්‍ය සමයන්හි දී පමණි. (එම: 19, 15- 18, 22, 13, 23 38- 39) මහාවංසයෙහි 1 වැනි කොටසේ දී අභයගිරි විහාරය හෙ ස්තූපය ගැන වාර්තා වන්නේ රජවරුන් පස් දෙනෙකුගේ සමයන්හි දී පමණි. (මහාවංසය 1967: 33, 82,. 36, 7-9, 33, 111,. 37, 11-16, 59)

කඹුරුපිටියේ වනරතන හා හිමියන් මහාවංශයේ හා එම ටීකාවේ එන තොරතුරු ද පාදක කොට ගනිමින් සඳහන් කරන්නේ වලගම්බාවන්ගේ සොහොයුරා මැරීමට කුමන්ත්‍රණය කළ **අභය** සහ **උත්තර** යන කුමාරවරුන් දෙදෙනා සිහිවීම සඳහා එහි **අග්ගිපවේසක** නමින් සෑයක් කරවා තිබී එය ගජබා රජු විසින් විශාල කරවා ඊට **අභයුත්තර** යන නම දෙන ලද බව ය. (වනරතන හිමි 1970: 95) මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා සඳහන් කරන්නේ ද මීට සමාන අදහසකි. (වික්‍රමගමගේ 2001: 67) එහෙත් ගජබා රජු විසින් අභයගිරි දාගැබ සත්‍ය වශයෙන් ම අලුතින් තැනුවා ද එසේ නැතහොත් විශාල කළා ද යන ගැටළුව විසඳාගත හැකි ශිලාලේඛනමය සාධකයක් අභයගිරි විහාර භූමියෙන් ම ලැබී ඇත. මෙය රත්නප්‍රසාද ලිපිය වශයෙන් හඳුන්වනු ලබන අතර එය ගජබා රජුට අයත්වීම ද මෙහි දී සැලකිල්ලට බඳුන්විය යුත්තකි. එහි සඳහන් වන්නේ මහ රජ වසභගේ පුත්‍ර තිස්ස මහ රජුගේ පුත්‍ර මහරජ ගජබාහු ගාමිණී අබය රජු තිලරාජිය නම් ප්‍රදේශයෙහි ජලගම්බක වැව අබිය ගාමිණී උත්තර මහා චේතියට රන් කෙන්ඩියෙන් පැන් වඩා දුන් බවය. (IC II 1983: 88) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ **උත්තර චේතිය , උත්තර විහාරය** යනුවෙන් අභයගිරි විහාරය හා දාගැබ හඳුන්වා දී ඇති බවට සාධක ඇතත් **අභය ගමිණි උත්තර චේතිය** යන පෞද්ගලික සංඥා නාමය මෙම දාගැබේ නාමය සමග යෙදුනු එකම අවස්ථාව මෙය බවය. එක්කෝ මෙය ගජබාහු වෙනුවෙන් හෝ නැතහොත් වට්ටගාමිණී අභය වෙනුවෙන් යෙදෙන්නට ඇතැයි ඔහු කල්පනා කරයි. (IC II 1983: 88) මේ හැර අපට සිතිය හැක්කේ



CamScanner

වලගම්බා රජු විසින් කරවූ දාගැබ ගජබා රජු විසින් විශාල කළේ යැයි. සිතුව හොත් ඉහත දාගැබ හා සම්බන්ධ වූ පුද්ගලික නාමයන් පැහැදිලිව ගැලපිය හැකි වේ. එනම් **අභය** යනුවෙන් මෙහි හඳුන්වන්නේ **වළගම්බා** රජු විය හැකි අතර **ගමිණි** යනු **ගජබාහු** රජු හැඳින්වීමට යොදාගත් පදය විය හැකිය. වංසකතාවේ සඳහන් වන්නේ ද අභය-ගිරි යන පද දෙකෙන් මුල් පදය රජුගේ නමත් ගිරි යන්න නිඝණ්ඨයාගේ නමත් ගෙන අභයගිරි වූ බවයි. (මහාවංසය 1967: 33, 84) රත්නප්‍රසාද ලිපියේ මුලින් ගජබා රජුගේ නම දක්වා ඇත්තේ **මහරජ ගමිණි අබය** යනුවෙනි. මේ හැර මේ රජුට අයත් තවත් ලිපි 11 ක ම ගජබා රජුගේ නම දක්වා ඇත්තේ **ගමිණි අබය** යනුවෙනි. (IC, II 1983: 88-104) ඔහුට අයත් කිසිඳු ලිපියක මේ තාක් ඔහුව හැඳින්වීමට **අබය ගමිණි** යන යෙදුම හමුවී නැත. එබැවින් අභයගිරියේ රත්නප්‍රසාද ලිපියෙහි **අබය ගමිණි උතර මහ චෙත** යන යෙදුමෙන් අදහස් කර ඇත්තේ **වලගම්බා ගජබා උත්තර මහා චෛතිය** යන අදහසය. මේ හැර මේ සඳහා අපට දිය හැකි පුරාවිද්‍යාත්මක සාධක කීපයක් පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. එනම් අභයගිරි මළුවේ අප කරන ලද අධ්‍යයන කටයුතු වල දී ගජබා රාජ්‍ය සමයෙන් පෙර කාලයට අයත් වන සෙල්ලිපි කීපයක් ම සලපතල මළුවෙන් හමුවිය. මේවා බොහෝ විට ක්‍රි.ව. 1-2 සියවස් අතරට අයත්වන ඒවාය. අභයගිරි විහාර ව්‍යාපෘතියේ පුරාවිද්‍යා අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන මහාචාර්ය ටී. ජී. කුලතුංග මහත්මා සඳහන් කරන්නේ බටහිර ආයකය ඉදිරිපිට කරන ලද කැනීමක දී වලගම්බා රාජ්‍ය සමයේ දී කුඩාවට කළ දාගැබේ මළුවට අයත් විය හැකි ගඩොලින් කළ සීමා ප්‍රාකාරය හමු වූ බව ය. (කුලතුංග 2004: 12) එසේනම් මෙම ගල් ඇතිරීම වලගම්බා සහ ගජබා රාජ්‍ය සමය අරතුර දී කරන්නට ඇත. මේ හැර පෙර දී සලපතල මළුව මත තිබී මෑත දී වැලි මළුව මත තැන්පත් කරන ලද සිරිපතුල් ගලක ද මදක් කඩතොළු වූ ක්‍රි.ව. 1 වැනි සියවසට පමණ අයත් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියූ ලේඛනයක් හමු විය. එහෙත් මෙය පසු කාලයේ දී පිටතින් ගෙනෙන ලද්දකැයි කෙනෙකුට තර්ක කිරීමට ද බාධාවක් නැත. නමුදු අතීතයේ බුද්ධ සංකේතයක් ලෙස සිරිපතුල් ගල් භාවිත වූ බැවින් ඒවා තනා දාගැබ අබියස තැන්පත් කර තැබුවේය යන අදහස ගැනීම අතිශය යුක්ති

සහාගත වේ. මෙම දාගැබේ පැරණිකම දැක්වීම සඳහා භාවිත කළ හැකි අනෙක් වැදගත් ම පුරාවිද්‍යාත්මක සාධකය වන්නේ සලපතල මළුව මත ඇති කරවිඩක ස්ථම්භ (යූපගල්) දෙකයි. මෙයින් එකක් කුඩා වන අතර අනෙක විශාල වේ. ඉන් කුඩා කරවිඩක ටැම බටහිර හා උතුරු ආයක අතර සලපතල මළුව මත වේ. කැබලි දෙකකට කැඩී ඇති මෙහි ඇත්තේ කරවිඩකයේ ඉහළඅන්තයට අයත් අටපට්ටම් කොටස පමණි. එහි පහත සතරැස් කොටස හමු වී නැත. මෙම කැබලි දෙකෙහි සම්පූර්ණ දිග මීටර් 3.74 කි. එහි විශ්කම්භය සෙ.මී. 28 කි. අනෙක් කරවිඩක ගල විශාල ප්‍රමාණයේ එකක් වන අතර එහි කැබලි 3 ක් පැහැදිලිව හඳුනාගත හැකි වේ. තවත් කැබැල්ලක් මිළඟවී ගිල්වා ඇති බවක් පෙනියයි. මෙම කැබලි උතුරු ආයකය හා නැගෙනහිර ආයක අතර පතිත වී තිබේ. මෙහි පහත කොටස සතරැස් වන අතර ඉහළ කොටස අටපට්ටම්ය. මෙම කැබලි සියල්ල ම එකට ගත් කල එහි අවම දිග මීටර් 7.10 කි. එහි විශ්කම්භය සෙ.මී. 66 කි. මේවා ප්‍රමාණයෙන් වෙනස් වූ දාගැබ් දෙකකට යොදන ලද බව පැහැදිලි වේ. මේවායේ නිර්මාණ ලක්‍ෂණ පිළිබඳව විමසීමේ දී පෙනී යන්නේ කුඩා කරවිඩක ස්ථම්භය වඩා පැරණි බවය. මේ අනුව අනුමාන කළ හැක්කේ මෙම කුඩා කරවිඩක ස්ථම්භය වළගම්බා රජු විසින් ඉදිකළ යූපස්ථම්භය විය හැකි බවත් විශාල කරවිඩක ස්ථම්භය ගජබා හෝ පසුකාලීන රජ කෙනෙකු විසින් ඊට එකතු කරන ලද බවය. මෙය කණිට්ඨතිස්ස රජු විසින් කරවන්නට ඇතැයි වඩාත් විශ්වාස කළ හැකි වේ. හේතුව වන්නේ අභයගිරි සලපතල මළුවේ දකුණු ආයකය ඉදිරිපිට අතුරා ඇති විශාල ගල් පුවරුවේ ඇති කණිට්ඨ තිස්ස රජුට අයත් සෙල්ලිපියේ එතුමා විසින් උතර මහ චේතියේ කරවිඩකය කරවූ බව සඳහන් කොට තිබීමයි. (IC II 2001:152) කරවිඩකය යනු යූපස්ථම්භය ලෙස අපට පැහැදිලි වූ හෙයින් මෙය මහතිස රජුට අයත් සේ පිළිගැනීම ඉතා යෝග්‍ය වේ. ගජබා රජුගෙන් පසුව අභයගිරි දාගැබ සම්බන්ධයෙන් කටයුතු සිදුකළ බවට සාධක ලැබෙන්නේ දෙ වන **භාතිකතිස්ස** (ක්‍රි.ව. 143-167) රජුට අයත් අභයගිරියෙන් හමු වූ ශිලාලේඛනයකිනි. එතුමා මහල්ලකනාග රජතුමාගේ වැඩිමල් පුත්‍රයා ද වේ. (මහාවංසය 1967: 36, 1-2) මොහු තමාගේ අභිෂේකයෙන් පළමු වර්ෂයේ දී **අබය උත්තර**

මහා චේතියට එහි කැඩුම් බිඳුම් පිළිසකර කිරීම සඳහා කරන ලද කුඹුරු පූජාවක් පිළිබඳව කියැවේ. (වජිර හිමි 1994: 12 - 16) මෙහි අභයගිරි දාගැබ හඳුන්වා ඇත්තේ **අබය උත්තර මහාචේති** යනුවෙනි. මෙහි ගජබා රජුගේ රත්නප්‍රසාද ලිපියේ මෙන් **ගමිණි** යන පදය **අබය** යන්න සමග යෙදී නැත. ගජබා රජු දාගැබ සමග තිබූ සබඳතාව නිසා නම් නාමයේ කොටසක් **අබය** යන්න සමග යෙදුව ද භාතික අභය ට එ කැමැත්තක් නොදැක්වූවා විය හැකිය. ඔවුන් **අභය උතර මහචෙත** යනුවෙන් දාගැබෙහි වලගම්බා රජුට ඇති සබඳතාව පමණක් සඳහන් කරන්නට ඇතැයි සිතිය හැකිය. අභය උත්තර යන යෙදුම දීපවංසයේ කිසි විටෙකත් යොදා නොමැති අතර මහාවංසයේ මෙම යෙදුම දක්නට ඇත්තේ දෙවන කොටසේ සිටය.එනම් ඇතැමුන් චූලවංසය නමින් හඳුන්වන කොටසෙහි දී ය. දීපවංසයේ හා මහාවංසයේ 1 වැනි කොටසෙහි අභයගිරි විහාරය හැඳින්වීමට යොදා ඇත්තේ **අභයගිරි විහාරය** හෝ **භයාගිරි විහාර** යනුවෙනි. (දීපවංස 1970: 19, 15- 18., 22, 13, 23, 38, 39 ., මහාවංසය 1967: 33, 82 , 36, 7-9, 33, 111, 37, 11-16)

ඉහත දැක්වූ දෙවන භාතික තිස්ස රජුගේ ශිලාලේඛනයෙන් අපට අභයගිරි දාගැබෙහි පැරණිකම පිළිබඳව ද යම් අදහසක් මතුකර ගැනීමට හැකියාවක් ඇත. එනම් දීපවංසයට අනුව අප ගජබා රජු මෙම දාගැබ ඉදිකළා යැයි කල්පනා කළහොත් ගජබා රජුගේ රාජ්‍ය සමයෙන් වසර 7 කට පසු රජකමට පත් වූ 2 වන භාතික තිස්ස රජුට උත්තර චේතියේ හෙවත් අභයගිරි දාගැබේ කැඩුම් බිඳුම් පිළිසකර කිරීමට එකසිය අට කරීසයක හෙවත් වර්තමාන මිනුම් ක්‍රමයට අනුව කුඹුරු අක්කර 864 ක් පූජා කිරීමේ අවශ්‍යතාවයක් මතුවේ යැයි සිතිය නොහැකිය. වලගම්බා රජු සමයේ මෙම දාගැබ ඉදිකළා යැයි සිතුව හොත් දාගැබ ඉදිකොට භාතිකාභය සමය වන විට වසර 200 ක් පමණ කල්ගතව තිබෙන හෙයින් එහි පැරණිකම අනුව පිළිසකර කිරීමට යන වියදම වැඩිවනවා මෙන්ම එය සංකීර්ණ කාර්යයක් ද වේ. මහාවංසයේ සඳහනට අනුව ගජබා රජු දාගැබ විශාල කොට බඳවන ලද්දේ නම් එය ද පැරණි දාගැබේ ම පිළිසකර කටයුත්තක් හෙයින් එම දාගැබේ පිළිසකර කටයුත්තේ භාරධූර තත්වය තේරුම්ගත් භාතිය රජු

මේ සඳහා විශාල කුඹුරු ප්‍රමාණයක් දාගැබ වෙත පරිත්‍යාග කිරීමට පුළුවන .

මෙයින් පසුව අපට අභයගිරි දාගැබ වෙනුවෙන් කරන ලද කාර්යයන් පිළිබඳව තොරතුරු ලැබෙන්නේ ඉහත සඳහන් කළ දෙ වන භාතික තිස්ස රජුගේ සොයුරු කණිට්ඨ තිස්ස ( ක්‍රි.ව. 167-186 රාජ්‍ය සමයේදී ය. දාගැබ් මළුවේ දකුණු ආයකය ඉදිරිපිට අතුරා ඇති ශිලාලේඛනයට අනුව ඔහු අභයගිරි දාගැබේ **කරවිඩකය** කරවා **ඡත්‍ර** නංවා එහි **ආයක** සතර ද කරවා ඇත. (IC II 2001: 152) එහෙත් මහාවංසයෙහි හෝ දීපවංසයෙහි මේ පිළිබඳව කිසිවක් සඳහන්ව නැත. දාගැබ් හා විහාරයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා එතුමා වැව් කුඹුරු හා භූමි වලින් ඉපයෙන බදු ආදිය ද අභයගිරි විහාරයට පරිත්‍යාග කොට ඇත. මෙම ලිපිය ද අපට දාගැබෙහි පැරණිකම පිළිබඳව දැන ගැනීම සඳහා යම් උපකාරයක් කරගත හැකි වේ. එනම් අභයගිරි දාගැබ ගජබා රජු විසින් කලේයැයි කල්පනා නොකළහොත් ඔහුගේ ඉදි කිරීමෙන් වසර 30 ක් තරම් කෙටි කාලයක දී කණිට්ඨ තිස්ස රජුට කරවිඩකයේ හා ඡත්‍ර වල යම් ප්‍රතිසංස්කරණයක් කිරීමට සිදුවේයැයි සිතිය නොහැකිය. එබැවින් මෙහි දී සිදුවන්නට ඇත්තේ මීට පෙර ද අප සඳහන් කළ පරිදි ම වලගම්බා රජුගේ කරවිඩකය ඉවත් නොකොට ගජබා රජු ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරන්නට ඇත. එහෙත් කණිට්ඨ තිස්ස රජු එය ඉවත්කොට නැවත සකසා ඡත්‍ර නැංවීම ද කරන්නට ඇත.

කරවිඩකය දාගැබ මත පිහිටවන ලද්දේය යන අදහස පිළිගත හැකි තවත් ප්‍රබල සාධකයක් වන්නේ දැවැන්ත ගල් කුළුණු සහිත රත්නප්‍රාසාදයේ ඉදිකිරීමය. මහාවංසයට අනුව රත්නප්‍රාසාදය කණිට්ඨ තිස්ස රජු විසින් ඉදි කරන ලද්දකි. (මහාවංසය 1967: 36, 7-8) රත්නප්‍රාසාදයේ ඇති ගල් කුළුණු තරම් විශාල ගල් කුළුණු අපට අභයගිරියේ වෙනත් කිසිදු ගොඩනැගිල්ලකින් හමු නොවේ. එපමණක් නොව ඔහුගේ සෙල්ලිපිය ලියූ තරම් විශාල ගල් පුවරුවක් අභයගිරියේ වෙන කිසිම කාර්යයකට යොදාගත් බවට ද සාධක නැත. මෙම ගල්

කුළුණු හා ගල් පුවරු එහා මෙහා ගෙනයාමේ හා එසැවීමේ තාක්ෂණය හොඳින් පරිහරණය කළ කණිට්ඨතිස්ස වැනි රජ කෙනෙකුට මෙම ආරම්භකය මෙවන් යුපගල නිර්මාණය කොට දාගැබ මතට ඔසවා තැබීම දුෂ්කර කාර්යයක් නොවේ.

කණිට්ඨතිස්ස රජුට අයත් ලිපියේ ආයක 4 ක් කළ බව සඳහන් වන්නේ එහි සිව් දිසාවට මුහුණලා ඇති වාහල්කඩ යන ප්‍රසිද්ධ ව්‍යවහාරයෙන් යුතු කලාත්මක ශිලාමය නිර්මාණයයි. මුලින් පරණවිතාන මහත්මා ද වාහල්කඩ යන ප්‍රසිද්ධ ව්‍යවහාරයෙන් මෙය හඳුන්වනු ලැබුව ද (පරණවිතාන 1963: 38) පසුව කණිට්ඨ තිස්ස රජුගේ ශිලාලේඛනයට අනුව **ආයක** නමින් හැඳින්වීම සුදුසුයැයි සඳහන් කොට ඇත. (එම: 48) ඇතැම් උගතුන්ගේ අදහස වන්නේ කණිට්ඨ තිස්ස රජු මෙහි ආයක ඉදි කිරීමට පෙරාතුව ආදිමුඛ නමින් සරල නිර්මාණයක් ගජබා රජු විසින් කර තිබූ බවය. (කුලතුංග 2004: 2) මහාවංසයේ මෙම කරුණ සඳහන් වන්නේ ***අභයුත්තර මහාථූපංවඩ්ඪාපෙත්වා චිනාපයී චතු ද්වාරෙ ච තතොච ආදිමුඛ මකාරයී.*** (මහාවංසො 1959: 35, 119) අභයගිරි මහාථූපය විශාලකර ගොඩනගා සතර දොරටුව ද එහි ආදිමුඛ සතරක් කළ බවය. කඩුරුපිටියේ වනරතන නා හිමියන් සඳහන් කරන්නේ ආදිමුඛ යනු වාහල්කඩ ද එසේ නැතහොත් තොරණ් ද යනු අවිනිශ්චිත බවය. (වනරතන හිමි 1970: 96) මෑත දී අභයගිරි දාගැබේ උතුරු ආයකය කැනීමේ දී ඊට යටව තිබූ ආයකයකට සමාන සරල ඉදි කිරීමක අවශේෂ දක්නට ලැබුණි. මේවා ආදිමුඛ වීමට පුළුවන.

කණිට්ඨ තිස්සගේ ආයක ඉදිකිරීම් සනාථ කෙරෙන තවත් ප්‍රබල සාධකයක් දාගැබේ දකුණු ආයකය අබියසින් එස්. එම්. බරෝස් මහත්මාට අනාවරණය කරගත හැකි විය. **එනම් කණිට්ඨ තිස්ස රජුගේ මිතබිය නම් දේවිය හා මෑණියන් විසින් කරන ලද ශිලාමය කරඬු** දෙකක් සොයා ගැනීමට හැකි වීමයි. (parker 1969: 302) මෙම කරඬු දෙක දැනට කොළඹ කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. කණිට්ඨ තිස්ස රාජ්‍ය සමයෙන් පසුව දීපවංසයේ මෙන් ම මහාවංසයේ ද



CamScanner

වෝහාරික තිස්ස රජු (ක්‍රි.ව. 209-231) අභයගිරි දාගැබෙහි ඡත්‍ර සැදවූ බව වාර්තා කර ඇත. (දීපවංසය 1970: 22, 38 ., මහාවංසය 1967: 36, 33) මහසෙන් රාජ්‍ය සමයේ දී මහා විහාරයට ද විශාල හානියක් පමුණුවමින් එහි තිබූ ගොඩනැගිලි අවශේෂ පවා අභයගිරියට ගෙනැවිත් විවිධ ඉදිකිරීම් කළ බව මහාවංසයේ සඳහන් වෙතත් (මහාවංසය 1967: 37, 11-16) ඒ සමයේ දී අභයගිරි දාගැබෙහි කරන ලද ප්‍රතිසංස්කරණ පිළිබඳව කිසිඳු සඳහනක් නොවේ. ක්‍රි.ව. 412 දී පමණ අභයගිරියට වැඩම කළ **පාහියන්** නම් චීන ජාතික භික්ෂුව වාර්තා කොට ඇත්තේ බුදුන් වහන්සේ විසින් තැබූ සිරිපා සටහනක් මත අඩි 400 ක් උසට දාගැබ තනා එය රන් රිදී හා මැණික් වලින් අලංකාර කොට තිබූ බවය. (පාහියන් දේශාටන වාර්තාව 1999: 93) 5 වැනි සියවස පමණ වන විට රජවරු මහාථූපය හෙවත් රුවන්වැලිය අභයගිරිය හා ජේතවනය යන මහ දාගැබ් 3 පිළිබඳව සමාන සැලකිල්ලක් දැක්වීමට හුරු පුරුදු වී සිටි බවට වංස කතා සාධක ලැබේ. එනම් මිත්තසේන (ක්‍රි:ව: 428-429) රජු දාගැබ් 3 හිම ඇත් පවුර හා තොරණ කරවූ බව කියැවේ. (මව 1967: 38' 10) 5 වැනි සියවසෙහි අභයගිරි දාගැබේ තිබූ මෙම ඇත් පවුර අද දැකගත නොහැකිය. ඇතැම් විට එය පසු කාලයේ දී කරන ලද ප්‍රතිසංස්කරණයක දී වෙනස් වී ගියා විය හැකිය. 1987 වර්ෂයේ දී වැලි මළුවේ ඇතුල් ප්‍රාකාරය අබියස කැනීම් කිරීමේදී ගලින් කළ ඇත් දළ වලට සමාන නිර්මාණ කිපයක් හමු වී තිබීම ද සඳහන් කළ යුත්තකි. (Hettiaratchi 1989: 75) මිත්තසේන රජු විසින් කරන ලදැයි සැලකෙන තොරණ දාගැබෙහි කවර ස්ථානයක කවරාකාරයෙන් තනන ලද එකක්දැයි පැහැදිලි නැත. ධාතුසේන රාජ්‍ය සමයේ දී (455-473) එතුමා දාගැබ් තුනෙහි ම සුනුකම් කරවා රනින් කළ ඡත්‍රයක් ද පළිඟු සුඹුලුවක් ද කර ඇත. ( මහාවංසය 1967: 38, 74) පළිඟු සුඹුලුව හෙවත් **වජ්‍ර චුම්බටක** යන්නට පරණවිතාන මහත්මා අර්ථ දී ඇත්තේ පළිඟු වළල්ල යනුවෙනි. (පරණවිතාන 1963 : 82) මීට පෙර සංඝතිස්ස (ක්‍රි:ව: 243-247) රාජ්‍ය සමයේ දී ද එතුමා ලක්ෂයක් වටිනා මෙබඳු ම වජ්‍ර චුම්බටකයක් රුවන්වැලි දාගැබ මත ද පිහිටුවනු ලැබූ බව මහාවංසය සඳහන් කරයි. (මහාවංසය 1967: 37, 66- 67) මෙය විදුලිය කෙටීමේ දී සිදුවන අකුණු වැදීමෙන් දාගැබ ආරක්ෂා වීමට උපකාර වන බව මහාවංස

ක්‍රමයෙන් කරුණු අනාවරණය කරගත හැකිය. (වංසත්ථප්පකාසිනී 1994: 538) මහානාග රජු (ක්‍රි.ව. 569-571) මහා චෛතිය තුනෙහි ම සුනු ආලේප කිරීමත් (පලිඟු) සුඹුළුව ( චුම්බට ) හා හස්ති වේදිය කිරීමත් එසේ ම සිතුවම් ඇඳීමත් කර ඇත. (මහාවංසය 1959: 40. 95) මහාවංස සිංහල පරිවර්තනයේ දී පාලියෙහි එන **චුම්බටක** යන වචනය කොත්කැරලි යනුවෙන් ද **හස්ති වේදී** යන්න ඇත් පවුර යනුවෙන් ද ගෙන ඇත. (මහාවංසය 1967: 40' 95) මෙම වස්තුව පලිඟුයෙන් නිර්මාණය කරනලද්දක් බැව් ඉහතදී පැහැදිලි විය. පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ පේසාවේ ඇත් හිස් සහිතව කරන ලද ගරාදි වැට **හස්ති වේදි** යනුවෙන් හඳුන්වන ලද බවය. (පරණවිතාන 1963: 15) ඒ අනුව අභයගිරි දාගැබේ තුන්වැනි පේසාව මත ශිලාමය ඇත් හිස් සහිත වේදිය හස්ති වේදිය වශයෙන් හැඳින්විය හැකි අතරේ එම ඇත් හිස් මීටර් 3 ක පමණ නියත පරතරයකින් සවිකොට තිබී ඇතත් ඒවා 19 වැනි හා 20 වැනි සියවස් වල කරන ලද ප්‍රතිසංස්කරණ වලදී ඉවත්ව ඇති බව උගතුන් විසින් පෙන්වාදෙයි. (කුලතුංග 2004: 21)

දෙ වන සංඝතිස්ස රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 614) දාගැබ් තුන ම අළුත් වස්ත්‍ර වලින් ආවරණය කළ බවත් ඒවායේ මහා පූජාදිය පැවැත්වූ බවත් වාර්තා වී ඇත (මහාවංසය 42, 44) ශිලාමේඝවර්ණ රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 619-628) එතුමා දාගැබ් තුනට ම සත්කාර කළ බව පමණක් මහාවංසය වාර්තා කර ඇත. ( එම: 42, 65) එහෙත් මේ කවරාකාරයේ සත්කාර කිරීමක් දැයි පැහැදිලි කර දක්වා නැත. දෙවන මිහිඳු (777-797) රාජ්‍ය සමයේ දී ද එතුමා මහාථූප තුනට සත්කාර කොට මහා පූජා කරවූ බව මහාවංශය වාර්තා කරයි. (එම: 46, 122) නමුත් මෙහි දී ද වැඩි විස්තර වාර්තා නොවේ. පූජාවලියෙහි කියැවෙන පරිදි 4 වන කාශ්‍යප රජු (ක්‍රි.ව. 898-914) හගිරිනකා මහ සෑය හෙවත් අභයගිරි දාගැබ ප්‍රතිසංස්කරණය කොට ඇත. (පූජාවලිය 1997: 781) සද්ධර්ම රත්නාකරය ට අනුව මෙතුමා රියන් 140 උසට දාගැබ බඳවා එහි ගර්භය තුළ **ධර්ම ධාතුව** තැන්පත් කළ බව කියැවේ. (සද්ධර්ම රත්නාකරය 1995: 359) කෙසේ වෙතත් මහාවංසයේ මෙම රජු අභයගිරි දාගැබේ කරන ලද ප්‍රතිසංස්කරණයක් පිළිබඳව සඳහනක් නැතත්

අභයගිරි විහාරයෙහි එතුමා නමින් ප්‍රාසාදයක් කරවා ඊට ගමක් ද වස්තු හා වෙනත් පරිත්‍යාගයන් කළ බව වාර්තා කොට ඇත. (මහාවංසය 1967: 52, 13-14) අභයගිරි දාගැබෙහි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ඉතා වැදගත් සඳහනක් තුන් වන සේන (ක්‍රි. ව. 938-946) රාජ්‍ය සමයේ දී මහාවංසය වාර්තා කරයි. (එම: 54, 33) එතුමා අභයගිරි දාගැබ් මළුවේ ගල් ඇතිරවීම සඳහා සතලිස් දහසක් වැය කරවූ බව කියැවේ. මෙසේ වැය කළ මූල්‍ය වර්ගය වාර්තා වී නැතත් ඒවා කහවණු විය හැකිය.

ඉහත දක්වා ඇති පරිදි මළුවේ ගල් පුවරු ඇතිරීමට දායකත්වය සැපයූ තුන් වන සේන රජුට අයත් සෙල්ලිපියක් නවමත් සලපතල මළුව මතින් සොයා ගෙන නැතත් ඊට සමකාලීන හෝ ආසන්න කාලවකවානු වලට අයත් විවිධ පුද්ගලයින් විසින් අතුරන ලද ගල් පුවරු හේතුවෙන් පෙනෙන්නේ රජුට අමතරව වෙනත් අයවලුන් ද ඊට සම්මාදම් වූ බවය. පස් වන කාශ්‍යප (ක්‍රි:ව: 914-923) රජුට අයත් අභයගිරි පුවරු ලිපියට අනුව අභයගිරි දාගැබෙහි කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය වාර්තාවක් පවත්වා ගෙන ගිය බවට සාධක ලැබේ. (Ez. I, 1912: 45) 4 වන මිහිඳු රජුට අයත් පුවරු ලිපි දෙකක් අභයගිරියෙන් හමු වී ඇති අතර ඉන් අංක 1 ලිපියෙහි අභයගිරි දාගැබ විස්තර කිරීම සඳහා උපමා භාවිත කරන අතර එය හිමාල පර්වතය මෙන් සෝභන බව පවසයි. (Ez I, 1912: 218 ) මින් පැහැදිලි වන්නේ අභයගිරි දාගැබ එම භූමියේ තිබූ විශාලතම නිර්මාණය වූවා සේම එය සුදු පැහැයෙන් බැබලෙමින් තිබූ බවය. මෙම ලිපියේ අභයගිරි සෑය හඳුන්වා ඇත්තේ **අබයතුරා මහ සෑ** යනුවෙනි. අභය-උත්තර යන්න ලේඛන පහසුව හා කලාත්මක යෙදුමක් ලෙස මෙසේ වෙනස් කරගත් බව පෙනීයයි. මෙම රජුට ම අයත් දෙවන ලිපියෙහි ද දාගැබේ පිළිසකර කිරීම් සඳහා අය සහ වැය ලේඛනයක් පවත්වා ගෙන ගිය බව පෙනීයයි. ( Ez I 1912: 233 ) මෙයින් පෙනෙන්නේ මනා පරිපාලනයක් යටතේ දාගැබේ කටයුතු ද පවත්වා ගෙන ගිය බවය.

දහවන සියවසේ අවසානයත් සමග දකුණු ඉන්දියානු ආක්‍රමණ හේතුවෙන් බිඳ වැටෙන අනුරපුර රාජධානිය ඉන්පසු වසර 70 කට



CamScanner

ආසන්න කාලයක් වල්බිහිව ගිය බව පැහැදිලි කරුණකි. මෙම කාලය තුළදී විනාශයට පත් අභයගිරිය ඇතුළු දාගැබ් නැවත ප්‍රතිසංස්කරණය කෙරෙන්නේ පොළොන්නරු සමයේ දී ය.

ද්‍රවිඩ බලය යටපත් කොට නැවත රජය පිහිටුවන 1 වන විජයබා (1055-1110) රජු අනුරාධපුරයේ දී අභිෂේක උත්සවය පැවැත්වීය. ඔහු එහි දී ශ්‍රී මහා බෝධිය ප්‍රතිසංස්කරණය කර ඇත. (මහාවංසය 1967: 59' 8, 60' 33, 63) නමුත් අභයගිරිය ගැන සඳහනක් නැතත් එතුමා අභයගිරියට ද පැමිණුනාට සැක නැත. ඔහුගෙන් පසුව අනුරාධපුරයේ පූජ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ මහා ව්‍යාපාරයක් ගෙන යන්නේ මහා පරාක්‍රමබාහු (ක්‍රි:ව: 1153-1186) රජතුමා විසිනි. එතුමා සොළී සේනාව විසින් විනාශ කර තිබූ පූජණීය ඉදිකිරීම් නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එක් ඇමතියෙකුට භාර දී ඔහුට රිසි පරිදි එම කටයුතු පවත්වා ගෙන යාමට පැවරූ බව මහාවංසය කියයි. (එම: 74, 1-7) පරාක්‍රමබාහු සමයේ දී රුවන්වැලිසෑය , අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය ආදී දාගැබ් සියල්ල ගරාවැටී ගඩොල් මතු වී ගහකොළ වැවී වලසුන්ගේ හා දිවියන්ගේ වාසභූමි වී තිබූ බව වැඩි දුරටත් කියයි. (එම: 78, 100-104) එකසිය හතළිස් රියන් උස අභයගිරි දාගැබේ සම්පූර්ණයෙන් ම පිරිසිදු කොට සුණු පිරියම් කර ඇත (එම: 78' 101-106) පරාක්‍රමබාහු රජු විසින් අනුරාධපුරයේ කරන ලද මෙම සංරක්ෂණ කටයුතු පිළිබඳව රුවන්වැලි සෑ මළුවේ ඇති එතුමාට අයත් සෙල්ලිපියක වැඩි දුරටත් කරුණු සඳහන්ය. (අප්‍රකාශිතය) එහි අභයගිරිය ගැන පැහැදිලිව සඳහනක් නැතත් අනුරපුරයේ කළ ප්‍රතිසංස්කරණ ගණනාවක් ගැනම කියැවේ. මේ හැර රජතුමා රුවන්වැලි දාගැබේ කටයුතු නිමවා රුවන්වැලි සෑය වෙත පැමිණ කොත් පළඳවා කරන ලද පූජාවක් ගැන ද මහාවංසය වාර්තා කරයි. මෙය හැඟීම් දනවන අයුරින් හා සිත් ගන්නා ලෙසින් ඉදිරිපත් කොට තිබීම ද විශේෂයකි. (මහාවංසය 1967: 76, 106-122) මේ අවස්ථාවේ දී රජු අභයගිරි දාගැබ වෙත පැමිණුනාට සැකයක් නොමැත. බටහිර ආයකය අබියස කරන ලද කැනීමක දී ගල් පුවරුවක් යට තිබී පරාක්‍රමබාහු රජුට අයත් තඹ කාසියක් හමු වීමත් නැගෙනහිර ආයකයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ

හා සිතුවම් ආශ්‍රයෙන් ඒවා පොළොන්නරු සමයේ දී ප්‍රතිසංස්කරණයකට ලක්වූ බවපැහැදිලිය. (කුලතුංග 2004: 4)

පැරකුම්බා රජුගෙන් පසුව කල්‍යාණවතී බිසවගේ සමයේ දී රුවන්වැලි සෑයෙහි මහ පූජා පැවැත්වූනු බැව් එහි ඇති ශිලාලේඛනයක සඳහන් වෙතත් අභයගිරිය ගැන එහි කිසිඳු සඳහනක් නැත. (Ez IV 1943: 253-260) එසේ ම නිශ්ශංකමල්ල රජතුමා ද අනුරපුරයට පැමිණ රුවන්වැලියේ මහා පූජා පවත්වා ඇතත් (Ez II 1985: 76-78) එතුමාගේ කිසිඳු ශිලාලේඛනයක අභයගිරි දාගැබ ගැන සඳහනක් නැත. සිව්වැනි විජයබාහු (ක්‍රි:ව: 1270-1272) රජුගේ සමයේ දී එතුමා අනුරාධපුරයට ගොස් රුවන්වැලි දාගැබෙහි ප්‍රතිසංස්කරණ කළ බව කියැවේ. (මහාවංසය 1967: 88, 83) ඇතැම් විට ඒ අවස්ථාවන්හි දී සුළු අවධානයක් අභයගිරිය සම්බන්ධයෙන් දක්වූවා විය හැකිය. මේ හැර මහනුවර සමයේ දී විජය රාජසිංහ (ක්‍රි:ව: 1739-1747) රජු අනුරාධපුරයට පැමිණ මහා පූජා පැවැත්වූ බව කියැවේ. (එම: 98' 87) එසේ ම මහනුවර සමයේ දී ද විශාල ශාසනික මෙහෙවරක් ඉටු කළ කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි:ව: 1747-1781) රජු ද සපිරිවරින් අනුරාධපුරයට පැමිණ උතුම් බෝධීන් වහන්සේට හා චෛත්‍යයන්ට ද ඇත්, අස් ආදීන් ද රන්, රිදී ආදියෙන් ද පූජා පැවැත්වූ බව කියැවේ. (එම: 99, 36-37) කෙසේ වෙතත් අභයගිරි දාගැබ ශ්‍රී මහා බෝධියෙන් හා රුවන්වැලි දාගැබෙන් ද මදක් බැහැරින් පිහිටි නිසා ඒ කෙරෙහි පැවති අවධානය බෙහෙවින් දුරස්වන්නට ඇතැයි සිතිය හැකිය.

බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් අවධියේ දී එනම් 1818 දී පමණ අනුරාධපුරයට පැමිණි ඉංග්‍රීසි ජාතික චිත්‍ර ශිල්පියෙකු විසින් අඳින ලදැයි සැලකෙන අභයගිරියේ හා ලංකාරාමයේ සිතුවම් දෙකක් වේ. (විමලානන්ද 1964: 60, 72) මෙම රූප සටහන් වලට අනුව එකල දාගැබ සම්පූර්ණයෙන් වන ගහනයට ලක්ව තිබී ඇති අතර දාගැබ වෙතට සමීප වීමට කුඩා අඩි පාරක් තිබී ඇත. ගමන් බිමන් අශ්වයා පිට කරන ලද බව පැහැදිලිය. මෙහිදී අපට (1747-1781) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද



CamScanner

අනුරාධපුරයට පැමිණ ශ්‍රී මහා බෝධීන් වහන්සේට හා දාගැබ් වලට ඇතුන් හා අශ්වයන් පූජා කළාය යන ඉහත දැක්වූ මහාවංස සඳහන ද සිහිපත් වේ. කෙසේ වුව ද අභයගිරි දාගැබ හා ජේතවන දාගැබෙහි නම් මාරු කොට භාවිත කිරීමට තරමට ම මෙම ස්ථාන ජනතා අවධානයෙන් ඈත් වූ බව සඳහන් කළ යුතුය. මෙම නම් මාරු වීම කවදා සිට සිදු වූයේ දැයි ස්ථිරව ම සඳහන් කළ නොහැකි වුවත් ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහත්මා සඳහන් කරන්නේ මෙය 1833 න් පමණ පසුව සිදුවූවා විය හැකි බව ය. එතුමා වැඩි දුරටත් සඳහන් කරන්නේ රජයේ මිනුම් කටයුතු භාර **ස්කිනර්** මහතා විසින් 1833 දී අනුරපුර ස්මාරක සම්බන්ධයෙන් පිළියෙල කළ සැලසුමෙහි නිවැරදි ලෙස ම මෙම දාගැබ් දෙක සලකුණු කර ඇති බව යි. මෙම සැලසුම උඩමළුව විහාරස්ථානයේ ඓතිහාසික ලිපි ලේඛන අතර ඇතැයි ද පවසනු ලැබීය. (1993-12-20, අභයගිරියේදී කරන ලද කරුණු පැහැදිලි කිරීමකින්) මෙම සැලසුම අපට ද දැක ගැනීමේ අවස්ථාව උදාවිය. 1888 දී මෙම ස්ථාන දෙකෙහි නම් මාරුව පිළිබඳව ලංකා ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ ලේකම්වරයා වූ **හියු නෙවිල්** මහත්මා රජයට වාර්තා කර ඇත. (Ceylon literary Register II, 1887-88, p.294) 1906 දී පමණ පැරණි ලංකාව පිළිබඳව ග්‍රන්ථයක් සම්පාදනය කළ **හෙන්රි පාකර්** ද මෙම වෙනස උදාහරණ සහිතව අවධානය යොමු කොට ඇත. (Parker 1981: 302-5) එසේම 1912-1914 අතර පුරාවිද්‍යා කොමසාරිස් වරයා ලෙස කටයුතු කළ **ඊ. ආර්. අයර්ටන්** මහතා රත්නප්‍රාසාදයෙන් හමු වූ ගජබා රජුගේ පුවරු ලිපිය හා කණිට්ඨ තිස්ස රජුට අයත් අභයගිරි සලපතළ මළුවේ ශිලාලේඛනය ද සැලකිල්ලට ගනිමින් එහි සඳහන් **උතර මහ චෙත** යනු අභයගිරි දාගැබ බව ඔහු සඳහන්කර ඇත. (Hocart 1924: 12) එහෙත් මෙම නම් මාරු වීම පිළිබඳව ඍජු ලෙසම උදාහරණ ගණනාවක්ම උපයෝගී කර ගනිමින් කරුණු ඉදිරිපත් කර නිරාකරණය කරනු ලබන්නේ සෙනරත් පරණවිතාන මහත්මා විසිනි. (Ez IV1943: 136-141)

ඉහත දී සඳහන් කළ පරිදි අභයගිරි දාගැබ සම්බන්ධ ඓතිහාසික කරුණු අතරෙහි තවත් විශේෂ සිද්ධියක් වන්නේ 1815 න් පසු ලංකාවේ



CamScanner

ස්ථිර පදිංචියෙන් තොරව පැවති ඉඩකඩම්වල අයිතිය 1840 අංක 12 මුඩු බිම් පනත යටතේ රජයට පවරා ගැනීමේ දී අභයගිරි පූජා භූමිය ද ඊට ලක් වීමයි. (Silva 1973: 12) අනුරාධපුරයේ පූජ්‍යස්ථාන අතුරින් ශ්‍රී මහා බෝධිය හා රුවන්වැලි සෑයෙහි භික්ෂූන් වහන්සේලා සහ බෞද්ධ ජනයා නිතර ගැවසෙන ස්ථානවල දේපළ හැර අනෙක් පූජ්‍යස්ථාන මෙසේ රජයට පවරා ගැනුනි. (කරුණානන්ද 1992: 22) මෙම ඓතිහාසික සිද්ධස්ථානවල අයිතිය නැවතත් ලබා ගැනීමට ගිහි පැවිදි බෞද්ධ පිරිස් ගත් උත්සහයේ ප්‍රතිඵලයක් වශයෙන් 1856 විහාරගම් පනතට අනුව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් 1872 නොවැම්බර් මස 20 වැනි දින ඔප්පුවක් මාර්ගයෙන් අභයගිරිය ද ඇතුළු වූ අටමස්ථානයේ භාරකාරත්වය උඩමළුවේ අධිපති හිමියන්ට පැවරීය. (Hansard 1901 oct : 23) එහෙත් ඒ වන විට මෙම පූජ්‍යස්ථාන අතුරින් භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරන ලද්දේ උඩමළුව විහාරස්ථානයේ පමණිය. නාරන්විට සුමණසාර හිමියන් රුවන්වැලි විහාරයට පැමිණ ඇත්තේ ද 1873 වර්ෂයේ දී ය. (හරිශ්චන්ද්‍ර 2001: 155) මෙම පූජ්‍යස්ථානවල පදිංචිය සඳහා අවසර දීමට සුදුපාලකයින් වැඩි කැමැත්තක් දක්වා නැත. එවකට අනුරාධපුරයෙහි ඒජන්ත වරයා ලෙස කටයුතු කළ **එල්. ඩබ්ලිව්. බූත්** මහතා 1901-10-19 වැනි දින ලංකාරාම මළුවෙහි නැවතී සිටි **සියම් භික්ෂූන්** වහන්සේලා දෙනමක් එම භූමියෙන් පිටමං කරවීමට කටයුතු කර ඇත. ඔවුන් සඳහන් කර ඇත්තේ ලංකාරාම දාගැබ සමීපයේ රජය සතු ඉඩමෙහි අනවසරයෙන් එම භික්ෂූන් වහන්සේලා පදිංචි වී සිටි බවය. (Diary, GANCP, 24 Oct. 1901, SLNA 41/499 - සිතියම් සහිත පුරාවිද්‍යාව, 328 පිටුව) මෙයින් පෙනෙන්නේ බ්‍රිතාන්‍ය රජය අටමස්ථානයට 1872 දී භාර දී ඇත්තේ බොහෝ විට දාගැබ වටා ඇති සුළු භූමි කොටසක් පමණක් බවය. අවම වශයෙන් ථූපාරාමයේ වැලි මළුව වත් අටමස්ථානය සතු නොවූ බව වලිසිංහ හරිශ්චන්ද්‍රයන්ගේ සටහන් වලින් පැහැදිලි වේ. (2001, 92, 296-336) මේ තත්වය යටතේ කලක් යනතුරු අභයගිරි විහාරයට ද භික්ෂූන් වහන්සේලා පදිංචිය සඳහා පැමිණි බවට සාධක නැත. එහෙත් බ්‍රිතාන්‍ය ජාතිකයින් මෙම ආරාමය පිළිබඳව නිරන්තර වාර්තා කිරීම් වල යෙදුනි. ඒ අනුව 19

වන සියවසේ මැද භාගයේ දී ලංකාවේ සේවය කළ **එමර්සන් ටෙනන්ට්** නම් ඉංග්‍රීසි ජාතිකයා ලංකාව පිළිබඳව කරන ලද කෘතියෙහි ජේතවනය යන මාතෘකාව යටතේ අභයගිරි දාගැබ පිළිබඳ දීර්ඝ වාර්තාවක් ඉදිරිපත් කොට ඇත. බ්‍රිතාන්‍ය ජාතිකයින්ට දැනෙන සේ බ්‍රිතාන්‍යයේ ඇති යම් යම් වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් හා ස්ථාන සමග සසඳමින් හා සමකාලීන බ්‍රිතාන්‍ය සමාජයේ කර්මාන්ත උදාහරණයට ගනිමින් අභයගිරි දාගැබේ ප්‍රෞඪත්වය කියා පෑමට ඔහු උත්සහ දරා ඇත. එම වාර්තා වාර්තාවල් දාගැබේ විශ්කම්භය අඩි 360 ක් හා උස අඩි 249 ක් වශයෙන් දක්වා ඇත. එසේම මුළු බැම්මේ ප්‍රමාණය ඝන අඩි දෙකෝටියකට අධික වේ. වත්මන් යන්ත්‍ර වලද ආධාර ලබා ගනිමින් කර්මාන්ත කරුවන් (මේසන්වරුන්) 500 දෙනෙකු වැඩ කළහොත් වසර 7ක් පමණ ගතවන බවත් මේ සඳහා අවම වශයෙන් රන් පවුම් දශ ලක්ෂයක්වත් වැයවෙන බව කියා ඇත. (Tennent 1977: 1056) ඔහු තව බොහෝ තොරතුරු තම ග්‍රන්ථයේ ඉදිරිපත් කොට ඇත. ලංකාවේ සිවිල් සේවකයෙකු වූ **එස්. එම්. බරෝස් මහත්මා** ද 1884-86 පමණේ දී අභයගිරියේ පුරාවිද්‍යාත්මක කටයුතු බොහොමයක් සිදු කළ බව ඔහුගේ වාර්තා සාක්ෂි දරයි. (Burrows 1886 : 91-97)

මෙයින් පසු අභයගිරි දාගැබ පිළිබඳ තත්වාකාරයෙන් තොරතුරු, ඡායාරූප හා සැලසුම් ඉදිරිපත් කිරීමේ ගෞරවය බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයෙකු වූ ජේ. ජී. ස්මිදර් මහතාට හිමි වේ. (Smither 1993: 61-67) ඔහු නිවැරදි ලෙස හා සැලකිල්ලෙන් කරන ලද මෙම වාර්තා කිරීම වර්තමානයට ද විශාල ආලෝකයක් ලබා දෙන අතරම කදිම ආදර්ශයක් ද සපයයි. ස්මිදර් මහත්මාගේ කාර්යයන් පරණවිතාන මහත්මා ද ඉහළින් වාර්තා කොට ඇත. " *මෙම ගෘහ නිර්මාණ ලක්ෂණයන් පිළිබඳ පැහැදිලි විස්තර කිරීම් ගැනත් නිවැරදි රූ සටහන් ඇඳ තිබීම ගැනත් අප විසින් මිය ගිය ජේ. ජී. ස්මිදර් මහතාට විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුයි* " යනුවෙන් සඳහන් කරයි. (පරණවිතාන 1997: 15) ඔහු තුල තිබූ පර්යේෂණාත්මක දැනුම මෙම කෘතියෙන් කදිමට අනාවරණය කෙරේ.

ස්මිදර් විසින් අභයගිරි දාගැබේ මිණුම් පහත අයුරින් ඉදිරිපත් කොට ඇත.

1. ස්තූප ගර්භයේ විෂ්කම්භය ( මුදුන් පේසාව මතින් ) අඩි 310
2. ස්තූප පාදයේ විෂ්කම්භය අඩි 355
3. සලපතල මළුවේ සිට පළමු පේසාවේ උස අඩි 6.6
4. එම ඉහළම පේසාවට උස ( පේසා 3 ම ) අඩි 16
5. සලපතල මළුවේ සිට ගර්භය මතු සිටට අඩි 154.6
6. සලපතල මළුවේ සිට හතරැස් කොටුව මතුපිටට අඩි 187.6
7. සලපතල මළුවේ සිට කොත් කැරැල්ල මතුපිටට අඩි 245

(Smither 1993: 64)

මෙයින් පසුව අභයගිරි දාගැබ පිළිබඳව **හෙන්රි පාකර්** මහත්මා ද ස්මිදර්ගේ මිණුම ද සැලකිල්ලට ගනිමින් අභයගිරි දාගැබ පිළිබඳ ඓතිහාසික තොරතුරු මෙන් ම ඔහුගේ අධ්‍යයනයෙන් අනාවරණය කොට ගත් තොරතුරු ඉදිරිපත් කොට ඇත. (Parker 1981: 299-307) එතුමා නිවැරදි ලෙසින් ම ජේතවනය හා අභයගිරිය හඳුනාගෙන ඒ අනුව කරුණු ඉදිරිපත් කොට තිබීම ද විශේෂත්වයකි. වංසකතාගත තොරතුරු මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක කෙරෙහි ද ඔහු අවධානය යොමු කොට ඇත. විශේෂයෙන් ම මෙහි දී එතුමා **එස්. එම්. බරෝස්** මහතා විසින් ( 1884-86 ) අභයගිරියේ දකුණු ආයකය අබියස සුන්බුන් ඉවත් කිරීමේ දී සොයාගත් කණිට්ඨ තිස්ස රජුගේ නම සඳහන් ශිලාමය ධාතු කරඬු දෙකක් පිළිබඳ දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කරයි. (Parker 1981: 302) කණිට්ඨ තිස්ස රජුට බොහෝ කලකට පසු ජේතවන දාගැබ ඉදි වූ නිසා එම රජුගේ නම සඳහන් ධාතු කරඬුවක් කෙසේවත් ජේතවන දාගැබේ දකුණු ආයකයේ තිබිය නොහැකි යැයි පාකර් සඳහන් කළේය. එතුමා ස්මිදර් මහත්මා විසින් ඉදිරිපත් නොකළ දාගැබේ ඇතැම් මිනුම් ද ඉදිරිපත් කිරීමට සමත්ව ඇත. ඒ අනුව



CamScanner

| | |
|---|---|
| හතරැස් කොටුවේ දිග පළල | අඩි 75 X 75 |
| හතරැස් කොටුවේ උස | අඩි 33 |
| හතරැස් කොටුවේ සූර්ය ලාංඡනයේ විශ්කම්භය | අඩි 6.6 |
| හතරැස් කොටුවේ එක් එක් පැත්තක ගරාදි කුළුණු ආකෘති සංඛ්‍යාව | 12 |
| හතරැස් කොටුවේ එක් එක් පැත්තක ගරාදි කුළුණුවල පළල | අඩි 2.3 |
| හතරැස් කොටුවේ ගරාදි ආකෘති සංඛ්‍යාව | 14 |
| එක් එක් හරස් ගරාදියක පළල | අඩි 1.3 |
| කොත් කැරැල්ලේ පහළ කෙළවරෙහි විශ්කම්භය | අඩි 30 |
| කොත් කැරැල්ලේ ශීර්ෂාකාර කොටසේ උස | අඩි 5 |
| කොත් කැරලි අතර පරතරය | අඩි 2.6 |
| කොත් කැරැල්ලේ උස | අඩි 57.6 |
| ආයකයේ පළල | අඩි 45.6 |
| ආයකයේ උස | අඩි 16 |

(Parker 1981: 306-307)

අභයගිරියේ පුරාවිද්‍යාත්මක කටයුතු සම්බන්ධයෙන් උදාවුනු වැදගත් කාල පරිච්ඡේදයක් වශයෙන් 1890 සිට 1912 දක්වා අතර කාලය දැක්විය හැකිය. මේ කාල වකවානුවේ දී පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස කටයුතු කළ එච්. සී. පී. බෙල් මහතා අභයගිරි භූමියෙහි ගවේෂණ කැනීම් හා සංරක්ෂණ කටයුතු සිදුකළ බව ඔහුගේ වාර්ෂික පුරාවිද්‍යා වාර්තා වලින් පැහැදිලි වේ. (ASCAR 1893: 5, 1894: 2-3, pl. xiv-xxxi , 1904: 4) ඔහු මෙම වාර්තා කිරීම් සියල්ල සිදු කර ඇත්තේ ජේතවනය නමිනි. මේ හැර අභයගිරියේ ඇති ශිලාලේඛන කීපයක් ද එතුමා විසින් ඩී. එම්. ඉසැඩ් වික්‍රමසිංහ මහතා සමග එක්ව පළකොට ඇත්තේ ජේතවන යන නාමය යටතේය. (Ez I 1912 : 1-9, 41-57, 66-74, 213-229, 230-241, 252-259) අභයගිරි දාගැබ සම්බන්ධයෙන් බෙල් මහතාගෙන් සිදු වූ වැදගත් ම සේවාවක් නම් ගරා වැටී තිබූ දාගැබේ උපරිභාගය තව දුරටත් විනාශයට පත්වීම වලක්වා ගැනීම සඳහා විශේෂඥ උපදෙස් ලබා ගනිමින් එය ප්‍රතිසංස්කරණය කිරීමයි.

එතුමා 1897 ජනවාරි මාසයේ දී ස්තූපයේ සතරැස් කොටුවේ පැවති අන්තරායකාරී ස්වභාවය පිළිබඳව පරීක්ෂා කොට දිසාපති වරයාට හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යභාර ඉංජිනේරුවරයාට දැනුම් දුන්නද ඔවුන් ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියා මාර්ගයක් හෝ ප්‍රතිපාදන වෙන් නොකළ හෙයින් බෙල් දෝෂාරෝපණ මුඛයෙන් කථා කර ඇත. (Oertel 1903: 461)

කෙසේ වෙතත් මේ වන විට අභයගිරිය දාගැබට අමතරව ජේතවනය, මිරිසවැටිය, ආදී දාගැබ් ද අනතුරු දායක තත්වයක පැවති හෙයින්, මේ සියලු දාගැබ් සඳහා ක්‍රමවත් ප්‍රතිසංස්කරණ සැලැස්මක් සකස් කිරීම සඳහා යටත් විජිත ආණ්ඩුව බ්‍රිතාන්‍යයේ රාජකීය ආසියාතික සංගමය විසින් ඉන්දියාවේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ නිර්මාණ ශිල්පියෙකු වූ **එෆ්. ඕ. ඔටෙල්** ලංකාවට ගෙන්වා දාගැබ් සංරක්ෂණය හා කල් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන ඇත. ඕටෙල් මේ සම්බන්ධයෙන් වෙනම ම වාර්තාවක් පිළියෙල කොට රජයට ඉදිරිපත් කොට ඇත. ඇතැම් විට මෙය ලංකාවේ පැරණි ස්මාරක සංරක්ෂණය වෙනුවෙන් පිළියෙල වූ පළමු වාර්තාව ද විය හැකිය. මෙම නිර්මාණ ශිල්පියා විසින් සකස් කරන ලද වාර්තාවේ අභයගිරි දාගැබේ සංරක්ෂණ කටයුතු වලට අදාල උපදෙස්, සැලසුම් හා ඡායාරූප ද ඇතුලත්ව ඇත. ඔහු සතරැස් කොටුව හා කොත් කැරැල්ල බිඳවැටීම වලක්වාලීම සඳහා කළ යුතු ප්‍රතිකර්ම විශේෂයෙන් එම වාර්තාවේ දක්වා ඇත. (Oertel, 1903: 8) ඔහු වැඩි දුරටත් සඳහන් කරන පරිදි දාගැබේ ගර්භයට ගස් වලින් සිදුව ඇති හානිවලට අමතරව වෙනත් මාර්ග වලින් හානි සිදු වී නොමැත. නමුදු ගස් වල අතු සෑම වර්ෂා කාලයකට පසුව පරිස්සමින් කපා දැමීමට උපදෙස් දී ඇත. හානි වූ හතරැස් කොටුව හැකි ඉක්මනින් සංරක්ෂණය කළ යුතු බවත් ඒ සඳහා ආධාරක පැති බැමි (කයියෝරු) යෙදිය යුතු බවට නිර්දේශ කර ඇත. ඒ සඳහා කොන්ක්‍රීට් ගඩොල් හා සිමෙන්ති භාවිත කිරීමට අවසර දී ඇත. අනෙක් පැලුම් ස්ථාන හුණු බදාමයෙන් සැකසිය යුතුය. කොත් කැරැල්ල ආරක්ෂා වීම සඳහා කුඩා තාණ විශේෂ හා කුඩා පඳුරු වැවෙන්නට හැරීමට යෝජනාකර ඇත. විශේෂයෙන් ස්තූපය නිරතුරුව

නිරීක්ෂණයට ලක් කළ යුතු බව ද වැඩි දුරටත් සඳහන් කරයි. ඔහු ඉදිරිපත් කරන සමස්ථ වාර්තාවෙන් මතු කෙරෙන ප්‍රධාන කරුණු 3 ක් වේ.

එනම්,

1. සංරක්ෂණ කාර්යය කොතෙක් කඩිනම් වුවද ඒ පිළිබඳ පූර්ණ විද්‍යාත්මක ගවේෂණයකින් තොරව නොකළ යුතුය.

2. ප්‍රතිසංස්කරණයට වඩා ශේෂ වී ඇති ප්‍රමාණය ආරක්ෂා කර ගැනීමට උත්සහ දැරීම.

3. අනාගත සංරක්ෂණයක් සඳහා අවශ්‍ය පසුබිම සකසා තැබීම.

ඔහුගේ මෙම අදහස් අතිශය විද්‍යාත්මක වන අතර ඔටෙල් ගේ මෙම නිර්දේශය අනුව බෙල් මහතා විසින් අභයගිරි දාගැබේ සතරැස් කොටුවේ සංරක්ෂණ කටයුතු සිදු කළ බව බෙල්ගේ වාර්තා සහ සැලසුම් වලින් පෙනීයයි. (ASCAR, 1910-1911, p.17, - 1911-1912, pl. xiii, xiv) ඔහුගේ සේවා කාලයෙහි අවසන් සමයේ දී අභයගිරි විහාරයෙහි වාසය සඳහා භික්‍ෂූන් වහන්සේ නමක් ද පැමිණි බවට සාධක වේ. කළුතර දිස්ත්‍රික්කයේ හොරණට නුදුරු කුඹුකේ විහාරස්ථානයෙහි **කුඹුකේ ධම්මාරාම** නම් හිමි නමක් 1909 දී එහි වාසය සඳහා පැමිණ ඇත. උන්වහන්සේ වසර 2 ක් පමණ මහජනයාගෙන් ලද අධාර උපයෝගී කර ගනිමින් දාගැබේ සහ එහි මළුවේ කැලය ඉවත් කර පිරිසිදු කොට ඇත. (හරිශ්චන්ද්‍ර 2001: 198) කෙසේ වුව ද මුන්වහන්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව දකුණු ආයකය යටින් හෑරීම හේතුවෙන් එහි ඉහළ කොටස කඩාවැටුණු බව ද පැවසේ. (කුලතුංග 2004: 2 - 11) එම ස්වාමීන් වහන්සේ රෝගී භාවයට පත්වීම නිසා **පළන්තොරුවේ සෝභිත** නම් හිමි නමක් 1910 මැයි මස සිට 1911 ජුලි මස දක්වා චෛත්‍යස්ථානයේ දියුණුවට කටයුතු කරගෙන ගිය අතර අටමස්ථාන කොමිටිය හා හටගත් ආරවුල් හේතුවෙන් ඉන් ඉවත් වූ බව කියැවේ. (හරිශ්චන්ද්‍ර, 2001: 198)

1912 දී අටමස්ථාන කොමිටිය යටතේ **කඩිහාරේ ගුණරතන** නම් භික්ෂුවක් අභයගිරියේ වාසය සඳහා පැමිණි අතර උන්වහන්සේ අභයගිරි ස්තූපයේ දකුණු ද්වාර මණ්ඩපයට වම් පසින් වැලි මළුව මත තාවකාලික කුඩා පන්සලක් සකසා වාසය කරනු ලැබ ඇත. (අපවත් වී වදාළ පෙරිමියන්කුලමේ උපතිස්ස හිමියන් සමග 1993-11-23 වැනි දින කරන ලද සාකච්ඡාවකින්) කඩිහාරේ ගුණරතන හිමියන් විසින් දාගැබේ පේසා වළලු තුනෙහි කොටසක් නැවත ඉදිකර ඇත. (Wikramagamage 1992 : 30) මේ හැර උන්වහන්සේ විසින් 1918 දී දැනට විහාර මළුවේ දකුණු ආයකය ඉදිරිපස ඇති පිළිමගෙය ඉදිකරනු ලැබඇත. (1993-11-23 සාකච්ඡාවෙන්) මෙම විහාර මන්දිරය ඉදිකළ ස්ථානයෙහි පැරණි විහාර ගෘහයක් තිබූ බව ද ස්මිදර් විසින් වාර්තාකොට ඇත. එම පැරණි විහාර ගෘහයේ දිග අඩි 24 ක් හා පළල අඩි 15 ක් වන බවත් එහි අඩි 6 අඟල් 6 ක් උස ගල් කණු 8 ක් ඇති බවත් ඔහු විසින් වාර්තා කර ඇත. (Smither 1993: 65) එහෙත් පසුව ඉදිකළ විහාර ගෘහය පුරාවිද්‍යාත්මක පදනමක් මත ඉදිකරන ලද්දක් නොව කාලීන අවශ්‍යතාවය අනුව සාදන ලද්දක් බව සඳහන් කළ හැකිය. මේ තුළ හිඳි, හිටි සහ සැතපෙන බුදු පිළිම නිර්මාණය කොට ඇති අතර විෂ්ණු, මෛත්‍රී හා වලගම්බා රජුගේ ප්‍රතිමාවක් ද වේ. මෙම පිළිම ගෙය 2005 වසරේ දී නැවත ප්‍රතිසංස්කරණය කරනු ලැබීය. 1912 දී බෙල් මහත්මාගේ විශ්‍රාම ගැනීමෙන් පසුව පුරාවිද්‍යා කොමසාරිස් තනතුරට පත් ඊ. ආර්. අයර්ටන් මහත්මා ද අභයගිරි විහාරයෙහි විශේෂයෙන් රත්නප්‍රාසාදයෙහි කැනීම් හා සංරක්ෂණ කටයුතු සිදු කරනු ලැබීය. (Hocart 1924: 12 , pl. 70-72) මෙයින් පසුව නැවතත් ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතු සංවිධානාත්මක ලෙස ක්‍රියාත්මක වන්නේ 1924 දී පමණ **ඒ., එම්. හොකාර්ට්** මහත්මා යටතෙහිය. ඔහු දාගැබෙහි කැනීම් හෝ සංරක්ෂණ කළ බවට සාධක නැතත් අභයගිරි දාගැබට බටහිරින් වූ ගොඩනැගිලි කීපයක් ම ගවේෂණයට, කැනීමට හා සංරක්ෂණයට ලක්කොට ඇත. (ibid 54-55, pl. 77) අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේ දාගැබ් මළුවෙහි සණ්ඨා කුළුණක් ඉදිකිරීමට උත්සාහ කිරීමේ දී එතුමා එය තහනම් නොකළ අතර එම භූමියේ ඓතිහාසිකත්වයට ගැලපෙන පරිදි සැලැස්මක් තමා විසින් ම පිළියෙල කොට විහාරස්ථානයට ලබා දීම

ප්‍රශංසනීය කට යුත්තකි. මෙම සණ්ඨා කුළුණු 1928 දී ගොඩනගන්නට යෙදුනි. ( පෙරිමියන්කුලමේ උපතිස්ස හිමි සමග 1993-11-23 දින කරන ලද සාකච්ඡාවකින් ) මෙයින් පසුව අභයගිරි විහාරය හා අභයගිරි දාගැබ වෙනුවෙන් කරන ලද ඉතාම වැදගත් කාර්යයක් ඉටු කරන ලද්දේ සෙනරත් පරණවිතාන මහත්මා විසිනි. එතුමා 1923 වර්ෂයේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග කටයුතු කළ අතර 1935 වර්ෂයේ සිට පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස කටයුතු කරන්නට යෙදුනි. ඔහු 1944 වර්ෂයේදී සලපතළ මළුවේ ගිණිකොණ දිග ගරාවැටී තිබූ පස් ඉවත් කළ අතර ම ගර්භය මත වැවී තිබූගස් ඉවත්කර ඇත. (JCBRAS , xxxvi, 1944, 93) එසේ ම එතුමා දාගැබේ උපරිභාගයේ සංරක්ෂණ කටයුතු පහසුකර ගැනීම සඳහා 1952 දී නැගෙනහිර දිශාවෙන් ආයකය අබියසින් ඉහළට පියගැට පෙළක් පිළියෙල කරනු ලැබුව ද ප්‍රතිසංස්කරණ අවසන් වීමට පෙර 1957 වර්ෂයේ දී ඇති වූ මහා වර්ෂාව හේතුවෙන් එම කොටස් සියල්ල නැගෙනහිර ආයකය මතට ඇද වැටී ඒවා ද විනාශයට පත් වී ඇත. (පුරාවිද්‍යා පාලන වාර්තා - 1957, 6) මේ හැර අභයගිරි දාගැබ් පරිශ්‍රයේ පරණවිතාන මහතා විසින් කරන ලද විවිධ පුරාවිද්‍යාත්මක කටයුතු පිළිබඳව පුරාවිද්‍යා පාලන වාර්තා (1963-64, 9 , 1964-65, 19-21) වල සඳහන්ය. මේ හැර 1965-70 සමයේදී දාගැබේ බටහිර හා නැගෙනහිර අතර පේසා වළලුවල ප්‍රතිසංස්කරණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් සිදුවිය. (Wikramagamage 1992: 30)

අභයගිරි දාගැබෙහි හා එම සංකීර්ණයෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වැදගත් ම කාල පරිච්ඡේදය උදාවන්නේ 1981 වර්ෂයේදී මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය ආරම්භ වීමත් සමගිනි. මේ අනුව අභයගිරි විහාර ව්‍යාපෘතිය යටතේ 1981 දී ක්‍රියාත්මක වුනු කැනීම් හා සංරක්ෂණ වැඩ පිළිවෙල තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ පළමුවෙන් ම දාගැබ් පරිශ්‍රයේ කැනීම් කරන ලද්දේ වැලි මළුවේ පිට ප්‍රාකාරය හා ඇතුල් පවුර පාදා ගැනීමේ අරමුණෙනි. එම කැනීම් 1982 වර්ෂයේදී ආරම්භ කෙරුණි. (ibid : 24-37) 1987 වර්ෂයේ දී සලපතළ මළුවේ

බටහිර හා නැගෙනහිර දොරටුව අබියස කරන ලද කැනීම් වලින් සලපතළ මළුව දරා සිටින ගඩොලින් බැඳි පනාබැම්මේ සාධක හොඳින් අනාවරණය කරගත් අතර සලපතළ මළුවේ සිට වැලි මළුව වෙත ජලය ගලායාම සඳහා නිමවන ලද ගලින් කළ ජල නිර්ගමන නාලිකා සොයා ගැනුණි. (Hettiartchi 1987: 5, 97) මේ වන විට සම්පූර්ණ සලපතළ මළුවේ සිව් දෙසින් ම ඇති පනාබැම් තහවුරු කර ඇති හෙයින් මෙම එක් එක් පැත්තක ඇති ජල නිර්ගමන නාලිකා 8 ක් බැගින් සියල්ල 32 ක් වේ. මේ සියලුම නාලිකා සලපතළ මළුවේ සිට වැලි මළුව දෙසට යොමු වී ඇත. ඇතැම් ඒවායේ පිට අන්තයේ මකර මුඛයක් සැරසිලි ගන්වා ඇත. මෙම හැම ජල නිර්ගමන නාලිකාවක් ම සලපතළ මළුවේ ගිල්වා ඇති හෙයින් ඒ වෙත පහසුවෙන් ජලය ගලා ගොස් ඒ මගින් වැලි මළුවට ජලය මුදා හැරේ. 1990 දශකයේ දී ස්තූප සලපතළ මළුවේ බටහිර හා නැගෙනහිර අතර කොටස සංරක්ෂණය කරන්නට යෙදුනි. එසේ ම උතුරු හා බටහිර යන සලපතළ මළුවේ දොරටු ද සංරක්ෂණය කරනු ලැබ ඇත. මෙම සංරක්ෂණයේ දී සලපතළ මළුවේ ගිල්වා තිබූ ආයකයට අයත්විය හැකි ඇතැම් කැටයම් පුවරු එම ස්ථාන වලින් ගලවා ඉවත් කරනු ලැබ ඇත. මේ හැර සිරිපතුල් ගල් ද විශාල ප්‍රමාණයක් එම ස්ථාන වලින් ඉවත් කරන්නට යෙදුනි. මෙයට හේතුව වන්නේ සිරිපතුල් ගල් පුවරු බුදුන් වහන්සේ වෙනුවට වන්දනා කළ පූජනීය වස්තුවක් හෙයින් ඒවා පෑගීම වැලැක්වීමේ අටියෙනි. එක් අතකින් මෙම තර්කයෙහි ප්‍රබල සත්‍යතාවයක් අපට ද තහවුරු කර ගැනීමට අවස්ථාව උදාවිණි. එනම් සලපතළ මළුවේ බටහිර ආයකය හා දොරටුව අතර මළුවේ අතුරා තිබූ එක් සිරිපතුල් ගලක යටි මුහුණතේ ඇතුලට කුහරයක් හරා ඒ තුළ පළිඟු කරඬුවක් ඔබ්බවා තිබිණි. මෙම කරඬුව කොටස් දෙකකට ගැලවිය හැකි අයුරින් සකසාතිබූ අතර එහි ගර්භය මත යෙදූ කුහරයක් තුළ රනින් නිමවූ සූරයක් බඳු වස්තුවක් විය. මෙම රන් කොපුව තුළ අළු පැහැති කිසියම් ද්‍රව්‍ය ස්වල්පයක් විය. මේවා ධාතූන් වහන්සේලා ලෙස සැලකීම කිසිදු අපහසුවක් නැත. මේ අනුව මෙම සිරිපතුල් ගල ඇතැම් විට දාගැබ අබියස තැන්පත් කර තිබූ හෝ පිටතින් ගෙනැවිත් තැන්පත් කළා වියහැකිය. එය සිදුවන්නට ඇත්තේ සිරිපතුල් ගල්වල ගෞරවය අඩු වී

ගිය කාල වකවානුවක විය හැකිය. 90 දශකයේ දී මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සලපතළ මළුවේ ගල් පුවරු තහවුරු කිරීම් කටයුතු කරද්දී ගල් පුවරු යට රතු පැහැයට හුරු බොරළු තට්ටුවක් අතුරා ඒ මත ගල් පුවරු තැන්පත් කර තිබූ අයුරු අපට දැකගත හැකි විය. එසේම ඇතැම් ගල් පුවරු යට ගෙල පළඳින පබළු වැල් හා කාසි දැක ගැනීමට ද හැකි විය. මෙම කාසි බොහොමයක් අනුරපුර අවසන් සමයේ දී භාවිත රෝම කාසි වීම මෙම ගල් ඇතුරුමෙහි කාලය වඩාත් තහවුරු කර ගැනීමට හැකියාවක් ලැබුණි. දාගැබ් මළුවේ නිරිතදිග කොටසෙහි ගල් ඇතුරුම් ඉතා හදිසියෙන් කළ බවක් පෙනියයි. මෙහි බොහොමයක් ඇත්තේ වෙනත් ගොඩනැගිලි වලින් ගලවාගත් ශිලාමය අවශේෂයන්ය. මේ අතර ආයකයේ කැටයම් ගල් , කොරවක් ගල් , මුරගල් , පියගැට පෙළවලට අයත් කොටස් හා විවිධ ගල් පුවරු කැබලි පමණක් නොව කැඩිකිලි ගල් පවා මළුව මත අතුරා ඇත. මෙම කොටස පොළොන්නරු යුගයේ දී පරාක්‍රමබාහු සමයේ කරන ලද ප්‍රතිසංස්කරණ අවස්ථාවේ දී ඔබ්බවන්නට ඇතැයි සිතිය හැකිය. මීට ප්‍රබලතම සාධකය වූයේ එම ගල් පුවරු අතර තිබී 13 සියවසට පමණ අයත් දෙමළ අක්ෂරයෙන් ලියූ කුඩා සෙල්ලිපියක් අපට හමු වීමයි. මෙම ශිලාලේඛනය අප විසින් පේරාදෙණි විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය පද්මනාදන් මහත්මාට ඉදිරිපත් කරනු ලදුව එතුමා මෙය අක්ෂර ලක්ෂණ අනුව ක්‍රි. ව. 1250 ආසන්න කාලයකට අයත් කරන ලදී. ඒ අනුව දඹදෙණි සමයට මෙම ලිපිය අයත් වේ. මහාවංසයේ සඳහන් වන පරිදි 2 වන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1236-1270) රජතුමා දඹදෙණියේ පාලනය කරන අතරතුර දී අනුරාධපුරයේ, විශේෂයෙන් රුවන්වැලි දාගැබෙහි කරන ලද ප්‍රතිසංස්කරණ පිළිබඳව සඳහන්ය. (මහාවංසය 1967: 88, 33) පූජාවලියෙහි ද මෙම රජතුමා රුවන්වැලිය, ශ්‍රී මහා බෝධිය, ජේතවනය යන විහාරයන්හි කරන ලද ප්‍රතිසංස්කරණයන් ගැන කියැවේ. (පූජාවලිය 1997: 308) එහෙත් එම වංසකතාවල අභයගිරියේ කරන ලද යම් ප්‍රතිසංස්කරණයක් පිළිබඳව සඳහන් නොවුව ද එම සමයේ දී හදිසියේ මුත් මෙම ගල් ඇතිරවීම ද කරන්නට ඇතැයි සිතිය හැකි වේ. ඒ සමයේ දී කිසියම් ද්‍රවිඩ අයෙකු විසින් හෝ ද්‍රවිඩ දත් සිංහල අයෙකු මෙම ගල් පුවරුව තබන්නට ඇත. මේ කාලයේ දී

ද්‍රවිඩ ශිල්පීන් ද මෙම රජතුමා යටතේ සේවය කළ බවට ද පුරාවිද්‍යාත්මක සාධක අපට සොයා ගැනීම දුෂ්කර නොවේ. එනම් දඹදෙණියේ විජයසුන්දරාරාමයේ පිළිම ගෙයි පාදම හා එම විහාර පරිශ්‍රයේ ඇති සිංහ කැටයම් ආදිය ද කිසියම් ද්‍රවිඩ ලාක්ෂණික ඡායාවන් අපට පෙන්වා දෙයි. මේ වන විට දාගැබ් සලපතල මළුවේ අර්ධයක් පමණ ප්‍රතිසංස්කරණය කොට තිබෙන අතර ඉතිරි අර්ධය සංරක්ෂණය කළ යුතුව පවතී.


## සලපතළ මළුවේ ශිලාලේඛන

අභයගිරි සලපතළ මළුවේ ශිලාලේඛන 50 කට ආසන්න ප්‍රමාණයක් වේ. මෙම ශිලාලේඛන බ්‍රාහ්මී, අපර බ්‍රාහ්මී, සිංහල, සංස්කෘත හා ද්‍රවිඩ යන අක්ෂරයෙන් ලියැවී ඇත.මෙම ලිපිවලින් එකක් හැර ඉතිරි සියලු ලිපි අනුරාධපුර යුගයට අයත් වේ. මේවා ලිවීම සඳහා ස්ඵටික හුණුගල් , ග්‍රැනයිට් හා නයිස් පාෂාණ උපයෝගී කොට ගෙන ඇත.

මළුවේ ඇති සෙල්ලිපි අතර බ්‍රාහ්මී ලිපි 2 කි. මේවා ක්‍රි. ව. 1-2 පමණ කාලයට අයත්ය. අපර බ්‍රාහ්මී ලිපි 4 ක් පමණ හමුවන අතර මේවා ක්‍රි. ව. 2-4 පමණ කාලයට අයත්ය. සිංහල අක්ෂරයෙන් ලියැවුනු ලිපි සියල්ල ම 8-10 සියවස් අතරට අයත්ය. අනුරපුර යුගයෙන් පසු භාගය නියෝජනය කරනු ලබන කිසිඳු සිංහල ශිලාලේඛනයක් සලපතළ මළුවෙන් හමු නොවේ. දඹදෙණි කාලයට අයත් යැයි අනුමාන කෙරෙන එක් ද්‍රවිඩ සෙල්ලිපියක් ද ක්‍රි. ව. 9-10 සියවස් අතරට අයත්විය හැකි යැයි සිතෙන සිංහල අක්ෂරයෙන් ලියූ සංස්කෘත මන්ත්‍ර පාඨයක් ද හමු වේ. මෙය මහායාන ධාරණී පාඨයක් විය යුතුය. මෙම ශිලාලේඛන අතර ගිහි පැවිදි දෙපක්ෂයට ම අයත් ලිපි හමු වේ. ගිහියන් තැබූ ලිපි අතර රජවරුන්ට අයත් ලිපි කීපයක් ද වෙනත් රාජකීය නිලයන් දැරූ පුද්ගලයන්ට අයත් ලිපි කීපයක් ද වේ. මේ හැර භික්ෂූන්ට අයත් ලිපි අතර විශේෂ නිලතල දැරූ භික්ෂූන් වහන්සේලා ද වේ.

විවිධ කාර්මික ශිල්පීන්ට අයත් ලිපි ද මේ අතර වේ. මෙම ලිපි වලින් ලංකාවේ ඉතිහාසය අධ්‍යයන සඳහාත් සමකාලීන ආගමික හා සංස්කෘතික වට පිටාව තේරුම් ගැනීමට බෙහෙවින් උපකාර වේ. සලපතල මළුවේ ඇති මෙම ලිපි වැඩි ප්‍රමාණයක් සොයාගත හැකි වූයේ නැගෙනහිර ආයකයේ සිට දකුණු දෙසින් බටහිර අර්ධය අතර කොටසෙහි තිබියදීය. මෙයට ප්‍රධාන හේතුවක් වූයේ මෙම භූමි කොටස මීට දශකයකට පමණ පෙර පස් ඉවත් කොට හොඳින් අනාවරණය කොටගෙන තිබූ නිසාවෙනි. එහෙත් උතුරු අර්ධය සම්පූර්ණ පිරිසිදු කිරීමට ලක් කොට නොමැති හෙයින් මළුව පූර්ණ ලෙස පරීක්‍ෂා කොට එහි ශිලාලේඛන තිබේද නැද්ද යන්න වඩා නිශ්චිත කරගත නොහැකි විය.

## දක්ඛිණ ථූපය





CamScanner

# දක්ඛිණ ථූපය

## පිහිටීම හා වර්තමාන තත්වය

අනුරාධපුර පැරණි නගරයට දකුණින් හා ශ්‍රී මහා බෝධීන් වහන්සේට නිරිත දිගින් ඉසුරුමුණිය වෙත වැටී ඇති මාර්ගයේ දකුණු පස දක්ඛිණ ස්තූපය පිහිටා ඇත. ශ්‍රී මහා බෝධියේ සිට මීටර් 500 ක් පමණ දුරක් මේ සඳහා ඇතැයි සිතිය හැකි වේ. මෙය උත්තර අක්ෂාංශ $08^0$, 20.27 හා නැගෙනහිර දේශාශ $80^0$, 23.41 වන සේ පිහිටියේය.

එළාර සොහොන යනුවෙන් ද කලක් ප්‍රසිද්ධව තිබූ මෙම දාගැබ පසුව පරණවිතාන මහත්මා විසින් එහි කරන ලද කැනීම් හා අධ්‍යයනයන් තුළින් දුටුගැමුණු රජතුමාගේ දේහය ආදාහනය කළ ස්ථානයේ ඉදිකළ දාගැබ බව පෙන්වා දුන්නේය. අනුරාධපුරයේ ඇති විශාල දාගැබ් අතුරින් අවධානය බොහෝ අඩුවෙන් හිමිකර ගත් දාගැබක් ලෙස ද  මෙය හැඳින්විය හැකිය . ඇතැම් විට දාගැබ පිහිටි ස්ථානය ද මේ සඳහා බලපානවා විය හැකිය. එය ශ්‍රී මහා බෝධියට නිරිත දිගින් හුදකලාව මෙන් පිහිටිය ද ඊට උතුරින් ලෝවා මහාප්‍රසාදය, රුවන්වැලිය, ථූපාරාමය, ජේතවනය, අභයගිරිය ආදී පූජ්‍යස්ථානවල පිහිටීම දැක්විය හැකිය.  එළාර සොහොන වශයෙන් තිබූ පිළිගැනීම ද මේ සඳහා බලපාන්නට ඇත.

දක්ඛිණ ථූප දාගැබ මීට දශක කීපයකට පෙර සංරක්ෂණය කොට ඇතත් එහි මළුව හා හාත්පස භූමිය පාදාගෙන නොමැත දාගැබ් මළුව වර්තමානයේ සම්පූර්ණයෙන් තණ කොළ වලින් හා කුඩා පඳුරු වලින් වැසී පවතී. එය පොළොව මට්ටමෙන් මදක් උස් භූමියක් ලෙස පවතී. මළුවේ සීමාවන් නැගෙනහිර පැත්තෙහි යන්තමින් හඳුනාගත හැකි වෙතත් ඉතිරි සියල්ල පසින් වැසී ඇත. ඒවායේ පනා බැමි හෝ සිව් දෙසින් වන ඇතුළුවීමේ දොරටු පිළිබඳව හෝ කිසිඳු අදහසක් ඇති කර ගත නොහැකිය. පරණවිතාන මහත්මා නැගෙනහිර පනා බැම්මෙහි සීමාවන් හඳුනාගත් අතර එතුමා සඳහන් කරන්නේ මළුව



CS CamScanner

සම් සතරැස් විය හැකි බව ය. එහි එක් පැත්තක දිග අඩි 372 ක් (මීටර් 111.60) වියහැකි බවත් මෙම මළුව අක්කර 3 1/4 ක් පුරා පැතිරෙන්නට ඇතැයි සඳහන් කරයි. නැගෙනහිර පඩිපෙළ හා පසාබැම්ම සොරුන් විසින් බෙහෙවින් ම විනාශ කර ඇති බව ද වාර්තා කර ඇත. (පරණවිතාන 2001: 30) ඔහුගේ අධීක්ෂණයෙන් කැනීම් හා සංරක්ෂණය කිරීම්වල දී දාගැබෙහි වැලිකොන්ද, පේසා වළලු 3 ක් හා දාගැබ් ගර්භයේ වට සීමාව හඳුනාගෙන ඇත. එහෙත් පේසාවන් හෝ ගර්භය තිබූ අයුරින්ම පාහේ සංරක්ෂණය කොට තිබෙනු හැර ප්‍රතිසංස්කරණයකට බඳුන් කොට නැත. මේ නිසා පේසා වළලු හෝ දාගැබේ ගර්භයෙහි හැඩය එක ලෙසින් ම දාගැබ වටා ම දැකගත නොහැකිය.

පරණවිතාන මහත්මාගේ මිනුම්වලට අනුව දාගැබේ වට ප්‍රමාණය අඩි 578 කි. (මීටර් 173) මළුව මට්ටමේ සිට 3 වන පේසා වළල්ල දක්වා උස අඩි 10 අඟල් 6 කි. (මීටර් 3.25) පේසාවේ පළල අඩි 7 ක් (මීටර් 2.10) වේ. දාගැබෙහි ආයක 4 ක් අතීතයේ දී තිබී ඇතත් ඒවා දරුණු ලෙස සොරුන් විසින් විනාශ කොට ඇති බවත් ඒවායේ කොටස් 'බොහෝ කලකට පෙර ඉන් ඉවත් කොට බැහැරට ගෙන ගොස් ඇති බව ද පරණවිතාන මහත්මා සඳහන් කරයි. (IC II 2001: 161-162) දැනට දකුණු ආයකයේ සැරසිලි ස්ථම්භ දෙකක් හා සුළු අවශේෂ ප්‍රමාණයක් ද උතුරු ආයකයේ කුඩා කැටයම් ස්ථම්භයක් ද වේ. ආයකයේ පළල මීටර් 7.40 ක් පමණ වේ. නැගෙනහිර හා බටහිර ආයකය සම්පූර්ණයෙන් ම ඉවත් කොට ඇත. මෙම දාගැබෙහි පූර්ණ සලපතළ මළුවක් ඇති බවට සාධක නැතත් වැලිකොන්ද අසල අඩි 7 ක් පමණ පළලින් ගල් පුවරු තීරුවක් පමණක් අතුරා ඇත. මෙය කිඤ්ජක්ඛ ගල් ඇතුරුම් තීරුව ලෙස දැක්විය හැකිය. ග්‍රැනයිට් ගල් පුවරුවලින් මෙම ඇතුරුම නිර්මාණය වී ඇති අතර එහි පුවරු ගණනාවක ම සෙල්ලිපි ලියැවී ඇත. මෙම ඇතුරුම් ගල් පුවරු දාගැබ වටා ම දක්නට නැත. තැන් තැන්වල ගල් පුවරු ඉවත් කොට ඇත. එසේ ම ඇතැම් කොටස් පසින් වැඪී ගොසිනි. පරණවිතාන මහත්මා විසින් මෙම ගල් පුවරුමත තිබී සෙල්ලිපි 17 ක් කියවා ඇතත් දැනට

එහි ඇත්තේ ලිපි 7 ක් පමණි. අනුරපුර කෞතුකාගාරයේ ශිලාලේඛන අංශයේ ශිලාලේඛන පිළිබඳව සොයා බැලීමේ දී පරණවිතාන මහත්මා විසින් කියැවූ සෙල්ලිපි 3 ක් පමණක් එහි තිබී සොයාගත හැකි විය. ඒවා එහි ගෙනා දිනයක් හෝ ලියාපදිංචි අංකයක් සොයාගත නොහැකි විය.

මෙම දාගැබ සහිත කුඩා භූමි කොටසින් බැහැර භූමිය දිගු කලක් තිස්සේ ජනාවාසයට ලක් වූ නිසාවෙනුත් තවමත් පෞද්ගලික ඉඩම් වලට නතුව තිබීම හේතුවෙන් ද දක්ඛිණ විහාර ආරාම සංකීර්ණයෙහි අනෙකුත් ආරාම අංග විශේෂයෙන් පෝය ගෙය , පිළිමගෙය, බෝධිය, දාන ශාලාව ආදී අංග හඳුනා ගැනීමට හැකියාව ලැබී නැත. දක්ඛිණ ස්තූපය දිගු කලක් තිස්සේ ම හඳුනා ගැනීමට නොහැකිව තිබූ පූජ්‍යස්ථානයක් බවට පත්ව තිබිණි. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමත් පොළොන්නරු යුගයෙන් පසු ජන ශූන්‍ය වීමත් හේතු කොට ගෙන මෙම දාගැබ පමණක් නොව අභයගිරිය, ජේතවනය යන මහ දාගැබ් පවා නිසියාකාරව හඳුනා ගැනීමේ දුෂ්කරතාවයක් මහ ජනතාවට පැන නැඟී තිබුණි. එසේ වන් කල දිගු කලක් ආරාමික භික්ෂූන්ගෙන් ශූන්‍ය වූ මෙම දාගැබ සහිත ආරාම සංකීර්ණය හඳුනා ගැනීමට දුෂ්කරතා මතු වීම එතරම් විමතිය දනවන කරුණක් නොවේ.

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ජනාවාස වීමත් සමග මෙම ආරාම කෙරෙහි අවධානයත් සැලකිල්ලත් නැවත යොමුවන්නට විය. 1833 වන විටත් මෙය දුටුගැමුණු රජු විසින් ගොඩ නැගූ එළාර සොහොන වශයෙන් පිළිගෙන තිබූ බව ස්කිනර් නම් රජයේ මිණුම් නිලධාරියා විසින් 1833 පෙබරවාරි 26 වැනි දින අඳින ලද සිතියමෙන් පැහැදිලි වේ. ඒ වන විටත් මෙය බෙහෙවින් විනාශව තිබූ බව දාගැබ සංකේතවත් කළ ඔහුගේ රූප සටහන් හා කෙටි වාර්තාවෙන් පැහැදිලි වේ. (Ratnayake 1984: Figure 45) ජේ. ජී. ස්මිදර් මහත්මා ද 1894 දී අනුරාධපුර ස්මාරක හා සම්බන්ධව අඳින ලද සැලසුම් වල මෙය එළාර සොහොන වශයෙන් දක්වා ඇත. (Smither 1992: pl. i)



CamScanner

එහෙත් දක්ඛිණ ථූපයේ පළමු පුරාවිද්‍යාත්මක කටයුතු ආරම්භ කරනුයේ එච්. සී. පී. බෙල් මහත්මා විසිනි. ඔහු 1896 දී මෙම ස්ථානය පිළිබඳව වැදගත් වියහැකි යයි සිතූ මූලාශ්‍ර ගත සාධක බොහොමයක් අධ්‍යයනය කොට කැනීමක් සිදුකර ඇත. එහිදි එළාර සොහොන වශයෙන් හඳුන්වනු ලබන මෙම දාගැබ පිහිටි ස්ථානය පිළිබඳ එන වංසකතා සාධක පිළිබඳව සලකා මෙය දක්ඛිණ විහාරය විය හැකි බවට අදහසක් ඉදිරිපත් කරන ලදී. ඔහු වාර්තා කරන පරිදි දාගැබේ ගර්භය හසුවන පරිදි උතුරු හා නැගෙනහිර දිශාවෙන් අගල් කැනීම් දෙකක් සිදු කර ඇත. (ASCAR 1896: 4) ඇතැම් විට වංසකතාගත සාක්ෂි මත පදනම් වූ බෙල් මහතාගේ අනුමානය තහවුරු කර ගැනීමේ අටියෙන් ද ඔහු මෙහි කැනීම් කළා විත්තට පුළුවන. 1897 වර්ෂයේ දී ඔහු මෙම කැනීම් තව දුරටත් කරගෙන ගිය අතර සිරස් අතට අඩි 60 ක් ගැඹුරට කැනීම කළ බව වාර්තා කරන අතර මෙය භාරදූර මෙන්ම හිමින් කළ යුත්තක් බවට ද වාර්තා කර ඇත. (ASCAR 1897: 6) 1898 වර්ෂයේ දී ගඩොල් ටොන් ගණනක් ඉවත් කිරීමෙන් පසුව දාගැබේ පාදම අනාවරණය කර ගත් බව සඳහන් කරයි. එහි දී දාගැබේ පේසාවන් හා ගර්භයේ හැඩය ද ඔහුට හඳුනා ගැනීමට හැකි වී ඇත. එහි හැඩය ඝණ්ඨාකාර බව කියයි. ඔහු වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ නිදන් හොරුන් විසින් නැගෙනහිර හා උතුරු ආයක දැඩි ලෙස විනාශයට පත්කර තිබූ බවය. (ASCAR 1898: 5) එම වාර්තාවේ දී මෙම දාගැබේ ගර්භයෙහි වට ප්‍රමාණය අඩි 564 ක් පමණ විය හැකි බව අනුමාන කර ඇත. ඔහු තම වාර්තාවේ උතුරු ආයකය කැනීමෙන් අනාවරණය වූ ආකාරය දැක්වෙන ඡායා රූපයක් ද ඉදිරිපත් කර තිබෙන හෙයින් එදා එහි පැවති ස්වභාවය තේරුම් ගැනීමට එය කදිම සාධකයක් ද වේ. (ASCAR 1898: pl. E) මේ හැර ඔහු මෙම කැනීම් කටයුතු 1899 හා 1900 වර්ෂය දක්වාම පවත්වාගෙන ගොස් ඇත. (ASCAR 1899: 4, 1900, 5) කෙසේ වෙතත් 1900 වර්ෂයේ දී බෙල් මහතා ඇතුළු සේවක පිරිසට මෙම දාගැබ් භූමියේ දී දෙබරුන්ගේ පහර කෑමකට ලක්වීම හේතුවෙන් අදාල කටයුතු අතහැර දැමූ බව වාර්තා වී ඇත. මෙම කරුණ පිළිබඳ පසු විපරමක් කරන පරණවිතාන මහත්මා විසින් සඳහන් කරන්නේ බෙල් මහතා ඇතුළු කණ්ඩායමෙහි කටයුතු ගැන බෞද්ධ


ජනතාව අසතුටින් සිටි බවත් ඊට දෙවියන් දුන් දඬුවමක් ලෙසින් මෙම දෙබර ප්‍රහාරය ජනතාව විසින් සලකන බව ය. (පරණවිතාන 2001:-10) 1909 වර්ෂයේ දී **හෙන්රි පාකර්** මහත්මා විසින් දක්ඛිණ ථූපය පිළිබඳව **පුරාණ ලංකාව** නම් තම කෘතියෙහි වාර්තා කර තිබෙන අතර එතුමා බෙල් මහතාගේ තොරතුරු ද පාදක කර ගනිමින් හා විශේෂයෙන් ම එම ස්තූපයේ ගඩොල් අනුරාධපුරයේ අනෙක් පැරණි ගඩොල් හා සසඳමින් ස්ථිරව ම මෙය දක්ඛිණ විහාරයේ දාගැබ විය යුතු බව සඳහන් කරයි. ඔහු ද වංසකතා සාධක හොඳින් අධ්‍යයනය කරන ලද බවක් පෙනීයයි.

බෙල් මහතාගේ කැනීම් වලින් පසුව මෙම දාගැබෙහි කැනීම් කටයුතු නැවත ඇරඹෙන්නේ 1946 වර්ෂයේදී පරණවිතාන අතිණි. (ASCAR 1948: 6) ඔහු සඳහන් කරන්නේ තමාට පෙර දාගැබ සහිත කඳු ගැටයේ ගස් කපා ශුද්ධ කිරීම් හැර වෙනත් පුරාවිද්‍යාත්මක කටයුත්තක් සිදු නොවූ බවය. එසේ ම බෙල් විසින් කනිනු ලැබූ අගල් ක්‍රමයෙන් වැසී ගොස් ඒ මත ගස් වැවීගිය අතර මැයි සහ ජූනි මාස වල අනුරාධපුරයට පැමිණෙන වන්දනා කරුවන්ගේ පොදු වැසිකිලි බවට එම අගල් පත්ව තිබුණු බවය. (පරණවිතාන 2001: 10-11)

1946 ඔක්තෝබර් මාසයේ දී පරණවිතාන සේවකයින් 50 දෙනෙකු පමණ සම්බන්ධ කොට ගෙන දාගැබේ කටයුතු ආරම්භ කළ අතර පළමුව දාගැබ මත වැවී තිබූ ගස් හා පඳුරු කපා ශුද්ධ කොට අනතුරුව බෙල් මහතා විසින් දගක ගණනාවකට පෙර කැන තිබූ කොටස් පිළිබඳව අධ්‍යයනය කොට දාගැබේ දකුණු බැවුම පළමුව කැනීමට ලක් කොට ඇත. මෙහි දී දකුණු ආයකය මතුකර ගැනීමට හැකි වූ අතර එය ද බෙල් මහතාගේ කැනීම් වලින් මතුවුනු උතුරු හා නැගෙනහිර ආයක මෙන් ම සොරු විසින් විනාශ කොට තිබූ බව වාර්තා කර ඇත. (එම: 11-12) එතුමාගේ අදහස වන්නේ මෙම විනාශ කිරීම සිදු කරන්නට ඇත්තේ දාගැබේ ඉහළ කොටස කඩා වැටීමටත් සෑහෙන කලකට පෙර සිට බවය. මෙම ආයකයේ වැලි කොන්ද ගල් තීරුව හා බටහිර අංගයේ ගල් කුළුණු දෙක පමණක් ඉතිරිව තිබී ඇත.



CS CamScanner



එච්. සී. පී. බෙල් මහතා විසින් 1897 දි දක්ඛිණ ථූපයේ කරන ලද කැණීමෙන් අනාවරණය වූ උතුරු ආයකය.
(උපුටා ගැනීම Archaeological Survey of Ceylon Annual Report 1898)



CamScanner

එහි එක් ගල් කුළුණක් අඩි 16 අඟල් 11 ක් පමණ උස වූ අතර අඩි 1 අඟල් 9 1/2 ක් දිග හා අඩි 1 අඟල් 4 ක් පළල වූ බවත් මේවා අලංකාර කැටයමින් යුක්ත වූ බවත් වාර්තා වී ඇත. (එම: 12) 1947 වර්ෂය පුරාම දාගැබේ කැනීම් කටයුතු කර ගෙන ගිය පරණවිතාන මහත්මාට ගර්භයේ හා දාගැබේ පදනමෙහි විශාල කොටසක් අනාවරණය කරගැනීමට හැකිවිය. දාගැබෙහි ගර්භය මත හුණු කපරාරුවේ සාධක සම්පූර්ණයෙන් ම විනාශ වී ගොස් තිබූ අතර බටහිර ආයකයේ ද වැලිකොන්දේ කුඩා හුණුගල් තීරුවක් හැර ඉතිරිය සම්පූර්ණයෙන් ම ඉවත් කොට තිබූ බව සඳහන් කරයි. අනාවරණය කොට ගත් කොටසේ පේසා වළලුවල සාධක ද ශේෂ වී තිබී නැත. එසේ ම බටහිර ආයකය පිහිටි තැනට පිටුපසින් ගර්භය තුලට සොරුන් විසින් කනින ලද උමගක් වූ බවත් ඒ ආසන්නයේ හුණුගල් කරඬු හා ඒවායේ පියන් තිබූ බවත් ඒවායේ තිබූ සියලු වටිනා දේ සොරුන් විසින් පැහැර ගෙන තිබූ අතර ඔවුනට නොවටිනා වීදුරු කැබලි පබළු ආදී දේ එහි දමා ගොස් තිබූ බවත් සඳහන් කරයි. 1948 වර්ෂය දක්වා ම පරණවිතාන මෙහි කැනීම් කටයුතු පවත්වාගෙන ගිය අතර එම වර්ෂයේ මාර්තු මාසයේ දී මළුවේ සුන් බුන් ඉවත් කිරීමේ දී දකුණු හා බටහිර ආයක අතර වැලිකොන්ද අසලම අතුරන ලද අඩි 7 ක් පමණ දිග ගල් තීරු කීපයක තිබී ගල් පුවරු ගණනාවක් ම හමු වූ බව වාර්තාකර ඇත. (ASCAR 1948: 8-10) මෙම ශිලාලේඛන හමුවීම පිළිබඳව මහත් උද්දාමයෙන් වාර්තා කරන පරණවිතාන මහත්මා දෙපාර්තමේන්තුව මගින් විශාල වියදමක් දරා කරනලද කාර්යයේ සාර්ථක ප්‍රතිඵල මෙම ශිලාලේඛන හමුවීම සමග සඵල වූ බව සඳහන් කරයි. මීට ප්‍රධානතම හේතුව වන්නේ මෙම ශිලාලේඛනවල **දක්ඛිණ විහාරය** නමින් සඳහන්ව තිබීමයි. එළාර සොහොන වශයෙන් බොහෝ දෙනා මෙම දාගැබ හඳුන්වා දෙමින් තිබිය දී බෙල් මහතා විසින් මෙම දාගැබ දකුණු දාගැබ විය හැකියයි අනුමාන කිරීම බෙල් මහතාගේ විචක්ෂණ භාවය පිළිබඳ කදිම නිදසුනක් ලෙස දක්වයි. මෙම ශිලාලේඛන හමුවීම දාගැබෙහි කොටසක එහි නාම පුවරුව තිබී හමුවූවාට සමාන යයි පරණවිතාන කියයි. (පරණවිතාන 2001: 15-16) මෙම ශිලාලේඛන කියවා අර්ථ දෙන එතුමා (IC II ii 2001: 161-175) වංසකතාවේ සඳහන් කරුණු ගණනාවක්

පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ වන බව සඳහන් කරයි. (පරණවිතාන 2001: 17) මෙම ශිලාලේඛනවල එන කරුණු හා වංසකතාගත තොරතුරු පිළිබඳව තව දුරටත් කරුණු අධ්‍යයනය කිරීම සඳහා එතුමා දාගැබේ අභ්‍යන්තරය පරීක්ෂා කිරීමකට ලක් කළේය.

ඒ සඳහා පෙර සඳහන් කළ සොරුන් විසින් හාරා තිබූ බටහිර දිශාවෙන් වූ දෝනාව ම උපයෝගී කොට ගැනුණි. එහි දී අළුතින් ගඩොල් ගැලවීමක් සිදු නොකොට කඩා වැටී තිබූ ගඩොල් හා පස් ඉවත් කරමින් ධාතු ගර්භය පරීක්ෂාවට ලක් කෙරිණි. එහෙත් එහි තිබී ඇත්තේ ධාතු ගර්භය වෙනුවට අඩි 17 අඟල් 10 ක් දිග අඩි 16 අඟල් 9 ක් පළල හා අඩි 4 ක් ගැඹුරු ඔරුවක හැඩය ගත් නිර්මාණයකි. අඩියක් තරම් පළල්ව සිටින සේ ගඩොල් කැබලි වලින් බිත්ති බඳින ලද මෙය පෙර අවස්ථාවක දී දාගැබ බිඳිනු ලැබූ විට නැවත කරන ලද ප්‍රතිසංස්කරණයක් අවස්ථාවේ දී පිහිටුවන්නට ඇතැයි පරණවිතාන මහතා කල්පනා කරයි. හාරන ලද මාර්ගය මතත් මෙම ඔරුව තුලත් පබළු හා සුළු භාණ්ඩ කීපයක් තිබූ බව සඳහන් වේ. ඔරුවේ බිත්ති වලට හානි නොවන පරිදි ඒ මැදින් පොළොව දෙසට තව දුරටත් කැනීම් කරන ලද අතර එය ද පැරණි සමයේ දී සොරුන් විසින් හාරා තිබිණි. මෙම සෑරීම් වලදී විනාශ කළ ධාතු ගර්භයකට අයත් විය හැකි ගල් පුවරු කීපයක් හුණු ගල් කරඬුවක කොටසක් හා ශිලාමය බුදු පිළිම දෙකකට අයත් කොටස් සොයාගෙන ඇත. පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දක්ඛිණ ථූපයේ මළුවේ බිම් මට්ටමට වඩා අඩි 13 ක් පොළොව තුලට කැනීම් කළ බවත් එය ද සොරුන් හාරා තිබූ බවත්ය. ඔහුට මෙහි දී පැතිරුනු අඟුරු තට්ටුවක් හා ගඩොල් මෙන් පිළිස්සුණු පස් තට්ටුවක් ද හමු වූ බව වාර්තා කර ඇත. මෙය හොඳින් නිරීක්ෂණය කිරීමේ දී එතුමාට පැහැදිලි වූයේ මෙම දැවුණු පොළොව හා අඟුරු තට්ටුව මත දාගැබ ඉදිකර ඇති බවය. ඒ අනුව එතුමා නිගමණය කරන්නේ මෙම චෛත්‍ය මුල දී ම ආදාහන මළුවක භෂ්මාවශේෂ මත ඉදිකරන ලද්දක් බවය. එසේ නම් එබඳු දාගැබකින් පිදුම් ලැබීමට නම් එක්කෝ ඔහු රහත් කෙනෙකු හෝ නැතහොත් රජෙකු විය යුතු බව කල්පනා කළේය. මෙහි දී එතුමා වංසකතා සාධක උපයෝගී කර

ගනිමින් සඳහන් කරන්නේ මෙය වෙන කිසිවක් නොව දුටු ගැමුණු රජුගේ දේහය ආදාහනය කළ කම්මමාලකයේ ඉදිකළ දාගැබ බව ය. (එම: 24-26) මෙම අළු හා අඟුරු නියැදි ප්‍රංශයේ පරමාණු බල ආයතනයට යවා වාර්තාවක්ද ලබාගන්නා ලදී.

පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දක්ඛිණ විහාරයේ ස්තූපය මහ පුලිලමළුව නැමැති ස්ථානයක ඉදිකරනු ලැබූවේය යන පරම්පරාගත පුවතක් සද්ධර්මාලංකාරයේ සඳහන් වන බවත් **පුලිල** යන්න පාලි භාෂාවෙන් **පිවුල** වන බවත් **මළුව** යන්න **මාළක** වශයෙනුත් වන බව යි. (එම: 18) මරණ මඤ්චකයේ සිට දුටු ගැමුණු රජු තම සොයුරු සද්ධාතිස්ස කුමරුගෙන් තමාගේ දේහය මහාථූපය පෙනෙන මානයේ සංඝයාගේ කම්ම මාලකයෙහි ආදාහනය කරන මෙන් ඉල්ලීමක් කළ බව මහාවංසයේ සඳහන්යය. (මහාවංසය 1967: 32, 58-59) නමුත් එහි කම්ම මාලකය පිහිටි තැනක් පිළිබඳව සඳහන්ව නැත. එය දුටුගැමුණු සමය වන විට ප්‍රසිද්ධ ස්ථානයක් බවට පත්ව තිබූ හෙයින් විස්තරාත්මකව මහාවංස කරුට එම ස්ථානය දැක්වීමේ උවමනාවක් නැත. පරණවිතාන මහතා මෙම කම්මමාලකය පිහිටි ස්ථානය මහාවංසය, මහාවංස ටීකාව, මහා බෝධිවංස ගැටපදය හා සද්ධර්මාලංකාරයේ එන කරුණු ද මනාව සසඳමින් එය ස්ථිර වශයෙන් ම දක්ඛිණ ථූපය පිහිටි භූමිය බව පෙන්වා දී ඇත. (පරණවිතාන: 18-23) එතුමා තර්කානුකූලව ඉදිරිපත් කරන කරුණුවල ට එකඟ වීම මිස ඉන් බැහැර කරුණක් ඉදිරිපත් කිරීමට කිසිවෙකුත් අසමත්ව තිබෙන බැවින් එම කරුණ ම නැවත නැවත අප විසිනුදු ඉදිරිපත් කිරීමේ අර්ථයක් ඇතැයි නොහැගේ. පරණවිතාන මහතාගේ මෙම මතය ඉතිහාස විශාරදයෙකු වූ සී. ඩබ්ලිව්. නිකුලස් විසින් පිළිගෙන තිබේ. (නිකලස් 1979: 173) කඹුරුපිටියේ වනරතන හිමියෝ ද මෙම මතය සනාථ කරන අතර උන්වහන්සේ සඳහන් කරන්නේ දුටුගැමුණු රජුගේ පියාණන් වූ කාවන්තිස්ස රජතුමා ද මරණයට පත් වූ අවස්ථාවේ දී තිස්සාරාමයට ගෙනැවිත් ආදාහනය කළ හෙයින් (මහාවංසය 1967: 24, 13) පූජ්‍යස්ථානයක ශ්‍රේෂ්ඨයින්ගේ ආදාහනය කිරීම උසස් ආගමික චාරිත්‍රයකවපැවති බවය. එහෙයින් දුටුගැමුණු රජුගේ ආදාහනය ද



CS CamScanner

පුළිලමළුවෙහි හෙවත් දක්ඛිණ ථූප භූමියෙහි කරන්නට ඇතැයි පිළිගෙන ඇත. (වනරතන හිමි 1970: 126-127) ශරත් වික්කල මහත්මා ද (වික්කල 1994: 41) ආචාර්ය ජී. ඇම්. රත්නපාල මහත්මා ද මෙම ස්ථානය දුටුගැමුණු රජු ආදාහනය කරන ලද ස්ථානය යැයි කියැවෙන පරණවිතාන මතය තර්කයකින් තොරව ම පිළිගෙන ඇත. (රත්නපාල 1999: 121) කෙසේ වෙතත් පරණවිතාන මතය දැඩි විවේචනයට ලක් කළ එකම පුද්ගලයා වූයේ කොත්තමකොට් විමලානන්ද පමණි. ඊට හේතුව වූයේ ද ඒ වන විට පරණවිතාන මහත්මා විසින් ශිලාලේඛන කියවා පූර්ණ වාර්තාවක් ද ඉදිරිපත් කොට නොතිබීමයි. (විමලානන්ද 1964: 34-40)

මෙසේ දක්ඛිණ ථූපයේ මූලාරම්භය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දුටුගැමුණු කුමරුන්ගේ දේහය දැවූ ස්ථානයෙහි සිය සොයුරු සද්ධාතිස්ස රජු විසින් කුඩාවට දාගැබක් තනන්නට ඇති බවත් පසුව වළගම්බා සමයේ දී එහි විහාරයක් ආරම්භ කරන්නට ඇති බව ය. (Paranavitana 2001: 163) පාලි මහාවංසය සඳහන් කරන්නේ වළගම්බා රජුගේ සමයේ දී ඔහුගේ **උත්තිය** නම් යෝධයා නගරයෙහි දකුණු පස දක්ඛිණ විහාරය කරවූ බව ය. (මහාවංසය 1959: 33, 89) මහාවංස ටීකාව ද මෙම කරුණම තහවුරු කොට ඇත. (වංසත්ථප්පකාසිනී 1994: 498) දක්ඛිණ ථූප මළුවෙන් හමු වූ ශිලාලේඛනවල පැහැදිලි ලෙස ම **පිතුමහරාජ** හෙවත් **වළගම්බා** රාජ්‍ය සමයේ දී දක්ඛිණ විහාරය ඇරඹි බව සඳහන්ව තිබීම වංසකතාවේ සඳහන තහවුරු කරන බව ඉතා පැහැදිලි ය. මේ හැර **මූල** නම් ඇමතියා ද එම ස්ථානයෙහි ම **මූලවෝකාස** නම් විහාරයක් ද තැනවීය. (මහාවංසය1967: 33, 90) පරණවිතාන මහත්මා වැඩි දුරටත් සඳහන් කරන්නේ මහාවංසයේ කියැවෙන **දක්ඛිණ විහාරය** හා නිකාය සංග්‍රහයේ කියැවෙන **දක්ඛිණගිරි විහාරය** යනු දෙකක් නොව එකක් වන බවය. (Paranavitana 2001: 162 ) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් **සිනදියගල** නම් ස්ථානයෙන් ලැබුණු වසභ රජුට අයත් ගිරි ලිපියක දකිබිණ විහාරයේ පෝය ගෙයක් කරවීමට කහවණු ලක්ෂයකුත් කාලක් (125000) යෙදවූ බව සඳහන්ය. (Ibid: 72) පුළිල මළුවේ වූ පෝය ගෙයට රජවරු දැක්වූ අවධානය මෙම ලිපියෙන් ද සනාථ වේ. මේ හැර පරණවිතාන මහත්මා තවත් ඉතා වැදගත් ශිලාලේඛන සාධකයක් ද ඉදිරිපත් කරයි. එම

ලිපිය ගජබා රාජ්‍ය සමයට (ක්‍රි.ව. 112-134) අයත් වන අතර එය හමු වී ඇත්තේ රුවන්වැලි සෑයෙනි. මෙම ශිලාලේඛනයේ සඳහන් වන්නේ **දක්ඛිණ අබය** ආරාමයට කරන ලද පරිත්‍යාගයන් කිපයක් පිළිබඳවය. **දකිණි අබය අරබ** යනුවෙන් එය සෙල්ලිපියේ දැක්වේ. පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ ඇතැම් විට රුවන්වැලි සෑය වෙත මෙම ලිපිය බැහැරින් ගෙනෙන්නට ඇති බවය. මෙම ලිපියේ දක්ඛිණ විහාරය හඳුන්වා ඇත්තේ **දක්ඛිණ අබයආරාමය** ලෙසිනි. එසේ නම් කිරීමට හේතු වන්නට ඇත්තේ දුටුගැමුණු රජු වෙනුවෙන් මුලින් ම මෙය සෑදූ නිසාවෙන් බවය. **දුට්ඨගාමිණි අභය** යන්නෙහි **අභය** යන කොටස ගෙන එය නම් කරන්නට ඇතැයි සඳහන් කරයි. (Paranavitana 1983: 86-87) එසේ ම දක්ඛිණ ථූප මළුවෙන් හමු වූ ශිලාලේඛනවල දක්ඛිණ විහාරයේ **තිසචේතිය** නමින් ද මෙම දාගැබ හඳුන්වා ඇත. පරණවිතානයන් සඳහන් කරන්නේ මෙම නම් කිරීම සඳහා බලපාන්නට ඇත්තේ මහාවංසයේ සඳහන් වන පරිදි **කණිට්ඨතිස්ස** රජු දාගැබ විශාල කොට කඤ්චුකයක් යෙදීමයි. (Paranavitana 2001: 163) මෙම කරුණ පාලි මහාවංසයේ වාර්තා කර ඇත්තේ **දක්ඛිණ විහාර ථූපම්හි කඤ්චුකඤ්ච අකාරයි** (මහාවංසො 1959: 36, 12) දක්ඛිණ විහාර ථූපයෙහි කඤ්චුකය ද කරවිය.

එහෙත් මෙය සිංහල පරිවර්තනයේ දී ගෙනහැර දක්වා ඇත්තේ **දකුණු වෙහෙර සෑයෙහි සෑ ගෙයද කරවීය** යනුවෙනි. (මහාවංසය 1967: 36, 12-13) මෙය පැහැදිලි ලෙස ම **කඤ්චුක** යන වචනයට දෙන ලද වැරදි පරිවර්තනයකි. දීපවංසයෙහි ද දක්ඛිණාරාම ථූපයට ගෙයක් කරවූ බව වාර්තා වෙතත් (දීපවංසය 1970: 22, 24) දක්ඛිණ ථූපයට චෛතියඝරයක් හෙවත් සෑ ගෙයක් අතීතයේ දී ඉදකර තිබූ බවට කිසිඳු සාධකයක් පුරාවිද්‍යාත්මක වශයෙන් දැක ගැනීමට නැත. දීපවංසය ද දාගැබට කඤ්චුකයක් යෙදීම මෙලෙස වැරදි ලෙස වාර්තා කරන්නට ඇතැයි සිතිය හැකි වේ. ඉහත දැක්වූ පරිදි කණිට්ඨතිස්ස රජු විසින් දුටුගැමුණු භෂ්මාවශේෂ මත ඇතැම් විට කුඩා ප්‍රමාණයෙන් ඉදිවුනු දාගැබ මත කඤ්චුකයක් දමා විශාල කිරීම හේතුවෙන් එතුමාගේ නමින් එම දාගැබ හැඳින්වීමට පෙළඹෙන්නට ඇත. මීට පෙර එම දාගැබ දුටුගැමුණු නාමයට සම්බන්ධ කර හැඳින්වීමට පෙළඹී සිටියාක් මෙන්ම



CamScanner

පූර්ණ ප්‍රතිසංස්කරණයෙන් පසු මෙසේ කණිට්ඨතිස්ස රජුගේ නාමයට සම්බන්ධ කොට දාගැබ හැඳින්වීමට බාධාවක් නැත. මෙපමණක් නොව කණිට්ඨතිස්ස රජතුමා මහාවිහාරයට අයත් මහමෙව්නා භූමිය උල්ලංඝනය කොට දක්ඛිණ විහාරය සඳහා දාන ශාලාවක් තැනූ අතර ම මහා විහාරයේ සීමා පවුරේ කොටසක් කඩා දක්ඛිණ විහාරයට පිවිසුම් මාර්ගයක් ද තනා ඇත. (මහාවංසය 1967:36, 13-14) මේ හැර මෙම රජු මහා විහාර සීමාව මැඩ **කුක්කුටගිරි විහාර** පන්තිය ද කළ බව සඳහන්ය. (එම: 36, 10) මහාවංසයේ මෙම කරුණු වාර්තා කරන ආකාරයෙන් පෙනී යන්නේ රජතුමා එක්තරා දුරකට මහාවිහාරය නොසලකා කටයුතු කළ බව ය. **වෝහාරික තිස්ස** (ක්‍රි.ව. 214-236) රජු මෙම දාගැබෙහි ඡත්‍ර නැංවීම කර ඇත. (එම: 36, 33) පෙර යොදා තිබූ ඡත්‍ර දිරාපත්වීම හේතුවෙන් මෙසේ නව ඡත්‍රයක් ඔහු විසින් යොදන්නට ඇතැයි සිතිය හැකි වේ. මේ හැර එතුමා දක්ඛිණ විහාරය වටා ප්‍රාකාරයක් ද කළ බව කියැවේ. (එම: 36, 33) එහෙත් මෙම පවුර දාගැබ වටා කළ එකක් ද නැතහොත් විහාර සීමාව වටා ඉදිකරන ලද්දේ දැයි පැහැදිලිව කිව නොහැක. ඇතැම් විට දාගැබේ ඡත්‍ර කර්මයන් ද සිදු කළ නිසා මේය දාගැබ වටා බැඳ ඇති ප්‍රාකාර මෙසේ ඉදිකළා වීමට ද ඉඩකඩ ඇත. මේ සමයේ දී දක්ඛිණ විහාරය හඳුන්වා ඇත්තේ දක්ඛිණ මූලය වශයෙනි. ඇතැම් විට මේ වන විටත් මෙය අභයගිරි විහාරයට සම්බන්ධ ආයතනයක් ලෙසින් ක්‍රමයෙන් දියුණු වෙමින් තිබූනාවිය හැකිය. අභයගිරියෙහි උත්තර මූලය, වහදු මූලය, කපාරා මූලය, මහනෙත්පා මූලය වශයෙන් මූල 4 ක් තිබිණි. මෙහි උත්තර මූලය යනුවෙන් තිබෙන හෙයින් බොහෝ විට දක්ඛිණ මූලයක් තිබීමට ඉඩකඩ ඇත. කෙසේ වෙතත් අපට ස්ථිර ලෙස ම අභයගිරියට සම්බන්ධව දක්ඛිණ මූලය ලෙසින් මෙම ආරාමය හැඳින්වූයේ දැයි පිළිගැනීමට ප්‍රමාණවත් සාධක නැත.

ගෝඨාභය රාජ්‍ය සමය (ක්‍රි.ව. 249-262) දක්ඛිණ විහාරයේ ඉතිහාසය සම්බන්ධයෙන් ගත් කල සුවිශේෂ ස්ථානයක් හිමි කර ගන්නා කාල පරිච්ඡේදයක් වශයෙන් දැක්විය හැකි වේ. මේ රජු දක්ඛිණ විහාරයෙහි පොහොය ගෙය ප්‍රතිසංස්කරණය කරන ලදැයි සඳහන්ය. (එම: 36, 107) මේ සමයේ දී සිදු වූ විශේෂතම සිද්ධියක් වූයේ ශාසනයට

නිග්‍රහයක් ලෙස සැලකූ වෛතුල්‍යවාදී අදහස් දැරූ අභයගිරි භික්ෂූන් වහන්සේලා 60 නමක් පිටුවහල් කිරීමයි. (එම: 36' 111-12) මෙම සිද්ධියෙහි ම තවත් මුහුණුවරක් නිකාය සංග්‍රහය අපට පෙන්වා දෙයි. එනම් අභයගිරියේ වෛතුල්‍යවාදීන් සමග රජු උරණ වූ බැවින් අභයගිරියේ විසූ **උස්සිලියා තිස්ස** නම් මහ තෙර නමක් වෛතුල්‍යවාදී අදහස් ගත් භික්ෂූන් වහන්සේලා සමග වාසය කිරීම නොකටයුතු යැයි කල්පනා කර උන්වහන්සේ තවත් භික්ෂූන් 300 ක් දෙනා වහන්සේලා සමග **අභයගිරි ධම්මරුචික** නිකායෙන් වෙන්ව දක්ඛිණගිරි විහාරයට වැඩම කොට ඇත. මේ අනුව බුදුන් වහන්සේ පිරිනිවී සත්සිය පස් අවුරුද්දක් ගිය කල **සාගලික නිකාය** දක්ඛිණගිරි විහාරය මුල් කර ගෙන ඇරඹි බව නිකාය සංග්‍රහය වාර්තා කරයි. (නිකායසංග්‍රහය 1987: 23) දක්ඛිණගිරි විහාරය මුල් කර ගෙන සාගලික නිකාය ආරම්භ වීම නිසා ලංකාවේ එතෙක් දෙකක්ව පැවති නිකාය නව නිකාය සමග තුනක් බවට පත්වී ම ශාසන ඉතිහාසයේ කැපී පෙනෙන සිද්ධියක් ලෙස දැක්වීමට පුළුවන. කෙසේ වෙතත් මේ සිද්ධියෙන් පසුව දක්ඛිණ විහාරය වෙනම නිකායක් ලෙසින් ස්වාධීනව කටයුතු කරන්නට ඇතැයි සිතිය හැකිය. මින් පසුව දක්ඛිණ විහාරය හා සම්බන්ධයෙන් තවත් විශේෂ සිදුවීමක් වන්නේ මහසෙන් රාජ සමයේ දී ය. (ක්‍රි.ව. 274-301) එතුමා දක්ඛිණ විහාරයේ වැඩ වාසය කළ **කොහොන්තිස්ස** නම් මහ තෙර කෙනෙකු කෙරෙහි පැහැදී මහා විහාර සීමාව තුළ වූ **ජෝතිවන** නම් උයන තුළ **ජේතවන විහාරය** කිරීමට ආරම්භ කරනු ලැබීය. (මහාවංසය 1967: 37, 32 ., නිකාය සංග්‍රහය 1987: 25) මෙය ලාංකික භික්ෂු ශාසනය තුළ දැඩි මතභේදාත්මක සිද්ධියක් බැව් මූලාශ්‍ර ග්‍රන්ථ හා ශිලාලේඛනවල එන කරුණු වලින් පැහැදිලි වේ. මහාවංසයේ මෙම කරුණ වාර්තා කර ඇත්තේ මෙලෙසිනි.

> ***"දකුණු අරම් වැසි කුහක වූ වංක සිත් ඇති පාප මිත්‍ර වූ නොසන්හුන් තිස්ස තෙරුන් කෙරෙහි පැහැද මහා විහාර සීමා පෙදෙසෙක් වූ ජෝතිවන උයන්හි වලකිනු ලබන්නාහු ද ඒ තෙමේ ජේතවන විහාරය කරවීය."***

( මහාවංසය 1967: 37, 32-34 )

නිකාය සංග්‍රහයේ මෙම කරුණ වාර්තා වන්නේ

**" පාප මිත්‍ර සංසර්ගය නිසා සුශීල දුශීලයන් නොහැඳින දකුණුගිරි වෙහෙර වසන වංක සිත් ඇති කොහොන්තිස්ස නම් මහ තෙරුන් කෙරෙහි භක්ති උපදවා ඔවුනට මහ වෙහෙර සිමින් ඇතුළත ජෝතිවන උයන්හි දෙනා වෙහෙර කරවන්නට පටන් ගත. "**

(නිකාය සංග්‍රහය 1967: 25 )

මේ හැර මෙම මූලාශ්‍ර දෙකෙහි ම රජතුමා සහ භික්ෂූන් අතර ඇති වූ ආරවුල දීර්ඝ වශයෙන් විස්තර කෙරෙන අතර මේ සඳහා රහතන් වහන්සේලා මෙන්ම අභිඥානලාභී භික්ෂූන් වහන්සේලා ද මැදිහත් වූ බව සඳහන්ය. මහාවිහාර සීමාව ඉක්මවා ජේතවන විහාරය ඉදිකිරීමේ අදහස අත් නොහරින රජු එම විහාරය තනවා තිස්ස තෙරුන් හට පූජා කරන්නට යෙදුනි. මෙම කරුණ සනාථ කෙරෙන 10 වැනි සියවසට අයත් ශිලාලේඛනයක් ද ජේතවන භූමියෙන් හමු වී තිබීම විශේෂ කරුණකි. සිව් වැනි මිහිඳු රජුට අයත් මෙම ශිලාලේඛනය අදාල සිද්ධිය වසර 700 කට පමණ පසුව වාර්තා කරණ අතර එහි දී තිස්ස තෙරුන්වහන්සේ හඳුන්වා ඇත්තේ " **සාගුලි මහ හිමියන් නැමින් පාළ වූ අපිස් සතොස් තිස් මහ තෙර නට පිහිටි දෙනා රජ මහ වෙහෙර** " යනුවෙනි. (Ez III1933: 227) මෙම ලිපියෙහි තෙරුන් වහන්සේ හඳුන්වා ඇත්තේ අල්පේච්ඡතා සන්තුට්ඨිතා ගුණයෙන් යුතු තිස්ස තෙරුන් යනුවනි. එපමණක් නොව උන්වහන්සේ සාගුලික මහ හිමියන්ගේ ගුරු පරපුරට අයත් බව ද පැහැදිලිව සඳහන්ව තිබීම විශේෂ කරුණකි. මේ අනුව දක්ඛිණ විහාරයේ ප්‍රබලතම භික්ෂූන් වහන්සේ **සාගුලික** මහ තොරුන් වහන්සේ වශයෙන් 10 වැනි සියවස වන විටත් සැලකූ බවට මෙය කදිම සාක්ෂියකි. එසේ ම දක්ඛිණ විහාරයේ වැඩ වාසය කළ තිස්ස තෙරුන්ගේ මූලිකත්වයෙන් ජේතවන විහාරය ආරම්භ වූ බවත් 10 වැනි සියවස වන විටත් ජේතවන විහාරයේ ආදී කර්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක් තිබූ බව පැහැදිලි වේ.

ධාතුසේන රාජ්‍ය කාලයේ දී (ක්‍රි.ව. 455-473) එතුමා දක්ඛිණගිරියේ සංවර්ධන කටයුතු කළ බව මහාවංසයේ සඳහන්ව ඇතත්



CS CamScanner

(මහාවංසය 1967: 38, 47) ඒ කවරේදැයි විස්තර සහිතව දක්වා නැත. නිකාය සංග්‍රහය වාර්තා කරන පරිදි සිලාකාල (ක්‍රි.ව. 518-531) රාජ්‍ය සමයේ දී ඔහුගේ අභිෂේකයෙන් 12 වන වර්ෂයෙහි මෙරටින් කසී රටට ගිය පූර්ණ නම් වෙළඳ පුත්‍රයෙක් වෛතුල්‍යවාද ලියූ පොතක් ලැබ සැබෑ ධර්මයකැයි සිතා මෙරට ගෙනවුත් රජුට පුද පඬුරු වශයෙන් දී ඇත. එම රජු ධර්ම අධර්ම විභාග කිරීමට අසමර්ථව අභයගිරිවාසී භික්ෂූන් හා මන්ත්‍රණය කොට ජේතවන විහාරයේ භික්ෂූන්ට වෛතුල්‍යවාද පොත පතට හා ඉගැන්වීම් වලට ගරු කරන ලෙස විධාන කොට ඇත. එහෙත් දක්ඛිණගිරි විහාරයෙන් ජේතවනයට පැමිණි මෙම භික්ෂූන්ට පෙර රජවරුන් දවස වෛතුල්‍යවාදය ගත් හෙයින් ගිරිහැර වලට ලක්වීම නිසා ඊට අකමැති වූ බව සඳහන් කර ඇත. (නිකාය සංග්‍රහය 1987: 27) මෙයින් පෙනෙන්නේ අභයගිරිය මුල්කොට ගෙන සාගලිකයින් භින්න වුව ද අභයගිරිකයින්ගේ මතවාදයන් පිළිගැනීමට දක්ඛිණගිරි වාසීන් කැමති නොවූ බවය. 1 වැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව. 571-604) දක්ඛිණ විහාරයේ ඉතා සිත්කළු ප්‍රාසාදයක් කළ බව මහාවංසයේ සඳහන් වේ. (මහාවංසය 1967: 41,14)

දක්ඛිණ විහාර ඉතිහාසයෙහි එක්තරා අඳුරු කාල පරිච්ඡේදයක් පළමු වැනි දාඨෝපතිස්ස රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව.) උදාවිය. එනම් ඔහුගේ යුව රාජයා ලෙස කටයුතු කළ කාශ්‍යප විසින් දක්ඛිණ ථූපය බිඳ එහි වූ වස්තුව මංකොල්ල කන ලදැයි මහාවංසය කියයි. (එම: 43, 139-140) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දක්ඛිණ ථූපය පමණක් නොව ඉතා පූජනීය සිද්ධස්ථානයක් වූ ථූපාරාමය පවා ඔහු විසින් කොල්ල කන ලද බවය. එසේම දක්ඛිණ ථූපය ගැන පසුකාලීන ලේඛනවල කිසිවකුත් සඳහන් නොවන හෙයින් මෙම දාගැබ කවරෙකු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද්දේ දැයි කිව නොහැකි බව එතුමා සඳහන් කරයි. (පරණවිතාන 2001: 25) දක්ඛිණ විහාරය පිළිබඳව අපට වංසකතාවන්හි අවසන් වතාවට තොරතුරු හමු වන්නේ පස්වැනි කාශ්‍යප රාජ්‍ය සමයේ දී ය. (ක්‍රි.ව. 914-923) එතුමා දක්ඛිණගිරි විහාරයට ගමක් පූජා කොට ඇත. (මහාවංසය 1967: 52, 61) මෙයින් පෙනෙන්නේ අනුරාධපුර යුගය අවසානය දක්වා ම දක්ඛිණ විහාරය භික්ෂු වාසයක්ව




CamScanner

පැවති බවය. අනුරාධපුරයේ බිඳවැටීමත් සමග මෙම විහාරය සම්පූර්ණයෙන් ම අභාවයට යන්නට ඇත. ඉන් පසුව ද කිප වරක් ම සොරුන් විසින් මෙම දාගැබ බිඳින ලද බවට සාධක ඇතැයි පරණවිතාන මහත්මා සඳහන් කරයි. (පරණවිතාන 2001: 25) මෙම දාගැබේ ආයක, ගර්භය හා එහි අභ්‍යන්තරයට සිදුවී ඇති හානි පිළිබඳව සැලකීමේ දී අනුරාධපුර ප්‍රධාන නගරයේ පැවති මහ දාගැබ් අතුරින් බරපතල ලෙසින් හානි පමුණුවන ලද දාගැබ වශයෙන් මෙය හඳුන්වාදීම සාධාරණය.

මෙම දාගැබ කැනීම් කිරීමේ දී ඊට අදාලව අනාවරණය වූ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් ලක්‍ෂණ පිළිබඳව සඳහන් කරන පරණවිතාන මහත්මා දාගැබේ ඉදිකිරීම් පිළිබඳව වැදගත් සාක්‍ෂි කීපයක් ම ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඔහු දාගැබේ පාදම මළුව මට්ටමෙහි සිට අඩි 13 ක් යට සිට ගඩොලින් ඉහළට බැඳ ඇති බව තහවුරුකොට ඇත. එය සලපතළ මළුවට යටින් පේසාවේ සීමාව ද ඉක්මවා මළුව මත ස්ථාන කීපයක කරන ලද කැනීම්වලින් තහවුරු කරගෙන ඇත. ඒ අනුව දාගැබ විශාල කෘත්‍රිම තලව්වක් (වේදිකාවක් ) මත ඉදිකර ඇති බව ඔහු පවසයි. දාගැබේ බරින් තලව්ව ගිලා බැසීම වලක්වාලීම සඳහා එය පිහිටි පොළොව දක්වාම බැඳ තිබූ බවත් මේ අනුව මතුපිට දාගැබේ පෙනෙන ප්‍රමාණයට වඩා වැඩි ගඩොල් ප්‍රමාණයක් පොළොව යට ගිල්වා ඇති බවත් සඳහන් කරයි. රුවන්වැලි දාගැබේ හා ජේතවන දාගැබ් ඉදිකිරීමේ දී ද මෙම ක්‍රමයම අනුගමනය කර ඇතැයි එතුමා වැඩිදුරටත් පවසයි. (පරණවිතාන 2001: 29) මෙම දාගැබේ පාදම අනාවරණය කර ගැනීම සඳහා කරන ලද කැනීම් වලෙහි වැසි වතුර බැසයාම සඳහා කානුවක් කැපීමේ දී තලව්වේ ශක්තිමත්භාවය සඳහා බොරළු මිශ්‍ර පස් වලින් එහි හාත්පස පුරවා තිබූ බව අනාවරණය විය. මෙම බොරළු තට්ටුවේ මතුපිට ගඩොල් වර්ග 3 ක් භාවිත කරමින් ඇතුරුමක් යෙදූ බවත් එය බැඳීම සඳහා හුණු බදාම භාවිත කළ බවට සාධක ඇතැයි සඳහන් කරයි. (එම: 29-30) මෙම සඳහන් කෙරෙන ගඩොල් ඇතුරුම කවරෙක්දැයි පැහැදිලි නැතත් බොහෝ විට මෙය දාගැබ් මළුවේ පැරණි සමයේ දී තිබූ ගඩොල් ඇතුරුම විය හැකි යැයි අනුමාන කළ හැකි වේ. පරණවිතාන මහත්මා දාගැබේ සලපතළ මළුවේ

නැගෙනහිර කොටස ගවේෂණය කිරීමේ දී එහි වූ ආයකයේ හරි මැද සිට අඩි 74 ක් නැගෙනහිර දිශාවට වන්නට නැගෙනහිර දොරටුවේ පියගැට පෙළත් එහි පනා බැම්මත් හමු වූ බව වාර්තා කරයි. එසේ ම සම චතුරස්‍රාකාර හැඩයක් ගන්නා මළුවේ එක් පැත්තක දිග අඩි 465 ක් බවත් ඊට අත්කර 5 ක් පමණ අයත් වන බවත් එතුමා වැඩි දුරටත් සඳහන් කරයි. (එම: 29-30) පරණවිතාන මහත්මාගේ අධීක්ෂණය යටතේ මෙම දාගැබ 1955 වර්ෂයේ දී තහවුරු කිරීම් අවසන් කර ඇත. (පුරාවිද්‍යා පාලන වාර්තාව , 1956, 13) ඉන් පසුව මේ දක්වා එහි කැනීම් හෝ නව සංරක්ෂණ කාර්යයක් සිදුකර නොමැත.

ජේතවන දාගැබ





CamScanner

# ජේතවන දාගැබ


## පිහිටීම හා වර්තමාන තත්වය

ජේතවන විහාරය පැරණි නගරයට ගිණිකොන දිගින් හා රුවන්වැලි දාගැබට නැගෙනහිරින් පිහිටියේය. එය උත්තර අක්ෂාංශ 08", 21.04 ක් හා නැගෙනහිර දේශාංශ 80", 24.12 ක් වන්නේය. දාගැබේ මුහුදු මට්ටම වන්නේ 78.42 කි.

ජේතවන විහාරය අනුරාධපුර අටමස්ථානයට අයත් පූජ්‍යස්ථානයක් වන අතර අටමස්ථානාධිපතීන් වහන්සේගේ භාරකාරත්වය යටතේ එහි ස්වාමීන් වහන්සේලා කටයුතු කරමින් වැඩ වසති. මෙම විහාර සංකීර්ණයේ ද දාගැබ ප්‍රධානතම පූජනීය ඉදිකිරීම වන අතර ඒ වටා ප්‍රතිමා ගෘහ බෝධිඝර දානශාලා ආවාස ගෘහ පොකුණු ආදී විවිධ වාස්තු විද්‍යාත්මක අංග නටබුන්ව පවතී. දැනට දළ වශයෙන් මල්වතු ඔය හා හාල්පානු ඇලෙන් වටවන අක්කර 195 ක පමණ ප්‍රදේශය ජේතවන ආරාම සංකීර්ණයට අයත් යැයි හඳුනාගෙන ඇත. (Ratnayake 1984: 3) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙන් ම 1981 දී සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වුනු කැනීම් හා සංරක්ෂණ වලින් මේ වන විට දාගැබට උතුරින් ඇති කොටස හැර අනෙක් බොහෝ කොටස් කැනීමෙන් පසු සංරක්ෂණය කොට පවත්වා ගෙන යනු ලැබේ. දාගැබෙහි ද කැනීම් හා සංරක්ෂණ කටයුතු ද බොහොමයක් ම මේ වනවිට හමාරය.

මෙම දාගැබ ඉදිකිරීමේ දී අනුගමනය කොට ඇත්තේ රුවන්වැලි සහ අභයගිරි දාගැබ ඉදිකිරීමේ දී අනුගමනය කරන ලද ආකෘතිය ම වේ. ඒ අනුව සිව් දිශාවෙන් දාගැබ වෙත ප්‍රවේශ වීමට ද්වාර මණ්ඩප සතරක් සහ ඊට සම්බන්ධව පිට පවුර ආදිය වේ. මෙම පිට පවුරේ විශේෂත්වය වන්නේ රුවන්වැලිය අභයගිරිය හා මිරිසවැටිය මෙන් ගල් පුවරු වලින් බඳින ලද පවුරක් එහි නොවීමයි. එහි ඇත්තේ අක්‍රමවත් ගල් කැබලි සිරස්ව තබා බඳින ලද පවුරකි. මෙහි පහත කොටසේ

සාධක ඉතිරි වී ඇතත් එහි ඉහළ කොටසේ නිර්මාණ ලක්ෂණ අපහැදිළිය. මෙම පවුරේ දිග හා පළල මීටර් 209.90 ක් පමණ වේ. වැලි මළුවෙන් සලපතළ මළුව වෙත ගොඩ වීමට පියගැට පෙළකි. මෙහි පාමුල අභයගිරියේ මෙන් ම ගල් පුවරු එකලස් කර සකසන ලද විශාල සඳකඩපහණකි. වැලි මළුවේ සිට මීටර් 2.15 ක් පමණ උසින් ගඩොලින් බඳින ලද ආධාරක බැම්ම හෙවත් පනාබැම්ම මගින් සලපතළ මළුව දරා සිටී. මේ වන විට සිව් පැත්තම තහවුරු කර ඇති පනාබැම්ම හේතු කොට ගෙන සලපතළ මළුව ආරක්ෂා වී පවතී. සලපතළ මළුව මත එහි කේන්ද්‍රයෙහි දාගැබ ඉදිවී ඇත. එය පේසා වළලු තුනකින් යුක්ත වේ. පළමු පේසාව මීටර් 2 ක් උස වන අතර දෙවන පේසාව මීටර් 1.42 ක් වේ. තුන්වන පේසාව මීටර් 1.35 ක් වේ. පේසා වළලු තුනෙහි ම මතු මුහුණතේ පළල වන්නේ මීටර් 2.10 කි. පේසාවට නැගීම සඳහා දකුණු ආයකය අබියසින් පිය ගැට පෙළක් වේ.



ජේතවන විහාර සංකීර්ණය

අනෙකුත් ආයක ද දාගැබේ ගර්භය හා හතරැස් කොටුව සංරක්ෂණය කොට හමාරව පවතී. කොත් කැරැල්ලේ ඇත්තේ අඩක් පමණි. දැනට දාගැබේ ඇති උස අඩි 232 ක් වන්නේය. දාගැබෙහි සතර දිශාභිමුඛව ඉදිකොට ඇති ආයක හා සළපතළ මළුව මේ වනවිට තහවුරු කොට ඇත.

## ආරම්භය සහ සංවර්ධනීය අවස්ථා

වංසකතාවලට අනුව ජේතවනාරාමය ඉදිකිරීමට උපස්ථම්භක වූයේ මහසෙන් රජතුමාය. (ක්‍රි.ව. 274-301) මෙය සිදුවන්නේ ලංකාවේ භික්ෂු ශාසනය තුළත් දේශපාලන ක්‍රියාවලිය තුළත් සංකීර්ණ ප්‍රශ්න ගණනාවක් ම පවතින සමයක දී ය. මහාවංසයේ හා නිකාය සංග්‍රහයේ සඳහන් වන පරිදි දක්ඛිණගිරි විහාරයේ වාසය කළ **කොහොන් තිස්ස** නම් තෙර කෙනෙකු කෙරෙහි පැහැදී රජතුමා විසින් මහාවිහාර සීමාව තුළ වූ ජෝතිවන උයනෙහි ජේතවනාරාමය කිරීම පටන්ගෙන ඇත. (මහාවංසය 1967: 37, 32-36 ., නිකාය සංග්‍රහය 1987: 25) තිස්ස තෙරුන් වහන්සේව මෙම මූලාශ්‍ර දෙකෙහි ම හඳුන්වා දී ඇත්තේ පහත් ගතිගුණ ඇති භික්ෂුවක් ලෙසිනි. මහාවංසයේ උන්වහන්සේ හඳුන්වා ඇත්තේ " ***දකුණු අරම් වැසි කුහක වූ වංක සිත් ඇති පාප මිත්‍ර වූ නොසන්හුන් තිස්ස තෙරුන් කෙරහි පැහැද මහා විහාර සීමා පෙදෙසක් වූ ජෝතිවන උයන්හි වලකනු ලබන්නාහු ද ඒ තෙමේ ජේතවන විහාරය කරවීය.*** (මහාවංසය 1967: 37, 32-34) මෙම කරුණ නිකාය සංග්‍රහයේ දක්වා ඇත්තේ " ***දකුණුගිරි වෙහෙර වසන වංක සිත් ඇති කොහොන් තිස්ස නම් මහ තෙරුන් කෙරෙහි භක්ති උපදවා ඔවුනට මහ වෙහෙර සිමින් ඇතුළත ජෝතිවන උයන්හි දෙනා වෙහෙර කරවන්නට පටන් ගත."*** (නිකාය සංග්‍රහය 1987: 25) මෙම මූලාශ්‍ර දෙක ම උත්සාහ දරනුයේ උන්වහන්සේ පාපී භික්ෂුවක් බව පෙන්වීමටය. ඒ සඳහා විවිධ උප පද යෙදීමට ද අමතක කර නැත. **කුහක, වංචාකාර, පාපක්‍රියා කරන** භික්ෂුවක් බව හඳුන්වයි. මහා විහාරය විසින් රචිත වංසකතාවල එන මෙම හඳුන්වා දීම එකල කිසියම් මත භේදයකට තුඩු දී තිබූ බව අනුරාධපුර අවසන් සමයට අයත් 4 වන මිහිඳු රජුගේ ජේතවන පුවරු ලිපියකින් පැහැදිලි

වේ. මෙම ලිපියෙහි තිස්ස තෙරුන් වහන්සේ හඳුන්වා ඇත්තේ " **සාගුලි මහ හිමියන් නැමින් පාළ වූ අපිස් සතොස් තිස් මහ තෙරනට් පිහිට් දෙනා රජමහ වෙහෙර්හි**" (Ez., III 1933, .227) එනම් සාගුලි මහ තෙරුන් වහන්සේගේ නාමයෙන් පහළ වූ (බිහි වූ) ලද දෙයින් සතුටු වන (අල්පේච්ඡතා සංතුට්ඨිතා ගුණයෙන් යුතු) තිස්ස මහ තෙරුන් වහන්සේ වෙනුවෙන් පිහිටුවන ලද ජේතවන රජමහ විහාරය යනුවෙන් තිස්ස තෙරුන් වහන්සේ උසස් ගුණයන්ගෙන් යුතු භික්ෂුවක් බව සඳහන් කරයි. මෙසේ වංසකතාවෙහිත් ශිලාලේඛනයෙහිත් එකිනෙකට ප්‍රතිවිරුද්ධව කරුණු ඉදිරිපත් කර ඇති හෙයින් ජේතවනය පිළිගත් භික්ෂුව දැඩි අපහසුතාවයකට එකල පත්ව සිටින්නට ඇතැයි පරණවිතාන මහත්මා සඳහන් කරයි. (Ez., III 1933, .228)

මේ කරුණ අපට වඩාත් තහවුරු වන්නේ උක්ත වංසකතා දෙකෙහි ම ජේතවනාරාමය පිහිටුවන අවස්ථාවේ දී මහා විහාරය සමග ඇති වූ ගැටුම විස්තර කොට ඇති ආකාරයෙනි. මහා විහාර සීමාව තුළ වූ ජේතවන උයනෙහි විහාරය පිහිටුවීමට රජතුමා කටයුතු කළ අවස්ථාවේ දී මහා විහාරීය භික්ෂූන් දැඩි ලෙස ඊට විරෝධතාවය පළකොට ඇත. එහෙත් අභයගිරි විහාර වාසීන්ගේ ඉගැන්වීම් වලින් රජු මහා විහාර මතය බැහැර කොට මහා විහාර සීමාව වෙනස් කර දෙන මෙන් එම භික්ෂූන් වහන්සේලාගෙන් ඉල්ලීම් කර ඇත. ඊට එකඟ නොවූ මහා විහාරීය භික්ෂූන් වහන්සේලා මහා විහාරය අතහැර රුහුණට පලා ගියහ. එහෙත් භික්ෂූන් වහන්සේලා කීප නමක් මහා විහාරය තුළ සැඟව සිටිමින් ජේතවන සීමාවත් සලකුණු කළ අවස්ථාවන්හි දී ඒවා රහසිගතව ගලවා දැමූ බව කියැවේ. (මහාවංසය 1967: 37, 37) නිකාය සංග්‍රහයට අනුව මෙම අර්බුදයට රහතන් වහන්සේලාත් සිතුල්පවු විහාරයේ වාසය කළ අභිඥානලාභී හෙරණ කෙනෙකුත් මැදිහත් වී ඇත. මෙම අභිඥානලාභී භික්ෂුව රාක්ෂස වේශයක් මවා යගදාවක් ද අතින් ගෙන ජේතවන භික්ෂු පිරිස මැදට පැන උන්වහන්සේලා බියකර පලවා හැරීමට පවා කටයුතු කර ඇත. (නිකාය සංග්‍රහය 1987: 26) කෙසේ වෙතත් ජේතවන විහාර සීමාව මහා විහාර සීමාවෙන් වෙන් කොට දැක්වීමට මහසෙන් සමයේ දී කටයුතු කළ බවට කදිම

ශිලාලේඛනමය සාධකයක් මෑතක දී මහා විහාර ව්‍යාපෘතිය මගින් සොයා ගන්නා ලදී වර්තමාන හාල්පාතු ඇලට සමාන්තරව බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය දෙස සිට උතුරු දිසාවට දිවයන සීමා පවුරේ දිය බැස යන කානුවකට මෙම ශිලාලේඛනය සහිත ගල් පුවරුව යොදා තිබුණි. මෙය එම කානුවට පසුකාලීනව යෙදුවා ද නැතහොත් මහසෙන් සමයේදීම යොදන ලද්දේ දැයි ස්ථිරව සඳහන් කිරීම දුෂ්කරය. නමුත් මෙය කිසියම් ලෙසකින් සිටුවා තිබුව හොත් මහා විහාර වාසීන් විසින් විනාශ කළ හැකි යැයි ඇතැම් විට විශ්වාස කළ හෙයින් ජල මාර්ගයෙහි ම යෙදුවා විය හැකිය. මෙම ලිපියෙහි සඳහන්ව ඇත්තේ **ජෙවන වෙහෙර සිමෙ** එනම් ජේතවනාරාම විහාර සීමාවයි යනුවෙනි. මෙම ලිපියේ තවත් විශේෂත්වයක් වූයේ ඊතලයක බඳු සංකේතයක් ද එහි සටහන් කර තිබීමයි. මෙම සංකේතයේ තුඩ පැත්ත ජේතවන දාගැබ දෙසට හෙවත් ජේතවන විහාරය දෙසට එල්ල වී තිබී ඇති නිසා එම සීමා පවුරෙන් ඉදිරිය ජේතවනයට අයත් වන්නේය යන අදහස මින් ලබා දෙන බව ඉතා පැහැදිලිය. මෙහි අක්ෂර ලක්ෂණ අනුව එය ස්ථිර වශයෙන් 3-4 සියවස් වලට අයත් වන හෙයින් මෙය මහසෙන් සමයේ දී ම යොදන්නට ඇති බවට සැකයක් නැත. (මෙම ලිපිය මහා විහාර ව්‍යාපෘති කාර්යාල භූමියේ තැන්පත් කොට ඇත) මහාවංසයේ හා නිකාය සංග්‍රහයේ මහා විහාර සීමාව ඉගිලවීමට නොහැකි වූ බවත් සීමාව තුල ම දෙනා වෙහෙර කරවූ බව කියයි. (මහාවංසය 1967: 37, 34-35., නිකාය සංග්‍රහය 1987 26) එහෙත් මෙම ගල් පුවරුවට අනුව පැහැදිලි ලෙස සීමා සලකුණු කර තිබූ බව පෙනීයයි.

කෙසේ වෙතත් ජේතවනය පිහිටුවීමට මුල් වූ තිස්ස හිමියන්ට සංඝයා විසින් **අන්තිම වස්තුවෙන්** චෝදනා කළ හෙයින් ධාර්මික නම් වූ අමාත්‍යවරයෙකු විසින් මෙම චෝදනාවන් විනිශ්චයකොට බලා එහි තීන්දුවට අනුව රජුගේ අකමැත්ත පිට ම උන්වහන්සේට සිවුරු හැරීමට සිදු වූ බව වංසකතාව සඳහන් කරයි. (මහාවංසය 1967: 37 38-39 ., නිකාය සංග්‍රහය 1987: 26) මෙම චෝදනාව පාරාජිකාපත්තියකට සමාන හෙයින් බරපතල ම වූ චෝදනාවක් ලෙස සැලකිය හැකිය. ඇතැම් විට උන්වහන්සේ ඇමතිවරයා විසින් දුන් තීන්දුවට අනුව සිවුරු හැර යන්නට

ඇත්තේ තම ජීවිතය පිළිබඳව ද කිසියම් අවිනිශ්චිතතාවක් ද තිබූ හෙයින් විය හැකිය. මහසෙන් රජුගේ ගුරු තනතුරේ කටයුතු කළ අභයගිරියේ වසමින් මහාවිහාරය නැසීමට කටයුතු කළ වෛතුල්‍යවාදී අදහස් දැරූ **සංඝමිත්‍ර** නම් තෙරුන් වහන්සේ රජුගේ එක් බිරිඳක් විසින් උපක්‍රම කොට මරණයට පත් කරන ලදී. එපමණක් නොව උන්වහන්සේට ඉතා හිතවත්ව කටයුතු කළ **සෝණ** නම් ඇමතියෙකු ද තලා පෙළා මරණයට පත් කොට කසල ගොඩට ඇද දමා ඇත. (මහාවංසය 1967: 37, 26-29 ., නිකාය සංග්‍රහය 1987: 25) පූජාවලිය සඳහන් කරන පරිදි මහසෙන් රජු ජේතවන දාගැබ බැඳ එහි නිධන් කිරීමට ධාතු නොමැතිව අහස දෙස බලා දෙවියන් අයැද සිටි කල දෙවියෝ බුදුන්වහන්සේගේ **පටි ධාතුව** අහසෙහි සිට රජුට පෙනෙන සේ පහතට එල්ලෙන්නට සලස්වා ඇත. රජු ඊට වන්දනා කර එය ගැනීමට අත පැව ද කීප වරක් දෙවියෝ රජුගේ අතට හසු නොවන පරිදි ඉහළ පහළ කළ විට ඉන් වෙහෙසට පත් රජු අහසට පැන තම කඩුවෙන් පටියේ කොටසක් කපාගෙන ඇත. (පූජාවලිය 1997: 777 ) 15 වැනි සියවසේ දී ලියැවුනු පැරකුම්බා සිරිතෙහි ද මෙම කරුණ සඳහන් කරන අතර ධාතු නොලැබුනහොත් රජු ජේතවන මළුවේ සිට රා බොමියි දෙවියන්ට තර්ජනය කළ බව ද එහි වැඩි විස්තර වශයෙන් දක්වා ඇත. (පැරකුම්බා සිරිත 1997 : 17, 18 කවිය) මේ කරුණුවලින් පෙනෙන්නේ ඔහු තර්ජනාත්මක ස්වරූපයෙන් වීරත්‍වය පා ධාතු පවා ලබාගත් බවයි. මහසෙන් රජුගේ ඇවෑමෙන් රජකමට පත් ඔහුගේ පුත්‍ර කිත්සිරි මෙවන් රජු බෙහෙවින් මධ්‍යස්ථ අයෙකු වූ අතර එතුමා පිය රජු විසින් විනාශ කළ මහාවිහාරයේ සියලුම විහාරාරාංග ප්‍රතිසංස්කරණයට කටයුතු කළේය. එපමණක් නොව පියරජු විසින් අඩක් ඉදිකළ ජේතවන විහාරයේ ඉදිකිරීම ද සම්පූර්ණ කරන ලදැයි සඳහන්ය. (මහාවංසය 1967: 37, 51-65)

ජේතවන විහාරයේ භික්ෂූන්ගේ ආගමණය දක්ඛිණ ථූපයෙන් සිදු වූ හෙයින් එය **සාගලික නිකාය** හෝ **දෙනානක** හෙවත් **ජේතවන නිකාය** යනුවෙන් හැඳින්වූ බව පෙනියයි. ජේතවන විහාරයට අයත්

නිකාය යන අර්ථයෙන් උක්ත යෙදුම භාවිත වී ඇතැයි පෙනියයි. ජේතවන විහාරය හැඳින්වීමට අනුරපුර යුගයට අයත් ශිලාලේඛනවල **දෙනා වෙහෙර්** හෝ **දෙනා රජ මහ වෙහෙර්** යනුවෙන් යොදා තිබීමෙන් මේ බව වඩාත් පැහැදිලි වේ. (Ez. I 1912: 218, Ez II 1985: 46; Ez III 1933: 227) අනුරාධපුර යුගයේ අවසන් සමයට අයත් රබෑව ශිලාලේඛනයේ **දෙව්නා මහවෙහෙර** යනුවෙන් ද මෙම විහාරය හඳුන්වා ඇත. (IC V II: 62'8) මෙම විහාරයට ජේතවන විහාරය යන නාමය ලැබීමට හේතුව වශයෙන් සැලකෙන්නේ එය **ජෝතිය වනයෙහි** පිහිටීම හේතුවෙනි. කෙසේ වෙතත් මහාවංසයේ සඳහන් වන්නේ අනුරාධපුරයේ මහමෙව්නාව අබියස වූ නන්‍දන වනය ශ්‍රේෂ්ඨ වූ රහතන් වහන්සේලා විසින් ශාසනය බැබළු වූ ස්ථානය වූ හෙයින් ඊට ජෝතිවනය යනුවෙන් ව්‍යවහාර කළ බවය. (මව 1967: 15, 221) මෙයින් පෙනෙන්නේ නන්‍දන වනය ම පසුකාලයේ දී **ජෝතිවනය** නැතහොත් **ජේතවනය** යනුවෙන් ව්‍යවහාර කළ බවය. ආචාර්ය හේම රත්නායක මහත්මා විසින් ජේතවන දාගැබ ඉදිවූයේ මිහිඳු හිමියන්ගේ ආදාහනය සිද්ධ වූ ස්ථානයේ යැයි උදාහරණ කීපයක් ඉදිරිපත්කරමින් තහවුරු කිරීමට උත්සහ කරනුලැබ ඇත. (රත්නායක 1998: 330-40 පිටු) එම අදහස පිළිගත හැකි මට්ටමින් තහවුරු කර ගැනීමට වංසකතා සාධක හා පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක ඉදිරිපත්ව නැත. (කුලතුංග 2001: 26-28)

කෙසේ හෝ ජේතවන ආරාමය ඉදිකිරීමෙන් පසුව විවිධ රජවරුන් හා පරිත්‍යාග ශීලීන්ගේ උපකාරයෙන් අනුරාධපුර යුගය පුරා ම දියුණු තත්වයෙන් පවත්වාගෙන ගිය බව වංසකතා සාධක අභිලේඛන සාධක මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක වලිනුත් ඔප්පු වේ. ඉහත දී විස්තර කළ පරිදි කිත්සිරි මෙවන් රජුගේ රාජ අනුග්‍රහයෙන් පසුව වංසකතාවේ සඳහන් වන්නේ මිත්තසේන රජු ( ක්‍රි.ව. 428-429 ) සෑයෙහි ඇත් පවුර හා තොරණ කරවූ බවය. ( මහාවංසය 1967: 38, 10) මෙම ඇත් පවුර හා තොරණ දාගැබෙහි කවර ස්ථානයක ඉදිකරන ලද්දේ දැයි වැඩිදුර සඳහන් කර නොමැත. **හත්ථි පාකාර** යනුවෙන් පාලි මහාවංසයේ යෙදී ඇති හෙයින් මෙය ඇත් පවුර බව පැහැදිලිය. බොහෝ විට මෙය නිමවා තිබෙන්නට ඇත්තේ වැලි මළුවේ ඇතුල් සීමාව



CamScanner


සලකුණු කරන හා සලපතළ මළුව දරා සිටින පනාවැලිමෙහි විය යුතුය. දැනට එහි ඇත් පවුරක සලකුණු පැහැදිලිව දැක ගැනීමට සාධක නැත. ඇතැම් විට පසුකාලීනව සිදු වූ යම් යම් ප්‍රතිසංස්කරණ හේතුවෙන් එය වෙනස්ව ගියා විය හැකිය. කෙසේ වෙතත් ජේතවන ස්තූපයෙහි මෑත දී කරන ලද කැනීම්වල දී නැගෙනහිර දොරටුව අභියස පවුරේ ඇත් රුවකට අයත් පාදයක කොටසක් අනාවරණය කොට ගෙන ඇත. (Ratnayake 1984: pl.20) ධාතුසේන රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 455-473) එතුමා මෙම දාගැබෙහි ඡත්‍ර කරවූ බව වාර්තා වේ. (මහාවංසය 1967: 38, 55) ඒ හැර ඒ පිළිබඳ වැඩි තොරතුරු වාර්තා වී නැත. තවද එතුමා මෙම දාගැබෙහි සුණු පිරියම් කිරීම හා දාගැබ මුදුනෙන් වජ්‍ර **චුම්බටකයක්** සවිකිරීම ද සිදු කොට ඇත. (එම: 38, 74-75) මහානාග රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 569-571) එතුමා ද දාගැබේ සුණු ආලේප කොට වජ්‍ර චුම්බටකයක් සවි කොට ඇත්, වේදිය කරවූ බව කියැවේ. (එම: 40, 95-96) මහානාග රජුගේ මෙම කාර්යයන් වාර්තා කරන පාලි මහාවංසයේ එන ඇතැම් වචන වැරදි ලෙස සිංහල මහාවංසයට ගෙන ඇති බව සඳහන් කළ යුතුය. පාලි මහාවංසයේ එන **චුම්බටක** යන්නට කොත් කැරලි යනුවෙනුත් **හත්ථිවේදී** යන්නට ඇත් පවුර යනුවෙනුත් අර්ථ දී ඇතත් ඒවා වැරදි සහගත අර්ථකථන බැව් සඳහන් කළ යුතුය. චුම්බටක යනු කොත් කැරලි නොව පළිඟුමය නිර්මාණයකි. මෙය දාගැබ මතට අකුණු සැර වැදීම වැලැක්වීම සඳහා යොදන ලද්දකැයි වංසත්ථප්පකාසිනිය වාර්තා කරයි. (වංසත්ථප්පකාසිනි 1994: - 538) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ මෙහි එන විස්තරයට අනුව මෙම නිර්මාණය පළිඟු වළල්ලක් සේ හැඟෙන අතර එයින් දාගැබ මුදුනේ ඇති මැණික ආරක්ෂා වන්නට ඇති බව ය. (පරණවිතාන 2001: 32) එසේ ම හත්ථිවේදි යන්න ද පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ දාගැබේ පේසාව මත ඇත් හිස් සහිතව ඉදි කරන ලද වැට බව ය. (එම : 15) හත්ථි පාකාර යනු ඇත් පවුරයි. පැහැදිලිව ම මෙම නිර්මාණයන් දෙක දෙකක් ම වන්නේය. මේ හැර මහානාග රජු ජේතවන විහාරයට **උඩුගම්හි වැහැප්** නම් ගමක් පරිත්‍යාග කොට ඇත. (මහාවංසය 1967: 40, 97) 1 වැනි අග්ගබෝධි රජතුමා ද (ක්‍රි.ව. 571-604) මෙම දාගැබෙහි ඡත්‍ර රනින් කළ බව කියැවේ. (එම: 41, 32) 2

වැනි සංඝතිස්ස කුමරු (ක්‍රි.ව. 614) අළුත් වස්ත්‍ර වලින් දාගැබ වැසූ බව කියැවේ. (එම: 41, 44) සිලාමේඝවණ්ණ රජු ද (ක්‍රි.ව. 619-628) තුන් සැයට සත්කාර කළ බව මහාවංසය කියයි. (එම: 42, 65) මෙම සත්කාර කිරීම යනු කවරාකාර එකක්දැයි පැහැදිලි නැත. තුන් වන ජෙට්ඨතිස්ස රජු (ක්‍රි.ව. 628-629) ජේතවන විහාරයට **ගොඩිගමුව** නම් ගමක් පරිත්‍යාග කොට ඇත. (එම: 42, 97) ජෙට්ඨතිස්ස රජුගෙන් අනතුරුව රජ පැමිණි තුන් වන අග්ගබෝධි (ක්‍රි.ව. 629-639, දෙවන වර) ජේතවන විහාරයට **මාමිණියා** නම් ගමක් පරිත්‍යාග කොට ඇත. (එම: 42, 121) සීගිරි ගීයක ද මාමිණියාව යන ගම පිළිබඳව සඳහනක් ඇත. (සී. 658) ඇතැම් විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති මාමිණියාව යන ගම මෙය වීමට ඉඩ ඇත. ක්‍රි. ව. 639-650 අතර සමයේ දී රජකමට පත්ව සිටි 1 වැනි දාඨෝපතිස්ස රජු ජේතවනය ඇතුළු ප්‍රධාන විහාර තුනෙහි ධාතුඝර විනාශ කොට ඒවායේ පූජා වස්තු මෙන් ම රන් පිළිම, රන් මාල ආදී බොහෝ පූජා භාණ්ඩ පැහැර ගත් බව කියැවේ. (එම: 42, 131-132) 4 වන අග්ගබෝධි (ක්‍රි.ව. 667-683) රජු ජේතවනයේ භෝජන ශාලාවට ප්‍රත්‍යය දෙනු ලැබීය. එසේ ම තුන් නිකායට ම භෝග උපදනා ගම් දහසක් දුන් බව කියයි. (එම: 44, 3, 17-18) මේ හැර එම රජුගේ ඇමතිවරයෙකු වූ **පොත්ථසාත** නැමැත්තා ජේතවන විහාරයෙහි පිරිවෙණක් කරවූ බව කියැවේ. (එම: 44, 22) දෙවන දප්පුල රජු (ක්‍රි.ව. 815-831) ජේතවන විහාරයෙහි රන්මුවා පිළිමයක් කොට එය බෝධිඝරයේ තැන්පත් කර මහා පූජාවන් කළ බව කියැවේ. (එම: 49, 78) 1 වැනි සේන රජු (ක්‍රි.ව. 833-853) ජේතවන විහාරයෙහි මහල් ප්‍රාසාද කීපයක් කරවීමත් රන් බුද්ධ ප්‍රතිමාවක් කරවීමත් ගින්නෙන් විනාශ වූ මහා ප්‍රාසාදයක් ද කරවා එම විහාරයට තවත් භෝග දුන් බව සඳහන්ය. (එම: 50, 65-68) පස්වන කාශ්‍යප රජු ද (ක්‍රි.ව. 914-923) ජේතවන විහාරයේ දාන ශාලාවට ගමක් දුන් අතර තුන් නිකායට ම අයත් භික්ෂූන් ලවා එකල නුවර පිරිත් දේශනා කරවා රෝ බිය පහ කළ බව ද කියැවේ. (එම: 52, 58, 80-81) තුන්වන සේන (ක්‍රි.ව. 938-946) රාජ්‍ය සමයේ දී එතුමා සතර විහාරයෙහි රූකම් හා රම්‍ය මණ්ඩපයක් කරවා හැම කලම ධාතු පූජා කළේ යැයි සඳහන්ය. (එම: 54, 36-37) සතර විහාරය යනුවෙන් මෙහි දී අදහස් කර ඇත්තේ මහාවිහාරය, අභයගිරිය,


ජේතවනය හා දක්ඛිණ විහාරය යැයි සැලකිය හැකි වේ. සතර විහාරය පිළිබඳව සඳහන් වන එක ම අවස්ථාව වන්නේ ද මෙයයි. සිව්වැනි මිහිඳු රාජ්‍ය සමයේ දී (ක්‍රි.ව. 956-972) එතුමාගේ ඇමතිවරු සිව් දෙනෙකු ජේතවනයෙහි පිරිවෙන් සතරක් කරවූ බව කියැවේ. (මහාවංසය 1967: 54, 51) සිව් වැනි මිහිඳු සමයට අයත් බෞද්ධ වැට පුවරු ලිපිය වශයෙන් හඳුන්වනු ලබන ලිපියෙහි ද **රත්නමා පිරිවෙන්** වැසි උපාසකයන් විසින් කරවන ලද දොරටු පැන් මඩියක් හා ඒ හා සම්බන්ධව අනුගමණය කළ යුතු නීති රීති පිළිබඳව තොරතුරු කියැවේ. (Ez III 1933: 227) ඇතැම් විට මෙම ශිලාලේඛනය එම ඇමතිවරුන් හා සම්බන්ධ වීමට ද ඉඩ ඇත. අනුරාධපුර යුගයේ අවසාන සමයේ දී පස් වන මිහිඳු රාජ්‍ය සමයේ (ක්‍රි.ව. 982-1029) ඇතිවන චෝල ආක්‍රමණයත් සමග ජේතවනය ඇතුළු අනුරාධපුරයේ වෙහෙර විහාර දැඩි කොල්ල කෑමකට ලක් වූ බව මහාවංසයේ එන කරුණු වලින් පැහැදිලි වේ. මහාවංසය මෙම කරුණ වාර්තා කර ඇත්තේ පහත ආකාරයෙනි. " **තුන් නිකාහි දාගැබ් ද මුළු ලක්දිව් තෙලෙහි මැහැඟි නොයෙක් ස්වර්ණාදී පිළිබිඹු ද එසේම ඒ ඒ වෙහෙර සියල්ල ද ලා හෙලා බිඳගෙන ඕජස් උරන යකුන් සෙයින් ලක්දිව හි සාරය ගත්හ."** ( එම: 55, 18-22) මෙය මහා දරුණු විනාශයක් බව වංසකතාව වාර්තා කර ඇති ආකාරයෙන් පැහැදිලි වේ. මෙම සිද්ධියෙන් පසුව අනුරාධපුර යුගය තුළ දී ජේතවන විහාරය පිළිබඳව අපට තොරතුරු හමු නොවේ. මෙයට ප්‍රධානම හේතුව වූයේ 1017 දී සොළීන් අනුරපුරය ආක්‍රමණයකොට විහාරාරාම විනාශ කිරීම හා අනතුරුව චෝලයින් පොළොන්නරුවේ පාලන මධ්‍යස්ථානය පිහිටුවා ගැනීමය. අනුරාධපුරය ජනශූන්‍ය වීම නිසා මෙම විහාරාරාම අත්හැරීමට භික්ෂූන් වහන්සේලාට සිදුවුහ. නැවත චෝලයින්ගේ පාලනය අවසන් කරමින් 1 වන විජයබාහු රජු (ක්‍රි.ව. 1055-1111) ලංකාවේ දේශපාලන බලය තහවුරු කොට ගෙන අනුරාධපුරයේ දී අභිෂේක ලබා එහි කෙටි කලක් ගත කළ ද (එම: 59, 8-9) ඔහුට ජේතවනය ඇතුළු මහා දාගැබ් වල වැඩි ප්‍රතිසංස්කරණයක් කිරීමට හෝ පෙර තත්වයටම භික්ෂු ආවාස පරිවර්තනය කිරීමට නොහැකි වූ බව පෙනීයයි. එතුමා තුන් නිකායික භික්ෂූන් උදෙසා අතිශය මනහර වූ විහාර කරවා සිව්පසය සලස්වා පොළොන්නරුවේ නවත්වා ගත් බැව් මහාවංසයේ

සඳහන් වන හෙයින් (එම: 60, 9-15) ජේතවන, අභයගිරි හා මහාවිහාර භික්ෂූන් පොළොන්නරුවට වැඩම කළ බව පැහැදිලි වේ. නමුත් අනුරාධපුරයේ සම්පූර්ණයෙන් භික්ෂූන්ගෙන් හිස් වූයේ යැයි සිතිය නොහැකිය. කෙසේ වෙතත් පොළොන්නරු සමයේ දී වැඩි ශාසනික කාර්ය භාරයක් සිදුවන්නේ මහා පරාක්‍රමබාහු රාජ්‍යයේ දී ය. එතුමා විසින් විනාශයට පත්ව තිබූ ජේතවනය ඇතුළු අනුරාධපුරයේ මහ දාගැබ් ප්‍රතිසංස්කරණය කළ බව වංසකතා මෙන් ම ශිලාලේඛන ද සාක්ෂි දරයි. මහාවංසය සඳහන් කරන පරිදි පැරකුම් රජු දෙමළුන් විසින් නසන ලද අනුරාධපුරයේ විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙනම ම ඇමතිවරයෙකු පත්කර ඇත. දෙමළුන් දාගැබ් පලා දැමීම හේතුවෙන් කැලෑ වැවී තිබූ මහා දාගැබ් 3 න් එකසිය සැට රියනක් උසට ජේතවන දාගැබ පිළිසකර කර සුණුකම් කරවා මළුව ද ශුද්ධ කළ බව කියැවේ. (එම: 78, 100-105) රුවන්වැලි සෑ මළුවෙන් හමු වූ පරාක්‍රමබාහු රජුට අයත් ශිලාලේඛනයක ද ජේතවන දාගැබ පිළිසකර කළ බව සඳහන්ව ඇත. නිශ්ශංකමල්ල රජු හා කල්‍යාණවතී බිසවට අයත් ශිලාලේඛන දෙකක් රුවන්වැලි සෑ මළුවේ ඇතත් ජේතවන විහාරය පිළිබඳව යමක් එවායේ සඳහන්ව නැත. කෙසේ වෙතත් රුවන්වැලි දාගැබ සහ ථූපාරාමය තරම් විශේෂත්වයක් ජේතවන දාගැබ වෙත ලැබුණා යැයි සිතිය නොහැකිය. මාඝ ආක්‍රමණයත් සමග නැවතත් අභාවයට යන අනුරපුරයේ ජේතවනය ඇතුළු මහ දාගැබ් කෙරෙහි දඹදෙණි සමයේ දී සුළු වශයෙන් දෙවන පරාක්‍රමබාහු රජු විසින් අවධානය යොමුකර ඇති බව පෙනීයයි. එතුමා ආක්‍රමණිකයන් විසින් විනාශ කර තිබූ රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණය කොට රන් කොතින් සැරසීමට තම පුතු විජයබාහු කුමරාට භාර කර ඇත. (මහාවංසය 1967: 87, 68) එසේ ම විජයබා කුමරුවන්ට රාජ්‍ය උරුම වූ පසුවත් (ක්‍රි.ව. 1270-1272) ඔහු ශිල්පීන් එක්රැස් කරවා මහජනයාගේ ද සහායයෙන් දාගැබේ නව කර්මාන්ත කොට භික්ෂූන් ද එහි වාසය කරවීය. (එම: 88, 33) මේ සමයේ දී ජේතවනය පිළිබඳව අවධානය යොමු කළ බවක් මහාවංසයේ සඳහන් නොවෙතත් ඇතැම් විට සුළු වශයෙන් පිරිසිදු කිරීම් හෝ කරන්නට ඇතැයි සිතිය හැකි වේ. නුවර යුගයේ දී විජය රාජසිංහ (ක්‍රි.ව. 1739-1747) රජු ද අනුරාධපුරයේ මහා

පුද පැවැත්වූ බව වාර්තා වී ඇත. (එම: 98, 87) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747-1781) ද පිරිවර සමග අනුරාධපුරයට ගොස් බෝධිය හා චෛත්‍යයන්ට ඇත්, අස් ආදීන් ද රන් රිදී ආදී නොයෙක් පූජාවන් ද කළ බව කියැවේ. (එම: 99, 36-37) මෙහි වෙන් වෙන්ව දාගැබ් ගැන සඳහන් කර නැතත් ඒවා වෙත ගොස් මේ පූජාවන් කරන්නට ඇතැයි සිතේ. කෙසේ වෙතත් මෙය අනුමානාත්මක නිගමණයක් මිස ස්ථිර අදහසක් නොවේ. අපට ජේතවනයේ ඇති ශිලාලේඛන සාධක පිළිබඳව සැලකීමේ දී අනුරපුර යුගය ඉක්ම වූ කිසිඳු ශිලාලේඛනයක් ජේතවන භූමියෙන් හමු වී නොමැති බව ද සඳහන් කළ යුතුය.



ජේතවන දාගැබ 1894 වර්ෂයට පෙර ගත් ඡායාරූපයක්.
(උපුටා ගැනීම ජේතවන ස්තූප පුරාණය)



ජේතවන දාගැබ 1894 දී පමණ.
(උපුටා ගැනීම ජේම්ස්. ජී. ස්මිදර්ගේ Architectural Remains Anuradhapura)

පොළොන්නරු යුගයෙන් පසුව ජේතවනයේ කරන ලද කටයුතු පිළිබඳ පැහැදිලි ලිඛිත සාක්ෂි හමු වන්නේ බ්‍රිතාන්‍ය සමයේ දී ය. එම සමය වන විට ජේතවනය හා අභයගිරිය පිළිබඳ නම් මාරුවීමක් තිබුණු හෙයින් බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ජේතවනය පිළිබඳව කරනු ලබන වාර්තාවන් සැලකිල්ලෙන් ගත යුතුව ඇත.


බ්‍රිතාන්‍ය සමයේ දී පළමුවතාවට අනුරාධපුරය පිළිබඳව **ජෝන් ඩේවි** වාර්තා කර ඇතත් ජේතවනය පිළිබඳව විශේෂයෙන් වාර්තා කිරීමක් නැත. මේ සමයේ දී පැහැදිලිව පළමු වතාවට ජේතවනය ගැන වාර්තා කර තිබෙන්නේ **මේජර් ෆෝබ්ස්ය**. ඔහුගේ වාර්තාවලට අනුව 1828 හා 1832 දී ඔහු අනුරාධපුරයට පැමිණි විට ජේතවන දාගැබ අබියසට පැමිණ ඇත. පළමුවර පැමිණෙන විට දාගැබ ඝන කැලෑවෙන් වැසී තිබුණු බවත් පසුව ජේතවනයේ විසූ ශ්‍රද්ධා සම්පන්න භික්ෂූන් වහන්සේ නමක් දාගැබෙහි වැසී තිබූ ගහකොළ කපා ශුද්ධ කිරීමෙන් අනතුරුව ඇදහැළුණු ධාරානිපාත වර්ෂාවක් හේතුවෙන් දාගැබේ කොටසක් කඩා වැටී එම භික්ෂූන් වහන්සේ ද අනතුරට ලක් වූ බව වාර්තා කර ඇත. මේ හැර ඔහු තම ග්‍රන්ථයෙහි මේ දාගැබේ චිත්‍ර සටහනක් ද ඉදිරිපත් කොට ඇත. එය සම්පූර්ණයෙන්ම වනයෙන් වැසී ඇත. එය කවර දිශාවේ සිට අඳින ලද දැයි සඳහන් කර නැති අතර ඒ වන විටත් සතරැස් කොටුව සැලකිය යුතු අන්දමින් ගරා වැටී තිබූ බවත් එසේ ම ද්වාර මණ්ඩපයක ගල් කුළුණු ගණනාවක්ම ඒ වන විටත් හොඳින් සුරැකී තිබූ බව පෙනෙයි. (Forbes vol. I: 1840) මේ හැර බ්‍රිතාන්‍ය සමයේ රජයේ මිණුම් සහායක ජනරාල් මේජර් **තෝමස් ස්කිනර්** විසින් 1833 දී අඳින ලද අනුරාධපුර පූජා භූමි සැලසුමෙහි ජේතවන දාගැබ උස අඩි 244 ක් වන බව ද සඳහන් කර ඇත. එහෙත් එම සිතියමේ මෙම දාගැබ නම් කොට ඇත්තේ අභයගිරිය වශයෙනි. (Ratíyake 1982: 17) 1885 දෙසැම්බර් 6 වැනි දින රාත්‍රියේ දී ජේතවන දාගැබේ සතරැස් කොටුවේ බස්නාහිර පැත්තේ කොටසක් කඩා වැටුණු බව **හිෂර්** ඒජන්ත මහත්මා වාර්තා කර ඇත. (Ievers 1899: 235) එහෙත් වලිසිංහ හරිශ්චන්ද්‍ර මෙම බිඳ වැටීම 1882 දී සිදු වූ බව උපුටා

දක්වා ඇත. (හරිශ්චන්ද්‍ර 2001: 194) එස්. එම්. බරෝස් විසින් ද මෙම බිඳ වැටීම 1885 දී සිදු වූ බව වාර්තා කරන බැවින් (Burrows 1886: 6) වලිසිංහ හරිශ්චන්ද්‍රට ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බව පෙනීයයි. මෙම කඩා වැටීම පිළිබඳව අවධානය යොමු කල ආණ්ඩුකාරවරයාගේ නියමය පිට 1883 දී දාගැබේ සතරැස් කොටුවේ ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට භාර දුන් බවත් 1890 වන විට කොත් කැරැල්ලේ භාගයක් බඳින ලද බවත් වලිසිංහ හරිශ්චන්ද්‍ර වැඩි දුරටත් උපුටා දක්වා ඇත. ( හරිශ්චන්ද්‍ර 2001: 195 )

ඉංග්‍රිසි ආණ්ඩුකාර **විලියම් හෙන්රි ග්‍රෙගරි** ( 1872-1877 ) මහත්මා විසින් 1873 දී පරිපාලන ඒකකයක් වශයෙන් උතුරු මැද පළාත පිහිටුවීමෙන් පසුව එහි ප්‍රථම ඒජන්තවරයා ලෙස පත්වූයේ **ජෝන් ෆෙඩ්රික් ඩික්සන්** මහතාය. 1877 පමණ වන විටත් අනුරාධපුරයේ බෞද්ධ නටබුන් බෙහෙවින් ම වන ගහනයට යටත්ව තිබූ බව වාර්තා කරන අතර එහි කච්චේරිය , උසාවි ගොඩනැගිල්ල ඉංග්‍රිසි නිලධාරීන්ගේ හුදෙකලා නිවාසයක් ගෙවල් කීපයක් හා කුඩා කඩ පළක් පමණක් තිබූ බව වාර්තා කර ඇත. (Ievers 1899: 75) ජේ. එෆ්. ඩික්සන් ඒජන්ත තැන 1884 දී අභයගිරි දාගැබ තුළ රනින් කළ පොත් තැන්පත් කොට ඇතැයි යන ප්‍රවාදය මත දාගැබ හාරා ඒවා පරීක්ෂා කර බැලීමට යෝජනා කර ඇත. මෙම කාලයේ දී ජේතවනය හා අභයගිරිය යන නම් මාරුව නිසා නියම අභයගිරි දාගැබ වෙනුවට ජේතවනය හැරීමට බඳුන් විය. පසුව 1887 දී **අයිවර්ස්** නම් ඒජන්ත තැන විසින් මෙම දාගැබේ නැගෙනහිර පැත්තෙහි සලපතළ මළුවේ සිට අඩි 33 ක් උඩින් ගර්භය බිඳ ක්‍රමානුකූලව ගඩොල් ඉවත් කරමින් ගර්භය තුළට 162 ක් දිග දෝනාවක් කැන එතැන් පටන් ධාතු ගර්භය පාදා ගැනීමේ අදහසින් ගැබ තුලින් පහතට අඩි 46 ක් පමණ හාරා ඇත.



CS CamScanner



ජේතවන දාගැබේ ඇතුල් ප්‍රාකාර බැම්මේ හිරිත දිග කැණීම්.
(උපුටා ගැනීම Jethawanaramaya project Anuradhapura First Archaeo-logical Excavation and Research Report)

ඒ අනුව සලපතළ මළුව මට්ටම ද ඉක්මවා පොළොව දෙසට හාරා ගිය බව පෙනීයයි. මෙම වැඩ කරගෙන යන අතරතුර දී 1888 නොවැම්බර් 8 දන රජය මගින් නිකුත් කළ ලිපියක් හේතුවෙන් **අයිවර්ස්** මහතාට එම කටයුතු නවතා දැමීමටත් නැවත එම දෝනාවන් වසා දැමීමටත් සිදුවූබව වාර්තා කර ඇත. (ibid: 235) අයිවර්ස්ගේ මෙම දාගැබ හැරීම කෙරෙහි බෞද්ධ ගිහි පැවිදි දෙපක්ෂය ම පලකළ විරෝධය හේතුවෙන් රජයට මෙම කටයුත්ත අත්හැර දැමීමට සිදුවූ බවට සාධක වේ. මහනුවර මල්වත්තේ නා හිමියන් මේ සඳහා විරෝධය දක්වා මහලේකම් වෙත ලියුම් යැවූ බවත්, මේ විරෝධය පෑමේ කාර්යයන් සඳහා **හික්කඩුවේ සුමංගල** නා හිමියන් ද මැදිහත්ව කටයුතු කළ බව පෙනීයයි. (පඤ්ඤානන්ද හිමි 1947: 644 ) 1888 වර්ෂයේ දී **හියු නෙවිල්** පළමු වතාවට ජේතවනය හා අභයගිරිය යන ස්ථානයන්හි නාමය නිවැරදි කිරීමේ උත්සහයක යෙදුනි. (Nevill 1887-88: 294)

එස්. එම්. බරෝස් මහතා 1884-85 නැගෙනහිර ආයකය කැනීමට ලක් කිරිමත් ජේතවනයෙන් ගොඩනැගිලි කීපයක් ම සොයා ගැනීමටත් සමත්ව ඇත. (Burrows 1886: 2) 1885 වර්ෂයේ දී ධාරානිපාත වර්ෂාව හේතුවෙන් විනාශ වී ගිය දාගැබේ සතරැස් කොටුවේ බටහිර බැම්ම බරෝස් විසින් පරික්ෂාකොට ඇති අතර (ibid: 6) 1890 වන විට එම හතරැස් කොටුවේ හා කොත් කැරැල්ලේ වැඩ කර අවසන්ව තිබූ බව එවකට අටමස්ථානාධිපතිව වැඩ විසූ **ශ්‍රී සුමන මේධංකර** අනුනාහිමියන් හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමියන්ට 1890 සැප්තැම්බර් මස 17 වැනි දින යවන ලද ලිපියකින් පැහැදිලි වේ. (පඤ්ඤානන්ද හිමි 1947: 648) කෙසේ වෙතත් බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ දක්ෂ ඉංජිනේරුවන් ගේ උපදෙස් පිට කරන ලද හතරැස් කොටුවේ බටහිර බැම්ම 1902 දෙසැම්බර් මස 9 වැනි දින රාත්‍රි පැවති අධික වර්ෂාව හේතුවෙන් බිඳ වැටුනු බව වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා වාර්තා කර ඇත. (හරිශ්චන්ද්‍ර 2001: 196) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ජේතවන ආරාම සංකීර්ණය තුළ වැඩිපුරම අධ්‍යයන , කැනීම් හා තහවුරු කිරීමේ කාර්යයේ නියැලුනු පුද්ගලයා ලෙස එවකට පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස කටයුතු



CamScanner



ජේතවන දාගැබේ නැගෙනහිර ආයකයේ කැටයම්.



ජේතවන දාගැබේ නැගෙනහිර ආයකයේ කැටයම්.

කළ එච්. සී. පී. බෙල් මහතා හඳුන්වා දීමට පුළුවන. (1890-1912) ඔහුගේ පාලන වාර්තාවලට අනුව ඔහු පළමුව අවධානය යොමුකර ඇත්තේ දාගැබ පිරිවර කොට ඒ වටා පිහිටි ගොඩනැගිලි පිළිබඳව ය. එහි දී ප්‍රථමයෙන් පොහොය ගෙයක් අනතුරුව ගරාදි වැට සහිත ගොඩනැගිල්ල, ඒ ආසන්න ගොඩනැගිලි සංකීර්ණය දාගැබට බටහිරින් වූ විශාල පිළිම ගෙය නැගෙනහිරින් පිහිටි දානශාලාව ආදි ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගන්නා ලදී. ඔහු දාගැබේ කටයුතු ආරම්භ කරන ලද්දේ 1894 දීය. එම වර්ෂයේ දී ඔහු විසින් දාගැබෙහි කරන ලද කටයුතු අනුපිළිවෙලින් විස්තර කොට ඇත.

(අ) ද්වාර මණ්ඩප කැනීම් කොට ඒවායේ ගල් නැවත තබා තහවුරු කිරීම.

(ආ) දාගැබේ සලපතළ මළුව වෙත වැටී ඇති පෙත්මගේ පියගැටපෙළ පිරිසිදු කොට සකස් කිරීම.

(ඇ) දාගැබ වටා ඇති පේසා වළලු මත හා ආයක මත තිබූ ගඩොල් හා සුන්බුන් ඉවත් කොට පිරිසිදු කිරීම.

(ඈ) නැගෙනහිර , දකුණු, බටහිර හා උතුරු ආයක කැනීම හා තහවුරු කිරීම.

(ඉ ) නැගෙනහිර හා දකුණු ආයක අබියස කැනීම් කිරීම, පරීක්ෂා කිරීම, දාගැබේ හැඩය හඳුනා ගැනීම හා දාගැබ මත සන හුණු බදාමයක් යොදාතිබූ බව අනාවරණය කරගැනීම.

(ඊ) දාගැබේ පාදම පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීම සඳහා නැගෙනහිර හා දකුණු සලපතළ මළුවේ කැනීම් කිරීම .( මෙහිදී සලපතළ මළුව මට්ටමට වඩා අඩි 26 ක් පොළොව යට සිටම ගඩොලින් ඉදිකර ඇති බව එහි දී අනාවරණය වී ඇත.)

(ඇ) මළුවේ දකුණු පාර්ශවයේ කොටස ගස් කපා පිරිසිදු කිරීම.

(ඈ) මළුවේ වයඹ දිග අන්තයේ පිහිටි සතරැස් ගොඩනැගිල්ලක් කැනීම් කිරීම.

(ASCAR 1894: 1-2)

බෙල් මහතා තමා කළ කටයුතු පිළිබඳව හොඳින් වාර්තා තබා තිබෙන අතර ඊට හැකි පමණින් සැලසුම් හා ඡායාරූප ඉදිරිපත් කිරීමට අමතක කොට නැත. (ASCAR, 1890-1899) ජේතවන දාගැබේ ඓතිහාසිකත්වය පිළිබඳවත් එහි වාස්තු විද්‍යාත්මක අංග පිළිබඳවත් සාලසුම් හා ඡායාරූප සහිතව ඉතා ප්‍රශස්ථ මට්ටමේ වාර්තාවක් තබා ඇති පුද්ගලයෙකු වශයෙන් ජේ. පී. ස්මිදර් මහත්මා ද හඳුන්වා දිය හැකිය. ඔහු ඉදිරිපත් කළ සැලසුම් තවමත් ඉතා ඉහළ අගයකින් යුක්තය. (Smither 1993 : 59-78, pl. XLIII - LI) ඔහුගේ වාර්තාවේ ද අභයගිරි ජේතවන නම් මාරුව පවත්නා බැවින් ඔහුගේ මුල් කෘතිය අධ්‍යයනයේ දී අපට සැලකිල්ලෙන් එය අධ්‍යයනය කිරීමට සිදු වේ. එතුමා දාගැබේ මිනුම් ඉදිරිපත් කරනු ලබන්නේ පහත අයුරිනි.

| | අඩි | අඟල් |
|---|---|---|
| ඉහළම පේසාව මට්ටමේදී දාගැබේ විශ්කම්භය | 325 | . 00 |
| එහි පාදමේ වට ප්‍රමාණය | 367 | . 00 |
| මළුවේ සිට 1 වන පේසාවේ උස | 67 | . 9 |
| මළුවේ සිට 2 පේසාවේ උස | 11 | . 6 |
| මළුවේ සිට 3 වන පේසාවේ උස | 16 | . 00 |
| මළුවේ සිට දාගැබ් ගර්භය හතරැස් කොටුව තෙක් උස | 150 | . 6 |
| මළුවේ සිට හතරැස් කොටුවේ මුදුනට උස | 183 | . 00 |
| මළුවේ සිට නටබුන් දාගැබේ උපරිම උස | 232 | . 00 |

(Smither 1993: 69)

මෙයින් පසුව 1909 **හෙන්රි පාකර්** මහත්මා ද ජේතවන දාගැබ හා ආරාම සංකීර්ණය පිළිබඳ බොහෝ තොරතුරු ඉදිරිපත් කොට



CS CamScanner

ඇත. (Parker 1981: 287-89) ඔහු ස්මිදර්ගේ කෘතිය ද මෙහි දී බෙහෙවින් උපකාර කරගෙන ඇති බව පෙනියයි. එම වාර්තාවේ විශේෂත්වයක් වන්නේ නිවැරදි ලෙස ම අභයගිරිය හා ජේතවනය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තොරතුරු ඉදිරිපත් කොට තිබීමයි. **හෙන්රි ඩබ්ලිව්. කේව්** මහත්මා ද 1896 දී ලංකාවේ නටබුන් නගර යන තම කෘතියෙහි ජේතවනාරාමය පිළිබඳව කෙටි සටහනක් පමණක් තබා ඇත. ඔහු දාගැබේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීමට ද අමතක කොට නැත. (කේව්, 1956: 53-54) අභයගිරිය යන මාතෘකාව යටතේ ජේතවන විහාරය පිළිබඳව වැදගත් කරුණු රැසක් වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මා විසින් ද ඉදිරිපත් කොට ඇත. එතුමා ඒ සමයේ දී ඇතැම් බ්‍රිතාන්‍ය නිලධාරීන් දාගැබ සම්බන්ධයෙන් කරන ලද ඇතැම් ක්‍රියා දෝෂ දර්ශනයට ලක් කර ඇත. (හරිශ්චන්ද්‍ර 2001: 195-96) 1916 **දී ජී. ඊ. මිටන්** නැමැත්තෙකු ද මෙම දාගැබ පිළිබඳව වාර්තා කොට ඇත. අභයගිරිය නමින් දාගැබ හඳුන්වමින් කරනු ලබන වාර්තාව සඳහා ඔහු **බෙල්** මහතාගේ වාර්තා ද උපයෝගී කොට ගෙන ඇත. (Mitton 1991: 111-13) ලංකාවේ බොහෝ ස්ථානවල පුරාවිද්‍යාත්මක ගවේෂණ කැනීම් හා සංරක්ෂණ කටයුතු සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කළ සෙනරත් පරණවිතාන මහත්මා ජේතවන දාගැබෙහි කැනීම් කිරීමක් හෝ සංරක්ෂණ කාර්යයක් පිළිබඳව මැදිහත් වූ බවට සාධක සොයා ගැනීමට නොහැකිය. මෙම දාගැබ පිළිබඳව එතුමා සඳහන් කර ඇත්තේ ද සුළු වශයෙනි. කෙසේ වෙතත් එතුමා පළමු වතාවට වඩාත් පිළිගත හැකි අයුරින් උදාහරණ ඉදිරිපත් කරමින් මෙම ස්ථාන දෙකෙහි නම් මාරුව නිවැරදි කිරීමට සමත් විය. (Ez. IV :136-141) පරණවිතාන මහත්මා සඳහන් කරන්නේ මෙම දාගැබ ලංකාවේ දාගැබ් අතර විශාලම දාගැබ වන අතර ඇතැම් විට මෙය ලෝකයේ ද විශාල ම දාගැබ වීමට ඉඩ ඇති බව ය. එතුමා වැඩි දුරටත් සඳහන් කරන්නේ පැරණි වාර්තාවලට අනුව ජේතවන දාගැබ එකසිය හැට රියනක් හෙවත් අඩි 400 ක් උසකින් යුතුව පැවතී ඇති අතර දැනට අඩි 231 ක් උසින් යුතු බවය. ස්තූපයේ පාදයේ විශ්කම්භය අඩි 370 ක් බවත් සඳහන් කරයි. දාගැබේ සලපතළ මළුව පිළිබඳව අවධානය යොමු කරන එතුමා සඳහන් කරන්නේ අනුරාධපුර යුගය ද්‍රවිඩයින්ගේ ආක්‍රමණයත් සමග අවසන් වූ හෙයින් දාගැබ්



ජේතවන දාගැබේ නැගෙනහිර ආයකයේ සිබි ජාතකයට අයත්
අවස්ථා නිරූපණයක්.



ජේතවන දාගැබෙහි නැගෙනහිර ආයකයේ සිබි ජාතකයට අයත්
අවස්ථා නිරූපණයක්.

සලපතළ මළුවේ ගල් පුවරු අතුරමින් තිබිය දී එය අතරමග අතහැර දැමීමට සිදුවූ බවක් පෙනෙන්නට තිබෙන බවකි. (පරණවිතාන 1963: 98) ජේතවන ආරාම සංකීර්ණයෙහි මහා පරිමාණ සංවර්ධන ක්‍රියාවලියක් සිද්ධ වූ කාල පරිච්ඡේදයක් වශයෙන් 1981 වර්ෂයෙන් මෙපිට කාල පරිච්ඡේදය දැක්වීමට පුළුවන. සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙල යටතේ ජේතවන ආරාම සංකීර්ණය තුළ පුළුල් ගවේෂණ, කැනීම් හා සංරක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවෙමින් පවතී. මේ යටතේ මේ වන විට දාගැබේ උතුරු කොටස් කැනීම් කොට පාදා ක්‍රමානුකූලව සංරක්ෂණයට ලක් කොට ඇත. මේ හැර ආයක හා සලපතළ මළුවේ සංරක්ෂණ ද අවසන්ව පවතී. පසුගිය වසර 25 ක් පුරා ජේතවන ආරාම සංකීර්ණය තුළ කරන ලද කැනීම් වලින් අනාවරණය කරගත් තොරතුරු හා පුරාවස්තු අතිවිශාල ප්‍රමාණයකි. 1984 වර්ෂයේ සිට මේ දක්වා දාගැබ හා සම්බන්ධයෙන් කරන ලද කැනීම්වලින් දාගැබෙ සිව් දිශාභිමුඛ පියගැට පෙළ , සලපතළ මළුව හා වැලි මළුව සීමා කරන පනාබැම්ම දාගැබේ ආයක හා දාගැබ් පදනම අනාවරණය කර ගැනීමට හැකියාව ලැබී ඇත. මේ අනුව දාගැබේ පාදම සලපතළ මළුවෙන් යට පොළොව තුළ මීටර් 7ක් (අඩි 23) පමණ ගැඹුරට විහිදී යන බව අනාවරණය කර ගැනුණි. (රත්නායක 1998: 334) බෙල් මහත්මා නැගෙනහිර හා දකුණු සලපතළ මළුවේ කරන ලද කැනීම් වලින් ජේතවන දාගැබේ පාදම අඩි 26 ක් සලපතළ මළුවෙන් යටට දිවෙන බැව් ඉහත දී ද සඳහන් කරන ලද සඳහන (ASCAR 1894 :1-2) මෙම නව කැනීම් වලින් ද තහවුරු විය. ඒ හැර මෙම කැනීම්වලින් පැහැදිලි වී ඇත්තේ මෙම පාදම් දාගැබ දෙස සිට මාලක වශයෙන් ක්‍රමයෙන් පිටට විහිදෙන පරිදි සකසා ඇති බවය. සලපතළ මළුව මට්ටමේ සිට මේ සඳහා අවම වශයෙන් ගල් වරි 86 ක් වත් භාවිත වී ඇත. මෙම සාධක සලපතළ මළුවේ තුන් පැත්තකින්ම අනාවරණය වූ බැවින් දාගැබ සකසා ඇත්තේ විශාල ගඩොල් වේදිකාවක් මත බව පැහැදිලි වේ. එය ද දාගැබේ බර දරා ගෙන සිටිය හැකි අයුරින් මාලක වශයෙන් පාදම සකසා තිබීම වාස්තු විද්‍යාත්මක වශයෙන් වැදගත් කරුණකි. සලපතළ මළුව මට්ටමේ සිට ගඩොල් වරි 60 ක් පහතට දිව ගොස් එතැන් සිට මීටර් 1 ක් පමණ පිටට විහිදෙන පාදම නැවතත් සුළු පැන්නුම් සහිත පාදම තෙරා ගොසින්



Scanned with CamScanner
CamScanner

ඇත. එක් අතකින් අපට මතුපිටට පෙනෙන දාගැබේ ගඩොල්වලට වඩා ගඩොල් ප්‍රමාණයක් මෙසේ පොළොව යට පාදම වෙනුවෙන් ගිල්ලවා ඇති බව පෙනීයයි . දාගැබේ පාදම පිහිටි ගල මතුපිට සිට ඉහළට බඳින අතරම එහි යටම කොටස බොරළු දමා තලා සවිමත් කොට ඇති බව ද කැනීම් වලින් තහවුරු වී ඇත. දාගැබ ගර්භයේ සහ සතරැස් කොටුවේ කරන ලද කැනීම් වලින් ද දාගැබේ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පිළිබඳ බොහෝ සාධක අනාවරණය වී ඇත. ( ගමලත් 1997:2)

සලපතළ මළුවේ ගල් ඇතිරීම පිළිබඳව සැලකීමේ දී පෙනී යන්නේ එය අවස්ථා කීපයක දී කර ඇති බව ය. වැඩි වශයෙන් ම 9-10 සියවස් අතර දී මෙම ගල් පුවරු අතුරා ඇති බව එහි ඇති පරිත්‍යාගීලීන්ගේ සෙල්ලිපිවලින් පැහැදිලි වේ. නැගෙනහිර, දකුණු හා බටහිර ආයක අතර කොටසේ ගල් පුවරු බොහෝ සෙයින් අතුරා අවසන් කර ගැනීමට මේ කාල වකවානුවේ දී එහි නිර්මාණ කරුවන්ට හැකිව තිබුණ ද මළුවේ උතුරු ඊසාන දිග හා වයඹ කොටස්වල ගල් ඇතිරීමට පූර්ණ අවකාශයක් ලැබී නැත. මේ හේතුව නිසා වෙනත් ගොඩනැගිලිවල බොහෝ අවශේෂ මළුවේ අතුරා තිබෙනු පෙනේ. විශේෂයෙන් බෞද්ධ වැට සහිත ගොඩනැගිල්ලේ ශිලාමය අවශේෂ මෙන් තදාසන්න ගොඩනැගිලිවලට අයත් පියගැට කොරවක්ගල් . මුරගල්, හා වෙනත් ගල් පුවරු යොදා ගෙන ඇත. මේවා බොහෝ විට පොළොන්නරු යුගයේ දී හෝ දඹදෙණි යුගයේ දී යොදන්නට ඇතැයි සිතිය හැකි වේ.

**සලපතළ මළුවේ ශිලාලේඛන**

ජේතවන සලපතළ මළුවෙන් කුඩා ප්‍රමාණයේ ශිලාලේඛන 250 ක් වත් සොයා ගත හැකිය. මෙහි එක් දෙමළ ලිපියක් තිබෙන අතර ඉතිරි ඒවා සියල්ල ම පාහේ සිංහල අක්ෂරයෙන් ලියන ලද ඒවා වේ. මෑත කාලයට අයත් ඉංග්‍රීසි අක්ෂර සහිත ලිපි කීපයක් ද තිබෙන බැව් සඳහන් කළ යුතුය. මෙම ශිලාලේඛන අතුරින් වැඩිම ප්‍රමාණයක් අයත් වන්නේ අනුරපුර යුගයේ අවසන් සමයට හෙවත් ක්‍රි.ව. 9-10

සියවස් අතරටය. මෙම සියලු ලිපිවල ම පාහේ සඳහන්ව ඇත්තේ සලපතළ මළුවේ ගල් ඇතිරවීම් පිළිබඳව ය. මේ සඳහා ගිහි පැවිදි මෙන්ම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම දායකත්වය සපයා ඇත. ගිහි පක්ෂය අතර වැඩිපුරම ඇත්තේ සාමාන්‍ය ජනතාව බැව් පෙනීයයි. මේ හැර විවිධ තනතුරු හා උසස් නිලයන් දරණ අය මෙන්ම විවධ ව්‍යාපාරිකයන් ද වේ. මේ සඳහා යෙදවූ මුදල් රන් කහවනු හා රන් මසුවලින් වැඩි වශයෙන් ම ගෙවා ඇත.

මේ හැර සලපතළ මළුව මත සිටුවා තිබෙන විශාල පුවරු ලිපියකි. මෙහි අඩු තරමින් අක්ෂර පේළි 60 ක් වත් ඇතත් එය ද බෙහෙවින් ගෙවී ගොස් ඇති අතර අන්තර්ගත කරුණු අනාවරණය කරගත නොහැකිය. එහි කතෘත්වය පස් වන කාශ්‍යප රජුට අයත් බව පෙනීයයි. මළුවේ ඇති විශාල ම ලිපිය වන්නේ ද මෙයයි. මෙය බිම අතුරා නොතිබෙන්නට ඇතත් එම ලිපිය සිටුවා තිබුනේ කවර ස්ථානයක දැයි අවිනිශ්චිතය.

ලංකාවේ දැනට විවිධ පුද්ගලයන්ට අයත් වැඩිම ශිලාලේඛන ප්‍රමාණයක් හමු වන්නේ නම් ඒ ජේතවන සලපතළ මළුවෙන් වීම විශේෂ කරුණකි.



CamScanner

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. පඤ්ඤානන්ද හිමි, යගිරල., 1947, ශ්‍රී සුමංගල චරිතය, කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
2. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1950, පාලි සිංහල අකාරාදිය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
3. සංඝරාජ සාධු චරියාව, 1954, සංස්: හේන්පිටගෙදර පියනන්ද හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
4. කේව්, හෙන්රි, ඩබ්ලිව්., 1956, ලංකාවේ නටබුන් නගර, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.
5. සිංහල ථූපවංසය, 1958, බද්දේගම විමලවංස හිමි, සංස්:, කොළඹ, ඇම් ඩී. ගුණසේන සහ සමාගම.
6. ෆාහියන් දේශාටන වාර්තාව, 1958, බලගල්ලේ විමල බුද්ධි ස්ථවිර, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
7. මහාවංසො, 1959, බුද්ධදත්ත මහා ථෙර, කොළඹ, ගුණසේන සහ සමාගම.
8. පරණවිතාන, එස්., 1963, ලංකාවේ ස්තූපය, කොළඹ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.
9. විමලානන්ද, තෙන්නකෝන්., 1964, පුරාවිද්‍යාව හා ඉතිහාසය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
10. පරණවිතාන, එස්. 1964, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, හේමචන්ද්‍ර රාය ඇතුළු පිරිස, කැලණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංග්‍රහයේ සිංහල පරිවර්තනය.
11. මහාවංසය, 1967, ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ දේවරක්ඛිත, සංස්:, කොළඹ, රත්නාකර පොත් වෙළෙඳ ශාලාව.
12. විජේසේකර, නන්දදේව., 1970, පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
13. දීපවංසය, 1970, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, සංස්: 2, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
14. වනරතන හිමි, කඹුරුපිටියේ., 1970, අනුරපුර නටබුන්, මාතර, සීමාසහිත මාතර වෙලෙන්දෝ.
15. පරණවිතාන, එස්., 1972, පුරාවිද්‍යා පරියේසන, කොළඹ, ලේක් හවුස් සමාගම.




CamScanner

16. නිකොලස්. සී. ඩබ්ලිව්., 1979, පුරාණ ස්ථාන නාම හැඳින්වීම, පරිවර්තනය සෝමපාල ජයවර්ධන, දෙහිවල, තිසර ප්‍රකාශකයෝ.
17. මහාබෝධිවංශ ග්‍රන්ථි පදය, 1985, ගතාරේ ධම්මපාල හිමි, සංස්:,
18. නිකාය සංග්‍රහය, 1987, එල්. ගුණරත්න, සංස්., කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ.
19. වත්තල, ශරත්., 1989, අනුරාධපුර විහාරාරාම, කොළඹ, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
20. උක්කුබණ්ඩා, කරුණානන්ද., 1991, බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර සහ අනුරපුර බෞද්ධ ප්‍රබෝධය, කැලණිය, ශිලා ප්‍රින්ටින් වර්ක්ස්.
21. විජේසූරිය, ගාමිණී, 1993, මිරිසවැටිය උද්‍යානය, කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
22. වංසත්ථප්පකාසිනී, 1994, අකුරටියේ අමරවංශ නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, සංස්: කැලණිය, විද්‍යාලංකාර මුද්‍රණාලය.
23. වජිර හිමි, හබරකඩ, 1994, "දෙවන භාතික තිස්ස රජුගේ අභයගිරි ශිලා ලේඛනය", සංස්කෘතික පුරාණය, මධ්‍යම සංස්කෘතික අරමුදල.
24. සද්ධර්මරත්නාකරය, 1995, ධර්මකීර්ති ශ්‍රී සුගුණසාර දේවානන්ද, කොළඹ.
25. පූජාවලිය, 1997, කිරිඇල්ලේ ඤාණවිමල හිමි, සංස්: කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
26. පැරකුම්බා සිරිත, 1997, සංස්: රෝහිණී පරණවිතාන, සංස්: මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.
27. හමිලන්, ඩී. පී., 1997, "ජේතවන ස්තූප ගර්භයේ ඉදිකිරීම් තාක්ෂණික ක්‍රම", සංස්කෘතික පුරාණය, 2 වෙළුම, 8 කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල.
28. රත්නපාල, ඊ. එම්., 1999, ඇසිරිමත් අනුරපුරය, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.
29. හරිශ්චන්ද්‍ර, වලිසිංහ., 2001 (නැවත මුද්‍රණය), සිතියම් සහිත පුරාවිද්‍යාව බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.
30. කුලතුංග, ටී. ජී., 2001, අනුරපුර ජේතවන විහාරය, මහරගම, තරංජී ප්‍රින්ටස්.
31. වික්‍රමගමගේ, චන්ද්‍රා., 2001, අටමස්ථාන, මහරගම, තරංජී ප්‍රින්ටස්.

32. නොක්ස්, රොබට්., 2004, නොක්ස් දුටු ලක්දිව, පරිවර්තනය, ජේමචන්ද්‍ර අල්විස්, කොළඹ, සූරිය ප්‍රකාශකයෝ.
33. කුලතුංග, ටී. ජී., 2004, අනුරපුර අභයගිරි විහාරය, මහරගම, තරංජි ප්‍රින්ටස්.
34. කුලතුංග, ටී. ජී., 2004, I ලංකාවේ ස්තූපය, මහරගම, තරංජි ප්‍රින්ටස්.
35. ධම්බන්ධු, ටී. ඇස්., (මුද්‍රිත වර්ෂය නොමැත) සිංහල වීරයෝ.
36. Forbes. J., 1840, Vol II, Elven Years in Ceylon, London Richerd Bentley.
37. Archaeological Survey of Ceylon (ASCAR), 1894, North - Central, Sabaragamuwa and Central Provinces, Annual Report.
38. Bell, H. C. P., 1894, Archaeological Survey of Ceylon, Annual Report North Central Province, Government Printer, Ceylon.
39. Smither, James. G., 1894, Architectural Remains, Anuradapura, Sri Lanka, Revised and Edited Chandra WIckramagamage, 1993, Maharagama, Taranjee Prints.
40. Ortel, F. D. 1895, Report on the Restoration of Ancent monuments, Government Press.
41. Levers, R. W., 1899, The Manual of the North Central Province, Colombo.
42. Epigraphia Zelanica, Vol. I (EZ), 1912, D. M. Z. WIckramasinghe, Ed;, Archaeological, Survey of Ceylon, Oxford University Press, London.
43. Epigraphia Zelanica, Vol. II, (EZ), 1928, (Re-Printed in 1985), D. M. Z. WIckramasinghe, Ed;, Archeologeical Survey of Ceylon, Oxford University Press., London.
44. Epigraphia Zelanica, Vol. III, (EZ), 1933, S. Paranavithana, Ed:, Archaeological Survey of Ceylon, Oxford University Press, London.
45. Epigraphia Zelanica, Vol. IV., (EZ), 1943, S. Paranavithana, Ed;, Archaeological Survey of Ceylon, Oxford, University Press, London.



CamScanner